

ප්‍රතිඵලවත් තුළින් නැඟී සිටීම

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව
වාර්ෂික වාර්තාව 2023

පටුන

මූල්‍ය විශේෂතා	3
මූල්‍ය සමාලෝචනය	4
සභාපතිතුමාගේ පණිවුඩය	8
ප්‍රධාන විධායක නිලධාරිතුමාගේ පණිවුඩය	12
අධ්‍යක්ෂ මණ්ඩලය	16
ආයතනික කළමනාකාරිත්වය	19
ජේෂ්ඨ කළමනාකාරිත්වය	21
ආයතනික පාලනය	22
අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු වාර්තාව	44
අධ්‍යක්ෂ මණ්ඩල නාම යෝජනා කමිටු වාර්තාව	46
අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටු වාර්තාව	47
අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව (BIRMC)	48
අවදානම් කළමනාකරණය	51
මානව සම්පත් කළමනාකරණය	55
2023 -සීමා අභිබවා: ආයතනික සහ සේවා සන්නාම පිළිබඳ සමාලෝචනය	57
අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව	60
මූල්‍ය වාර්තාකරණය සම්බන්ධයෙන් අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය	63
අභ්‍යන්තර පාලනය පිළිබඳ විගණකාධිපති වාර්තාව	65
මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ වගකීම	67
විගණකාධිපති වාර්තාව	69
මූල්‍ය තත්ත්ව ප්‍රකාශය	74
ආදායම් ප්‍රකාශය	75
විස්තීර්ණ ආදායම් ප්‍රකාශය	75
ස්කන්ධය වෙනස්වීම් ප්‍රකාශය	76
මූදල් ප්‍රවාහ ප්‍රකාශය	77
මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්	78
දස වසරක සංඛ්‍යාත්මක සාරාංශය	124
සටහන්	125
ආයතනික තොරතුරු	*පිටුපස කවරය*

ප්‍රත්‍යක්ෂතාව තුළින් නැඟී සිටීම

ඕනෑම ව්‍යාපාරයක් සිය දුෂ්කර කාලවලදී මෙහෙයුම් කටයුතුවලින් මද විරාමයකින් ගෙන ඉදිරිය වෙනුවෙන් සැලසුම් කිරීම අත්‍යවශ්‍ය වන්නේය. අනපේක්ෂිත ඉදිරි අභියෝග සම්බන්ධයෙන් කටයුතු කිරීමේදී අපි අපගේ අභ්‍යන්තර ක්‍රියාවලීන් පිළිබඳ සැලකිලිමත් වූයෙමු. එය අපගේ පාර්ශ්වකරුවන් සහ ඔවුන් අප කෙරෙහි තබා ඇති විශ්වාසය වෙනුවෙන් අප සතු කාර්යභාරය ඉටු කිරීමට සහය දක්වන අත්‍යවශ්‍ය අංගයකි. අපගේ ඩිජිටල් වේදිකා සහ ආයතනික ආචාර ධර්ම ඉහළ නංවමින් අනුග්‍රහය, ඉදිරි චින්තනය සහ අනුවර්තනය ආදිය කැටිකොට ගත් සුවිශේෂිතාව තුළින් අපි අපගේ පාරිභෝගිකයින්ට සහයෝගය පිරිනමන්නෙමු. අප තුළ පවතින ඔරොත්තු දීමේ හැකියාව, බාහිර පරිසරය තුළ එදිනෙදා මෙහෙයුම්වලදී ශක්තියක් වූ අතර, එය වසරේ ධනාත්මක ධෛර්ය සම්පන්න දැක්මට මහත් පිටිවහලක් විය.



දැක්ම

පාරිභෝගික මූල්‍ය කටයුතුවල වෙළෙඳපොල පෙරගමන්කරුවෙකු වීම සමඟින් සංවර්ධන බැංකුකරණයේ ජාතියේ අගනා කොටස්කරුවෙකු වීම



මෙහෙවර

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව ජාතියේ විශිෂ්ඨ නිවාස බැංකුව ලෙස ඉදිරියටත් පවත්වාගෙන යමින් සංවර්ධන බැංකුකරණයේ අගනා කොටස්කරුවෙකු වීම

ගනුදෙනුකරු	:	විශිෂ්ඨ පාරිභෝගික සේවාව, නව්‍යකරණය, ගුණාත්මක බව හා අති නවීන තාක්ෂණය මගින් අපගේ සියළුම ගනුදෙනුකරුවන්හට ඔවුන්ගේ නිවාස හා සංවර්ධන මූල්‍ය අවශ්‍යතාවයන්ට සරිලන පරිදි ආකර්ෂණීය මූල්‍ය විසඳුම් ලබා දෙමින් සේවය කිරීමට අපි ඇපකැපවී සිටිමු.
ව්‍යාපාර හවුල්කරුවන්	:	ඉහළ ආරක්ෂාවකින් හා නම්‍යතාවයකින් යුතුව ආයෝජන සඳහා විශිෂ්ඨ ප්‍රතිලාභ ප්‍රදානය කරන්නෙමු.
සේවකයා	:	කණ්ඩායම් හැඟීමෙන් සේවය කල හැකි යහපත් පරිසරයක් නිර්මාණය කරමින් අපගේ සේවකයින්ගේ කුසලතා උපරිම අයුරින් වර්ධනය කරගැනීම වෙනුවෙන් හා ඔවුන්ගේ ජීවන තත්ත්වය නගාසිටුවීම සඳහා ද අපි අවස්ථා ලබා දෙන්නෙමු.
කොටස්හිමියන්	:	පාර්ශ්වකරුවන්ගේ ප්‍රතිලාභ ආරක්ෂා කරමින් ලාභදායිත්වයේ වර්ධනය මගින් කොටස්කරුවන්ගේ තත්ත්වය ඉහළ නැංවීමට අපි කැපවී සිටින්නෙමු.
තාක්ෂණය	:	වේගවත්බව, ගුණාත්මක බව හා පහසුව ඇතිකරලීම සඳහා ස්වයංක්‍රියකරණ සහ තාක්ෂණික යෙදුම් මගින් අපගේ බාහිර ගනුදෙනුකරුවන් සඳහා අගය එකතුකළ සේවාවන් ලබාදීමට අපි බැඳී සිටිමු. තීරණ ගැනීමේ ක්‍රියාවලියේ කාර්යක්ෂම බව හා සඵලතාවය වැඩිකරලීම සඳහා අපගේ අභ්‍යන්තර ගනුදෙනුකරුවන්ට වේගවත් හා නිවැරදි තොරතුරු ලබා දෙන්නෙමු.
සමාජය	:	ජාතික සංවර්ධනයේ කොටස්කරුවෙකු ලෙස අපගේ ප්‍රජාවගේ ජීවන රටාව නගා සිටුවීම සඳහා සේවය කිරීමට අපි පොරොන්දු වෙමු.

ආයතනික වටිනාකම්

අප පෙනී සිටින්නේ

- ගෞරවය පුදකරමින් විශ්වාසනීයව කටයුතු කරමු
- අප ඉටුකරන සියළුම කාර්යයන්වලදී වෘත්තීයවේදීත්වය හා විශිෂ්ඨත්වය ප්‍රදර්ශනය කරමු
- අප කරන කාර්යයන් ඉතා කැපවීමෙන් ඉටුකරමින් වගකීම ආරක්ෂා කරමු
- අපි විවෘතභාවය ප්‍රදර්ශනය කරමින් කණ්ඩායමක් ලෙස කටයුතු කිරීමට උත්සාහ කරමු
- අපි නව්‍යකරණ අදහස් සහ සක්‍රීය විසඳුම් බලාපොරොත්තු වෙමු
- ඉගෙනුම සඳහා බලවත් කැමැත්ත සහ බැංකුව සමඟ වර්ධනයවීම සඳහා මහත් ලැදියාව අපි සතු වෙමු

මූල්‍ය විශ්ලේෂතා

	2023 රු. මිල	2022 රු. මිල	වෙනස %
පොලී ආදායම	9,324	7,402	25.97%
පොලී වියදම	(8,733)	(5,463)	59.86%
ශුද්ධ පොලී ආදායම	591	1,939	-69.52%
බදු වලට පෙර ලාභය	(1,165)	(89)	1208.99%
බදු කරණය	162	291	-44.33%
බදු වලට පසු ලාභය	(1,003)	202	-596.53%
රාජ්‍ය සුරැකුම් ආයෝජන	10,256	2,204	365.34%
ණය සහ අත්තිකාරම් ශුද්ධ	38,603	39,267	-1.69%
මුළු වත්කම්	59,067	56,965	3.69%
ගනුදෙනුකාර තැම්පතු	52,138	49,140	6.10%
ණය ගැනීම්	179	278	-35.61%
පාර්ශ්වකරුවන්ගේ අරමුදල	5,454	6,474	-15.76%
අනුපාත විශ්ලේෂණ			
ලාභදායීතා මට්ටම	%	%	%
ශුද්ධ පොලී ආන්තික	1.02%	3.52%	-71.06%
ස්කන්ධය මත ඉපැයීම් (ROE)	-16.82%	3.17%	-631.09%
වත්කම් මත ඉපැයීම් (ROA)	-2.01%	-0.16%	1144.19%
ප්‍රාග්ධන ප්‍රමාණාත්මකභාවය			
ස්කන්ධය/ මුළු වත්කම්	9.23	11.36	-18.75%
ස්කන්ධය/ ණය සහ අත්තිකාරම්	14.13	16.49	-14.31%
	Basel (III)	Basel (III)	
පළමු පෙළ	18.81%	18.81%	-0.02%
පළමු සහ දෙවන පෙළ	18.89%	19.76%	-4.40%
ද්‍රවශීලතාව			
ද්‍රවශීල වත්කම් අනුපාතය	35.60	34.69	2.62%
ණය සහ අත්තිකාරම්/ තැම්පතු	74.04%	79.91	-7.34%
ණය ගැනීම්/ ණය සහ අත්තිකාරම්	0.46%	0.71%	-34.50%
ශ්‍රේණිගත කිරීම්			
වත්කම් ගුණාත්මකභාවය			
අක්‍රීය ණය/ ණය සහ අත්තිකාරම්	25.99%	22.02%	18.03%
සේවක අර්ථසාධක අරමුදල හැර අක්‍රීය ණය	12.32%	10.31%	19.45%
මුළු වත්කම්වලට ණය සහ අත්තිකාරම්	69.42%	72.18%	-3.82%

මූල්‍ය සමාලෝචනය

2023 වර්ෂයේදී ශ්‍රී ලංකාව තුළ ආර්ථික පසුබිමේ දුෂ්කරතා මධ්‍යයේ රාජ්‍ය උකස් සහ ආයෝජන බැංකුව (SMIB) එහි වර්ෂයකට අඩු වත්කම්වල සහ බැංකුවේ වගකීම් තත්ත්වයන්වල ඉහළ සෘණාත්මක නොගැළපීම් හේතුවෙන් සමස්ත කාර්යසාධනයට සැලකිය යුතු මට්ටමේ බලපෑම් ඇති කරනු ලබන අභියෝගයන්ට මුහුණ දෙනු ලැබීය. දේශීය වෙළඳ පොළ තුළ කටයුතු කරනු ලබන රාජ්‍ය බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් ලෙස SMIB, දේශීය ආර්ථික වෙනස්කම් සහ නියාමන බාධාවන් හේතුවෙන් ඇති වූ බාධක මධ්‍යයේ කටයුතු කරනු ලැබුණි. 2022 වර්ෂය තුළ ඇති වූ අහිතකර ආර්ථික තත්ත්වයන් පාරිභෝගික ආකල්ප සහ ආර්ථික ක්‍රියාකාරකම් දුර්වල කරමින් එහි ප්‍රතිඵලයන් පෙන්නුම් කරන්නට විය. එමෙන්ම, 2023 මාර්තු දක්වා පැවති, 2022 දෙවන භාගය පටන් තැම්පතු පිරිවැයේ ශීඝ්‍ර වර්ධනය හේතුවෙන් බැංකුවේ ශුද්ධ පොළී ආන්තිකයන්ගේ පහත වැටීමේ ප්‍රවණතාවක් ඇති කරමින් ණය සහ අත්තිකාරම්වල සාමාන්‍ය ඵලදාව සහ තැම්පතු පිරිවැය අතර සෘණාත්මක පරතරය වර්ධනය කරනු ලැබීය. බැංකුවේ ශුද්ධ පොළී ආන්තිකයන් 2022 වර්ෂයේ 3.52% සිට 2023 වර්ෂ අවසානය වන විට 1.02% දක්වා අඩුවන ලදී. කෙසේ වෙතත් 2023 තෙවන කාර්තුවේ සිට සෘණාත්මක පරතරය වෙනස් කරලීමට බැංකුව සමත් වී ඇති අතර, 2023 ඔක්තෝම්බර් පටන් මාසික අලාභ ලැබීම් තත්ත්වයේ සිට ලාභ තත්ත්වයට වෙනස් විය.

SMIB විසින් එහි සීමිත අවධානය සහ විශේෂීකරණය හැරුණු කොට ශ්‍රී ලංකාවේ පවතින පුළුල් ආර්ථික පීඩනයන්ට මුහුණ දෙනු ලැබුණි. වැඩිවන උද්ධමනය, දැඩි මූල්‍ය පාලනයන් සහ ගනුදෙනුකරුවන්ගේ විශ්වාසය අඩු වීම ආදී ලක්ෂණ දේශීය ආර්ථික පසුබිම තුළ දැක ගත හැකි විය. විදේශීය විනිමය වෙළඳ පොළ ගැටලු අරමුණු කරගත් නමුත් ස්වෛරීය ණය අත්හිටුවීමට රජය ගත් තීරණ මඟින්ද බැංකුව සඳහා අතිරේක මූල්‍ය පීඩනයක් එක් කරනු ලැබීය. එමෙන්ම දැඩි නියාමන අවශ්‍යතා සහ දේශීය වෙළඳ පොළේ සීමිත ආදායම් උත්පාදන අවස්ථා මඟින් SMIB හි ලාභදායිත්වය සහ අරමුදල් පිරිවැය අවම කිරීම සඳහා සැලකිය යුතු බලපෑම් ඇති කරනු ලැබීය. SMIB විසින් මෙකී අභියෝගයන්ට පිළියම් ලෙස අවදානම් අවම කිරීම සහ ප්‍රාග්ධනය ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් සැලසුම් ක්‍රියාත්මක කරන ලදී. බැංකුවේ වත්කම් ත්ත්වය ශක්තිමත් කරලීමට දූරදර්ශී අවදානම් කළමනාකරණ ක්‍රියාමාර්ග, ස්ථීර ණය තක්සේරු ක්‍රියාමාර්ග, උසස් ණය පාලන ක්‍රියාවලි යොදා ගන්නා ලදී. ඊට අමතරව පිරිවැය යළි සකස් කිරීම සහ සහ පිරිවැය ආදායම් අනුපාතය වර්ධනය කිරීම අරමුණු කරගනිමින් පිරිවැය ප්‍රශස්තීකරණ ප්‍රයත්නයන් සහ මෙහෙයුම් කාර්යක්ෂමතාවය සඳහා මූලිකත්වයක් ලබා දෙන ලදී.

SMIB මඟින් 2023 වර්ෂයේ මිශ්‍ර මූල්‍ය සහ මෙහෙයුම් කාර්ය සාධනය පිළිබිඹු කරන බැවින් ශ්‍රී ලංකා ආර්ථිකය තුළ දැරිය හැකි නිවාස සහ ප්‍රවර්ධන ආයෝජන සඳහා පහසුකම් සැලසීම ඒ ආකාරයෙන්ම පවත්වා ගෙන යන ලදී. ඉදිරිය පිළිබඳ සලකා බැලීමේදී බැංකුව සිය මෙහෙයුම්වල ඔරොත්තු දීමේ හැකියාව වැඩිදියුණු කිරීමට, නවෝත්පාදනයන් පෝෂණය කිරීමට සහ දේශීය වෙළඳ පොළ තුළ ගනුදෙනුකරුවන්ට සහ පාර්ශ්වකරුවන්ට වටිනාකමක් ලබා දීමට කැපවී සිටින අතර, ඇතිවන අභියෝග ජය ගැනීමටත්, ශක්තිමත්ව නැඟී සිටීමටත් අදහස් කරනු ලබයි.

ආදායම් ප්‍රකාශය විශ්ලේෂණය

ආදායම් ප්‍රකාශයේ සාරාංශය

	2023 රු (මිලියන)	2022 රු (මිලියන)	වෙනස %
පොළී ආදායම්	9,324	7,402	25.97%
සමස්ත මෙහෙයුම් ආදායම	867	2,054	-57.79%
බදු පෙර ලාභය/(අලාභය)	(1,165)	(89)	1208.99%
බදු පසු ලාභය	(1,003)	202	-596.53%

පොළී ආදායම

බැංකුව විසින් 2023 වර්ෂයේදී පොළී ආදායම රු. මිලියන 9,324 ක් ලෙස අත්කර ගනිමින් සැලකිය යුතු වර්ධනයක් අත් කර ගන්නා ලදී. එය පසුගිය වසරේ රු. මිලියන 7,402 ට සාපේක්ෂව 25.97% ක සැලකිය යුතු වර්ධනයකි. මෙම වර්ධනය මඟින් බැංකුවේ ණය සාධන පත්‍රවල ආයෝජන, මූල්‍ය වෙළඳ පොළ සහ රජයේ සුරැකුම්පත් ස්ථාපිත කිරීම ඇතුළුව විවිධ පොළී උත්පාදන වත්කම් පිළිබඳ බැංකු ආයෝජන සැලසුම්වල ඵලදායීතාවය පෙන්නුම් කරනු ලබයි.

ශුද්ධ පොළී ආදායම

වර්ෂය තුළදී ශුද්ධ පොළී ආදායම පසුබෑමේ ප්‍රවණතාවයකට මුහුණ දෙනු ලැබීය. මේ සඳහා මූලික වශයෙන් විවිධ පොළී දරන වගකීම්, ඇප තබා ඇති මූල්‍යයනය, තැම්පතු සඳහා වැඩි කළ ඉහළ පොළී අනුපාතිකයෙන් ඇති වූ ඉහළ පොළී වියදම් සහ බැංකුවේ ණය පොත්වල ස්ථාවර ආයෝජන අනුපාත පහසුකම්වල දිගු කාලීන ණය ගැනීම් සහ අවම ඵලදාව බලපාන ලදී. මෙකී පසුබෑම් පැවතුණද ආයෝජනවල පොළී ආදායමේ වර්ධන හේතුවෙන් එකී බලපෑම අර්ධ වශයෙන් අවම විය. ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වාර්තා වූ පොළී ආදායම රුපියල් බිලියන 2.69 ට සාපේක්ෂව රුපියල් බිලියන 3.72 ක් විය. එය 38% ක වර්ධනයකි.


පොළී නොවන ආදායම

ගාස්තු සහ කොමිස් අරමුදල් ඇතුළත් පොළී නොවන ආදායම, මූල්‍ය උපකණ්ඩවල ශුද්ධ ලාභය/අලාභය සහ වෙනත් මෙහෙයුම් ආදායම මඟින් සැලකිය යුතු බලපෑම්වලට මුහුණ දෙන ලදී. අඩු වූ ආර්ථික ක්‍රියාකාරකම් සහ නියාමන අවිනිශ්චිතතාවයන් පෙන්නුම් කරමින්, ගාස්තු සහ කොමිස් ආදායම රුපියල් මිලියන 96 ක් ලෙස පසුබෑමකට මුහුණපාන ලදී. කෙසේ වෙතත් ආයෝජන සහ මූල්‍ය නොවන කටයුතුවල ලාභාංශ ඉපැයුම්වලින් ඇතිවන වෙනත් මෙහෙයුම් ආදායම රුපියල් මිලියන 22ක් ලෙස අගයක් දක්වමින් ධනාත්මක තත්ත්වයක් පෙන්නුම් කරන ලදී.

සමස්ත මෙහෙයුම් ආදායම

සමස්ත මෙහෙයුම් ආදායම, 2022 වර්ෂයේ රුපියල් මිලියන 2,054 සිට 2023 වර්ෂයේදී රුපියල් මිලියන 867 ක් ලෙස 57.50%ක පසුබෑමකට මුහුණ දෙන ලදී. මෙකී පසුබෑම් මඟින් පොළී සහ පොළී නොවන ආදායම් යන කාණ්ඩ සඳහා බලපාන අහිතකර සාධක මධ්‍යයේ, පවතින පීඩිත ආර්ථික තත්ත්වය තුළ අරමුදල්වල පිරිවැය කළමනාකරණය සහ කෙටි කාලයකින් ණය පොත්වල ඵලදාව වැඩි කිරීම සම්බන්ධයෙන් බැංකුව විසින් මුහුණ දෙනු ලබන ප්‍රබල අභියෝග ඉස්මතු කොට දක්වයි.

සමස්ත මෙහෙයුම් ආදායම




ලාභදායිත්වය

2023 මූල්‍ය වර්ෂයේදී බැංකුව තුළ සැලකිය යුතු අලාභයන් දැකගත හැකි විය. එම අහිතකර තත්ත්වයන් මධ්‍යයේ දැකගත හැකි වූ ඔරොත්තු දීමේ හැකියාව සහ අධිෂ්ඨානය ඉතා සුවිශේෂී වේ. බදු පෙර අලාභය රුපියල් මිලියන 1,165 ලෙස සහ බදු පසු අලාභය රුපියල් මිලියන 1,003 ලෙස වාර්තා වීම හැරුණු කොට, අභියෝගාත්මක වෙළඳ පොළ වෙනස්වීම් මධ්‍යයේ කටයුතු කිරීම සඳහා දැරූ ප්‍රයත්නය තුළින් බැංකුව සතු නම්‍යශීලිතාව මෙන්ම සැලසුම්ගත ඔරොත්තුදීමේ හැකියාව පෙන්නුම් කරනු ලබයි. පවතින අවිනිශ්චිතතාවයන් ඵලදායී ලෙස විසඳීම සහ ඉදිරි තිරසාර වර්ධනය අරමුණු කර ගනිමින් 2023 වර්ෂයේ තෙවන කාර්තුව දක්වා පැවති අලාභවල සැලකිය යුතු වර්ධනය කෙරෙහි නැවත අවධානය යොමු කරන ලදී.

කෙසේ වෙතත් 2023 වර්ෂයේ හතරවන කාර්තුවේ ඇති වූ අතිරික්තය තෙවන කාර්තුව දක්වා එකතු වූ අලාභයන්ට පිලියම් යෙදීම සඳහා ප්‍රමාණවත් නොවූ අතර හානිකරණය සහ පාරිතෝෂිකවල ආයුගණක ඇගයීම සහ විශ්‍රාම ලත් සේවක වෛද්‍ය යෝජනා ක්‍රම ප්‍රතිපාදනය සඳහා අමතර ප්‍රතිපාදන අවශ්‍ය විය. බැංකුව විසින් ක්‍රියාශීලි මූල්‍ය පසුබිමක් තුළ දිගු කාලීන සාර්ථකත්වය පිහිටුවා ගනිමින් ප්‍රායෝගික ක්‍රියාමාර්ග සහ දූරදර්ශී කළමනාකරණ සැලසුම් තුළින් මෙකී පසුබෑම් වලින් යථා තත්ත්වයට පත්වීමටත්, ශක්තිමත්ව නැඟී සිටීමටත් අදහස් කරනු ලබයි.

බදු පසු ලාභය/අලාභය



ජාතිය වෙනුවෙන් දායකත්වය

ජාතියේ පැරණිතම බැංකුව ලෙස රටේ සංවර්ධනය වෙනුවෙන් කැපවීමෙන් කටයුතු කිරීමට එමඟ් කටයුතු කරනු ලබයි. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නියෝග කරන ලද අවශ්‍ය ද්‍රවශීලතා සහ ප්‍රාග්ධන ප්‍රමාණවත් අනුපාත පවත්වා ගැනීමට අමතරව බැංකුව විසින් බදු වගකීම් සපුරාලමින්, ජාතික රක්ෂණ භාරකාර අරමුදල සඳහා දායකත්වය සලසමින් රටේ සංවර්ධනය වෙනුවෙන් විවිධාකාරයෙන් ක්‍රියාශීලි සහයෝගය ලබා දෙනු ලබයි.

2023 වර්ෂයේදී පුරා බැංකුව විසින් වැට් සහ සමාජ ආරක්ෂණ දායකත්ව බදු ඇතුළුව බදු සඳහා මුළු මුදල රුපියල් මිලියන 44.5 ක් ගෙවමින් රජය වෙනුවෙන් සැලකිය යුතු දායකත්වයක් ලබා දෙන ලදී. මෙකී මූල්‍ය දායකත්වයන් ඔස්සේ ජාතියේ ආර්ථික වර්ධනය සහ ස්ථායීතාව වෙනුවෙන් කටයුතු කරනු ලබන ප්‍රමුඛයෙකු ලෙස බැංකුව සිය පාර්ශවකරුවන් සහ පුළුල් ප්‍රජාව වෙනුවෙන් සිදු කරනු ලබන සේවය පෙන්නුම් කරනු ලබයි.

	2023 රු (මිලියන)
එකතු කළ අගය මත බදු (වැට්)	43.0
සමාජ ආරක්ෂණ දායකත්ව බදු (SSCL)	1.5
	44.5

මූල්‍ය තත්ත්වය විශ්ලේෂණය

වත්කම්

2023 මූල්‍ය වර්ෂය තුළ SMIB විසින් සිය මුළු වත්කම්වල අගය රුපියල් මිලියන 59,067 ක් ලෙස දක්වමින් ලෙස දක්වමින් සැලකිය යුතු වර්ධනයක් වාර්තා කරන ලදී. මෙය 2022 වර්ෂය සමඟ සසඳන කළ 3.7% ක සැලකිය යුතු වර්ධනයකි. මෙම වර්ධනය මඟින් ස්ථීර ශේෂ පත්‍රයක් පවත්වා ගැනීම සඳහා බැංකුවේ කැපවීම සහ වත්කම් පදනම වර්ධනය කරලීමට දරන සැලසුම්ගත ප්‍රයත්නයන් පෙන්නුම් කරනු ලබයි. ආයෝජන කළඹ මඟින් බැංකුවේ වත්කම් පදනම වර්ධනය කරලීමට ප්‍රධාන දායකත්වයක් දක්වන අතර, එය 2022 වර්ෂයට සාපේක්ෂව 19.6% ලෙස සනිටුහන් වන ලදී. වර්ෂය පුරා SMIB විසින් හි පොළී ඉපැයුම් ණය කළඹ සහ මූල්‍ය ක්‍රියාකාරකම් සාර්ථක ලෙස කළමනාකරණය කරමින් මූලික වෙළඳ පොළ ක්‍රියාකාරකම් කෙරෙහි අවධානය යොමු කරන ලදී. මෙම ඉලක්කගත ප්‍රවේශ මඟින් බැංකුවේ ශේෂ පත්‍රයේ සමස්ත ශක්තිය සහ ඔරොත්තු දීමේ හැකියාව සඳහා දායක වූ අතර ඉදිරි වර්ධනය සහ ස්ථීරභාවය සඳහා මං සලසන ලදී.

ණය සහ අත්තිකාරම්

සමස්ත වත්කම්වල වර්ධනය හැරුණු කොට 2023 වර්ෂයේදී SMIB හි ශුද්ධ ණය සහ අත්තිකාරම්වල සුළු අඩු වීමක් දැක ගත හැකි විය. ශුද්ධ ණය සහ අත්තිකාරම් රුපියල් මිලියන 38,603 ක් ලෙස වාර්තා වූ අතර, එය පසුගිය වසරට සාපේක්ෂව සුළු වෙනසක් ඇති කරමින් 0.27% ක පසුබැස්මක් පෙන්නුම් කරයි. මෙකී හායනය ණය ඉල්ලුම සහ සැලසුම්ගත ප්‍රමුඛ තීරණවල වෙනස්කම් ඇතුළුව විවිධ හේතු නිසාවෙන් ඇති විය. විශේෂයෙන්ම, සාමාන්‍ය ණය මාර්ගවලින් ප්‍රධාන වශයෙන් නිවාස ණය, පෞද්ගලික ණය, සහ නැවත මූල්‍යකරණ ණය ඇතුළු වර්ධනය වූ ණය ඉල්ලුමක් ඇති විය. පහත බැස්මක් වාර්තා කිරීම හැරුණු කොට SMIB විසින් සිය දූරදර්ශී අවදානම් කළමනාකරණ ක්‍රියාමාර්ග සහ සැලසුම්ගත ප්‍රමුඛ මුලපිරීම් නිරූපණය කරමින් නිසි විවිධත්වයෙන් යුතු ණය සහ ලැබීම් කළඹ විවිධාකාර ක්ෂේත්‍රවල පවත්වා ගෙන යන ලදී.

නිෂ්පාදන අනුව	2023 රු (මිලියන)	2022 රු (මිලියන)
උකස්	10,179.55	10,836.31
සේ.අ.අ	8,857.46	6,644.20
වාහන	-	-
සේවක මණ්ඩල ණය	1,208.08	1,360.48
පෞද්ගලික ණය	19,295.35	20,751.94
සෙසු	1,864.19	1,973.86
ශුද්ධ එකතුව	41,006.64	41,117.34

වගකීම්


ශුද්ධ ණය සහ අත්තිකාරම්වල අවිනිශ්චිත සංකෝචනය හැරුණු කොට, 2023 මූල්‍ය වර්ෂය තුළදී SMIB විසින් මුළු වගකීම්වල සැලකිය යුතු වර්ධනයක් පෙන්නුම් කරන ලදී. සමස්ත වගකීම් පසුගිය වසරට සාපේක්ෂව 6.18% සැලකිය යුතු වර්ධනයක් පෙන්නුම් කරමින් රුපියල් මිලියන 53,612 ලෙස සනිටුහන් විය. මේ සඳහා ප්‍රධාන වශයෙන්ම තැම්පතු වගකීම්වල මඳ වර්ධනය බලපාන ලද අතර, එමඟින් ණය සහ අත්තිකාරම් වර්ධනය වේගවත් කරන ලදී. විශේෂයෙන් විදේශ ණය ගැනුම් අවම කරමින් වසර පුරා අතිරික්ත ද්‍රවශීලතා පවත්වා ගෙන යන ලදී. විදේශ ණය ගැනීම්වල අවම කිරීම් මඟින් අවම පොළී පිරිවැයක් ඇති කළ අතර බැංකුවේ ශුද්ධ පොළී ආදායම සහ පොළී ආන්තික වර්ධනය කරලීමට හේතු විය.

තැම්පතු පදනම

රාජ්‍ය උකස් සහ ආයෝජන බැංකුව විසින් ඉතා තරගකාරී වෙළඳ පොළ තුළ සිය මෙහෙයුම් කටයුතු සිදු කිරීම මෙන්ම ආර්ථික වෙනස්වීම් සහ රටේ සැලකිය යුතු ණයබර සමඟ කටයුතු කිරීම හැරුණු කොට 2023 වර්ෂයේදී එහි තැම්පතු පදනමේ සැලකිය යුතු වර්ධනයක් අත් කර ගනු ලැබිය. ඉතිරි කිරීමේ තැම්පතු, ස්ථාවර තැම්පතු, සහ වෙනත් තැම්පතු ක්‍රම ඇතුළත් වූ සමස්ත තැම්පතු පෙර වසරට සාපේක්ෂව 6.10% ක සැලකිය යුතු වර්ධනයක් පෙන්නුම් කරමින් රුපියල් මිලියන 52,138 දක්වා වර්ධනයක් පෙන්නුම් කරන ලදී. මෙකී ස්ථීර වර්ධනය මඟින් පවතින පාරිභෝගික තැම්පතු රඳවා ගැනීම සහ නව පාරිභෝගිකයින් ආකර්ෂණය කර ගැනීම අරමුණු කර ගත් දූරදර්ශී කළමනාකරණ ක්‍රියාකරකම් සහ සාර්ථක ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා SMIB හි කැපවීම පෙන්නුම් කරනු ලබයි. සැලසුම්ගත මුලපිරීම් ඔස්සේ SMIB විසින් සාර්ථක ලෙස එහි ගනුදෙනුකරුවන්ගේ තෘප්තිය වෙනුවෙන් කැපවීම කටයුතු කරන ලද අතර, ඒ ඔස්සේ එහි තැම්පතු පදනම ශක්තිමත් කිරීම සහ එහි සමස්ත මූල්‍ය ඔරොත්තු දීමේ හැකියාව පවත්වා ගෙන යන ලදී.

මූල්‍ය සමාලෝචනය

තැම්පතු



ද්‍රවශීලතා ආවරණ

1988 අංක 30 දරන බැංකු පනතේ 86 වැනි වගන්තියේ නියම කර ඇති රෙගුලාසිවලට අනුකූලව ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ බලපත්‍රලාභී විශේෂිත රාජ්‍ය බැංකුවක් ලෙස (LSB) රාජ්‍ය උකස් හා අයෝජන බැංකුව (SMIB) විසින් 20%ක අවම ව්‍යවස්ථාපිත ද්‍රවශීලතා වත්කම් අනුපාතයක් පවත්වා ගෙන යාම අනිවාර්ය වේ. 2023 න් අවසන් වන මූල්‍ය වර්ෂය පුරා SMIB විසින් 35.60%ක හිතකර ව්‍යවස්ථාපිත ද්‍රවශීලතා වත්කම් අනුපාතයක් අත්කර ගනිමින් ශක්තිමත් අනුකූලතාවක් පෙන්නුම් කරන ලදී. ඊට අමතරව දින දර්ශනයේ දින 30ක ආතති තත්ත්වයක් තුළ ද්‍රවශීලතා අවශ්‍යතා සපුරාලීම සඳහා විශාල බරක් නොමැති උසස් තත්ත්වයේ ද්‍රව වත්කම් සහතික කරමින්, බැසල් III සම්මතයට අනුකූලව SMIB විසින් ද්‍රවශීලතා ආවරණ අනුපාතය (LCR) පුරා ද්‍රවශීලතා ඔරොත්තු දීමේ හැකියාව උත්සහශීලීව පවත්වා ගෙන යන ලදී. 2023 වර්ෂ අවසානය වන විට 100%ක ස්ථාපිත අවම අවශ්‍යතා ඉක්මවා යමින් SMIB හි ද්‍රවශීලිතා ආවරණ අනුපාතය 175.14%ක් ලෙස ශක්තිමත් වන ලදී.

ඊට අමතරව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් (CBSL) දක්වා ඇති පරිදි 2023 දෙසැම්බර් 31 දිනට අවම අවශ්‍යතාව වන 100%ක අවශ්‍යතාවය ඉක්මවා යමින් ශුද්ධ ස්ථාවර අරමුදල් අනුපාතය (NSFR) 129% ලෙස දක්වමින් බැංකුව විසින් ස්ථාවර අරමුදල් සඳහා ශක්තිමත් අවතීර්ණ වීමක් පවත්වා ගෙන යන ලදී. මෙකී කරුණු මඟින් ජාතියේ මූල්‍ය පසුබිම සඳහා සහයෝගය දැක්වීම උදෙසා නියාමන අනුකූලතාව සහ ප්‍රායෝගික ද්‍රවශීලතා කළමනාකරණය, මෙහෙයුම්වල ස්ථාවරත්වය සහ ඔරොත්තු දීම ශක්තිමත් කිරීම වෙනුවෙන් SMIB හි නොවෙනස්වන කැපවීම පෙන්නුම් කරනු ලබයි.

ආයතනික ශක්තිය තුළින් විශ්වාසය පිරිනැමීම



සභාපතිතුමාගේ පණිවුඩය	8
ප්‍රධාන විධායක නිලධාරීතුමාගේ පණිවුඩය	12
අධ්‍යක්ෂ මණ්ඩලය	16
ආයතනික කළමනාකාරිත්වය	19
ජ්‍යේෂ්ඨ කළමනාකාරිත්වය	21
ආයතනික පාලනය	22

සභාපතිතුමාගේ පණිවුඩය



අභියෝගාත්මක පරිසරයක් තුළ කටයුතු කරමින්, මූල්‍ය ක්ෂේත්‍රය මඟින් මුහුණදෙන ගැටලුවලට පිළියම් යොදමින් රාජ්‍ය උකස් හා අයෝජන බැංකුව ශක්තිමත්ව හා අනුවර්තනය තුළින් සිය මෙහෙයුම් කටයුතු පවත්වා ගෙන ගියේය. එකී තත්ත්වයන් අවම කිරීමට ඇතිවිය හැකි අවදානම් පිළිබඳ සුපරීක්ෂාකාරී වෙමින් සහ නිසි පියවර ගැනීමෙන් බැංකුව සිය ගනුදෙනුකරුවන්ගේ සිට කොටස්කරුවන් සහ සේවකයින් දක්වා වූ සියලු පාර්ශ්වකරුවන්ගේ අවශ්‍යතා සුරක්ෂිත කිරීමට සමත් විය.

2023 වර්ෂය සඳහා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ වාර්ෂික වාර්තාව සහ විගණනය කළ මූල්‍ය ප්‍රකාශ අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් මෙලෙස ඔබ වෙත සතුටින් ඉදිරිපත් කරනු ලබයි. 2023 වර්ෂය තුළදී මෙහෙයුම් කටයුතුවල බොහෝ වශයෙන් පැවති අස්ථාවරත්වය මධ්‍යයේ, බැංකුව සිය දරාගැනීමේ හැකියාව සහ උපාය මාර්ගික විසඳුම් තුළින් තිරසාර වර්ධනයක් පෙන්නුම් කරමින් කටයුතු කළේය. පවතින වාතාවරණය තුළ විවිධාකාර මූල්‍ය අවශ්‍යතාවලට අනුකූල විසඳුම් ලබා දෙමින් අවබෝධය සහ නම්‍යතාව ඔස්සේ බැංකුව සිය පාර්ශ්වකරුවන් උදෙසා වටිනාකම් නිර්මාණය කරනු ලැබිය.

අස්ථාවර වතාවරණය

2022 වර්ෂයේ ආර්ථික පසුබෑමේ බලපෑම ඉහළ යන අර්බුදකාරී තත්ත්වය සමඟ තවත් තීව්‍ර වෙමින්, 2023 මූල්‍ය වර්ෂයේදීද පැවතුණි. මෙතෙක් මුහුණ දුන් දුෂ්කරතම කාලය සමාලෝචනය කරනු ලබන වර්ෂය තුළදී දැකගත හැකිවිය. එදිනෙදා ජීවන තත්ත්වයට බලපෑම් කරමින් ආර්ථික තත්ත්වයේ අනපේක්ෂිතතාවය රට පුරා පැවතුණි. ඒ අනුව නොනවතින උද්ධමන පීඩනය සහ ඉහළ පොලී අනුපාත මෙන්ම මූල්‍ය ස්ථාවරත්වය පවත්වා ගැනීම අරමුණු කොට ගත් බදු ඉහළ දැමීම හමුවේ ප්‍රධාන අංශවල සැලකිය යුතු පසුබෑමක් දැකගත හැකි විය. මූල්‍ය අතරමැදිභාවයේ සැලකිය යුතු පසුබෑමක් ඇති වීම සහ ණය ගුණාත්මකභාවයේ පිරිහීමක් ඇති වීම යන මෙකී බාධා මූල්‍ය අංශය තුළ දැකගත හැකි විය. එමෙන්ම එම අංශයේ ස්ථාවරත්වයට සැලකිය යුතු අවධානමක් ඇති කරමින්, මන්දගාමී ණය ප්‍රසාරණය හමුවේ රජයේ ආයතනවල අවදානම වැඩිවීමෙන් පද්ධතිමය අසමතුලිතභාවයක් ඇති විය.

කෙසේ වෙතත්, 2023 වර්ෂයේ මාර්තු මස ව්‍යාජ්ත කළ අරමුදල් පහසුකම් (IMF-EFF) සඳහා ගිවිස ගැනීම හේතුවෙන් නව විශ්වාසයකින් යුතු වර්ධනයක් ඇති කරමින් මූල්‍ය අංශය තුළ සුභවාදී තත්ත්වයක් දැකගත හැකිවිය. බාධා මධ්‍යයේ වූවද මූල්‍ය ප්‍රඥාව සහ අනුවර්තනය ඔස්සේ කටයුතු කිරීමට උත්සහ කළහෙයින් මූල්‍ය අංශයේ ඔරොත්තුදීමේ හැකියාව දැකගත හැකි විය. IMF-EFF ගිවිසුම ආරම්භය මඟින් ස්ථාවරත්වය සහ ආයෝජක විශ්වාසය නැවත පිහිටුවාලමින් අවැසිව තිබූ ශක්තිය සපයනු ලැබුණි.

දුෂ්කරතා මධ්‍යයේ ඔරොත්තු දෙන උන්නතියක් ඇති කරලීමට ක්ෂේත්‍රය තුළ ශක්තිමත් පදනමක් ගොඩනැඟීම සඳහා මනා අවදානම් කළමනාකරණ ක්‍රියාවලියක් සහ ප්‍රායෝගික පාලන සැලසුමක අවශ්‍යතාවය පවතින ක්ෂුද්‍ර ආර්ථික තත්ත්වය තුළින් අවධාරණය විය. ඒ අනුව අත්විඳින ලද දුෂ්කරතා සහ උගත් පාඩම්වලින් ලද නව ප්‍රාණවත්භාවයෙන් සන්නද්ධව මූල්‍ය තත්ත්වයේ ශක්තිමත්භාවය සහ ස්ථිරත්වය වෙනුවෙන් වූ අපගේ කැපවීම අපි යළි තහවුරු කරන ලද්දෙමු.

ඔරොත්තුදීමේ හැකියාව ගොඩනැඟීම, අනුවර්තනයට හුරුවීම, ප්‍රගතිය වෙනුවෙන් අපගේ සැලසුම්

අභියෝගාත්මක පරිසරයක් තුළ කටයුතු කරමින්, මූල්‍ය ක්ෂේත්‍රය මඟින් මුහුණදෙන ගැටලුවලට පිළියම් යොදමින් රාජ්‍ය උකස් හා අයෝජන බැංකුව ශක්තිමත්ව හා අනුවර්තනය තුළින් සිය මෙහෙයුම් කටයුතු පවත්වා ගෙන ගියේය. එකී තත්ත්වයන් අවම කිරීමේදී ඇතිවිය හැකි අවදානම් පිළිබඳ සුපරීක්ෂාකාරී වෙමින් සහ නිසි පියවර ගැනීමෙන් බැංකුව සිය ගනුදෙනුකරුවන්ගේ සිට කොටස්කරුවන් සහ සේවකයින් දක්වා වූ සියලු පාර්ශවකරුවන්ගේ අවශ්‍යතා සුරක්ෂිත කිරීමට සමත් විය.

වෙනස්වන වෙළඳපොළ තත්ත්වයන් හමුවේ ස්ථාවර පදනමක් සපයමින් ශක්තිමත් ද්‍රවශීලතා ආරක්ෂාවක් සහ ස්ථිර ප්‍රාග්ධන තත්ත්වයක් පවත්වා ගැනීමට අපි සමත් විමු. ඒ අනුව බැංකුවේ ද්‍රවශීලතා ආවරණ අනුපාතය (LCR) ඇතුළු මූලික ද්‍රවශීලතා සහ ප්‍රාග්ධන ප්‍රමාණවත් අනුපාතය 175.14%ක් ලෙස පැවතුණ අතර, ශුද්ධ ස්ථාවර අරමුදල් අනුපාතය (NSFR) 129%ක් ලෙස පැවතුණි. නියාමන සීමා ඉක්මවමින් 1 වන මට්ටමේ අනුපාතය සහ සමස්ත ප්‍රාග්ධන අනුපාතය පිළිවෙලින් 18.81% සහ 18.89% ක් ලෙස පැවතුණි. අවිනිශ්චිතතා හමුවේ ප්‍රමාණවත් ද්‍රවශීලතා සහ ප්‍රාග්ධන සංචිත පවත්වා ගැනීම තහවුරු කිරීම සම්බන්ධයෙන් රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ දූරදර්ශී කළමනාකරණ ක්‍රමවේදයන් මේ තුළින් පෙන්නුම් කරනු ලබයි. ඊට අමතරව අනපේක්ෂිත ආර්ථික වතාවරණය හේතුවෙන් කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යවසායන් (SME) සහ ක්ෂුද්‍ර, කුඩා සහ මධ්‍යම පරිමාණ ව්‍යවසායන් (MSME) ඇතුළු විවිධත්වයෙන් යුතු සේවාදායක පිරිස මුහුණදුන් අභියෝග බැංකුව අවබෝධ කරගනිමින් ඔවුන්ගේ මූල්‍ය අවශ්‍යතා වෙනුවෙන් ප්‍රමුඛත්වයක් ලබා දුන්නේය. බැංකුව සිය තිරසාර පැවැත්ම සහ ශක්තිමත්භාවය තහවුරු කිරීමට මෙකී අංශ සඳහා සහය සැපයීම අරමුණු කරමින් ක්‍රමවේදයන් ක්‍රියාත්මක කිරීමට සාමූහික ප්‍රයත්න දැරුවේය.

බැංකුවේ කාර්යසාධනය උදෙසා ආර්ථික අනපේක්ෂිතතා, දුෂ්කරතා, පොලී අනුපාත වෙනස්වීම්, අක්‍රීය ණය සහ පිරිවැය කළමනාකරණ ගැටලු නිරන්තරයෙන් බලපෑම් කළ හෙයින්, එම වර්ෂය තුළදී රාජ්‍ය උකස් හා අයෝජන බැංකුව පරීක්ෂාකාරී සහ දූරදර්ශී උපායමාර්ගික ක්‍රමවේදයක් යොදාගනු ලැබිය. පවතින දුෂ්කරතාවල බලපෑම අවම කිරීමට සහ යථා තත්ත්වයට පත්වීමට පහසුකම් සැලසීම මෙයින් අරමුණු කරනු ලැබිය. ඉදිරි වර්ධනය සහ සමෘද්ධිමත්භාවය වෙනුවෙන් පදනමක් සපයමින් සේවාදායක පිරිස වෙනුවෙන් සහය සැපයීමට බැංකුව නිරන්තරයෙන් සිය ශක්‍යතාවයන් ශක්තිමත් කරනු ලැබිය. එමෙන්ම බැංකුව ප්‍රායෝගික ද්‍රවශීලතා කළමනාකරණය, කාර්යක්ෂම අක්‍රීය ණය සහ හානිකරණ කළමනාකරණය, පිරිවැය ප්‍රශස්තකරණය සහ ණය සහ අත්තිකාරම් තුළින් ඉපැයුම් වර්ධනය කරලීම මෙන්ම ආයෝජන ක්‍රියාකාරකම් යන ක්ෂේත්‍ර 4 මුල් කරගත් මෙහෙයුම් උපායමාර්ග පිළිබඳ අවධානය යොමු කරනු ලැබිය.

එමෙන්ම, නිරන්තර වර්ධන මුලපිරීම් යොදා ගනිමින් මූල්‍ය ශක්තිමත්භාවය සහ පාරිභෝගික කේන්ද්‍රීයත්වය පිළිබඳ අවධානය යොමු කරමින්, වෙළඳ පොළ වෙනස්කම් සඳහා උචිත අවදානම් ක්‍රමෝපායන් යොදා ගනිමින් ප්‍රායෝගික කළමනාකරණ භාවිතයන් යොදා ගන්නා ලදී. එහි ප්‍රතිඵලයක් වශයෙන් බැංකු අංශයේ පවතින අවස්ථා ප්‍රයෝජනයට ගනිමින් අනපේක්ෂිතතා හමුවේ සිය තත්ත්වය පවත්වා ගැනීමට බැංකුව සමත් විය.

සභාපතිතුමාගේ පණිවුඩය

කාර්යසාධනයේ නව පැතිකඩයන්

වෙනස්වන බැංකුකරණ පසුබිම තුළ කටයුතු කිරීමට බැංකුව වෙනස්කම් කිහිපයක් සිදු කළේය. පෙර පැවති උරුම පද්ධතිය වෙනුවට හර බැංකුකරණ පද්ධතියක් ක්‍රියාත්මක කිරීමට තීරණය කිරීම සුවිශේෂී වෙනස්කමක් විය. මේ වනවිට එය ක්‍රියාවට නැංවීමට කටයුතු කරනු ලබයි. මෙම නව පද්ධතිය මඟින් බැංකුවේ ගනුදෙනුකරුවන් වෙනුවෙන් කාර්යක්ෂම සේවයක් ලබා දීම උදෙසා බැංකුවේ ශක්‍යතාවය උසස් කරමින් අභ්‍යන්තර ක්‍රියාවලියේ කාර්යක්ෂම හා මනා ගැලපීමක් ඇති කරනු ලබයි. ඊට අමතරව ඩිජිටල් බැංකුකරණ ගනුදෙනු සඳහා පවතින ඉහළ ඉල්ලුම හඳුනාගනිමින් බැංකුව ඩිජිටල්කරණය වෙනුවෙන් නිරන්තරයෙන් කටයුතු කරනු ලැබීය. මේ සම්බන්ධයෙන් ජංගම දුරකථන, මාර්ගස්ථ වේදිකා සහ අන්තර්ජාලය හරහා ගෙවීම් ආදී විවිධාකාර ඩිජිටල් මාධ්‍ය හඳුන්වාදීම උදෙසා බැංකුව කටයුතු කරනු ලබයි. පවත්නා මෙහෙයුම් සඳහා සහය සැපයීමට රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව නියාමන ප්‍රමිති අනුව ප්‍රමාණවත් ද්‍රවශීලතා සහතික කිරීම තුළින් මූල්‍ය ඔරොත්තුදීමේ හැකියාව පවත්වා ගැනීම කෙරෙහි අවධානය යොමු කළේය. බැංකුව එහි පාර්ශවකරුවන් සඳහා විශ්වසනීය හවුල්කරුවෙකු මෙන්ම බැංකුකරණ ක්ෂේත්‍රය තුළ ධනාත්මක වෙනසක් ඇති කරන්නෙකු බවට පත් කරලීමට මෙකී වෙනස්කම් මඟින් දායකත්වයක් සපයනු ලැබීය.

පාලනය කටයුතු පවත්වාගෙන යාම සහ අවදානම් කළමනාකරණය

අපගේ පාර්ශවකරුවන් අතරේ විශ්වාසය සහ පූර්ණත්වය ගොඩනැඟීම උදෙසා ආයතනික පාලනයේ ඉහළ තත්ත්වය පවත්වා ගැනීම උදෙසා අපි නිරන්තරයෙන් කටයුතු කළෙමු. අපි අපගේ ව්‍යාපාර කටයුතුවල වගවීම සහ විනිවිදභාවය තහවුරු කිරීම උදෙසා මූල්‍ය වර්ෂය පුරාවට නිශ්චිත ආයතනික පාලන සම්මතයන් සහ ව්‍යවස්ථාපිත අවශ්‍යතා අනුව කටයුතු කළෙමු.

වෙනස්වන වත්මන් ව්‍යාපාරික පසුබිම තුළ ගෝලීය මට්ටමට උචිත කාර්යක්ෂමතාවය සහ අදාළත්වය පවත්වා ගැනීම උදෙසා අපගේ පාලන කටයුතු පිළිබඳ පූර්ණ සමාලෝචනයක් වර්ෂය පුරාවට අපි ක්‍රියාත්මක කළෙමු. කමිටු මනාව පවත්වා ගැනීම සහ අධ්‍යක්ෂ මණ්ඩලය සහ කළමනාකරණය අතර සම්පූර්ණ සහයෝගීතාවයක් පවත්වා ගැනීම ඔස්සේ අපගේ පාර්ශවකරුවන්ගේ දිගුකාලීන අපේක්ෂාවන් සඳහා මූලිකත්වය ලබා දෙන්නා වූ ශක්තිමත් තීරණ ගැනීමේ ක්‍රියාවලියක් වෙනුවෙන් අපි කටයුතු කොට ඇත.

එමෙන්ම අපි අපගේ අවදානම් කළමනාකරණ භාවිතයන් සහ ක්‍රියාවලි වැඩිදියුණු කිරීමට අවධාරණය යොමු කළෙමු. අපි ගෝලීය සහ දේශීය ආර්ථික අභියෝග පිළිබඳව විමසිලිමත්ව, බැංකුවේ මූල්‍ය යහපත්භාවය සහ කීර්තිය කෙරෙහි ඇති විය හැකි බලපෑම් අඛණ්ඩව අධීක්ෂණය කර විශ්ලේෂණය කළෙමු. මේ සම්බන්ධයෙන්, අපි සංවේදී දත්ත ආරක්ෂා කිරීමේ සහ විකාශනය වන පීඩනයන්ට ඔරොත්තු දීම සඳහා අපගේ පද්ධති ශක්තිමත් කිරීමේ අතිශය වැදගත්කම හඳුනා ගනිමින් තොරතුරු තාක්ෂණ සහ සයිබර් ආරක්ෂාව වෙනුවෙන් ආයෝජනය කිරීමට ප්‍රමුඛත්වය ලබා දුන්නෙමු. මනා පාලනයක් සහ ප්‍රායෝගික අවදානම් කළමනාකරණය වෙනුවෙන් වූ ස්ථිර කැපවීම අපගේ පාර්ශවකරුවන්ට තිරසාර වටිනාකමක් ලබා දෙන අතරම මූල්‍ය ක්ෂේත්‍රයේ සංකීර්ණතා සමඟ කටයුතු කිරීමට බැංකුව උපායමාර්ගිකව ස්ථානගත කර ඇත.

තිරසාර කැපවීම

තිරසාරත්වය සඳහා වන අපගේ කැපවීම වචනයට පමණක් සීමා වූවක් නොවේ, ඒ සඳහා වඩාත් පරිපූර්ණ සහ ඔරොත්තු දෙන අනාගතයක් ගොඩනැඟීම සඳහා අප මෙහෙයවනු ලබන අපගේ මූලික වටිනාකම් සඳහා ඇතුළත් වේ. පාරිසරික, සමාජීය සහ පාලන (ESG) සාධකවල අන්තර් සම්බන්ධිතභාවය අනුගමනය කරනු ලබන හෙයින්, අපගේ ව්‍යාපාරයේ සෑම අංශයක් තුළින්ම නිරූපණය වන අන්දමින්, අපගේ මෙහෙයුම් කටයුතුවලදී තිරසාරත්වය පිළිබඳ සැලකිල්ලට ගෙන ඇත. අපගේ ESG සහ සංවර්ධන ඉලක්කවල මූලික පදනම ලෙස පවතින, අන්තර් බැංකුකරණය සහ ප්‍රජාවේ ඔරොත්තුදීමේ හැකියාව කෙරෙහි අපි නිරන්තරයෙන් අවධානය යොමු කරමු. අපගේ කාර්යභාරය තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා සියලු ප්‍රයත්නයන් හරහා පුළුල් සහ වැඩිදියුණු කළ තිරසාරභාවයට පහසුකම් සැලසෙන කාර්යයන් ශක්තිමත් කිරීමට සහ නිර්මාණය කිරීමට අපි මහත් උනන්දුවෙන් කටයුතු කර ඇත්තෙමු.

මෑත කාලීන ආර්ථික අර්බුදය සහ දේශපාලන අස්ථාවරත්වය තුළින්, රටේ අවදානම් තත්ත්වය සහ විශේෂයෙන් බලශක්ති සහ ආහාර සුරක්ෂිතතාව සම්බන්ධයෙන් අනුවර්තනය වීමේ ශක්‍යතාවයන්ගේ වැදගත්කම පෙන්නුම් කරනු ලබයි. යථා තත්ත්වයට පත්වීම උදෙසා සමාජ හා ආර්ථික ඔරොත්තු දීමේ හැකියාව ගොඩනැඟීමේ අත්‍යවශ්‍යතාව මෙතුළින් පෙන්නුම් කරයි. එබැවින්, ආර්ථිකය ක්‍රමානුකූලව ස්ථාවර වීමත් සමඟ, ශ්‍රී ලංකාවේ සංවර්ධන අභිලාෂයන් වෙනුවෙන් සහය වීම සඳහා තිරසාර මූල්‍ය බලමුලු ගැන්වීමේ දී රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව හරහා ප්‍රධාන කාර්යභාරයක් ඉටු කිරීමට අපි අපේක්ෂා කරමු. මේ සඳහා, දිගුකාලීන ඔරොත්තු දීමේ හැකියාව ප්‍රවර්ධනය කිරීම සඳහා අපගේ විශේෂඥතාව සහ සම්පත් ප්‍රයෝජනයට ගනිමින් තිරසාර ප්‍රකෘතියක් සඳහා පහසුකම් සැලසීමට අපි ගනුදෙනුකරුවන් සහ පාර්ශවකරුවන් සමඟ සහයෝගීව කටයුතු කරන්නෙමු. ඉදිරියේදී, අපගේ පාරිසරික හා සමාජීය අරමුණුවලට අනුකූලවන වර්ධනයක් ඇති කරනු ලබන උපායමාර්ග යොදා ගනිමින්, මූල්‍ය තිරසාරත්වය සඳහා අපගේ ස්ථාවර කැපවීම නිරන්තරයෙන් පවත්වා ගන්නෙමු.

තාක්ෂණික සහය ලබා ගැනීමට සහ අපගේ විසඳුම් සහ වටිනාකම් යෝජනා වැඩිදියුණු කිරීමට අපි සංවර්ධන ආයතන සහ හවුල්කරුවන් සමඟ සහයෝගයෙන් කටයුතු කරන්නෙමු. තිරසාර මූල්‍ය බලය උපයෝගී කර ගැනීමෙන්, අපි අපගේ ප්‍රජාවන් තුළ ධනාත්මක බලපෑමක් ඇති කරන්නා සේම, සියලු දෙනාටම වඩාත් සමෘද්ධිමත් සහ සාධාරණ අනාගතයක් සඳහා මග පාදමින් පුළුල් තිරසාර සංවර්ධන කාර්යභාරය වෙනුවෙන් දායක වන්නෙමු.

ඉදිරි දැක්ම

අභියෝගාත්මක වර්ෂයක මතකයන් මෙසේ සනිටුහන් කරමින්, නව යුගයකට පිවිසෙන මොහොතේ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව උදෙසා සුභවාදී අනාගතයක් ගොඩනැඟීමට අපි අදහස් කරමු. දුෂ්කරතා හමුවේ ලද අත්දැකීම් වලින් ශක්තිමත් වූ අපි නව අරමුණක් සහ අධිෂ්ඨානයක් ඇතිව ඉදිරි ගමන ආරම්භ කරන්නෙමු. අපගේ පාර්ශවකරුවන් සඳහා වටිනාකමක් නිර්මාණය කරලීමට නොසැලී කැපවන බැවින්, ගතික පරිසරයේ විකාශනය වන අවශ්‍යතා සපුරාලීමට අවැසි පරිදි අනුවර්තනය වෙමින් අපගේ උපායමාර්ග ඉතා උනන්දුවෙන් අධ්‍යනය කිරීමට අපි සහතික කරමු.

අපි නිරන්තරයෙන් අපගේ කාර්යසාධනය සහ ප්‍රවේශය පුළුල් කරමින් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්, ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සහ ආයතනික ගනුදෙනුකරුවන්ට සේවය කිරීම සඳහා අපගේ නොසැලෙන කැපවීම පවත්වා ගන්නෙමු. පිරිවැය කාර්යක්ෂමතාව පවත්වා ගනිමින් අපගේ විනිවිදභාවය පුළුල් කිරීමෙන්, අපගේ ගනුදෙනුකරුවන් සඳහා වැඩිදියුණු කළ වටිනාකම් පිරිනැමීමට අපි උත්සාහ කරමු. අගය දාමයන් හරහා ක්‍රියාත්මක වීමට සැලසුම් කර ඇති ව්‍යුහගත වැඩසටහනක් හරහා අපගේ වටිනාකම් පිරිනැමීමේ ව්‍යාප්තියක් මේවනවිට ආරම්භ කර ඇති අතර, තිරසාර වර්ධනයක් සහ ලාභදායිත්වය සඳහා පදනමක් ලබා දී ඇත.

තවද, අඛණ්ඩව වැඩිදියුණු කිරීම සඳහා අපගේ කැපවීම තුළ, අපි අපගේ ගනුදෙනුකරුවන්ට බාධාවකින් තොරව සහ උසස් අත්දැකීමක් ලබා දෙමින් අඛණ්ඩ පදනමක් මත සේවා මට්ටම් ප්‍රමිතිකරණය කර වැඩිදියුණු කිරීමට අදහස් කරමු. ඊට අමතරව, අපගේ උපායමාර්ගයේ ප්‍රධාන අවධානය යොමු කරන ක්ෂේත්‍රයක් ලෙස, අපගේ කාර්යභාරය තවදුරටත් පුළුල් කිරීම සඳහා සෙසු වෙළඳ පොළ අවස්ථා ගවේෂණය කරමින් අපගේ සාමූහික හවුල්කාරිත්වයන් එකමුතු කරන්නෙමු. ඩිජිටල්කරණය අපගේ පරිවර්තනීය උපායමාර්ගයේ ඉහළින්ම පවතින්නක් වන අතර, අපි එහිදී උපායමාර්ගික ආයෝජන සහ නවෝත්පාදන හරහා මෙහෙයුම් කාර්යක්ෂමතාව ඉහළ නැංවීමට සහ පාරිභෝගික අත්දැකීම් වැඩිදියුණු කිරීමට ඩිජිටල්කරණය ඔස්සේ සක්‍රීය විසඳුම් ලබා දෙන්නෙමු. අනාගත අභියෝග තක්සේරු කිරීම සහ අවම කිරීම සඳහා අපි කාර්යක්ෂම උපායමාර්ග සහ අවස්ථා මත පදනම් වූ අවදානම් තක්සේරුකරණයක් භාවිත කරන්නෙමු. ඒ අනුව ප්‍රමාණයට වඩා ගුණාත්මකභාවය පිළිබඳ සැලකිල්ලට ගනිමින් අපි ස්මාර්ට් තාක්ෂණය කෙරෙහි වැඩි ප්‍රමුඛත්වයක් දෙන්නෙමු.

මෙකී කාර්යභාරයේදී, සහයෝගීතාවයේ ප්‍රතිලාභ ලබා ගැනීම අරමුණු කරමින් පාර්ශවකරුවන්, ව්‍යාත්තීය ආයතන සහ රාජ්‍ය ආයතන සමඟ හවුල්කාරිත්වයන් ඇති කර ගැනීමට අපි ප්‍රමුඛතාවයක් දෙන්නෙමු. අපි ගනුදෙනුකරුවන් සඳහා ප්‍රගස්ත ප්‍රතිඵල ලබා දෙමින් සහ අප සේවය කරන ප්‍රජාවන් තුළ ධනාත්මක වෙනසක් ඇති කරමින් වත්මන් තත්ත්වයෙන් ඔබ්බට ගිය වර්ධනයක් ළඟා කර ගැනීමට සාමූහිකව කටයුතු

කරන්නෙමු. විශිෂ්ටත්වය අත්පත් කර ගනු පිණිස අඛණ්ඩතාව, නවෝත්පාදනය සහ තිරසාර වර්ධනය වෙනුවෙන් කැපවීම තුළින් ඉදිරියේදී ඇතිවන අවස්ථාවන් වලින් ප්‍රයෝජනයට ගැනීමට රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව සූදානමින් සිටී.

ස්තුතිය

මෙම පිරිවැය-ඵලදායී මූල්‍යකරණ විකල්ප සහ පුළුල් පරාසයක උපදේශන සේවා පිළිබඳ අපගේ ගනුදෙනුකරුවන් යහපත් ප්‍රතිචාර දක්වන බවට මම සතුටින් දන්වා සිටිමි. ඔවුන්ගේ අඛණ්ඩ පක්ෂපාතිත්වය සහ විශ්වාසය වෙනුවෙන් මම ස්තුතිය පළ කරමි.

වසර තුළදී මනා උපදේශන සහ නොසැලෙන සහයෝගය ලබා දුන් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත මම ස්තුතිය පළ කරමි. එමෙන්ම ආයතනික කළමනාකාරිත්වය, ගරු සභාපති සහ මුදල් ඇමති විසින් ලබා දුන් අමිල දායකත්වය වෙනුවෙන් මම ස්තුතිය පළ කරමි. එමෙන්ම මුදල් අමාත්‍යාංශයේ ලේකම්තුමා, ශ්‍රී ලංකා මහ බැංකු අධිපතිතුමා, ඉහත ආයතනවල සියලුම නිලධාරීන්, නීතිපතිතුමා සහ විගණකාධිපතිතුමා වෙත මම ස්තුතිය පළ කර සිටිමි.

පුහුණු අවස්ථා කිහිපයක් ලබා දෙමින් බැංකුව සිය සේවකයින්ට සහය දැක්වූවේය. එමෙන්ම, අපගේ දැක්ම ප්‍රායෝගික ප්‍රතිඵලයක් බවට පරිවර්තනය කිරීමට ඔවුහු සහය දැක්වූහ. එබැවින්, සේවකයින් වෙනුවෙන් විශිෂ්ටත්වය, සංවර්ධනය සහ දියුණුව සපයනු ලබන පුළුල් සහ ප්‍රබෝධමත් සේවා ස්ථානයක් සහතික කිරීම සඳහා බැංකුව අඛණ්ඩව කටයුතු කරයි. රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව විශිෂ්ටත්වය කරා ගෙන යාම සඳහා අපගේ හොඳම දක්ෂතා ආකර්ෂණය කර ගැනීම, පෝෂණය කිරීම සහ රඳවා තබා ගැනීම කෙරෙහි අපි අපගේ අවධානය නිරන්තරයෙන් යොමු කරමු.

දුෂ්කර කාලයක් තුළ අපගේ මෙහෙයුම් පවත්වාගෙන යාම සඳහා ලබා දුන් ස්ථිර කැපවීම සහ වෙහෙස මහන්සිය නොතකා ලබා දුන් දායකත්වය වෙනුවෙන් රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ කළමනාකාරිත්වයට සහ කාර්ය මණ්ඩලයට මගේ හදපිරි ස්තුතිය පිරිනමමි. අප භාවිත කරනු ලබන බැංකු පද්ධතිය හරහා අපගේ ගනුදෙනුකරුවන්ට අඛණ්ඩ වටිනාකමක් ලබා දීමට මෙකී නොසැලෙන සහයෝගය සහ පක්ෂපාතිත්වය මහඟු පිටුවහලක් විය.

මීට විශ්වාසී,



ජෝශප් සුසෙදාසන්
සභාපති

ප්‍රධාන විධායක නිලධාරීතුමාගේ පණිවුඩය



කර්මාන්ත ප්‍රවණතා සමඟ මූලිකව කටයුතු කිරීම සහ ඵලදායීතාව වැඩි දියුණු කිරීම උදෙසා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව නව්‍යකරණයට සහ තාක්ෂණික භාවිතයට ප්‍රමුඛත්වය දෙමින් කටයුතු කර ඇත. මෙහිදී කෘත්‍රිම බුද්ධිය, බ්ලොක්චේන් සහ දත්ත විශ්ලේෂණ වැනි නැඟී එන තාක්ෂණයන් වෙනුවෙන් ආයෝජනය කරනු ඇත. ඒ තුළින් මෙහෙයුම් කාර්යක්ෂමතාව ඉහළ නැංවීම, අවදානම් කළමනාකරණය වැඩිදියුණු කිරීම සහ පාරිභෝගික නියැලීම වැඩිදියුණු කිරීම අපේක්ෂා කරයි.

2023 වර්ෂය වනවිට පෙර වර්ෂයේදී මුහුණදුන් දුෂ්කර ආර්ථික පසුබෑම්වලින් රට කෙමෙන් කෙමෙන් ප්‍රතිසාධනීය ලක්ෂණ පෙන්නුම් කළේය. ඉහළ උද්ධමනය සහ මූල්‍ය ප්‍රතිපත්ති කොන්දේසි ලිහිල් කිරීම සහ බාහිර අංශය යථා තත්ත්වයට පත්වීමත් සමඟ ආර්ථික කටයුතු නැවත ආරම්භ කිරීම හේතු කොට රට තුළ සාර්ව ආර්ථික ස්ථාවරත්වයේ ප්‍රගතියක් දැකගත හැකි වූ හෙයින් යම් අපේක්ෂාවක් දැල්විණ. බැංකු අංශය ඇතුළු සෑම අංශයක් විසින්ම අනපේක්ෂිත ආර්ථික දුෂ්කරතා මධ්‍යයේ කටයුතු කරමින් සුවිශේෂී දරාගැනීමේ හැකියාවක් මෙන්ම සැලසුම්ගතව වෙළඳ පොළ අභියෝගයන්ට මුහුණදීමේ හැකියාව පෙන්නුම් කරනු ලැබුණි. මෙකී තත්ත්වය අප සඳහාද කිසිදු වෙනසක් නොමැතිව බල පැවැත්වුණි. පාරිභෝගිකයාගේ සංකීර්ණ මූල්‍ය අවශ්‍යතා සපුරාලීමට යෝග්‍ය මූල්‍ය විසඳුම් ලබාදීම උදෙසා, රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව, කැපවීමෙන් ශක්තිමත්ව සිය ඔරොත්තු දීමේ හැකියාව සහ අනුවර්තනය වීමේ හැකියාව පෙන්නුම් කරමින් මෙහෙයුම් කටයුතු පවත්වා ගෙන ගියේය.

ආර්ථික පසුබිමේ නිරන්තර වෙනස්වීම් සහ විවිධත්වයෙන් යුතු බැංකුකරණ කර්මාන්තය තුළ පාර්ශවකරුවන් වෙනුවෙන් වටිනාකම් එක් කිරීමට බැංකුවේ මෙහෙයුම් සහ මූල්‍ය කාර්යසාධනය තිරසාර කිරීම සම්බන්ධයෙන් අපගේ කැපවීම පෙන්නුම් කරමින්, 2023 වර්ෂයට අදාළව රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ මූල්‍ය වාර්තාව සහ විගණිත මූල්‍ය ප්‍රකාශ මම මෙසේ සතුටින් ඉදිරිපත් කරමි.

මෙහෙයුම් පසුබිම

වර්ෂය ආරම්භයේදී ධනාත්මක වර්ධනයක් පෙන්නුම් කළද, පවතින අනපේක්ෂිත ආර්ථික තත්ත්වයන් සහ දේශපාලන අස්ථාවරත්වය හේතුවෙන් ඇති වූ නව දුෂ්කරතා මගින් ආර්ථික ප්‍රගතියේ මන්දනයක් ඇති විය. කොවිඩ් වසංගත තත්ත්වය සමඟ වැඩි වූ මෙකී මුල් බැස ගත් ආර්ථික ගැටලු මගින් ප්‍රතිසාධනයේ මූලික අපේක්ෂාවන් බිඳ දැමීම් වසර පුරා පැවතුණි. කර්මාන්ත හා සේවා ක්‍රියාකාරකම්වල මන්දනය හේතුවෙන්, 2023 වර්ෂයේ දෙවන කාර්තුවේදී ශ්‍රී ලංකා ආර්ථිකය 3.1%කින් සංකෝචනය විය. ආර්ථික ක්‍රියාකාරකම් තවදුරටත් අඩාල කරමින් පාරිභෝගික වියදම් මත පීඩනයක් ඇති කරමින් සහ පරිභෝජන රටාවන්ට බලපෑම් ඇති කරමින් ඉහළ උද්ධමනකාරී වාතාවරණයක් වසර පුරා පැවතුණි. එසේම, ඉහළ පොලී අනුපාත මගින් ණය බැඳීම් කළමනාකරණය කිරීමට සහ වර්ධන අවස්ථා සඳහා ආයෝජනය කිරීමට පවතින හැකියාව කෙරෙහි බලපෑම් ඇති කරමින් ණය ගැණුම්කරුවන්ට මෙන්ම ව්‍යාපාර සඳහා අභියෝග ඇති විය. උද්ධමනය පාලනය කිරීමට මහ බැංකුව විසින් මුදල් දැඩි කිරීම හේතුවෙන්, රට පුරා ණය ගැතියන් වෙත මූල්‍ය පීඩනයක් ඇති කරමින් ණය ගැනීමේ පිරිවැය ඉහළ යනු ලැබුණි.

ඉහළ අවිනිශ්චිතතාවයක් සහ ආයෝජකයින්ට අවධානම් ඇති කරමින් පැවති මෙකී තත්ත්වය, දේශපාලන අස්ථිරතාවය සහ පාලන අභියෝග හේතුවෙන් තවදුරටත් උග්‍ර විය. ව්‍යාපාර සහ පුද්ගලයන් සඳහා අපහසුතාවයක් ඇති කරමින්, මෙකී අස්ථාවරත්වය ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීමට සහ තීරණ ගැනීමට බලපෑම් ඇති කරන ලදී. එමෙන්ම ආර්ථිකයේ විවිධ අංශ සඳහා බලපෑම් ඇති කරමින්, සැපයුම් දාමයේ බිඳ වැටීම ප්‍රධාන ගැටලුවක් විය. ආර්ථික බලපෑම් හමුවේ දැනටමත් පීඩනයට ලක්වී සිටින ව්‍යාපාරවලට තවත් පීඩනයක් ඇති කරමින් අමුද්‍රව්‍ය ප්‍රසම්පාදනයේ අබණ්ඩ ප්‍රමාදයන්, ප්‍රවාහන ගැටලු සහ අත්‍යවශ්‍ය භාණ්ඩ හිඟය මඟින් නිෂ්පාදන හා බෙදා හැරීමේ කටයුතු සඳහා බාධා ඇති කළේය.

ඒ අනුව, 2023 වර්ෂයේදී, සාර්ව ආර්ථික පසුබිම තුළ දේශපාලන අස්ථාවරත්වය, සැපයුම් දාම කඩාකප්පල් කිරීම්, උද්ධමන පීඩන සහ ඉහළ පොලී අනුපාත වැනි ගැටලු පැවතුණි. ඒ තුළින් රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව (SMIB) වැනි ආයතන ඇතුළු බැංකු ක්ෂේත්‍රය තුළ උචිත උපාය මාර්ග සහ විචක්ෂණශීලී තීරණ ගැනීමේ වැදගත්කම පෙන්නුම් කරන ලදී.

බැංකු අංශයේ කාර්යසාධනය

මෙම අස්ථාවර මෙහෙයුම් පසුබිම තුළ, වර්ධිත ණය අවදානම්, ද්‍රවශීලතා බාධාවන්, නියාමන අවිනිශ්චිතතා සහ පොලී අනුපාත වෙනස්වීම් ආදී තත්ත්වයන් බැංකු අංශය දරා සිටියේය. පවත්නා ආර්ථික අවිනිශ්චිතතා තුළ ණය අවදානම මූලික ගැටලුවක් විය. ඒ අනුව බැංකුවට ණය ගැනුම්කරුගේ මූල්‍ය ශක්තිය නිරීක්ෂණය කිරීම ඇතුළු දැඩි ණය තක්සේරු කිරීමේ ක්‍රියාවලියක් ක්‍රියාත්මක කිරීමට සිදු විය. ශක්තිමත් ද්‍රවශීලතා ස්ථාවරයක් පවත්වා ගැනීම තවත් අභියෝගයක් විය. එහිදී බැංකුව විසින් ශක්තිමත් ද්‍රවශීලතා තත්වයක් සහතික කිරීම සඳහා වෙනස්වන තත්ත්වයන්ට කඩිනමින් ප්‍රතිචාර දක්වමින් අවශ්‍ය විචක්ෂණශීලී උපායමාර්ගික පියවර ගත යුතු විය. එමෙන්ම වෙනස් වන නියාමන පසුබිම හමුවේ විකාශනය වන රෙගුලාසි අනුව බැංකුවද යාවත්කාලීන වීම අවශ්‍ය විය. මේ සඳහා තාක්ෂණය සහ පුද්ගල පුහුණුව වෙනුවෙන් සැලකිය යුතු ආයෝජන අවශ්‍ය විය.

ක්ෂේත්‍රයේ ඉහළ අක්‍රීය ණය (NPL) අභියෝගයක් බවට පත් වූ අතර, එතුළින් විචක්ෂණශීලීව අක්‍රීය ණය කළමනාකරණ පිළිවෙත් ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාව අවධාරණය කළේය. එමෙන්ම ණය ගැණුම්කරුවන් සහ ව්‍යාපාර සඳහා පොලී අනුපාත අස්ථාවරත්වය අභියෝගයක් වූ අතර, ණය සහ ආයෝජන පියවීමේ හැකියාව කෙරෙහි බලපෑම් ඇති කළේය. එබැවින්, බැංකුවට ලාභදායීත්වය සහ අවදානම් කළමනාකරණය සැලකිල්ලට ගනිමින් තරඟකාරී පොලී අනුපාත හඳුන්වා දීමට සිදු විය.

ඩිජිටල් බැංකුකරණ සේවා ඔස්සේ පාරිභෝගික අභිරුචිය සපුරාලීම සඳහා තාක්ෂණික යටිතල පහසුකම් වෙනුවෙන් ආයෝජනය කරමින් සහ සේවක හැකියා වර්ධනය කරලමින් ඩිජිටල් පරිවර්තන වෙනුවෙන් බැංකු ක්ෂේත්‍රයද කටයුතු කරනු ලැබුණි. එය පාරිභෝගික අත්දැකීම් ඉහළ නැංවීමට සහ ඩිජිටල් යුගයේ තරඟකාරීව කටයුතු කිරීමට අවස්ථාව උදා කරන ලදී.

ක්ෂේත්‍රය තුළ පවතින මෙම තීරණාත්මක අභියෝගවලට මුහුණ දීම සඳහා බැංකුව විසින් විචාරවත් ක්‍රියාශීලී අවදානම් කළමනාකරණයක්

ප්‍රධාන විධායක නිලධාරීතුමාගේ පණිවුඩය

පවත්වා ගැනීම මෙන්ම, තාක්ෂණය සහ නවෝත්පාදන වෙනුවෙන් සැලකිය යුතු ආයෝජන සිදු කිරීම ඇතුළු උපාය මාර්ගික අනුවර්තනයක් සිදු කිරීම අවශ්‍ය විය.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ කාර්ය සාධනය

මෙකී වාතාවරණය තුළ, රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව විසින් අවදානම් අවම කර ගැනීමට සහ ඇතිවන අවස්ථාවන්ගෙන් ප්‍රයෝජන ගැනීමට උපාය මාර්ගික දුරදක්නා සහ ක්‍රියාශීලී ක්‍රියාමාර්ග ඔස්සේ වසරේ කාර්යභාර්ය ඉටු කරමින්, විවිධත්වයෙන් යුතු බැංකුකරණ පසුබිම තුළ අඛණ්ඩ වර්ධනය සහ සාර්ථකත්වය සඳහා බැංකුව ස්ථානගත කරමින් කැපී පෙනෙන ඔරොත්තු දීමේ හැකියාවක් සහ අනුවර්තනය වීමේ හැකියාවක් පෙන්නුම් කරන ලදී.

මූල්‍ය වර්ෂය තුළ 18.89%ක ශක්තිමත් ප්‍රාග්ධන ප්‍රමාණවත්තා අනුපාතය (CAR) මගින් පෙන්නුම් කළ හිතකර මූල්‍ය තත්ත්වය බැංකුවේ ප්‍රධාන ශක්තියක් විය. මෙකී අනුපාතය, නියාමන අවශ්‍යතා ප්‍රමාණයට සාපේක්ෂව බෙහෙවින් ඉහළ අගයක් විය. එමගින් වෙළඳ පොළ අස්ථාවරත්වය මධ්‍යයේ බැංකුවේ මූල්‍ය ස්ථාවරත්වය සහතික කරමින් ඇතිවිය හැකි අලාභවලට සාපේක්ෂව ශක්තිමත් ආවරණයක් සපයන ලදී. ඊට අමතරව, කෙටි කාලීන වගකීම් ඉටු කිරීමට සහ අනපේක්ෂිත ද්‍රවශීලතාවයන්ට ඔරොත්තු දීමට නියාමන ද්‍රවශීලතා අවශ්‍යතාවය ඉක්මවා යමින්, ප්‍රමාණවත් ද්‍රවශීලතා තත්ත්වයක් පවත්වා ගැනීමට රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව සමත් විය. බැංකුව, ආයෝජන කළඹ පුළුල් කරමින් සහ ඉලක්කගත වර්ධන ප්‍රයත්නයන් කෙරෙහි අවධානය යොමු කරමින් සිය වෙළෙඳ පොළ පැවැත්ම සහ ආදායම් ප්‍රවාහය ශක්තිමත් කරනු ලබන උපායමාර්ගික කටයුතු කෙරෙහි නිරන්තරයෙන් අවධානය යොමු කළේය; ඒ අනුව, ලාභදායිතාව වෙනුවෙන් ආර්ථික බලපෑම් ඇති වීම අවම කිරීමට සහ අංශය තුළ බැංකුවේ තරඟකාරී තත්ත්වය වැඩිදියුණු කිරීමට ආදායම් මාර්ග විවිධාංගීකරණය කළේය.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව බොහෝ අංශවල අභියෝගවලට මුහුණදෙනු ලැබුණි. ණය සහ අත්තිකාරම්වල වෙළඳ පොළ කොටස ක්‍රමයෙන් අඩුවීම (0.27% කින් අඩු වී ඇත) ප්‍රධාන බාධකයක් විය. එහිදී වෙනස්වීම් ඇතිවන ක්ෂේත්‍රයක වෙළඳ පොළ අදාළත්වය සහ තරඟකාරිත්වය පවත්වා ගැනීම සඳහා උපායමාර්ගික අනුගතවීම් සලකා බැලීමට බැංකුවට සිදු විය. එබැවින්, බලපෑම් ඇති කරනු ලබන මිලකරණ උපායමාර්ග සහ තරඟකරුවන්ගේ නිෂ්පාදන පිරිනැමීම් මධ්‍යයේ පාරිභෝගිකයින් ආකර්ශනය කර ගැනීම සහ රඳවා ගැනීම මෙන්ම වෙළඳ පොළ කොටස පවත්වා ගැනීම සම්බන්ධයෙන් වර්ධනය වන තරඟකාරිත්වය අධ්‍යනය කිරීමටද බැංකුවට සිදු විය.

අරමුදල්වල පිරිවැය වැඩිවීමට තුඩු දුන් ඉහළ පොලී අනුපාත වියදම් තවත් එක් අභියෝගයකි. කෙසේ වෙතත්, ඉහළ පොලී අනුපාත වියදම්වලින් පැන නගින අභියෝග මධ්‍යයේ වුවද බැංකුව ලාභදායිත්වය කෙරෙහි අවධානය යොමු කළේය. රු. මිලියන 9,324ක් ලෙස පොලී ආදායම කැපී පෙනෙන වර්ධනයක් පෙන්නුම් කළද, ඉහළ පොලී වියදම් හේතුවෙන් ශුද්ධ පොලී ආදායම පහත වැටීමේ ප්‍රවණතාවයකට මුහුණ දුන්නේය. මෙම බාධා අවම කරලීමට බැංකුව විසින් ක්‍රියාකාරී ක්‍රමවේදයක් පවත්වා ගෙන ගියේය. එහිදී ආදායම් උත්පාදනය ප්‍රශස්ත කිරීම සහ පොලී අනුපාත අවදානම් කළමනාකරණය කිරීම සඳහා තෝරාගත් පදනමක් මත උපායමාර්ගිකව ණය ප්‍රතිනිර්මාණය කිරීමට බැංකුව මූල්‍ය කළමනාකරණයේ යෙදුණි.

මෙම කාලපරිච්ඡේදය තුළදී, පොලී නොවන ආදායම් අංශය, විශේෂයෙන්ම ගාස්තු සහ කොමිස් ආදායම, සැලකිය යුතු අඩුවීමක් පෙන්නුම් කළද, අනෙකුත් මෙහෙයුම් ආදායම් මගින් ආයෝජනවලින් ඉපැයීම් ඔස්සේ සහය වීම දැක්වූ අතර, සමස්ත ආදායම සඳහා ධනාත්මක දායකත්වයක් ලබා දෙන ලදී.

පවතින ආර්ථික තත්ත්වය යටතේ වියදම් කළමනාකරණය සහ ආදායම් මාර්ග ප්‍රශස්තකරණය සම්බන්ධයෙන් අභියෝගය ඉස්මතු කරමින් බැංකුවේ සමස්ත මෙහෙයුම් ආදායම පෙර වසරට සාපේක්ෂව සැලකිය යුතු පසුබෑමක් පෙන්නුම් කළේය. කෙසේ වෙතත්, රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව බැංකුවේ සේවා පිරිනැමීම් කෙරෙහි දැඩි පාරිභෝගික විශ්වාසයක් සහ පක්ෂපාතිත්වයක් පෙන්නුම් කරමින් තැන්පතුවල සුවිශේෂී වර්ධනයක් අත්කර ගැනීමට සමත් විය. ඊට අමතරව, රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව විසින් බැංකුව සහ එහි ගනුදෙනුකරුවන් වෙත අවදානම අවම කිරීම සඳහා ණය සඳහා රක්ෂණ ආවරණයක් පිරිනමන ලදී. අනපේක්ෂිත තත්වයන් යටතේ ණය ආපසු ගෙවීම සහතික කරමින් ආබාධිතභාවය, බරපතල රෝගාබාධ හෝ මරණය වැනි සිදුවීම් වලින් රැකවරණය සැපයීම මෙම රක්ෂණ ආවරණයට ඇතුළත් විය. ණය ගැතියන් සඳහා මූල්‍ය සුරක්ෂිතභාවය ඉහළ නංවාලමින් සහ බැංකුව ණය අවදානම් නිරාවරණය වීම අවම කරමින් වගකීම් සහගත ණය දීම සහ පාරිභෝගික සුභසාධනය වෙනුවෙන් රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ කැපවීම මේ තුළින් පැහැදිලි වේ.

එමෙන්ම, රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව අඛණ්ඩ මෙහෙයුම් සඳහා සහය වීමේදී නියාමන අවශ්‍යතාවයට වඩා ද්‍රවශීලතා සංචිත පවත්වා ගැනීමට සමත් විය. මේ තුළින් විචක්ෂණශීලී අවදානම් කළමනාකරණය පිළිබඳ බැංකුවේ කැපවීම සහ එහි මෙහෙයුම්වල ස්ථාවරත්වය සහ ඔරොත්තු දීමේ හැකියාව ආරක්ෂා කිරීම සඳහා දක්වන උනන්දුව පෙන්නුම් කරනු ලබයි.

තාක්ෂණය යොදා ගැනීම සහ ඩිජිටල් පරිවර්තනය වෙනුවෙන් ආයෝජනය කරලීමද එහි උපායමාර්ගික ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් වැදගත් සාධකයක් විය. එහිදී බැංකුව සිය මෙහෙයුම් කාර්යක්ෂමතාව ඉහළ නැංවීම, පාරිභෝගික අත්දැකීම් වැඩිදියුණු කිරීම සහ අභ්‍යන්තර ක්‍රියාවලීන් විධිමත් කිරීම වෙනුවෙන් නිරන්තරයෙන් කටයුතු කළේය. මේ සඳහා ඩිජිටල් මාධ්‍ය උත්ශ්‍රේණි කිරීම, සයිබර් ආරක්ෂණ පියවර වැඩි දියුණු කිරීම සහ දැනුවත් තීරණ ගැනීම සඳහා දත්ත විශ්ලේෂණ භාවිත කිරීම ඇතුළත් විය.

දක්ෂතා සංවර්ධනය යනු උපායමාර්ගික සැලසුම්වල තවත් වැදගත් අංශයක් විය. එහිදී වෙනස්වන වෙළඳ පොළ තත්ත්වයන් හමුවේ කටයුතු කිරීමට සහ ගනුදෙනුකරුවන්ට සුවිශේෂී සේවාවක් ලබා දීම සඳහා අවැසි කුසලතා සහ හැකියාවන්ගෙන් සේවකයින් සන්නද්ධ කිරීමට පුහුණු වැඩසටහන් ආකාරයෙන් විවිධ වෘත්තීය සංවර්ධන වැඩසටහන් බැංකුව විසින් පවත්වන ලදී. බැංකුව ඔවුන්ගේ අභිප්‍රේරණය සහ ඵලදායිතාව තවදුරටත් ඉහළ නැංවීම සඳහා කාර්යසාධන දිරිගැන්වීම් සහ කුසලතා රඳවා ගැනීමේ ක්‍රමවේද ක්‍රියාත්මක කළේය.

කාල සීමාව තුළ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ උපායමාර්ගික සැලසුම් ප්‍රධාන සාධක හතරක් වටා කේන්ද්‍රගත විය. පළමුව, බැංකුව ඉහළ පොලී අනුපාත වාතාවරණයට සාපේක්ෂව විචක්ෂණශීලී ද්‍රවශීලතා කළමනාකරණය කෙරෙහි අවධානය යොමු කළේය. එහිදී 20%ක අවම ප්‍රතිශතයෙන් සාපේක්ෂව සාමාන්‍ය SLAR 35%ක් ලෙස සටහන් වීම මගින් පැහැදිලි විය. දෙවනුව, බැංකුව විසින් අක්‍රීය ණය සහ හානිකරණ කර්මාන්තයේ සාමාන්‍යයට වඩා පහළ මට්ටමක පවත්වා ගැනීමට බැංකුව කටයුතු කළේය. බැංකුව විසින් 2023 වර්ෂය අවසානයේදී 13.4%ක් වූ කර්මාන්තයේ අක්‍රීය ණය අනුපාතයේ සාමාන්‍යයට සාපේක්ෂව 12.32%ක් පවත්වා ගෙන ගියේය. තෙවනුව වැඩිවන පොදු කාර්ය පිරිවැය කළමනාකරණය කිරීම සඳහා පිරිවැය කළමනාකරණ උපායමාර්ග ද ක්‍රියාත්මක කරනු ලැබුණි. මෙකී ප්‍රයත්නවල ප්‍රතිඵලයක් ලෙස මෙහෙයුම් වියදම් පෙර මූල්‍ය වර්ෂයට සාපේක්ෂව 4.5% කින් පමණක් වර්ධනය විය. අවසාන වශයෙන්, ණය සහ අත්තිකාරම් සහ ආයෝජන ආදායම වර්ධනය කරලීම සඳහා කටයුතු කරනු ලදී. ඒ අනුව, වසර තුළ ණය සහ අත්තිකාරම්වල පොලී ආදායම 19% කින් සහ ආයෝජන ක්‍රියාකාරකම්වල ආදායම 38.2% කින් ඉහළ ගියේය.

මෙම උපාය මාර්ගවල පිටුබලය සමඟින්, විවිධ අංශ හරහා විවිධාංගීකරණය වූ ශක්තිමත් ණය කළඹක් පවත්වා ගනිමින් ස්ථාවර ණය වර්ධනයක් පවත්වා ගැනීමට රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව සමත් විය. දූරදර්ශී අවදානම් කළමනාකරණ පිළිවෙත් ඔස්සේ බැංකුව ශක්තිමත් වත්කම් ගුණාත්මකභාවයක් පවත්වා ගෙන ගිය අතර, එය අක්‍රීය ණය කළමනාකරණය කළ හැකි මට්ටමකට පවත්වා ගැනීමට දායක විය.

මූල්‍යමය වශයෙන් ගත් කළ, ස්ථාවර පොලී ආදායම, විචක්ෂණ වියදම් කළමනාකරණය සහ සම්පත් කාර්යක්ෂමව භාවිතය මගින් මෙහෙයවනු ලබන ලාභදායිත්ව ඉලක්ක සාක්ෂාත් කර ගැනීමට රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව සමත් විය. පාරිභෝගික සේවා සහ නියැලීම් සම්බන්ධයෙන්, රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව විසින් පාරිභෝගික තෘප්තියට ප්‍රමුඛත්වය ලබාදීම, සිය ඩිජිටල් බැංකු පිරිනැමීම් වැඩිදියුණු කිරීම සහ ගනුදෙනුකරුවන්ට පහසු සහ කාර්යක්ෂම සේවා සැපයීම සඳහා ක්‍රියාවලි විධිමත් කිරීම අඛණ්ඩව සිදු කළේය.

සමස්තයක් ලෙස, වසර තුළ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ කාර්යසාධනය මගින්, ඉදිරියේදී තිරසාර වර්ධනයක් ඇති කිරීම සහ අගයක් නිර්මාණය කිරීම සඳහා බැංකුව ස්ථානගත කරන ලදී. එමෙන්ම එතුළින් දූරදර්ශී අවදානම් කළමනාකරණය, නවෝත්පාදනය සහ පාරිභෝගික කේන්ද්‍රීයත්වය වෙනුවෙන් කැපවීම පිළිබිඹු විය.

සුවිශේෂී අවස්ථා

ඩිජිටල් පරිවර්තනය වෙනුවෙන් නිරන්තරයෙන් කටයුතු කිරීම, නවෝත්පාදනයේ ශක්‍යතාවය සහ පාරිභෝගික කේන්ද්‍රීයත්වය මෙන්ම ආයතනික සමාජ වගකීම් (CSR) සඳහා නොසැලෙන කැපවීම මඟින් රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ සුවිශේෂී සන්ධිස්ථාන ඉස්මතු කරයි.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව ඩිජිටල් පරිවර්තනය කරා යන ගමනේ දැවැන්ත ප්‍රගතියක් වන මූලික බැංකු පද්ධතියක් ක්‍රියාත්මක කිරීමට ගත් තීරණය වසරේ කැපී පෙනෙන ජයග්‍රහණයකි. මෙකී නවීකරණ මූලපිරීම මඟින් අභ්‍යන්තර ක්‍රියාවලීන් විධිමත් කිරීමට බලාපොරොත්තු වෙයි. ඒ තුළින් ක්‍රමානුකූලව ඩිජිටල්කරණය වූ බැංකු ක්ෂේත්‍රය තුළ සිය ගනුදෙනුකරුවන්ට බාධාවකින් තොරව, කාර්යක්ෂම සේවා සැපයීමේ හැකියාව වැඩි දියුණු කරයි.

මීට අමතරව, රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ ශාඛා ජාලය දිවයින පුරා විසිරී ඇති අතර, ප්‍රජා සහභාගීත්වය පෝෂණය කිරීම සහ පුද්ගල සබඳතා අර්ථවත්ව පෝෂණය කිරීම සඳහා ප්‍රධාන කාර්යභාරයක් ඉටු කළේය. බැංකුකරණ කටයුතුවලට පමණක් සීමා නොවෙමින් මෙකී ශාඛා, අදාළ ප්‍රදේශය තුළ සමාජ සහ වෙළඳ ආශ්‍රිත ක්‍රියාකාරකම්වලට සහභාගී වූ අතර, සේවා සපයන ප්‍රජාවන්ගේ ජීවිතවල කොටසක් ලෙස රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව කටයුතු කළේය. රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ ශාඛා එහි පාර්ශවකරුවන්ගේ යහපැවැත්ම සහතික කිරීම තුළින් අර්බුදකාරී කාලවලදී සංවේදීව සහ සහයෝගයෙන් කටයුතු කළේය.

ඉදිරියේදීත්, සමාජ වගකීම සහ තිරසාරභාවය වෙනුවෙන් වූ අපගේ කැපවීම අධිෂ්ඨානශීලීව සහ අඛණ්ඩව පවතී. බැංකුව විසින් එහි මූලික වටිනාකම් සහ සමාජයේ අභිවෘද්ධියට දායක වන කාර්යක්ෂම ප්‍රජාවක් සහ පාරිසරික ව්‍යාපෘති සඳහා අඛණ්ඩව සහය ලබා දෙනු ඇත. අඛණ්ඩ ප්‍රයත්නයන් තුළින් රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව, ශ්‍රී ලංකා බැංකු ක්ෂේත්‍රයේ සහ ඉන් ඔබ්බෙහි සාධනීය වෙනසක් ඇති කරනු ලබන පුරෝගාමියෙකු ලෙස සහ වගකිවයුතු ආයතනික පුරවැසියෙකු ලෙස සිය කීර්ති නාමය තහවුරු කිරීමට උත්සාහ කරයි.

ඉදිරි දැක්ම

ඉදිරි මූල්‍ය වර්ෂයේදී, තිරසාර වර්ධනය, මූල්‍ය ඔරොත්තු දීමේ හැකියාව සහ පාරිභෝගික කේන්ද්‍රීය නවෝත්පාදනය කෙරෙහි අවධානය යොමු කරමින්, කෙටි කාලීන අරමුණු සහ දිගු කාලීන ඉලක්ක යන ද්විත්වයට අනුගත වන උපායමාර්ගික සැලසුම් පවත්වා ගෙන යාමට අරමුණු කරයි. එබැවින්, වෙනස්වන පාරිභෝගික තේරීම් සහ වෙළඳ පොළ ඉල්ලීම් සපුරාලීම සඳහා ඩිජිටල් ශක්‍යතා වෙනුවෙන් නිරන්තරයෙන් ආයෝජනය කිරීම තුළින් කෙටි කාලයකින් අපගේ ඩිජිටල් වේදිකාව ශක්තිමත් කිරීම කෙරෙහි අපි අවධානය යොමු කරන්නෙමු. මෙහිදී ජංගම බැංකු යෙදුම්, මාර්ගගත වේදිකා, සහ ATM ජාලයක් ස්ථාපිත කිරීම ඇතුළු ඩිජිටල් ගෙවීම් විසඳුම් තවදුරටත් වැඩිදියුණු කිරීමට අවශ්‍ය වේ. පාරිභෝගික අත්දැකීම් විධිමත් කිරීම සහ මෙහෙයුම් කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම සඳහා ඉදිරි මූල්‍ය වර්ෂයේදී මෙය ක්‍රියාත්මක වනු ඇත. දෙවනුව, කුඩා හා මධ්‍යම ප්‍රමාණයේ ව්‍යවසායන් (SME), කෘෂිකර්මාන්තය සහ පුනර්ජනනීය බලශක්තිය වැනි ප්‍රධාන අංශ ඉලක්ක කර ගනිමින් අපගේ ණය කළඹ පුළුල් කිරීමට අපි අවධානය යොමු කරමු. සමස්ත ආර්ථික වර්ධනය, මූල්‍ය අන්තර්ගතය ප්‍රවර්ධනය කිරීම සහ ආදායම් මාර්ග විවිධාංගීකරණය කිරීම උදෙසා මෙකී ප්‍රයත්නයන් සහය වනු ඇතැයි අපි විශ්වාස කරමු. තෙවනුව, ඵලදායී පියවර, ක්‍රියාවලි ස්වයංක්‍රීයකරණය සහ සම්පත් ප්‍රශස්තකරණය තුළින් මෙහෙයුම් පිරිවැය ප්‍රශස්ත කිරීමෙන් පිරිවැය ප්‍රශස්තකරණ පියවර නිරන්තරයෙන් පවත්වාගෙන යාමට රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව උත්සහ කරනු ඇත. ඒ සඳහා අභ්‍යන්තර ක්‍රියාවලීන් විධිමත් කිරීම, පොදු කාර්ය වියදම් අඩු කිරීම සහ සමස්ත පිරිවැය-ඵලදායීතාවය වැඩිදියුණු කිරීම සඳහා ඵලදායීතාව ඉහළ නැංවීම ඇතුළත් වේ.

තිරසාර මූල්‍ය මූලාරම්භයන් සඳහා ආයෝජනය කිරීම, හරිත ණය දීමේ පිළිවෙත් ප්‍රවර්ධනය කිරීම සහ පාරිසරික සංරක්ෂණයට සහ සමාජ සුබසාධනයට දායක වන ව්‍යාපෘතිවලට සහාය වීම තුළින් මූල්‍ය කාර්ය සාධනය සමඟ සමාජ හා පාරිසරික වගකීම් ගලපාලමින් තිරසාර වර්ධනයක් අත්කර ගැනීම බැංකුවේ දිගු කාලීන අරමුණයි. දේශීය හා ජාත්‍යන්තර වශයෙන් වෙළඳ පොළ ව්‍යාප්තිය සහ විවිධාංගීකරණයද සැලසුම් අතර වේ. නව වෙළඳපල හඳුනා ගැනීම, උපායමාර්ගික හවුල්කාරිත්වයන් ඇති කරගැනීම සහ එහි පාරිභෝගික පදනම සහ භූගෝලීය රාමුව පුළුල් කිරීම සඳහා පවතින අවස්ථා ශක්තිමත් කිරීම මේ සඳහා ඇතුළත් වේ.

කර්මාන්ත ප්‍රවණතා සමඟ මූලිකව කටයුතු කිරීම සහ ඵලදායීතාව වැඩි දියුණු කිරීම උදෙසා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව නව්‍යකරණයට සහ තාක්ෂණික භාවිතයට ප්‍රමුඛත්වය දෙමින් කටයුතු කර ඇත. මෙහිදී කෘත්‍රිම බුද්ධිය, බ්ලොක්චේන් සහ දත්ත විශ්ලේෂණ වැනි නැඟී එන තාක්ෂණයන් වෙනුවෙන් ආයෝජනය කරනු ඇත. ඒ තුළින් මෙහෙයුම් කාර්යක්ෂමතාව ඉහළ නැංවීම, අවදානම් කළමනාකරණය වැඩිදියුණු කිරීම සහ පාරිභෝගික නියැලීම වැඩිදියුණු කිරීම අපේක්ෂා කරයි.


මූල්‍ය ඉලක්ක සම්බන්ධයෙන් ගත් කළ, රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව විසින් සිය ණය කළඹ පුළුල් කිරීමට කටයුතු කරන අතර, ඉලක්කගත ණය දීමේ කටයුතු මෙන්ම අංශයට විශේෂිත වූ අවධානය යොමු කරන ක්ෂේත්‍ර හරහා ණය දීමේ පරිමාවන්හි සැලකිය යුතු වර්ධනයක් අත්කර ගැනීමට ඉලක්ක කරනු ඇත. දෙවනුව, මෙහෙයුම් කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම් සහ පිරිවැය ප්‍රශස්තිකරණ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීමෙන් එහි පිරිවැය-ආදායම් අනුපාතය අවම කිරීමෙන් සමස්ත මූල්‍ය කාර්යසාධනය වැඩි දියුණු කිරීමට අපේක්ෂා කරනු ලබයි. මීට අමතරව, රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව විසින් පරිශීලක-හිතකාමී ඩිජිටල් වේදිකා සහ වැඩිදියුණු කරන ලද ඩිජිටල් බැංකු සේවා පිරිනැමීම තුළින් සිය පාරිභෝගික පදනම අතර ඩිජිටල් අනුගතවීම වැඩි කිරීමෙන් පාරිභෝගික කටයුතු සහ තෘප්තිය වැඩිදියුණු කරනු ඇත. අවසාන වශයෙන්, බැංකුව සිය ලාභදායීත්වය තිරසාර ලෙස වැඩිදියුණු කිරීමට අඛණ්ඩව කටයුතු කරනු ඇත. ස්ථාවර ආදායම් වර්ධනයක් අත්කර ගනිමින් සහ ආයෝජනයේ ප්‍රතිලාභ උපරිම කර ගැනීමට සහ දිගුකාලීන මූල්‍ය ස්ථාවරත්වය සහතික කිරීම සඳහා ඵලදායී පිරිවැය කළමනාකරණ උපාය මාර්ග මෙහිදී ක්‍රියාත්මක කරනු ලබයි.

සමස්තයක් වශයෙන්, රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අනාගත දැක්ම සහ නව මූල්‍ය වර්ෂය සඳහා උපායමාර්ගික සැලසුම් මඟින් තිරසාර වර්ධනය, නවෝත්පාදනය, පාරිභෝගික කේන්ද්‍රීයත්වය සහ මූල්‍ය ඔරොත්තු දීමේ හැකියාව වෙනුවෙන් ප්‍රමුඛත්වය දෙනු ඇත. ඒ තුළින් දිගුකාලීන සාර්ථකත්වය සහ පාර්ශවකරුවන් වෙනුවෙන් වටිනාකම් ඇති කිරීම කෙරෙහි ඉඩ සලසයි.

ස්තුතිය

2023 වර්ෂය පුරාවට නොසැලෙන කැපවීම සහ ශක්තිය ලබා දුන් සභාපතිතුමා, අධ්‍යක්ෂ මණ්ඩලය සහ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ සමස්ත කණ්ඩායමට මම අවංක කෘතඥතාව පුද කරමි. අපගේ ප්‍රගතිය වෙනුවෙන් අපගේ වටිනා ගනුදෙනුකරුවන්, හවුල්කරුවන් සහ නියාමකයින් මහඟු දායකත්වයක් ලබා දුන් අතර, අපි වටිනාකම් පිරිනැමීමට මෙන්ම වෙනස්වීමට හාජනය වන බැංකු ක්ෂේත්‍රය තුළ ඵලදායීතාවය පවත්වා ගැනීම වෙනුවෙන් කැපවී සිටිමු. ඉදිරිය පිළිබඳ සලකා බලන කළ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව සිය පාර්ශවකරුවන් සඳහා විශ්වාසදායක හවුල්කරුවෙකු ලෙසත්, සේවා සපයනු ලබන ප්‍රජාවන්හි ධනාත්මක වෙනසක් ඇති කරවනු ලබන පුරෝගාමියෙකු ලෙසත් කටයුතු කරන බවට සහතික කරමින්, අපි මූල්‍ය ඔරොත්තු දීමේ හැකියාව, නවෝත්පාදන සහ පාර්ශවකරුවන්ගේ සහභාගීත්වය වෙනුවෙන් නිරන්තර ප්‍රමුඛත්වය දෙන්නෙමු.

මීට විශ්වාසී,



තුෂාර අසුරමාන්න මහතා
සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී
රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව (SMIB)

අධ්‍යක්ෂ මණ්ඩලය



බී. ආර් මඩිහහේවා
මහතා
ස්වාධීන, විධායක
නොවන අධ්‍යක්ෂ

එස්. කේ. ඒ ගලප්පත්ති
මහතා
ස්වාධීන, විධායක
නොවන අධ්‍යක්ෂ

ජේ. එම් සුසෙදාසන්
මහතා
සභාපති

එච්. සී. ඩී. එල් සිල්වා
මහතා
විධායක නොවන,
හිටපු නිල අධ්‍යක්ෂ

මහාචාර්ය ඩී. ඒ. එම්
පෙරේරා මහතා
ස්වාධීන, විධායක
නොවන අධ්‍යක්ෂ

ජේ. එම් සුසෙදාසන් මහතා
සභාපති
ස්වාධීන, විධායක නොවන අධ්‍යක්ෂ

පත්වීම් කාලය:
2023 මැයි 17 දින සිට මේ දක්වා

හැකියාවන් සහ පළපුරුද්ද
- ශ්‍රී ලංකාවේ සහ විදේශයන්හි ප්‍රගතිශීලී කළමනාකරණ පළපුරුද්ද සහිත කළමනාකරණ ගණකාධිකාරීන්ගේ වරලත් ආයතනයේ (එංගලන්තය) සහ-සාමාජිකයෙකි.
- ශ්‍රී ලංකාවේ සහ විදේශයන්හි ඇඟලුම් නිෂ්පාදන සහ අපනයන අංශයේ ප්‍රධාන මෙහෙයුම් නිලධාරී/ සාමාන්‍යාධිකාරී ලෙස වසර 18කට අධික කාලයක පළපුරුද්දක් ඇත.
- ශ්‍රී ලංකාවේ සහ විදේශයන්හි හෝටල් සහ සංචාරක අංශය ඇතුළු වෘත්තීය සහ ආයතන සඳහා මූල්‍ය සහ කළමනාකරණ උපදේශක/ කළමනාකරු ලෙස සේවය කොට පුළුල් අත්දැකීම් ලබා ඇත.

සෙසු තනතුරු
- ට්‍රෙන්ඩ් සෙටර්ස් ප්‍රයිවට් ලිමිටඩ් හි කළමනාකරණ උපදේශක

පෙර දැරූ තනතුරු
- හොටෙල් ඩිවලොපර්ස් (ලංකා) පීඑල්සී හි අධ්‍යක්ෂ
- ප්‍රධාන මෙහෙයුම් නිලධාරී - ට්‍රෙන්ඩ් සෙටර්ස් ප්‍රයිවට් ලිමිටඩ්
- ටයිමෙක්ස් ඇන්ඩ් ෆර්ගසම් ගෘෘප් හි සාමාන්‍යාධිකාරී
- ස්ටාර් ඇපරල්ස් (ටී) ලිමිටඩ්, ටැන්සාර්නියා හි සාමාන්‍යාධිකාරී/ උපදේශක
- එල්. එම් ක්ලෙක්ෂන් ප්‍රයිවට් ලිමිටඩ් හි සාමාන්‍යාධිකාරී
- ජාත්‍යන්තර සංවර්ධනය සඳහා වූ එක්සත් ජනපද නියෝජිතායතනය, ග්ලෝබල් ට්‍රාන්ස්පොටේෂන් ඇන්ඩ් ලොජිස්ටික්ස් ප්‍රයිවට් ලිමිටඩ් සහ ජෝලංකා ගෘෘප් හි කළමනාකරණ උපදේශක.

එච්. සී. ඩී. එල් සිල්වා මහතා
විධායක නොවන, අධ්‍යක්ෂ (නිළබලයෙන්)

පත්වීම් කාලය:
2020 ජනවාරි 11 දින සිට මේ දක්වා

හැකියාවන් සහ පළපුරුද්ද
- ශ්‍රී ලංකා පරිපාලන සංවර්ධන ආයතනයෙන් රාජ්‍ය කළමනාකරණය පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් සහ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් රාජ්‍ය පරිපාලනය පිළිබඳ විද්‍යාවේදී විශේෂ ගෞරව උපාධියක් ලබා ඇත.
- ගිණුම්කරණ කාර්මික ශිල්පීන්ගේ සංගමයේ සහකාර සාමාජිකයෙකි.
- රාජ්‍ය මූල්‍ය ගණකාධිකාරීවරුන්ගේ සංගමයේ සහ-සාමාජිකයෙකි.
- ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ (ICASL) සහතිකලත් ව්‍යාපාර ගණකාධිකාරීවරයෙකි.
- ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ (ICASL) වරලත් රාජ්‍ය මූල්‍ය කළමනාකරණ ගණකාධිකාරීවරයෙකි.
- ඔහු රාජ්‍ය මූල්‍ය සහ ගණකාධිකරණ වරලත් ආයතනයේ සාමාජිකයෙකු වන අතර, 1992 වර්ෂයේ සිට ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ ගණකාධිකාරීවරයෙකු ලෙස වසර 30කට වැඩි කාලයක් සේවය කොට ඇත. ඔහු උපායමාර්ගික මට්ටමේ නිලධාරියෙකු ලෙස රාජ්‍ය මූල්‍ය කළමනාකරණය, භාණ්ඩාගාර මුදල් කළමනාකරණය, රාජ්‍ය ණය කළමනාකරණය, විගණනය, ගිණුම්කරණය සහ රාජ්‍ය ප්‍රසම්පාදන කළමනාකරණය වැනි ක්ෂේත්‍රවල විශේෂිත වූ පුළුල් දැනුම් සම්භාරයකින් යුතු අයෙකි.

සෙසු තනතුරු
- මූල්‍ය අමාත්‍යාංශයේ භාණ්ඩාගාර මෙහෙයුම් අධ්‍යක්ෂ ජනරාල්
- ජාතික නවෝත්පාදන නියෝජිත ආයතනයේ (NIA) මෙහෙයුම් කමිටුවේ සභා සාමාජික

පෙර දැරූ තනතුරු
- ජාතික ලොතරැයි මණ්ඩලයේ හිටපු අධ්‍යක්ෂ
- සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ හිටපු අධ්‍යක්ෂ
- ජාතික විද්‍යා පදනමේ හිටපු අධ්‍යක්ෂ

එස්. කේ. ඒ ගලප්පත්ති මහතා
ස්වාධීන, විධායක නොවන අධ්‍යක්ෂ

පත්වීම් කාලය:
පළමු පත්වීම - 2020 ජනවාරි 02 දින සිට 2023 ජනවාරි 01 දක්වා
දෙවන පත්වීම- 2023 මාර්තු 07 දින සිට මේ දක්වා

හැකියාවන් සහ පළපුරුද්ද
- කොළඹ විශ්වවිද්‍යාලයේ නීති විද්‍යා පීඨයේ ව්‍යවස්ථාදායක නීතිය පිළිබඳ උපාධියක් හිමි නීතිඥයෙකි.
- වාණිජ නීතිය, සමාගම් නීතිය, ඉඩම් නීතිය, දිස්ත්‍රික් උසාවි, වාණිජ මහාධිකරණය, සිවිල් අභියාචනා මහාධිකරණය සහ කම්කරු විනිශ්චය සභාවල කම්කරු නීතිය මෙන්ම රිට් අයදුම්පත්, පරිපාලන නීතිය සහ අභියාචනාධිකරණයේ සහ ශ්‍රේෂ්ඨාධිකරණයේ මූලික අයිතිවාසිකම් ආදී ක්ෂේත්‍ර සම්බන්ධයෙන් වසර 29කට අධික කාලයක් පුරා ක්‍රියාකාරී පළපුරුද්ද ඇත.
- ශ්‍රී ලංකා නීතිඥ සංගමයේ නියෝජිතයෙකි
- කොළඹ නීති සංගමයේ සාමාජිකයෙකි.
- වෘත්තීයවේදීන්ගේ සංගමයේ සාමාජිකයෙකි.

පෙර දැරූ තනතුරු
- අධ්‍යක්ෂ - ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථාව
- ජාතික ලොතරැයි මණ්ඩලයේ අධ්‍යක්ෂ
- නීති අධ්‍යක්ෂ - මර්කන්ටයිල් ඉන්වෙස්ට්මන්ට් ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී
- මූල්‍ය ආයතන සංගමයේ නීති කවයේ සභාපති
- අධ්‍යක්ෂක - ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථාව

අධ්‍යක්ෂ මණ්ඩලය

මහාචාර්ය ඩී. ඒ. එම් පෙරේරා මහතා
ස්වාධීන, විධායක නොවන අධ්‍යක්ෂ

පත්වීම් කාලය:
2023 මාර්තු 21 සිට මේ දක්වා

හැකියාවන් සහ පළපුරුද්ද
- KEISEI ජාත්‍යන්තර විශ්වවිද්‍යාලයෙන් ව්‍යාපාර කළමනාකරණය පිළිබඳව සහ වයඹ විශ්වවිද්‍යාලයෙන් අලෙවිකරණය පිළිබඳ ද්විත්ව ආචාර්ය උපාධියක් දරයි.
- ඉන්දිරා ගාන්ධි ජාතික විවෘත විශ්වවිද්‍යාලයෙන් මූල්‍ය කළමනාකරණය පිළිබඳ ව්‍යාපාර පරිපාලනවේදී උපාධියක් සහ වයඹ විශ්වවිද්‍යාලයෙන් පරිපාලනවේදී උපාධියක් ලබා ඇත.
- ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් රාජ්‍ය පරිපාලනය පිළිබඳ විශේෂ විද්‍යාවිදී උපාධියක් ලබා ඇත.
- ශ්‍රී ලංකා ගණකාධිකාරී ශිල්පීය සංගමයේ සාමාජිකයෙකි.

සෙසු තනතුරු
- ඔහු ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ ගණකාධිකාරී අංශයේ ප්‍රධානියා වේ.
- ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ ව්‍යාපාර අධ්‍යයනය සහ මූල්‍ය පීඨයේ මහාචාර්යවරයෙකි.
- ඇක්ෂන් වැලි කැම්පස් ප්‍රයිවට් ලිමිටඩ් හි අධ්‍යක්ෂ
- සණස කැම්පස් ප්‍රයිවට් ලිමිටඩ් හි අධ්‍යක්ෂ
- විෂන් 2040 ප්‍රයිවට් ලිමිටඩ් හි අධ්‍යක්ෂ

පෙර දැරූ තනතුරු
- සුනිත්‍ය බලශක්ති අධිකාරියේ අධ්‍යක්ෂ
- ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාවේ අධ්‍යක්ෂ
- මහජන බැංකුවේ අධ්‍යක්ෂ සහ 2028 දින සිට ජෙෂ්ඨ අධ්‍යක්ෂ ලෙස පත් වන ලදී.
- සිවිල් ගුවන් සේවා අධිකාරියේ අධ්‍යක්ෂ
- ජාතික පුස්තකාල සහ DB සේවා අධ්‍යක්ෂ
- WUTD ව්‍යාපෘතියේ ව්‍යාපෘති අධ්‍යක්ෂ (සෞඛ්‍ය සංවර්ධන අරමුදල), උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය
- රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය - උපදේශක
- BCI කැම්පස් හි උපදේශක
- KEISEI ජාත්‍යන්තර විශ්වවිද්‍යාලයේ ජාතික උපදේශක

බී. ආර් මඩිහහේවා මහතා
ස්වාධීන, විධායක නොවන අධ්‍යක්ෂ

පත්වීම් කාලය:
2023 මැයි 02 සිට මේ දක්වා

හැකියාවන් සහ පළපුරුද්ද
- ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ ව්‍යාපාර පරිපාලනවේදී සහ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව - ඕස්ට්‍රේලියන් ඉන්ස්ටිටියුට් ඔෆ් බිස්නසස්, ඇඩිලේඩ්
- වරලත් වෘත්තීය කළමනාකරුවන්ගේ සහ-සාමාජිකයෙකි.
- ශ්‍රී ලංකා අලෙවිකරණ ආයතනයේ සහතික ලත් සාමාජිකයෙකි.
- වරලත් කළමනාකරණ ආයතනයේ සහ-සාමාජිකයෙකි.
- ව්‍යාපාර විධායකයින්ගේ සංගමයේ සහ-සාමාජිකයෙකි.
- වරලත් අලෙවිකරණ ආයතනයේ සාමාජිකයෙකි.
- කළමනාකරණ ආයතනයේ සාමාජිකයෙකි.
- වාණිජ සහ මූල්‍ය අංශවල ජෙෂ්ඨ කළමනාකාරීත්වය සම්බන්ධයෙන් වසර 30කට අධික පළපුරුද්ද ඇත.

සෙසු තනතුරු
- කළමනාකරණ අධ්‍යක්ෂ
  - ස්වර්ණකලුම් ගෘප් ප්‍රයිවට් ලිමිටඩ්
  - ස්වර්ණකලුම් ලොජිස්ටික්ස් ප්‍රයිවට් ලිමිටඩ්
  - සංක ලොජිස්ටික්ස් ප්‍රයිවට් ලිමිටඩ්
  - ස්වර්ණකලුම් වීල් කෙයාර් ප්‍රයිවට් ලිමිටඩ්
  - සංක ඩිජිටල් වීල් කෙයාර් ප්‍රයිවට් ලිමිටඩ්

පෙර දැරූ තනතුරු
- සිලෝන් ෆර්ටිලයිසර් කම්පැනි ලිමිටඩ් හි සභාපති
- කළමනාකරණ අධ්‍යක්ෂ - ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථාව
- සීමාසහිත ලංකා පෙට්‍රෝලියම් ගබඩා පර්යන්ත සමාගම හි අධ්‍යක්ෂ
- ලංකා නැව් සංස්ථාවේ අධ්‍යක්ෂ
- සීමාසහිත ලංකා ගල් අඟුරු සමාගමේ අධ්‍යක්ෂ
- සිලෝන් ඔපින් ලයින්ස් ලිමිටඩ් හි අධ්‍යක්ෂ
- සීමාසහිත වරාය සේවා සමාගමේ අධ්‍යක්ෂ
- තෘතියික සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ සාමාජික

ආයතනික කළමනාකාරිත්වය



අයි. ටී. අසුරමාන්න මහතා
සාමාන්‍යාධිකාරී/ ප්‍රධාන විධායක නිලධාරී
MBA-PIM (USJP), BSc Eng (Hons), ACMA, CGMA, BMS, AM (IESL), MIEE- UK



එල්. අයි. රණසිංහ මහතා
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ණය)
MBA (Fin), BSc. Mkt. Mgt, LL.B, AIB, ACIM



කේ. එල්. එන්. ඒ. පෙරේරා මහතා
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මූල්‍ය සහ සැලසුම්කරණය)
MBA (Fin), FCA, B.Com (Sp), SAT, HNDA, Dip. In RM



නිශානි පී. කේ. ලොකුගේ මහත්මිය
සහකාර සාමාන්‍යාධිකාරී (නීති)
LL.B, Attorney-at-Law, Notary Public and Commissioner for Oaths, Company Secretary



කේ. කේ. කපිල කීරවැල්ල මහතා
සහකාර සාමාන්‍යාධිකාරී (අයකර ගැනීම්)
B.Com (Sp) Hons (USJ),PG.EX.Dip. In Bank Mgt (IBSL)



එල්. ඩබ්ලිව්. සමරවික්‍රම මහතා
සහකාර සාමාන්‍යාධිකාරී (ණය)
BSc (Sp) Estate Management & Valuation, AIV, ACBF – (IBSL)



ඩී. එම්. ආර්. දිසානායක මහතා
සහකාර සාමාන්‍යාධිකාරී (ශාඛා මෙහෙයුම්)
MA, B.Sc-EMV (Sp) Hons, DBF, Dip in MC, Dip in CE, AIV, AIB



ඩබ්ලිව්. ජී. එස්. එස්. කේ. අබේවික්‍රම මහත්මිය
සහකාර සාමාන්‍යාධිකාරී (අනුකූලතා)
Attorney at Law and Notary – Public, Commissioner for Oaths



ඒ. එම්. ඩී. එස්. අලහකෝන් මහත්මිය
අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්
LL.B, ACCS, Dip. ICSA (UK)

ආයතනික හා ජ්‍යේෂ්ඨ කළමනාකාරිත්වය



ආර්. එම්. ජේ. සී. කේ. මඩවල මහතා
සහකාර සාමාන්‍යාධිකාරී (මානව සම්පත් සහ සැපයුම්)
CQHRM – CIPM, MBA (Log), MBA (Gen), BSc(Def)



ඩබ්ලිව්. කේ. තන්තිරිගේ මහතා
සහකාර සාමාන්‍යාධිකාරී (පරිගණක)
MBA –PM,MDT,BSc MIS, CLSSGB,CISE



පී. කුරුවිට මහතා
ප්‍රධාන අභ්‍යන්තර විගණක
ACA, ACMA, CGMA, AAT, DIP IT, IIA Member



ආර්. යුෂන්ති ඩයස් මහත්මිය
අවදානම් කළමනාකරණ ප්‍රධානී
SIRM, ACII, MSc Risk Management, BA (Dual Hons)

ජෙෂ්ඨ කළමනාකාරිත්වය




එස්. වික්‍රමසිංහ මහතා
ප්‍රධාන කළමනාකරු (ණය)
B.Sc (EMV) (Sp) Hons., AIV



ආර්. එම්. යූ. ඩී. බණ්ඩාර මහතා
ප්‍රධාන කළමනාකරු (මානව සම්පත් හා සැපයුම්)
MHRM,BSc BA (Sp),NDHRM., AMCIPM



අයි. එදිරිසූරිය මහතා
ප්‍රධාන කළමනාකරු (තක්සේරු)
MEM, B.Sc (EMV) (Sp) Hons. MRICS, AIV



ඊ. ඒ. ඩී. වරුණි සේපාලිකා මහත්මිය
ප්‍රධාන කළමනාකරු (මූල්‍ය)
BSc. (Acc) , ACA



ආර්. කේ. ඒ. එන්. රත්නායක මහත්මිය
ප්‍රධාන කළමනාකරු - අවදානම් කළමනාකරණ අංශය
ACMA (UK), CGMA (UK), Dip in Bus.Mgmt



එන්. පී. ඩී. නුවන් තිලකවර්ධන මහතා
ජ්‍යෙෂ්ඨ කළමනාකරු - (අලෙවිකරණ ප්‍රධානි)
MBA,B.Sc. Bus Admin , PG Dip (Mkt), CIM – UK, MSLIM, ACIM

ආයතනික පාලනය

විධායක කළමනාකාරිත්වයේ කාර්ය සාධනය මෙන්ම සැලසුම්ගත ක්‍රියාමාර්ග අධීක්ෂණය කිරීම සහ පාලනය කිරීම සහ කොටස් හිමියන් හට එහි වගවීම සම්බන්ධයෙන් වැදගත් කරුණු ආයතනික පාලනය මඟින් ඉස්මතු කොට දක්වනු ලබයි.

ඉදිරි සංවර්ධනයන් සහ ආයතනික කාර්ය සාධනයන් සම්බන්ධයෙන් පදනමක් සපයනු ලබන යහපත් ආයතනික පාලනයක වැදගත්කම කෙරෙහි බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් ලෙස රාජ්‍ය උකස් සහ ආයෝජන බැංකුව විසින් එහි උපරිම අවධානය යොමු කරනු ලබයි.

රාජ්‍ය උකස් සහ ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය, ඉහළ තීරණ ගැනීමේ අධිකාරියක් ලෙස බැංකුවේ මෙහෙයුම් සහ මූල්‍ය යහපත්භාවය සම්බන්ධයෙන් සමස්ත වගකීම් දරනු අතර තැම්පත්කරුවන්, ණයහිමියන්, සේවකයින් සහ අනෙකුත් පාර්ශවකරුවන්ගේ අවශ්‍යතාවන් සපුරාලන බවට සහතික කරනු ලබයි. බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය යනු බැංකුකරණය, මූල්‍ය, ආර්ථිකය, ව්‍යාපාර කළමනාකරණය, මානව සම්පත් කළමනාකරණය, නීතිය, සහ අලෙවිකරණය ආදී අංශවල ප්‍රායෝගික අත්දැකීම්වලින් පිරි ක්‍රියාකාරී වෘත්තිකයන් සමූහයකගේ එකතුවකි. සැලසුම්කරණය, කාර්යසාධනය සහ සම්පත් සම්බන්ධයෙන් ඇතිවන ගැටලු සම්බන්ධයෙන් ස්වාධීන, මධ්‍යස්ථ සහ සෘජු තීරණ ගැනීම සඳහා අවශ්‍ය හැකියාවන් සහ පළපුරුද්ද ඔවුන් සතුය. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ආයතනයේ ක්‍රමෝපායික අරමුණු ක්‍රියාවට නැංවීම සඳහා නායකත්වය ලබා දීම, ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ අධීක්ෂණය කිරීම සහ කොටස් හිමියන්ට ඔවුන්ගේ කළමනාකාරිත්වය පිළිබඳ වාර්තා කිරීම පිළිබඳ බැංකුවේ කටයුතු සම්බන්ධයෙන් අධීක්ෂණ වගකීම් ශක්තිමත් කරනු ලබයි.

බැංකුවේ පාලන මූලධර්ම හා ව්‍යුහය මඟින් ඵලදායී තීරණ ගැනීම ශක්තිමත් කරනු ලබයි. ඒ තුළින් ඉහළ විනිවිදභාවයක් පවත්වා ගෙන යනු ලබන අතර ව්‍යාපාරයේ සෑම අංගයකම වගවීම සහතික කරනු ලබයි. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් බැංකුව විචක්ෂණශීලීව මෙන්ම රටේ සහ පාලන අධිකාරීවල නීතිය මෙන්ම රෙගුලාසි සහ බැංකුවේ අභ්‍යන්තර ප්‍රතිපත්ති රාමුව තුළ කළමනාකරණය වන බවට සහතික කරනු ලබයි.

බැංකුවේ තත්ත්වය සහ ඉදිරි කටයුතු පිළිබඳ සභාපතිතුමාගේ සමාලෝචනය/ පණිවුඩය සහ සාමාන්‍යාධිකාරී/ ප්‍රධාන විධායක නිලධාරී සමාලෝචනයෙ හි විස්තරාත්මකව ඉදිරිපත් කොට ඇත.

රාජ්‍ය උකස් සහ ආයෝජන බැංකුව පදනමක් මත ගොඩනැඟී ඇත. එතුළින් මූලික වශයෙන් බැංකුවේ ව්‍යාපාර කටයුතු නිවැරදිව වර්ධනය කරලීමක් පෙන්නුම් කරනු ලබන හෙයින් වගවීම, අවංකභාවය, සාධාරණත්වය, ආචාරවිධි සහ සදාචාර, නෛතික/ නියාමන අනුකූලතා, විනිවිදභාවය මෙන්ම අනාවරණය සහ විශිෂ්ට කාර්යක්ෂමතාව වැනි ඉතා වැදගත් මූලික ගුණාංග සහ ලක්ෂණ ඉතා වැදගත් වේ.

වගවීම

වගවීමෙන් යුතු පරිසරයක් ගොඩනැඟීම ආයතනයක සාර්ථකත්වය උදෙසා බලපානු ලබන ප්‍රධාන සාධකයක් වන බැවින් බැංකුව විසින් එහි ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් වගකීමක් දරනු ලබන පරිසරයක් ගොඩනඟා ඇති බවට තහවුරු කරනු ලබයි.

වගවීම යනු යහපාලනය සම්බන්ධයෙන් ඉතා වැදගත් කාරණයකි යන්න අවබෝධ කර ගැනීම තුළින් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විගණන කමිටුවේ නිර්දේශ මත බැංකුවේ වාර්ෂික සහ අතුරුකාල මූල්‍ය ප්‍රකාශ සමාලෝචනය සහ අනුමත කරන අතර, විනිවිදභාවයකින් සහ නිසි ආකාරයෙන් යුතුව මූල්‍ය ප්‍රකාශවල තොරතුරු බැංකුවේ පාර්ශවකරුවන්ට සහ මහජනතාවට වාර්තා කරයි.

මූල්‍ය ප්‍රකාශ විගණකාධිපති දෙපාර්තමේන්තුව විසින් විගණනය කරන අතර, බැංකුව විසින් කාර්තුමය සහ වාර්ෂික මූල්‍ය ප්‍රකාශ පුවත්පත්වල පළ කරනු ලබයි. මේ තුළින් වගවීම සහතික කිරීම සම්බන්ධයෙන් බැංකුවේ ප්‍රතිපත්ති සහ ක්‍රියාවලිවල විනිවිදභාවය සහ විශ්වාසනීයත්වය වර්ධනය කරයි.

බැංකුව එහි ව්‍යාපාර කටයුතුවලට අදාළ කරුණු සම්බන්ධයෙන් සියලුම නියාමන බලධාරීන් විසින් පනවනු ලබන අවශ්‍යතාවන්ට අනුකූල වී ඇත.

සාධාරණත්වය

ජාතියේ නිවාස බැංකුව ලෙස, බැංකුව විසින් උනන්දුවක් දක්වන සියලුම පාර්ශ්වයන්ට නිවැරදි සහ සාධාරණ ආකාරයකින් සලකනු ලබයි. බැංකුව විසින් එහි ගනුදෙනුකරුවන්, සේවකයින්, කොටස්හිමියන්, සැපයුම්කරුවන් සහ ප්‍රජාව වැනි සමස්තය සඳහා පීඩාවන් ඇති නොකරමින් ව්‍යාපාර අවශ්‍යතාවන් සපුරාලනු ලබන නිවැරදි තීරණ ගනු ලබයි.

බැංකුව සියලුම ගනුදෙනුකරුවන් උදෙසා යහපත් පරිසරයක් ගොඩනඟනු ලබයි. ණය පහසුකම් සැලසීමේදී, බැංකුව විසින් එහි ගනුදෙනුකරුවන්ගේ මාසික ගෙවීම්වල දැරීමේ හැකියාව වන ආපසු ගෙවීම් ප්‍රමාණය පිළිබඳ මිල විනිශ්චය කිරීම් සිදු කරනු ලබයි. බැංකුව අවසාන ක්‍රියාමාර්ගය ලෙස ණය ආපසු ගෙවීම් පැහැරහැරි ගනුදෙනුකරුවන් සඳහා පමණක් නෛතික ක්‍රියාමාර්ග ගනු ලබන අතර, ගනුදෙනුකරුවන් විසින් අනපේක්ෂිත දුෂ්කරතාවන්ට මුහුණපාන අවස්ථාවලදී සෑමවිටම ඔවුන් වෙනුවෙන් කටයුතු කර ඇත; එයින් ඉතා තරගකාරී බැංකුකරණ කර්මාන්තය තුළ ජාතියේ නිවාස බැංකුව ලෙස කටයුතු කරමින් බැංකුවේ දක්ම සහ මෙහෙවර නගා සිටුවනු ලබයි.

විනිවිදභාවය සහ අනාවරණය

ප්‍රාග්ධනය වෙන්කිරීම, ආයතනික ගනුදෙනු සහ මූල්‍ය කාර්යසාධන නියාමනය සම්බන්ධයෙන් කොටස්හිමියන්ට, පාර්ශ්වකරුවන්ට සහ අනාගත ආයෝජකයින්ට දැනුවත් තීරණ ගැනීමට පදනමක් සපයන බැවින්, විනිවිදභාවය සහ අනාවරණය ශක්තිමත් ආයතනික පාලන රාමුවක අත්‍යවශ්‍ය අංග ලෙස කටයුතු කරයි. මූලික වශයෙන් මූල්‍ය අනාවරණයේ අඩුපාඩුව සහ ප්‍රමාණවත් නොවන පාලන ප්‍රතිපත්ති හේතුවෙන් මූල්‍ය අර්බුදයට හේතුවන ප්‍රධාන දෝෂය පැන නඟින බැව් සාමාන්‍ය පිළිගැනීම වේ.

විනිවිදභාවය යනු ආයතනික පාලනය සඳහා මූලික පියවරක් වන අතර, කළමනාකරණයේ ක්‍රියාකලාප සියුම් නිරීක්ෂණයට ලක්වන බැවින් සහ ලක්විය හැකි බැවින් ඔවුන් විසින් අවිධිමත් සහ අයුතු ක්‍රියාවන් හි නොයෙදෙන බව සහතික කරනු ලබයි.

විනිවිදභාවය පවත්වා ගැනීම උදෙසා නිවැරදි ගිණුම්කරණ ක්‍රම යොදාගැනීම, සමාගමේ තොරතුරු සම්පූර්ණයෙන් සහ කඩිනමින් අනාවරණයන් සිදු කිරීම, මෙන්ම අධ්‍යක්ෂවරුන්ගේ හෝ පාලන කොටස්හිමියන් යනාදී පිරිසගේ බැදියා පිළිගැටුම් අනාවරණය කිරීම ආදිය සිදු කලයුතු බව බැංකුව තරයේ විශ්වාස කරනු ලබයි. ඒ අනුව බැංකුව විසින් වාර්ෂික වාර්තාව, ප්‍රාග්ධන ප්‍රමාණවත් බව, මූලික කාර්යසාධන දර්ශක, ව්‍යාපාර සංකේන්ද්‍රණ, ආයතනික පාලන ප්‍රකාශන සහ මූල්‍ය ප්‍රකාශන අනාවරණය ආදිය තුළින් එහි කටයුතු පිළිබඳ අනාවරණයන් සිදු වන බවට සහතික කරනු ලබයි.

එමෙන්ම, බැංකුව විසින් පැහැදිලි මෙන්ම පහසුවෙන් අවබෝධ කර ගත හැකි බාසල් 111 රෙගුලාසි සහ ශ්‍රී.ලං.මු.වා (SLFRS) ප්‍රමිතිවලට අනුකූලව සකස් කරන ලද බැංකු වාර්තා සහ කාර්තුමය මෙන්ම වාර්ෂික මූල්‍ය වාර්තා ප්‍රකාශයට පත් කරනු ලබයි. මෙතුළින් බැංකුවේ කටයුතු පිළිබඳ පොදු බැදියාව සුරක්ෂිත බැව් සහතික කරයි. බැංකුව විසින් අවශ්‍ය රහස්‍යභාව කඩනොකොට එහි අවදානම් නිරාවරණ සහ අවදානම් කළමනාකරණ ක්‍රමෝපායන් සලකා බලමින් මූලික කරුණු පිළිබඳ අනාවරණයන් සිදු කළ යුතුය යන කරුණට අනුකූල වෙමින්, විධිමත් වාර්තා අතර ඇතිවන සියලුම වැදගත් සංවර්ධනයන් අනවශ්‍ය ප්‍රමාදයක් නොමැතිව නීතිය මඟින් අවැසි පරිදි අදාළ බලධාරීන්ට සහ පාර්ශ්වකරුවන්ට අනාවරණය කරනු ලැබේ.

2023 වාර්ෂික කාලසීමාවේදී, බැංකුව තුළ අදාළ පාර්ශව ගනුදෙනු කිසිවක් වාර්තා වී නොමැත.

අධ්‍යක්ෂ මණ්ඩලය

1975 අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු නීතිය සහ එහි සංශෝධනවල දක්වා ඇති පරිදි, මුදල් ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යවරයා විසින් රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය පත්කරනු ලැබ ඇති අතර, විවිධ ක්ෂේත්‍රවල දැනුම සහිත සුදුසු සහ යෝග්‍ය ස්වාධීන සහ විධායක නොවන අධ්‍යක්ෂවරුන් නව දෙනෙකුගෙන් සමන්විත වේ. එකී සාමාජිකයින් නවදෙනාගෙන් අධ්‍යක්ෂවරු තිදෙනෙක් කෘෂිකර්ම විෂයභාර අමාත්‍යාංශයේ අමාත්‍යවරයාගේ, නිවාස විෂයභාර අමාත්‍යාංශයේ අමාත්‍යවරයාගේ සහ පශු සම්පත් විෂයභාර අමාත්‍යාංශයේ අමාත්‍යවරයාගේ නියෝජිතයින් විය යුතුය. මන්ද යත් මූල්‍ය සහ අනෙකුත් සහය ලබාදීම මඟින් කෘෂිකර්මය, කර්මාන්ත සහ නිවාස සංවර්ධනයන්වලදී පොදු ජනතාවට සහයවීම බැංකුවේ අරමුණ වන බැවිනි. අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණ ගැනීමේ ක්‍රියාවලිය තුළ මඟපෙන්වීම් දායකත්වයන්වල ප්‍රමාණවත් බල තුලනයක් සහ අඛණ්ඩතාවයක් ඇති බව අධ්‍යක්ෂ මණ්ඩල සංයුතිය මඟින් සහතික කරයි.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය, ඉහළ මට්ටමේ ක්‍රමෝපායික තීරණ ගැනීම මඟින් බැංකුවේ සමස්ථ වගකීම් සහ වගවීම හාරගන්නා අතර සාමාන්‍යාධිකාරී/ප්‍ර.වි.නි වෙත ක්‍රමෝපායන් ක්‍රියාත්මක කිරීමේ බලය පවරා ඇති අතර ඔහු මූලිකත්වය ගන්නා සහ ඔහු විසින් නායකත්වය සහ උපදෙස් ලබාදෙන ආයතනික කළමනාකරණ කණ්ඩායම තුළින් විධායක බලය ක්‍රියාවට නංවයි. බැංකුවට ඵලදායී නායකත්ව ව්‍යූහයක් ඇති අතර ඉන් අධ්‍යක්ෂ මණ්ඩලයට කණ්ඩායමක් ලෙස සහයෝගයෙන් කටයුතු කිරීමට ඉඩ ලබා දේ.

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඔවුන්ගේ තීරණ, පළපුරුද්ද සහ ප්‍රවීණත්වය මත විශ්වාසය තබමින්, ආයතනික කාර්ය මණ්ඩලය වෙත විශාල කාර්යභාරයක් ඉටු කරමින් සහ මඟපෙන්වීමේ මූලාශ්‍රයක් ලෙස සේවය කරයි. ඒ තුළින් බැංකුවේ ක්‍රමෝපායික ප්‍රමුඛතාවන්ට සමගාමීව සම්පත්වල ඵලදායී භාවිතය, ඵලදායී අභ්‍යන්තර පාලන ක්‍රියාපටිපාටි සහ සක්‍රීය අවදානම් කළමනාකරණ යාන්ත්‍රණයක් සහතික කරනු ලබයි.

සභාපති සහ අධ්‍යක්ෂ මණ්ඩලය ඔවුන්ගේ දැඩි කැපවීම සහ දූරදර්ශී මඟපෙන්වීම තුළින් බැංකුවේ පාලනය ඉදිරියටත් සිදු කරයි. අධ්‍යක්ෂ මණ්ඩලය අවම වශයෙන් මාසයකට වරක් මුණ ගැසෙන අතර, 2023 වසර තුළ, රැස්වීම් 11ක් පවත්වා ඇත

සියලුම අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා සාමාන්‍යාධිකාරීට ඇරයුම් කරනු ලබයි. අවශ්‍ය නම් පමණක් ක්‍රමෝපායික අරමුණු ක්‍රියාත්මක කිරීම, මූල්‍ය, සමාජ සහ පාරිසරික කාර්යසාධනය, මෙහෙයුම් පරිසරයෙන් ඇතිකළ වෙනස්වීම් සහ අභියෝග, නිර්දේශිත ප්‍රතිපත්ති රාමු සහ විධායක පාලන ව්‍යුහ පිළිබඳ ප්‍රගතිය ආදී කරුණු සම්බන්ධයෙන් විස්තර කිරීම සඳහා වෙනත් විධායක නිලධාරීන් හට රැස්වීම් සඳහා ආරාධනය කෙරේ.

අධ්‍යක්ෂ මණ්ඩලය ව්‍යාපාර අවස්ථාවන් සහ බැංකුව නිරාවරණය වන ප්‍රධාන අවදානම් සැලකිල්ලට ගනිමින් ආයතනික සැලැස්ම, කාර්ය සැලැස්ම, බැංකුවේ මෙහෙවර, දැක්ම, ව්‍යාපාර පරමාර්ථ සහ ක්‍රමෝපාය සකස් කිරීම කලින් කලට සමාලෝචනය කිරීම, තක්සේරු කිරීම සහ අනුමත කිරීම සිදු කරනු ලබයි. අනුමත කිරීමට පෙර යෝජනාවල යොග්‍යභාවය සලකාබලා අධ්‍යක්ෂ මණ්ඩලය ක්‍රමෝපායික සැලැස්මට සංශෝධන යෝජනා කරයි. කළමනාකාරිත්වය අනුමත කළ පරිදි ක්‍රමෝපාය ක්‍රියාත්මක කරන අතර අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ප්‍රගති වාර්තා ඉදිරිපත් කරයි.

අධ්‍යක්ෂ මණ්ඩලයේ සංයුතිය

	අධ්‍යක්ෂවරුන්ගේ නම	පත්වීමේ දිනය	අධ්‍යක්ෂවරයාගේ වර්ගීකරණය
1	ජේ. එම්. සුසෛදාසන් මහතා සභාපති	17-05-2023	ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ
2	එස්. කේ. ඒ. ගලප්පත්ති මහතා	07-03-2023	ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ
3	බී. ආර්. මඩිහළුවා මහතා	02-05-2023	ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ
4	එච්. සී. ඩී. එල්. සිල්වා මහතා	11-01-2020	විධායක නොවන අධ්‍යක්ෂ
5	ආචාර්ය ඩී. ඒ. එම්. පෙරේරා මහතා	21-03-2023	ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ

සාමාන්‍යාධිකාරී/ ප්‍රධාන විධායක නිලධාරී (ප්‍ර.වි.නි) ගේ කාර්යයන්

සාමාන්‍යාධිකාරී/ ප්‍රධාන විධායක නිලධාරී (ප්‍ර.වි.නි.) යනු බැංකුවේ ඉහළම ශ්‍රේණියට අනුයුක්ත පුද්ගලයාය. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් බැංකුවේ සාමාන්‍යාධිකාරී/ ප්‍රධාන විධායක නිලධාරී පත්කරනු ලබයි. සාමාන්‍යාධිකාරී වෙත බැංකුවේ කළමනාකාරිත්ව සහ මෙහෙයුම් කටයුතු පවරා ඇති අතර, ඔහු විසින් ආයතනික කළමනාකරණ කණ්ඩායම මෙන්ම බැංකුවේ කළමනාකරණ කමිටු මෙහෙයවනු ලබයි.

බැංකුවේ මෙහෙයුම් හා ව්‍යාපාර කටයුතුවල එදිනෙදා කළමනාකරණය භාරව කටයුතු කරන ඉහළ විධායක නිලධාරියකු ලෙස සාමාන්‍යාධිකාරිවරයා කටයුතු කරයි. ඉහළ මට්ටමේ කළමනාකාරිත්ව තීරණ ගැනීම සඳහා බැංකුවේ සියලුම සාර්ථකත්වයන් වෙනුවෙන් ඔහු වගකීමෙන් බැඳී සිටී. සාමාන්‍යාධිකාරී/ ප්‍රධාන විධායක නිලධාරී විසින් බැංකුවේ කාර්ය සාධනය සෘජුවම අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තාකරන අතර ඒ සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට වගකීමෙන් බැඳි සිටී. බැංකුවේ සමස්ථ සාර්ථකත්වයට අමතරව, සාමාන්‍යාධිකාරී/ ප්‍රධාන විධායක නිලධාරී සංවර්ධන කටයුතු මෙහෙයවීම සහ කොටස්හිමි වටිනාකම වැඩි කිරීම අරමුණු කරගත් දිගුකාලීන ක්‍රමෝපායන් ක්‍රියාවට නැංවීම සඳහා වගකීමෙන් බැඳි සිටී. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වෙනත් ආකාරයක උපදෙස් ලබා දී ඇත්නම් පමණක් සාමාන්‍යාධිකාරී අධ්‍යක්ෂ මණ්ඩලයේ සෑම රැස්වීමටකම පැමිණ සහභාගිවන නමුත් එහිදී ඡන්දය ප්‍රකාශ කිරීමේ අයිතිය ඔහුට නොමැත.

මෙය ඉතා වගකීම් සහගත තනතුරක් මෙන්ම බැංකු ක්ෂේත්‍රයේ විවිධ අංශ සහ මට්ටම්වල වසර ගණනාවක පළපුරුද්ද අවශ්‍ය වන බැවින්, බැංකුවේ සාමාන්‍යාධිකාරී/ ප්‍රධාන විධායක නිලධාරීට බැංකුව තුළ සෑම මට්ටමකම සිදුවන මෙහෙයුම් පිළිබඳ ගැඹුරු දැනුමක් ඇත. ඔහු බැංකුවේ මෙහෙයුම්වල ප්‍රධානී ලෙස, බැංකුවේ කළමනාකරණයේ සියලුම අංශ පාලනය සඳහා ඔහු වෙත පැවරී ඇති රාජකාරී දැඩිව අනුගමනය කරයි.

2023 වර්ෂයේ පැවති රැස්වීම් සඳහා අධ්‍යක්ෂවරුන්ගේ පැමිණීම පිළිබඳ මෙම වාර්ෂික වාර්තාවේ අධ්‍යක්ෂ වාර්තාවේ දක්වා ඇත. මහ බැංකුවේ උපදෙස් අනුව සභාපතිවරයාගේ සහ ප්‍රධාන විධායක නිලධාරියාගේ අධිකාරිය සහ වගකීම් වෙන් වෙන්ව දක්වා ඇත.

අධ්‍යක්ෂ මණ්ඩල අනු කමිටුව

බැංකුව විසින් අධ්‍යක්ෂ මණ්ඩලය අනුකමිටු හතරක් (4) පිහිටුවා ඇති අතර ඒවා සෘජුවම අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කළ යුතුය. අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටු, සාමාන්‍යයෙන් එකිනෙකාගෙන් ස්වාධීනව කටයුතු කරන අතර, සමස්ත අධ්‍යක්ෂ මණ්ඩලයට සහයවීමේදී ඒවා වෙත ප්‍රමාණවත් බලය, සම්පත් සහ පැවරුණු වගකීම් ලබා දේ.

අනු කමිටුව පහත පරිදි වේ;

1. අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව (BAC)
2. අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව (BHRRC)
3. අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා කමිටුව (BNC)
4. අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව (BIRMC).

මෙම වාර්ෂික වාර්තාවේ අනුකමිටු වාර්තාව තුළ මෙම අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටුවල විෂය පථයන් විස්තර කර ඇති අතර අදාළ ක්ෂේත්‍රය තුළ පළපුරුද්ද සහ ප්‍රවීණත්වය සහිත විධායක නොවන අධ්‍යක්ෂවරුන් විසින් මෙම කමිටු මෙහෙයවනු ලබයි.

මෙම අධ්‍යක්ෂ මණ්ඩල අනු කමිටුව (BAC) බැංකුවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය, විගණන ක්‍රියාවලිය, බැංකුවේ අභ්‍යන්තර පාලන පද්ධති සහ නීති සහ රෙගුලාසිවලට අනුකූලව අධීක්ෂණ කටයුතු සිදුකරනු ලබයි. මේ තුළින් මූල්‍ය ප්‍රකාශන කෙරෙහි අනාගත බලපෑම අවබෝධ කර ගැනීම සඳහා වැදගත් ගිණුම්කරණ සහ වාර්තාකරණ ගැටලු සහ මෑතකාලීන ව්‍යත්තීමය හා නියාමන ප්‍රකාශනයන් සමාලෝචනය කිරීම අරමුණු කරයි. වාර්තා සම්පූර්ණ සහ නිරවද්‍ය වන්නේද යන්න තක්සේරු කිරීම සඳහා කළමනාකරණය විසින් අභ්‍යන්තර අතුරු මූල්‍ය තොතුරු සංවර්ධනය කරන ආකාරය පිළිබඳ අවබෝධයක් ලබා ගැනීම අවශ්‍ය වේ.

අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව (BHRRC) අධ්‍යක්ෂවරු, සාමාන්‍යාධිකාරී/ ප්‍ර.වි.නි. සහ ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලය සඳහා ඉලක්ක සහ අරමුණු සකස් කරන අතර, වරින් වර සකස් කළ ඉලක්ක සහ අරමුණු අනුව ඒවායේ කාර්යසාධනය ඇගයීම, පාරිශ්‍රමික, ප්‍රතිලාභ සහ අනෙකුත් කාර්යසාධන පදනම් දිරිදීමනා ගෙවීම් සමාලෝචනය සඳහා පදනම් තීරණය කරයි. අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව වෙත පැවරී ඇති මූලික වගකීම් ලෙස බැංකුව වෙනුවෙන් මානව සම්පත් සංවර්ධන ක්‍රමෝපායන් සංවර්ධනය සහ සමාලෝචනය සහ සියලුම කාර්ය මණ්ඩලයට අදාළ කරුණු ඇතුළුව සියලුම මානව සම්පත් ගැටලු පිළිබඳ අනෙකුත් අධ්‍යක්ෂ මණ්ඩල අනු කමිටු සහ මෙහෙයුම් කමිටු සමඟ උපදේශක භූමිකාවක් පවත්වා ගැනීම ආදිය දැක්විය හැකිය.

ආයතනික පාලනය

සාමාන්‍යාධිකාරී/ ප්‍ර.වි.නි සහ ප්‍රධාන කළමනාරණ කාර්ය මණ්ඩල තෝරා ගැනීම/පත්කිරීම සඳහා ක්‍රියාපටිපාටියක් ක්‍රියාත්මක කිරීම සහ සාමාන්‍යාධිකාරී/ප්‍ර.වි.නි. තනතුරට සහ ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩල තනතුරුවලට පත් කිරීම හෝ උසස් කිරීම සඳහා සලකා බැලිය යුතු යෝග්‍යතාව සඳහා අවශ්‍ය සුදුසුකම්, පළපුරුද්ද සහ මූලික සුදුසුකම් වැනි නිර්ණායක තීරණය කිරීම වැනි වගකීම් අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා කමිටුව (BNC) වෙත පැවරී ඇත. ඒ අනුව මෙම කමිටුව බැංකුවේ ආයතනික පාලනයේ කොටසක් ලෙස කටයුතු කරයි. කමිටුව විසින් අධ්‍යක්ෂවරු සහ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් නැවත සේවයේ යෙදීම සඳහා අවශ්‍යවන අතිරේක/ නව නිපුණතා සහ අනුප්‍රාප්තික කටයුතු වරින් වර සලකා බලා අනුමත කරනු ලබයි.

අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව (BIRMC) විසින් සුදුසු අවදානම් දර්ශක හා කළමනාකරණ තොරතුරු යොදා ගනිමින් බැංකුවට ඇති ණය, වෙළඳපොළ, ද්‍රවශීලතා, මෙහෙයුම් සහ ක්‍රමෝපායික අවදානම් යන සියලුම අවදානම් තක්සේරු කරයි. මෙම කමිටුව මඟින් සියලුම කළමනාකාරීත්ව මට්ටමේ කමිටුවල ප්‍රමාණවත් බව සහ ඵලදායීත්වය සමාලෝචනය කරනු ලබයි. නිදසුනක් ලෙස කමිටුව විසින් නිර්දේෂ කොට ඇති විශේෂ අවදානම් පිළිබඳ සලකා බැලීම සහ එවැනි අවදානම් ප්‍රමාණාත්මක සහ ගුණාත්මක අවදානම් සීමාවන් තුළ එකී අවදානම් කළමනාකරණය කිරීම සඳහා වන ණය කමිටුව සහ වත්කම්-වගකීම් කමිටුව දැක්විය හැකිය. එකී අවදානම් බැංකුවේ ප්‍රතිපත්ති සහ නියාමන සහ අධීක්ෂණ අවශ්‍යතා මත පදනම්ව කමිටුව විසින් තීරණය කරන මට්ටම්වලින් එපිට පවතින අවස්ථාවලදී, එවැනි විශේෂ අවදානම්වල බලපෑම් අවම කිරීම සඳහා කඩිනම් නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග මෙම කමිටුව විසින් ගනු ලබයි.

අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව (BAC) සහ අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව විසින් (BIRMC) අභ්‍යන්තර පාලනයේ ප්‍රමාණවත් බව සහ විශ්වාසනීයත්වය පිළිබඳ සමාලෝචනය කර තීරණ ගැනීමට සහ මූල්‍ය තොරතුරු සහ ඒවායේ විශ්වසනීයත්වය, ක්ෂේත්‍රයේ ප්‍රධාන අවදානම් අංග සහ බැංකුවේ සුදුසු අවදානම් සාධක සහ ආයතනික පාලනය සමාලෝචනය කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට සහය වේ. ආයතනික පාලන භාවිතයන්ට අනුකූල වන මෙහෙයුම් මට්ටමට පූර්ණ පාලනය ලබා දීම වෙනුවට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙහෙයුම් පාලනයක් කරනු ලබයි.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ යහපත් අවදානම් කළමනාකරණය විසින් බැංකුව තුළ අවදානම් සහ පාර්ශ්වයන් අතර බැදියා ගැටුම් අවම මට්ටමක පවතින බැව් සඳහන් කරයි. මෙකී අවදානම් කළමනාකරණය යහපත් මට්ටමින් පවත්වා ගැනීම බැංකුවේ කාර්යසාධනය වර්ධනය කිරීමට හේතු වී ඇත.

කළමනාකරණ කමිටු

බාසල් මාර්ගෝපදේශවලට අනුගත වෙමින්, අධ්‍යක්ෂ මණ්ඩලය එදිනෙදා කළමනාකරණයට සහභාගී නොවිය යුතු වුවද කළමනාකරණය විනිශ්චය කිරීමට ප්‍රමාණවත් තොරතුරු ලබාගත යුතුය. බැංකුවේ කටයුතු කළමනාකරණය කිරීමේදී අධ්‍යක්ෂ මණ්ඩලය මඟින් සාමාන්‍යාධිකාරී/ ප්‍රධාන විධායක නිලධාරී විසින් මෙහෙයවනු ලබන ප්‍රධාන කාර්ය මණ්ඩලය සමන්විත යම් විශේෂිත කමිටුවලට ව්‍යාපාර මෙහෙයුම් පවරා ඇත. අධ්‍යක්ෂ මණ්ඩලයට එහි පාලන කාර්යයන්හිදී සහයවීම සඳහා මෙවැනි කමිටු ස්ථාපිත කරනු ලැබ ඇත. මෙම කමිටු විසින් වාර්තා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුය. එමඟින් ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලය විසින් බැංකුවේ එදිනෙදා කටයුතු ආරක්ෂිත සහ යහපත් ආකාරයෙන් සිදු කරන බවට අධ්‍යක්ෂ මණ්ඩලය වෙත මඟ පෙන්වීම සහ අධීක්ෂණය සඳහා අවස්ථාව උදා කරයි.

මෙම සන්දර්භය තුළ, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටුවලට අමතරව පහත සඳහන් කළමනාකරණ කමිටු පත් කර ඇත.

1. විධායක ණය කමිටුව (ECC)
2. වත්කම්/ වගකීම් කළමනාකරණ කමිටුව (ALCO)
3. අලෙවිකරණ කමිටුව (MC)
4. නිෂ්පාදන සංවර්ධන කමිටුව (PDC)
5. අයකිරීම් කමිටුව (RC)
6. විධායක ඒකාබද්ධ අවදානම් කළමනාකණ කමිටුව (EIRMC)

අධ්‍යක්ෂ මණ්ඩලයේ උපදේශය සහ පාලනය යටතේ ජේෂ්ඨ කළමනාකරණය විසින් ව්‍යාපාර ක්‍රමෝපාය, අවදානම් රුචිය, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත පාරිශ්‍රමිකය සහ අනෙකුත් ප්‍රතිපත්තිවලට අනුරූප වන ආකාරයකින් බැංකුවේ කටයුතු සිදුකර පාලනය කළ යුතු අතර, ඒ අනුව ඉහත සඳහන් කළමනාකරණ කමිටුවල සාමාජිකයින්ට ඔවුන්ගේ අධීක්ෂණ යටතේ ව්‍යාපාරය සහ සේවකයින් කළමනාකරණය කර ගැනීමට අවශ්‍ය පළපුරුද්ද, දක්ෂතා සහ විශ්වාසනීයත්වය තිබිය යුතු අතර ඔවුන්ගේ දක්ෂතා පවත්වා ගැනීමට සහ වර්ධනය කර ගැනීමට මෙන්ම ඔවුන් වගකීමට බැඳී සිටින ක්ෂේත්‍රවලට අදාළ සංවර්ධනයන් පිළිබඳ යාවත්කාලීනකර තබා ගැනීම සඳහා විධිමත් ප්‍රහුණුවක් වෙනුවෙන් අවස්ථාව උදා කරයි. ශාඛා කළමනාකරුවන්, ජේෂ්ඨ කළමනාකරණය සමඟ මාසයකට එක්වරක් ප්‍රගති සමාලෝචන රැස්වීම්වලට සහභාගී වේ.

බැංකු අනුකූලතා අවශ්‍යතා පිළිබඳ විගණකාධිපතිගේ වාර්තාව



ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE



මගේ අංකය எனது இல. My No. } BAN/F/SMIB/CG/2023/16 ඔබේ අංකය உமது இல. Your No. } දිනය திகதி Date } 16 May 2024

සභාපති,

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත්කර ඇති ආයතනික පාලන විධිවිධාන සපුරාලීම සඳහා අනුකූලවීමේ අවශ්‍යතා සම්බන්ධයෙන් රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ සිද්ධි වාචක සෙවීම් පිළිබඳ, 2023 දෙසැම්බර් 31 දිනට විගණකාධිපතිගේ වාර්තාව.

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත්කර ඇති ආයතනික පාලන විධිවිධාන සඳහා අනුකූලවීමේ අවශ්‍යතා සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පිළියෙලකර ඉදිරිපත්කර ඇති පාලන වාර්තාව සම්බන්ධයෙන් මෙම වාර්තාවේ ඇමුණුමට සම්බන්ධකර ඇති ක්‍රියාපටිපාටි ක්‍රියාවට නැංවීම මා විසින් සිදුකරනු ලැබ ඇත. එකඟ වූ ක්‍රියාමාර්ග සඳහා අදාලවන සම්බන්ධිත සේවා පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රමිති 4400 (SLSRS 4400) හි දක්වා ඇති මූලධර්මවලට අනුකූලව මෙම කටයුතු සිදුකර ඇත. ආයතනික පාලන විධිවිධානයන්ට අනුකූලවීමේ අවශ්‍යතාවය සපුරාලීම සඳහා ඔබට සහයවීම පිණිස පමණක් මෙම ක්‍රියාපටිපාටි ඉටුකර ඇත.

මාගේ සොයා ගැනීම් මෙම වාර්තාට අදාල ඇමුණුමෙහි මා විසින් දක්වා ඇත.

ඉහත ක්‍රියාපටිපාටි ශ්‍රී ලංකා විගණන ප්‍රමිති හෝ සමාලෝචන බැඳීම් සම්බන්ධයෙන් වන ශ්‍රී ලංකා ප්‍රමිතිවලට අනුකූලව සිදුකළ විගණනයක් හෝ සමාලෝචනයක් නොවන බැවින්, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත්කර ඇති ආයතනික පාලන විධිවිධාන සඳහා අනුකූලවීම සම්බන්ධයෙන් මම කිසිදු සහතික කිරීමක් ප්‍රකාශ නොකරමි.

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති හෝ සමාලෝචන කටයුතු පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රමිති අනුව පාලන වාර්තාවේ විගණනයක් හෝ සමාලෝචනයක් හෝ අතිරේක ක්‍රියාමාර්ග ඉටුකර තිබුණි නම් ඔබට වාර්තාකළ යුතුව තිබූ අනෙකුත් කරුණු සම්බන්ධයෙන් මාගේ අවධානයට ලක්විය යුතුව තිබුණි.

මාගේ වාර්තාව මෙම වාර්තාවේ පළමුවන පරිච්ඡේදයේ විස්තරකර ඇති කාර්යයන් සඳහා සහ ඔබගේ දැනගැනීම පිණිස පමණක් වන අතර, එය වෙනත් අරමුණු සඳහා හෝ වෙනත් කිසිම පාර්ශවයක් සඳහා ලබාදීම පිණිස නොවේ.

මෙම වාර්තාව ඉහත දක්වා ඇති අයිතමයන් සම්බන්ධයෙන් පමණක් වන අතර, සමස්ථයක් ලෙස ගත්විට රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ කිසියම් මූල්‍ය ප්‍රකාශයක් සම්බන්ධයෙන් විස්තර දැක්වීමක් නොවේ.

ඩබ් පී සී වික්‍රමරත්න
විගණකාධිපති

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.
No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34
+94 11 2 88 72 23
ag@auditorgeneral.gov.lk
www.naosl.gov.lk

ආයතනික පාලනය

ඇමුණුම - තථ්‍ය ප්‍රතිවල වාර්තාව

අනුක්‍රමික අංකය	විස්තර	යොමුව
3.1	**අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම්**	
3.1.i	මණ්ඩලය සහතික කිරීම සඳහා සිදු කළ යුතු ක්‍රියා පටිපාටි බැංකුවේ ආරක්ෂාව සහ සෞභාග්‍ය ශක්තිමත් කර ඇත.	
3.1.i.අ	බැංකුවේ උපාය මාර්ගික අරමුණු සහ ආයතනික වටිනාකම් පිළිබඳ මණ්ඩල අනුමැතිය පරීක්ෂා කරන්න.	සංශෝධිත ආයතනික සැලැස්ම (2023-2027) 2023.12.15 දින පැවති රැස්වීමේදී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලදී (මණ්ඩල පත්‍රිකාව අංක 23/07/BD(APP)/09)
	බැංකුව විසින් බැංකුවේ උපාය මාර්ගික අරමුණු සහ ආයතනික වටිනාකම් බැංකුව පුරා සන්නිවේදනය කර ඇත්දැයි පරීක්ෂා කරන්න.	2023 වර්ෂය තුළ පවත්වන ලද ජ්‍යෙෂ්ඨ කළමනාකරණ රැස්වීම් සහ ශාඛා කළමණාකරුවන්ගේ රැස්වීම් වලදී උපාය මාර්ගික අරමුණු සහ ආයතනික වටිනාකම් එක් එක් අංශවල දෙපාර්තමේන්තු ප්‍රධානීන් හරහා සන්නිවේදනය කරනු ලැබේ.
3.1.i.ආ	බැංකුවේ සමස්ත ව්‍යාපාර උපායමාර්ගයේ මණ්ඩල අනුමැතිය පරීක්ෂා කරන්න.	අනුමත ආයතනික සැලැස්මට (2023-2027) ඇතුළත් සමස්ත ව්‍යාපාරික උපාය (ආයතනික දැක්ම, මෙහෙවර සහ අරමුණු). මණ්ඩල පත්‍රිකාව අංක 23/07/BD(APP)/09
	සමස්ත ව්‍යාපාර උපාය මාර්ගයට සමස්ත අවදානම් ප්‍රතිපත්තිය, අවදානම් කළමනාකරණ ක්‍රියා පටිපාටි සහ යාන්ත්‍රණ ඇතුළත් දැයි පරීක්ෂා කර ඒවා ලේඛනගත කර ඇත්දැයි පරීක්ෂා කරන්න.	අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඒකාබද්ධ අවදානම් කළමනාකරණ (IRM) ප්‍රතිපත්තිය (2018 අගෝස්තු 09 දිනැති මණ්ඩල පත්‍රිකා අංක 18.09.132.04.03) අනුමත කර ඇති අතර ක්‍රමෝපායික, ණය, වෙළෙඳපොළ සහ මෙහෙයුම් අවදානම් හඳුනාගැනීම, මැනීම සහ අවම කිරීම සඳහා වන ක්‍රියා පටිපාටි ගෙනහැර දක්වයි.
	සමස්ත ව්‍යාපාරික උපාය මාර්ගයේ අවම වශයෙන් ඉදිරි වසර තුන සඳහා මැනිය හැකි ඉලක්ක තිබේදැයි පරීක්ෂා කරන්න.	උපායමාර්ගික ව්‍යාපාර සැලැස්මට උපාය මාර්ගික ඉලක්ක සහ ඉදිරි වසර තුන සඳහා මැනිය හැකි ඉලක්ක විස්තර කරන ක්‍රියාකාරී සැලැස්ම (2023-2027) ඇතුළත් වේ.
3.1.i.ඇ	මණ්ඩලය විසින් හඳුනාගෙන ඇති අවදානම් කළමනාකරණය සඳහා සුදුසු පද්ධති විචක්ෂණශීලී සහ නිසි ලෙස ක්‍රියාත්මක කර ඇත්දැයි පරීක්ෂා කරන්න.	මණ්ඩලය විසින් අනුමත කරන ලද TOR අනුව ලබා දී ඇති නියෝජිත අධිකාරිය යටතේ ක්‍රියා කිරීම සඳහා මණ්ඩලය විසින් ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව (BIRMC) වෙත පවරා ඇත. හඳුනාගත් ප්‍රධාන අවදානම් ක්ෂේත්‍ර තක්සේරු කිරීමට සහ බැංකුවේ ඒකාබද්ධ අවදානම් කළමනාකරණ රාමුව, අවදානම් තක්සේරු රාමුව සහ අවදානම් රුචිය සමාලෝචනය/අනුමත කිරීමට BIRMC වරින් වර රැස්වේ. BIRMC ප්‍රධාන අවදානම් මැනීමට, නිරීක්ෂණය කිරීමට සහ කළමනාකරණය කිරීමට පද්ධති ක්‍රියාත්මක කරයි. BIRMC විසින් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලදී සාකච්ඡා කිරීමට සහ අවදානම් අවම කිරීම සඳහා උපාය මාර්ගික තීරණ ගැනීමට KRIs, Stress testing results සහ BIRMC /රැස්වීම් වල අවදානම් තක්සේරු වාර්තාව ඉදිරිපත් කරයි. ප්‍රධාන අවදානම් දර්ශක සහ අවදානම් රුචිය මණ්ඩලය විසින් සකසා ඇත.
3.1.i.ඈ	තැන්පත්කරුවන්, ණයහිමියන්, කොටස් හිමියන් සහ ණය ගැණුම්කරුවන් ඇතුළු සියලුම පාර්ශවකරුවන් සමඟ සන්නිවේදන ප්‍රතිපත්තියක් මණ්ඩලය අනුමත කර ක්‍රියාත්මක කර ඇත්දැයි පරීක්ෂා කරන්න;	පාර්ශවකරුවන් සමඟ සන්නිවේදන ප්‍රතිපත්තිය 2015 වසරේ මණ්ඩලය විසින් අනුමත කර ඇත. (BP අංක 15.11.155.01-15/11/08).
3.1.i.ඉ	බැංකුවේ අභ්‍යන්තර පාලන පද්ධති සහ කළමනාකරණ තොරතුරු පද්ධතිවල ප්‍රමාණවත් බව සහ අඛණ්ඩතාව මණ්ඩලය විසින් සමාලෝචනය කර ඇත්දැයි පරීක්ෂා කරන්න.	**අභ්‍යන්තර පාලන පද්ධති** මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අභ්‍යන්තර පාලනය සැලසුම් කිරීම සහ සඵලතාවය පිළිබඳ ක්‍රියාවලිය හරහා මණ්ඩලය විසින් බැංකුවේ අභ්‍යන්තර පාලන පද්ධතිවල නිරවද්‍යතාවය හඳුනාගැනීම සඳහා වාර්ෂික මණ්ඩල යාන්ත්‍රණයක් බැංකුවේ පවතී. තවද බැංකුවේ අභ්‍යන්තර විගණන අංශය ඔවුන්ගේ සාමාන්‍ය විගණන හරහා සඵලතාවය තහවුරු කිරීමේ ක්‍රියාවලියට වටිනාකමක් එක් කරයි. **කළමනාකරණ තොරතුරු පද්ධති** අධ්‍යක්ෂ මණ්ඩලය සහ මණ්ඩල අනු කමිටු විසින් භාවිතා කරනු ලබන සියලුම මූල්‍ය/මූල්‍ය නොවන තොරතුරු වල විශ්වසනීයත්වය සහ නිරවද්‍යතාවය සමාලෝචනය කිරීම සඳහා අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව/ ස්වාධීන පාර්ශවය විසින් වලංගු ක්‍රියාවලියක් ආරම්භ කළ යුතුය.

අනුක්‍රමික අංකය	විස්තර	යොමුව
3.1.i.ඊ	2015 දෙසැම්බර් 02 දින නිකුත් කරන ලද බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ මාර්ගෝපදේශ අංක 02/17/550/0002/003 පසුව 2020 ජනවාරි 1 වන දින සිට බලපැවැත්වෙන 2019 අංක 01 දරන බැංකු පනත මගින් සංශෝධනය කරන ලද 2010 3 දරන බැංකු පනතේ නිර්ණය කර ඇති පරිදි LCB හි විධායක කාර්යයන් ඉටු කරන නිලධාරීන් ලෙස මණ්ඩලය විසින් ප්‍රධාන කළමනාකරණ පුද්ගලයින් හඳුනාගෙන නම් කර ඇත්දැයි පරීක්ෂා කරන්න.	සාමාන්‍යාධිකාරී, DGM, AGM, ජ්‍යෙෂ්ඨ ගණකාධිකාරී, ප්‍රධාන අභ්‍යන්තර විගණක, අනුකූලතා නිලධාරී සහ අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් යන අය බැංකුවේ ප්‍රධාන කළමනාකාරිත්වයේ නිලධාරීන් ලෙස මණ්ඩලය විසින් හඳුනාගෙන තිබුණි. අපි සාක්ෂි වශයෙන් 2015.12.11 දිනැති මණ්ඩල ව්‍යවස්ථාව නිරීක්ෂණය කළෙමු.
3.1.i. උ	මණ්ඩලයේ ප්‍රතිපත්තිවලට අනුකූල වන ප්‍රධාන කළමනාකාරිත්වයේ පුද්ගලයන් විසින් බැංකුවේ කටයුතු පිළිබඳ නිසි අධීක්ෂණයක් මණ්ඩලය විසින් සිදු කර ඇත්දැයි පරීක්ෂා කරන්න.	KMPs ඔවුන්ගේ විෂය පථය යටතේ ඇති කරුණු පිළිබඳව මණ්ඩලයට සහ අනු කමිටු වෙත නිතිපතා ඉදිරිපත් කරයි. සමාලෝචිත මණ්ඩල පත්‍රිකාව අංක 23/07/BD(APP)/05, BIRMC පත්‍රය අංක 23/BR/03/11 සහ BHRMC පත්‍රය අංක 23/05/BHRMC/0ſ).
3.1.i.ඌ	මණ්ඩලයේ අධ්‍යක්ෂවරුන් සඳහාම සහ ප්‍රධාන කළමනාකාරිත්වයේ නිලධාරීන් සඳහා වන අධිකාරී ක්ෂේත්‍ර සහ ප්‍රධාන වගකීම් මණ්ඩලය විසින් නිර්වචනය කර ඇත්දැයි පරීක්ෂා කරන්න.	අධ්‍යක්ෂවරුන්ගේ බලතල සහ අධිකාරිය 1975 අංක 13 SMIB නීතියේ 07 වගන්තිය යටතේ අර්ථ දක්වා ඇත. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අධ්‍යක්ෂ මණ්ඩල අනු කමිටු සඳහා අධ්‍යක්ෂවරුන් පත් කර ඇති අතර එක් එක් කමිටුවේ ප්‍රඥප්තිය/TOR වගකීම් නිර්වචනය කරයි. KMP වගකීම් ඔවුන්ගේ රැකියා විස්තරවල ලැයිස්තුගත කර ඇති අතර බලය පැවරී ඇති අධිකාරිය යටතේ අර්ථ දක්වා ඇත.
3.1.i.එ	(i) අධ්‍යක්ෂවරුන් සහ ප්‍රධාන කළමනාකාරිත්වයේ පුද්ගලයින් තෝරා ගැනීම, නම් කිරීම සහ තේරී පත්වීම ඇතුළුව; (ii) අවශ්‍යතා අතර ගැටුම් කළමනාකරණය කිරීම; සහ (iii) දුර්වලතා නිර්ණය කිරීම සහ අවශ්‍ය අවස්ථාවලදී වෙනස්කම් ක්‍රියාත්මක කිරීම. අධ්‍යක්ෂ මණ්ඩලයේ අධ්‍යක්ෂවරුන්ගේම පාලන ක්‍රමවල සඵලතාවය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වරින් වර තක්සේරු කර ඇත්දැයි පරීක්ෂා කරන්න.	1975 අංක 13 දරන SMIB නීතියට අනුව අමාත්‍යවරයා විසින් අධ්‍යක්ෂ මණ්ඩල තෝරා ගැනීම, නම් කිරීම සහ තේරී පත් කිරීම සිදු කරයි. දුර්වලතා සහ වෙනස්කම් ක්‍රියාත්මක කිරීම වාර්ෂික ස්වයං ඇගයීම් සාරාංශය ඉදිරිපත් කිරීම හරහා වසර අවසානයේ දී මණ්ඩලය විසින් සාකච්ඡා කර තීරණය කරනු ලැබේ. අධ්‍යක්ෂවරුන් තම ස්වයං-ඇගයුම් ආකෘති පත්‍රවලින් තහවුරු කළේ මණ්ඩලය තමන්ගේම පාලන භාවිතයන් පිළිබඳ වාර්ෂික ඇගයීමක් සිදු කර ඇති බවයි. 2023 වසර සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්පූර්ණ කරන ලද ස්වයං ඇගයීම් ආකෘති පත්‍ර නිරීක්ෂණය කරන ලදී.
3.1.i.ඒ	ප්‍රධාන කළමනාකාරිත්වයේ පුද්ගලයින් සඳහා අනුප්‍රාප්තික සැලැස්මක් මණ්ඩලය සතුව ඇත්දැයි පරීක්ෂා කරන්න.	ප්‍රධාන කළමනාකාරිත්වයේ පුද්ගලයින් සඳහා අනුප්‍රාප්තික ප්‍රතිපත්තියක් සහ අනුප්‍රාප්තික සැලැස්මක් 2023 ජූලි 20 දින මණ්ඩලය විසින් අනුමත කරන ලදී.
3.1.i.ඔ	ප්‍රතිපත්ති සමාලෝචනය කිරීමට, සන්නිවේදන මාර්ග ස්ථාපිත කිරීමට සහ ආයතනික අරමුණු කරා ප්‍රගතිය නිරීක්ෂණය කිරීමට මණ්ඩලය ප්‍රධාන කළමනාකාරිත්වයේ නිලධාරීන් සමඟ නිතිපතා රැස්වීම් සැලසුම් කර තිබේදැයි පරීක්ෂා කරන්න.	ප්‍රධාන කළමනාකාරිත්ව පුද්ගලයෝ තම වගකීම් ක්ෂේත්‍රවලට අදාළ කාර්ය සාධනය, උපාය මාර්ග, ප්‍රතිපත්ති සහ අනෙකුත් කාරණා සම්බන්ධයෙන් ප්‍රගතිය පිළිබඳ මණ්ඩලයේ සහ එහි අනු කමිටු රැස්වීමේ දී නිරන්තර සාකච්ඡාවලට සම්බන්ධ වෙති.
3.1.i.ඕ	නියාමන පරිසරය අවබෝධ කර ගැනීම සඳහා මණ්ඩලය විසින් ක්‍රියාමාර්ග සහ ක්‍රියාදාමයන් ගෙන ඇති බවත් බැංකුව නියාමකයින් සමඟ සබඳතාවක් පවත්වාගෙන යන බවත් පරීක්ෂා කරන්න.	නියාමන පරිසරය සහ බැංකුව නියාමකයින් සමඟ සබඳතාවක් පවත්වාගෙන යන බව අවබෝධ කර ගැනීම සඳහා මණ්ඩලය විසින් ක්‍රියාමාර්ග සහ ක්‍රියාදාමයන් ගෙන ඇත. සමාගම් ලේකම් විසින් මෑත වාර්ෂික වාර්තාවේ පිටපත්, ආයතනික පාලන නියෝග සහ SMIB පනතේ පිටපතක් මණ්ඩලයේ සියලුම සාමාජිකයින් වෙත ලබා දී ඇත. නියාමන අනුකූලතා වාර්තා කාලෝචිත ලෙස CBSL වෙත ඉදිරිපත් කරනු ලබන අතර, CBSL ව්‍යවස්ථාපිත වාර්තා ලැබුණු විට, මණ්ඩලය ඒ අනුව අවශ්‍ය ක්‍රියාමාර්ග ගනී.
3.1.i.ඖ	බාහිර විගණකවරුන් බඳවා ගැනීම සහ අධීක්ෂණය කිරීම සඳහා මණ්ඩලයට ක්‍රියාවලියක් තිබේදැයි පරීක්ෂා කරන්න.	අදාළ නොවේ. GOSL හි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සහ 1975 අංක 13 දරන රාජ්‍ය උකස් සහ ආයෝජන බැංකු නීතියට අනුව, විගණකාධිපතිවරයා බැංකුවේ බාහිර විගණකවරයා වේ.

ආයතනික පාලනය

අනුක්‍රමික අංකය	විස්තර	යොමුව
3.1.ii	මණ්ඩලය විසින් සභාපතිවරයා සහ ප්‍රධාන විධායක නිලධාරියා (CEO) පත් කර ඇත්දැයි පරීක්ෂා කරන්න. සභාපතිවරයාගේ සහ ප්‍රධාන විධායක නිලධාරියාගේ කාර්යයන් සහ වගකීම් මෙම උපදෙස්වල 3(5) විධානයට අනුකූලදැයි පරීක්ෂා කරන්න.	SMIB පනතේ 14 (1) වගන්තිය අනුව බැංකුවේ සභාපතිවරයා රේඛීය අමාත්‍යාංශයේ අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන අතර SMIB පනතේ 20 වැනි වගන්තිය අනුව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ප්‍රධාන විධායක නිලධාරී (සාමාන්‍යාධිකාරී) පත් කරනු ලැබේ. **අධ්‍යක්ෂවරයාගේ නම** — **තනතුරට පත් වූ දිනය** ජේ. එම්. සුසෙදාසන් මහතා සභාපති — 2023.05.17 එස්. කේ. ඒ. ගලප්පත්ති මහතා — 2023.03.07 ආචාර්ය ඩී. ඒ. එම්. පෙරේරා මහතා — 2023.03.21 බී. ආර්. මඩිහහේවා මහතා — 2023.05.02 එච්. සී. ඩී. එල්. සිල්වා මහතා — 2023.01.01
3.1.iii	මණ්ඩලය නිතිපතා රැස්වී ඇති අතර අවම වශයෙන් වසරකට දොළොස් වතාවක් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් දළ වශයෙන් මාසික කාල පරතරයක් ඇතිව පැවැත්වී ඇත්දැයි පරීක්ෂා කරන්න.	2023 වර්ෂය තුළ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 12 ක් පවත්වා ඇත. කෙසේ වෙතත්, මණ්ඩලයක් නොමැතිවීම හේතුවෙන් පළමු අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම 2023.06.26 දින පැවැත්විණි.
3.1.iv	ව්‍යාපාර ප්‍රවර්ධනයට සහ බැංකුවේ අවදානම් කළමනාකරණයට අදාළ කරුණු සහ යෝජනා සාමාන්‍ය මණ්ඩල රැස්වීම් සඳහා වන නඩුවට ඇතුළත් කිරීමට සියලුම අධ්‍යක්ෂවරුන්ට හැකි වන පරිදි ක්‍රියා පටිපාටියක් මණ්ඩලය සතුව තිබේදැයි පරීක්ෂා කරන්න.	පුරුද්දක් ලෙස, මණ්ඩලය විසින් සියලුම අධ්‍යක්ෂවරුන්ට සාමාන්‍ය මණ්ඩල රැස්වීම් සඳහා නඩුවට පත්‍රයට කරුණු සහ යෝජනා ඇතුළත් කිරීමට හැකියාව ලබා දේ. එවැනි ඕනෑම කරුණක් නඩුව පත්‍රයට ඇතුළත් කිරීමට සම්බන්ධ කර ගැනීමට ලේකම්වරයාට හැකි විය.
3.1.v	සියලුම අධ්‍යක්ෂවරුන්ට සහභාගී වීමට අවස්ථාවක් ලබා දීම සඳහා මණ්ඩලය අවම වශයෙන් දින 7ක දැනුම්දීමක් ලබා දී ඇත්දැයි පරීක්ෂා කරන්න. සහ අනෙකුත් සියලුම මණ්ඩල රැස්වීම් සඳහා දැනුම් දී ඇත.	රැස්වීමේ දැනුම්දීම සහ රැස්වීම සඳහා නඩුව පත්‍රය ලේකම්වරයා විසින් රැස්වීමට අවම වශයෙන් දින 7කට පෙර සියලුම අධ්‍යක්ෂවරුන් වෙත බෙදා හරින ලදී.
3.1.vi	ඊට පෙර මාස 12 ක කාලය තුළ අවම වශයෙන් තුනෙන් දෙකක් රැස්වීම්වලට නොපැමිණි හෝ ඊට පෙර අඛණ්ඩව පැවැත්වූ රැස්වීම් තුනකට නොපැමිණි අධ්‍යක්ෂවරුන් සම්බන්ධයෙන් මණ්ඩලය අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන තිබේදැයි පරීක්ෂා කරන්න. කෙසේ වෙතත්, පැමිණීම ලෙස පිළිගත හැකි පරිදි විකල්ප අධ්‍යක්ෂවරයෙකු හරහා අධ්‍යක්ෂවරුන්ගේ රැස්වීම්වලට සහභාගී වීම.	මණ්ඩල ලේකම් යනු ශ්‍රී ලංකා වරලත් ආයතනික ලේකම්වරුන්ගේ ආයතනයේ ආශ්‍රිත සාමාජිකයෙකි.
3.1.vii	1988 අංක 30 දරන බැංකු පනතේ 43 වැනි වගන්තියේ විධිවිධාන තෘප්තිමත් කරන සමාගම් ලේකම්වරයකු මණ්ඩලය විසින් පත් කර ඇති අතර, එහි මූලික වගකීම වන්නේ මණ්ඩලයේ සහ කොටස් හිමියන්ගේ රැස්වීම් සඳහා ලේකම් කාර්යාල සේවා හැසිරවීම සහ නිශ්චිතව දක්වා ඇති අනෙකුත් කාර්යයන් ඉටු කිරීම විය යුතු බව පරීක්ෂා කරන්න. ප්‍රඥප්ති සහ අනෙකුත් රෙගුලාසි.	සියලු අධ්‍යක්ෂවරුන්ට සමාගම් ලේකම්ගේ උපදෙස් සහ සේවාවන් සඳහා ප්‍රවේශය ඇත
3.1.viii	සියලුම අධ්‍යක්ෂවරුන්ට සමාගම් ලේකම්ගේ උපදෙස් සහ සේවාවන් සඳහා ප්‍රවේශය ලබා ගැනීමට ක්‍රියාවලිය පරීක්ෂා කිරීම.	සියලුම අධ්‍යක්ෂවරුන්ට අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්වරයාගේ උපදෙස් හා සේවය ලබා ගැනීමට ප්‍රවේශය ඇත.

අනුක්‍රමික අංකය	විස්තර	යොමුව
3.1.ix	සමාගම් ලේකම්වරයා අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාර්තා පවත්වාගෙන යන බවත් අධ්‍යක්ෂවරුන්ට එවැනි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාර්තා පරීක්ෂා කිරීමට ක්‍රියාවලියක් තිබෙදැයි පරීක්ෂා කරන්න.	අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වල සියලුම වාර්තා අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්වරයා යටතේ තබා ඇති බව නිරීක්ෂණය විය. ලේකම්වරයාගේ ප්‍රකාශය අනුව ඕනෑම අවස්ථාවක ඕනෑම අධ්‍යක්ෂවරයෙකුට අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සම්බන්ධයෙන් ඕනෑම තොරතුරකට ප්‍රවේශ විය හැක.
3.1.x	♦ මණ්ඩල රැස්වීමක වාර්තා වල පහත සඳහන් දෑ අඩංගු දැයි පරීක්ෂා කරන්න: ♦ මණ්ඩලය විසින් එහි සාකච්ඡා වලදී භාවිතා කරන ලද දත්ත සහ තොරතුරු වල සාරාංශයක්; ♦ මණ්ඩලය විසින් සලකා බලන කරුණු කවරේද; ♦ මණ්ඩලය නිසි සැලකිල්ලෙන් සහ විචක්ෂණශීලීව සිය රාජකාරී ඉටු කළේද යන්න නිදර්ශනය කළ හැකි කරුණු සෙවීමේ සාකච්ඡා සහ මතභේදයේ හෝ විසම්මුතියේ ගැටලු; ♦ මණ්ඩලයේ උපාය මාර්ග සහ ප්‍රතිපත්තිවලට අනුකූල වීම සහ අදාළ නීති සහ රෙගුලාසිවලට අනුකූල වීම පෙන්නුම් කරන කරුණු ♦ බැංකුව නිරාවරණය වන අවදානම් පිළිබඳ අවබෝධය සහ අනුගමනය කරන ලද අවදානම් කළමනාකරණ පියවරයන් පිළිබඳ දළ විශ්ලේෂණයක්; සහ තීරණ සහ මණ්ඩල යෝජනා.	මණ්ඩල ව්‍යවස්ථාවේ අවශ්‍ය සියලු විස්තර අඩංගු බව නිරීක්ෂණය විය
3.1.xi	සාධාරණ ඉල්ලීමක් මත, බැංකුවේ වියදමින්, සුදුසු අවස්ථාවන්හිදී ස්වාධීන වෘත්තීය උපදෙස් ලබා ගැනීමට අධ්‍යක්ෂවරුන්ට හැකියාව ලබා දීම සඳහා මණ්ඩලය විසින් එකඟ වූ ක්‍රියා පටිපාටි තිබෙදැයි පරීක්ෂා කරන්න.	සුදුසු තත්වයන් යටතේ වෘත්තීය උපදේශකත්වය ලබා ගැනීමට මණ්ඩලය සම්බන්ධ වී ඇත.
3.1.xii	අධ්‍යක්ෂවරුන්ට අවශ්‍යතා අතර ගැටුම් හෝ උනන්දුව පිළිබඳ ගැටුම් ඇතිවීම වළක්වා ගැනීමට අදාළව තීරණය කිරීමට, වාර්තා කිරීමට, විසඳීමට සහ සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට ක්‍රියා පටිපාටියක් තිබෙදැයි පරීක්ෂා කරන්න.	බැංකුවේ අදාළ පාර්ශ්ව ගනුදෙනු ප්‍රතිපත්තිය සහ 1975 අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු නීතියේ 17 වැනි වගන්තියේ අවශ්‍යතා අතර ගැටුම් විසඳීමට අදාළ විධිවිධාන ඇත.
	අධ්‍යක්ෂවරයෙකු ඔහු/ඇය හෝ ඔහුගේ/ඇයගේ සමීප ඥාතියෙකු හෝ අධ්‍යක්ෂවරයෙකුට සැළකිය යුතු උනන්දුවක් දක්වන සැලකිල්ලක් දක්වන කිසියම් මණ්ඩල යෝජනාවකට ඡන්දය දීමෙන් වැලකී ඇත්දැයි පරීක්ෂා කරන්න.	අනුකූලතා නිලධාරියාගෙන් ලද තොරතුරුවලට අනුව, 2023 වර්ෂයේදී එවැනි තත්වයක් සිදුවී නොමැත.
3.1.xiii.	බැංකුවේ දිශානතිය සහ පාලනය දැඩි ලෙස එහි අධිකාරිය යටතේ පවතින බව හඳුනා ගැනීමට තීරණය කිරීම සඳහා මණ්ඩලයට නිශ්චිතව වෙන් කර ඇති කරුණු පිළිබඳ විධිමත් කාලසටහනක් තිබෙදැයි පරීක්ෂා කරන්න.	BOD විසින් අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව සමඟ ඉදිරිපත් කරන ලද මණ්ඩලයේ තීරණය සඳහා විශේෂයෙන් වෙන් කර ඇති කරුණුවල විධිමත් කාලසටහන අනුමත කර ඇත. (2016 ඔක්තෝබර් 24 දිනැති අංක 16.10.40 සහ වාර්තා අංක 16.10.122.02 පුවරු පත්‍රිකාව නිරීක්ෂණය කරන ලදී) SMIB පනතේ 7 වැනි වගන්තිය මගින් අධ්‍යක්ෂ මණ්ඩලයට එවැනි සියලු බලතල ක්‍රියාත්මක කළ හැකි අතර බැංකුවේ ව්‍යාපාර කරගෙන යාමට අවශ්‍ය සියලුම ක්‍රියා සහ දේවල් කළ හැකිය. 8 වැනි වගන්තිය අනුව මණ්ඩලයට බැංකුවේ සියලුම හෝ ඕනෑම බලතල ක්‍රියාත්මක කළ හැකිය.
3.1.xiv	බැංකුව තම වගකීම් ඉටු කිරීමට නොහැකි වූ විට හඳුනා ගැනීමට ක්‍රියා පටිපාටිවලට නොහැකි බව සලකන්නේ නම්, යම් තීරණයක් හෝ ක්‍රියාමාර්ගයක් ගැනීමට පෙර මණ්ඩලය විසින් බැංකුවේ තත්ත්වය වහාම බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂවරයා වෙත දන්වා ඇත්දැයි පරීක්ෂා කරන්න. හෝ බංකොලොත් වීමට හෝ තැන්පත්කරුවන්ට සහ අනෙකුත් ණය හිමියන්ට ගෙවිය යුතු ගෙවීම් අත්හිටුවීමට ආසන්න වේ.	සමාලෝචිත කාලසීමාව තුළ එවැනි තත්ත්වයන් ඇති නොවීය.

ආයතනික පාලනය

අනුක්‍රමික අංකය	විස්තර	යොමුව
3.1.xv	මුදල් මණ්ඩලයට අවශ්‍ය මට්ටමින් බැංකුව ප්‍රාග්ධනීකරණය කර ඇත්දැයි පරීක්ෂා කරන්න.	2023.12.31 අවසන් වීමට පෙර බැංකුව රුපියල් බිලියන 7.5 ක අවම නියාමන ප්‍රාග්ධනය සම්පූර්ණ කර නොමැත.
3.1.xvi	මණ්ඩලය විසින් බැංකුවේ වාර්ෂික වාර්තාවේ, මෙම උපදෙස්වල 3 වන විධානයට අනුකූල වන බව දැක්වෙන වාර්ෂික ආයතනික පාලන වාර්තාවක් ප්‍රකාශයට පත් කරන්නේ දැයි පරීක්ෂා කරන්න.	මණ්ඩලය වාර්ෂික වාර්තාවේ මෙම දිශාවන් 3 ට අනුකූල වීම සඳහන් කරමින් වාර්ෂික ආයතනික පාලන වාර්තාව ප්‍රකාශයට පත් කරයි.
3.1. xvii	මණ්ඩලය විසින් වාර්ෂිකව එක් එක් අධ්‍යක්ෂවරයා විසින් සිදු කළ යුතු ස්වයං ඇගයීම් ක්‍රමයක් අනුගමනය කරන්නේ දැයි පරීක්ෂා කර බලා එම තක්සේරු කිරීම් පිළිබඳ වාර්තා පවත්වාගෙන යයි.	2023 වර්ෂය සඳහා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් විසින් ඉදිරිපත් කරන ලද ස්වයං ඇගයීම් ආකෘති පත්‍ර නිරීක්ෂණය කරන ලදී.
3.2	**අධ්‍යක්ෂ මණ්ඩලයේ සංයුතිය**	
3.2.i	මණ්ඩලය 7 ට නොඅඩු සහ 13 කට නොවැඩි අධ්‍යක්ෂවරුන්ගෙන් සමන්විත දැයි පරීක්ෂා කරන්න.	මණ්ඩලය ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරුන් හතර දෙනෙකුගෙන් (04) සහ එක් (01) විධායක නොවන අධ්‍යක්ෂවරයෙකුගෙන් සමන්විත වේ.
3.2.ii.අ	ප්‍රධාන විධායක නිලධාරී තනතුර දරන අධ්‍යක්ෂවරයෙකු හැර වෙනත් අධ්‍යක්ෂවරයෙකුගේ මුළු සේවා කාලය වසර නවයක් නොඉක්මවන බව පරීක්ෂා කරන්න.	කිසිදු අධ්‍යක්ෂකවරයෙකුගේ සේවා කාලය වසර 9 ඉක්මවා නොමැති බව නිරීක්ෂණය විය.
3.2.ii..ආ	කිසියම් අධ්‍යක්ෂකවරයෙකු වසර 9කට වැඩි කාලයක් සේවය කරන්නේ නම්, සංක්‍රාන්ති ප්‍රතිපාදන යොදවා ඇත්දැයි පරීක්ෂා කරන්න.	අධ්‍යක්ෂකවරයෙකුගේ සේවා කාලය වසර 9 ඉක්මවා නොමැති බව නිරීක්ෂණය විය.
3.2.iii.	ප්‍රධාන විධායක නිලධාරී ඇතුළු විධායක අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාව මණ්ඩලයේ අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාවෙන් තුනෙන් එකක් නොඉක්මවන බව පරීක්ෂා කරන්න.	1975 අංක 13 දරන SMIB නීතිය, මණ්ඩලය රේබිය අමාත්‍යාංශය විසින් පත් කරන ලද අධ්‍යක්ෂවරුන්ගෙන් සමන්විත වන අතර සියලු දෙනා විධායක නොවන අධ්‍යක්ෂවරුන් වේ.
3.2.iv	මණ්ඩලයට අවම වශයෙන් ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරුන් තිදෙනෙකු සිටී දැයි පරීක්ෂා කරන්න - නැතහොත් මුළු අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාවෙන් තුනෙන් එකක්, ඔහු/ඇය නම් විධායක නොවන අධ්‍යක්ෂවරුන් ස්වාධීන ලෙස සැලකිය හැකිද යන්න පරීක්ෂා කරන්න:	1975 අංක 13 දරන SMIB නීතියට අනුව සියලුම අධ්‍යක්ෂවරුන් පත් කරනු ලබන්නේ අමාත්‍යවරයා විසිනි. අධ්‍යක්ෂවරුන් හතර දෙනෙකු ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරුන් වන අතර එක් අධ්‍යක්ෂවරයෙකු විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු වේ.
3.2.iv.අ	බැංකුවේ සියයට 1 කට වැඩි සෘජු හා වක්‍ර කොටස් හිමිකාරිත්වයක් දරයි;	බැංකුව සම්පූර්ණයෙන්ම රජය සතු බැවින් එවැනි තත්ත්වයක් මතුව නැත.
3.2.iv.ආ	දැනට ඔහු/ඇය අධ්‍යක්ෂවරයා ලෙස පත්වීමට පෙර වසර දෙකක කාලය තුළ බැංකුවේ නියාමන ප්‍රාග්ධනයෙන් සියයට 10 ඉක්මවන මෙහි 3(7) දිශානතියේ විස්තර කර ඇති පරිදි බැංකුව සමඟ කිසියම් ව්‍යාපාරික ගනුදෙනුවක් කර තිබේ.	එවැනි ගනුදෙනුවක් සිදුවී නැත.
3.2.iv.ඇ	අධ්‍යක්ෂ ලෙස පත්වීමට පෙර වසර දෙකක කාලය තුළ බැංකුව විසින් සේවයේ යොදවා ඇත.	බැංකුවේ සේවය කළ එවැනි විධායක නොවන අධ්‍යක්ෂවරුන් නොමැත.
3.2.iv.ඈ	බැංකුවේ හෝ වෙනත් බැංකුවක අධ්‍යක්ෂවරයෙකු, ප්‍රධාන විධායක නිලධාරියෙකු, ප්‍රධාන කළමනාකරණ පුද්ගලයින්ගේ සාමාජිකයෙකු, ද්‍රව්‍ය කොටස් හිමියෙකු සමඟ සමීප සබඳතාවක් ඇත; ("සමීප ඥාතියෙකු" යන්නෙන් අදහස් කරන්නේ කලත්‍රයා හෝ මූල්‍යමය වශයෙන් යැපෙන දරුවෙකු ය)	බැංකු පනතේ 42 වැනි වගන්තියට අනුව අධ්‍යක්ෂවරුන් විසින් කරන ලද ස්වයං ප්‍රකාශය සහ KMPs විසින් කරන ලද ප්‍රකාශය අනුව එවැනි විධායක නොවන අධ්‍යක්ෂවරයෙකුට සමීප සම්බන්ධයක් නොතිබුණි.
3.2.iv.ඉ	බැංකුවේ නිශ්චිත පාර්ශවකරුවෙකු නියෝජනය කරයි	බැංකුව සම්පූර්ණයෙන්ම රජය සතුය.

අනුක්‍රමික අංකය	විස්තර	යොමුව
3.2.iv.ඊ	සමාගමක හෝ ව්‍යාපාරික සංවිධානයක සේවකයෙකු හෝ අධ්‍යක්ෂවරයෙකු හෝ ද්‍රව්‍ය කොටස් හිමියෙකි: i බැංකුවේ නියාමන ප්‍රාග්ධනයෙන් සියයට 10 ඉක්මවන මෙම උපදෙස්වල 3(7) විධානයේ අර්ථ දක්වා ඇති පරිදි දැනට බැංකුව සමඟ ගනුදෙනුවක් ඇති, හෝ ii බැංකුවේ අනෙකුත් අධ්‍යක්ෂවරුන්ගෙන් කවරෙකු හෝ සේවයේ යෙදී සිටින හෝ අධ්‍යක්ෂවරුන් වන හෝ ද්‍රව්‍ය කොටස් හිමියන් වන; හෝ iii බැංකුවේ නියාමන ප්‍රාග්ධනයෙන් සියයට 10 ඉක්මවන මෙම විධානවල 3(7) විධානයේ අර්ථ දක්වා ඇති පරිදි බැංකුවේ අනෙකුත් ඕනෑම අධ්‍යක්ෂවරයෙකුට ගනුදෙනුවක් තිබේ.	බැංකු පනතේ 42 වගන්තියට අනුව අධ්‍යක්ෂවරුන් විසින් කරන ලද ස්වයං ප්‍රකාශය අනුව 2023 වර්ෂය තුළ අධ්‍යක්ෂවරයෙකු සෘජුව හෝ වක්‍රව උනන්දුවක් දක්වන කිසිදු ගනුදෙනුවක් සටහන් කර නොමැත.
3.2.v	ස්වාධීන අධ්‍යක්ෂකවරයෙකු නියෝජනය කිරීම සඳහා විකල්ප අධ්‍යක්ෂකවරයෙකු පත්කර ඇති අවස්ථාවක , එසේ පත් කරන ලද පුද්ගලයා ස්වාධීන අධ්‍යක්ෂකවරයාට අදාල වන නිර්ණායක සපුරාලන්නේදැයි පරීක්ෂා කිරීම.	විකල්ප අධ්‍යක්ෂවරු පත්කළ නොමැත
3.2.vi	ස්වාධීන අධ්‍යක්ෂවරුන් පත්කිරීමේ ක්‍රියාවලියක් බැංකුවට තිබේදැයි පරීක්ෂා කරන්න.	1975 අංක 13 SMIB නීතියේ 7 වැනි වගන්තිය අනුව අධ්‍යක්ෂවරුන් පත් කරනු ලබන්නේ අමාත්‍යවරයා විසිනි.
3.2.vii	බැංකුවේ නියම කර ඇති ගණපූරණයට අධ්‍යක්ෂවරුන්ගෙන් 50%කට වඩා ඇතුළත් වන අතර මෙම ගණපූරණයෙන් 50%කට වඩා විධායක නොවන අධ්‍යක්ෂවරුන් ඇතුළත් විය යුතුද යන්න පරීක්ෂා කරන්න.	සියලුම අධ්‍යක්ෂවරුන් විධායක නොවන අධ්‍යක්ෂවරුන් වේ.
3.2.viii.	වාර්ෂික ආයතනික පාලන වාර්තාවේ සභාපතිවරයා, විධායක අධ්‍යක්ෂවරුන්, විධායක නොවන අධ්‍යක්ෂවරුන් සහ ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගේ නම් ඇතුළුව අධ්‍යක්ෂවරුන්ගේ කාණ්ඩ අනුව මණ්ඩලයේ සංයුතිය බැංකුව හෙළිදරව් කරන්නේ දැයි පරීක්ෂා කරන්න.	2023 වර්ෂය සඳහා වන වාර්ෂික වාර්තාවේ කෙටුම්පතෙහි අනාවරණය කිරීම් දක්වා ඇත
3.2.ix	මණ්ඩලයට නව අධ්‍යක්ෂවරුන් පත්කිරීමේ ක්‍රියා පටිපාටිය පරීක්ෂා කරන්න.	1975 අංක 13 SMIB නීතියේ 7 වැනි වගන්තියට අනුව අධ්‍යක්ෂවරුන් පත් කරනු ලබන්නේ අමාත්‍යවරයා විසිනි.
3.2.x	අනියම් පුරප්පාඩුවක් පිරවීම සඳහා පත් කරන ලද සියලුම අධ්‍යක්ෂවරුන් ඔවුන්ගේ පත්වීමෙන් පසු පළමු මහා සභා රැස්වීමේදී කොටස් හිමියන් විසින් තෝරා පත් කර ගැනීමට යටත් දැයි පරීක්ෂා කරන්න.	1975 අංක 13 SMIB නීතියේ 7 වැනි වගන්තිය අනුව අධ්‍යක්ෂවරුන් පත්කිරීම් මුදල් අමාත්‍යවරයා විසින් සිදු කරනු ලබන බැවින් අදාළ නොවේ.
3.2.xi	අධ්‍යක්ෂවරයෙකු ඉල්ලා අස්වී හෝ තනතුරෙන් ඉවත් කර ඇත්දැයි පරීක්ෂා කරන්න, අ. අධ්‍යක්ෂවරයාගේ ඉල්ලා අස්වීම හෝ ඉවත් කිරීම සහ බැංකුව සමඟ අදාළ අධ්‍යක්ෂවරයාගේ එකඟ නොවීම සම්බන්ධ තොරතුරු ඇතුළුව නමුත් ඒවාට සීමා නොවී එවැනි ඉවත් කිරීම් හෝ ඉල්ලා අස්වීමට හේතු මණ්ඩලය නිවේදනය කරයි; සහ ආ. කොටස් හිමියන්ගේ අවධානයට යොමු කළ යුතු කරුණු තිබේද නැද්ද යන්න තහවුරු කරමින් ප්‍රකාශයක් නිකුත් කරන්න.	අධ්‍යක්ෂවරුන් ඉවත් කිරීම 1975 අංක 13 SMIB නීතියට අනුව අදාළ රේඛීය අමාත්‍යාංශයේ අමාත්‍යවරයා විසින් සිදු කරනු ලැබේ.

ආයතනික පාලනය

අනුක්‍රමික අංකය	විස්තර	යොමුව
3.2.xii	බැංකුවක අධ්‍යක්ෂවරයෙකු හෝ සේවකයෙකු වෙනත් බැංකුවක අධ්‍යක්ෂවරයෙකු ලෙස පත් කරන්නේද, තේරී පත්වන්නේද නැතහොත් නම් කරන්නේද යන්න හඳුනාගැනීමේ ක්‍රියාවලියක් තිබේදැයි පරීක්ෂා කරන්න.	අධ්‍යක්ෂවරුන්ගෙන් ලබා ගන්නා වාර්ෂික ප්‍රකාශයන් දැනට සිටින අධ්‍යක්ෂවරුන්ගේ අනෙකුත් අධ්‍යක්ෂ තනතුරු හඳුනා ගැනීමට උපකාරී වේ. කෙසේ වෙතත්, බැංකුවේ සේවකයෙකු වෙනත් බැංකුවක අධ්‍යක්ෂවරයෙකු ලෙස පත් කරන්නේද, තේරී පත්වන්නේද නැතහොත් නම් කරන්නේද යන්න හඳුනාග ැනීමේ ක්‍රියාවලියක් ඇත.
3.3	**අධ්‍යක්ෂවරුන්ගේ යෝග්‍යතාවය සහ සුදුසුබව තක්සේරු කිරීමේ නිර්ණායක**	
3.3.i	අධ්‍යක්ෂවරයා ලෙස කටයුතු කරන පුද්ගලයෙකුගේ වයස අවුරුදු 70 නොඉක්මවන බව පරීක්ෂා කරන්න.	සියලුම අධ්‍යක්ෂවරුන් වයස අවුරුදු 70 ට අඩු බව ප්‍රකාශ මගින් පරීක්ෂා කර සහතික කර ඇත.
3.3.i.අ	සංක්‍රාන්ති ප්‍රතිපාදනවලට අනුකූල වී ඇත්දැයි පරීක්ෂා කරන්න.	අදාළ නොවේ
3.3.ii	බැංකුවේ අනුබද්ධ සමාගම් හෝ ආශ්‍රිත සමාගම් ඇතුළුව සමාගම්/ ආයතන/ ආයතන 20කට වැඩි ගණනක අධ්‍යක්ෂවරයෙකු ලෙස යම් පුද්ගලයෙක් නිලතල දරන්නේද යන්න පරීක්ෂා කරන්න.	මහ බැංකුවට ඉදිරිපත් කර ඇති දිවුරුම් ප්‍රකාශයට අනුව, කිසිදු අධ්‍යක්ෂවරයකු සමාගම් 20කට වඩා අධ්‍යක්ෂ තනතුරු දරන්නේ නැත.
3.3.iii	ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන බලපත්‍රලාභී බැංකුවක අධ්‍යක්ෂවරයෙකු හෝ ප්‍රධාන විධායක නිලධාරියෙකු පෙර බැංකුවේ ඔහුගේ/ඇයගේ කාර්යාලය නතර කිරීම දින සිට මාස 6ක කාලයක් ඉකුත්වීමට පෙර ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන වෙනත් බලපත්‍රලාභී බැංකුවක අධ්‍යක්ෂවරයෙකු හෝ ප්‍රධාන විධායක නිලධාරියෙකු ලෙස පත් නොකළ යුතු බවට පරීක්ෂා කරන්න.	දිවුරුම් ප්‍රකාශයේ තොරතුරුවලට අනුව, වෙනත් බැංකුවකින් පත්කළ අධ්‍යක්ෂ හෝ සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරියකු සිටියේ නැත.
3.4	**මණ්ඩලය විසින් පවරනු ලබන කළමනාකරණ කාර්යයන්**	
3.4.i	අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පවරා දෙනු ලැබූ කටයුතු අනුමත කර ඇත්දැයි පරීක්ෂා කරන්න.	2020 සැප්තැම්බර් 23 දිනැති අංක 20.07.124.01 දරන මණ්ඩල ව්‍යවස්ථාවට අනුව බලතල පැවරීම සඳහා මණ්ඩලය විසින් මණ්ඩල අනු කමිටු 4ක් පත් කර ඇත.
3.4.ii	3 (1) (i) හි එවැනි ක්‍රියා පවරනු ලබන අවස්ථා වලදී පවා මණ්ඩලය වගකීම භාරගෙන ඇත්දැයි පරීක්ෂා කරන්න.	එවැනි දූත පිරිසක් සමස්තයක් ලෙස මණ්ඩලයට සිය කාර්ය භාරය ඉටු කිරීමට ඇති හැකියාව සැලකිය යුතු ලෙස බාධාවක් හෝ අඩු කරන තරමට මණ්ඩලය කිසිදු කරුණක් පවරා නැත.
20. එක් එක් අවදානම් දර්ශක අනුව මාසිකව ගණනය කරන ලද සැබෑ ප්‍රතිඵල සමාලෝචනය කිරීම සහ යම් අවදානම් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නියම කළ සීමාවන් ඉක්මවන අවස්ථාවක එම විශේෂිත අවදානම්වල බලපෑම අවම කිරීමට නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග වහාම ගතයුතුය.
21. විවිධ වර්ගයේ අවදානම් අනුව කළමනාකරණය විසින් නියමකළ පරාමිති සහ සීමා සමාලෝචනය කර අනුමත කිරීම සහ ඒවා අදාළ නීති සහ රෙගුලාසිවලට අනුකූලව මෙන්ම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නියමකළ අපේක්ෂිත ප්‍රතිපත්ති මට්ටම්වල පවතින්නේද යන්න සහතික කිරීම.
22. විශේෂ අවදානම් හඳුනාගැනීමට/ අභ්‍යන්තර පාලන උපදෙස්වලට අනුකූලවීමට අපොහොසත් වීම සඳහා වගකීමට බැඳී සිටින නිලධාරීන්ට එරෙහිව සුදුසු පියවර ගැනීම සහ කමිටුව විසින් නිර්දේශ කරන පරිදි කඩිනම් නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග සහ විනය ක්‍රියාපටිපාටි ගැනීම.
23. ව්‍යාපාර මෙහෙයුම්වල සෑම ක්ෂේත්‍රයක් තුළ නීති සහ රෙගුලාසි සහ නියාමන මාර්ගෝපදේශ, අභ්‍යන්තර පාලනයන් සහ අනුමත ප්‍රතිපත්ති සමඟ බැංකුවේ අනුකූලතාව තක්සේරු කිරීම සඳහා අනුකූලතා කාර්යයේ ඵලදායිත්වය සමාලෝචනය කිරීම.
24. වාර්ෂිකව ව්‍යාපාර අඛණ්ඩතාව සහ ආපදා පිළියම් සැලැස්ම සමාලෝචනය කිරීම.

25. බැංකුවේ අභ්‍යන්තර ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා තක්සේරු කිරීමේ ක්‍රියාවලිය සමාලෝචනය කර අනුමත කිරීම
26. බැංකුවේ ප්‍රධාන වියදම් වැඩසටහනට අනුව සිදුකරන අධ්‍යක්ෂ මණ්ඩලය වෙත දැනුම් දීමට අවශ්‍ය ප්‍රාග්ධන දායකත්වයන් සමාලෝචනය කිරීම.
27. වැදගත් පීඩන අවස්ථාවක් සම්බන්ධයෙන් ව්‍යාපාරය පිළිබඳ අර්බුදයක් වියහැකි බලපෑම සම්බන්ධයෙන් තොරතුරු රැස් කිරීම සහ කළමනාකරණය විසින් සිදුකළ යුතු අයකරගැනීමේ විකල්ප සමාලෝචනය කිරීම.
28. විගණන කමිටුවේ උපදේශකත්වයෙන්, අවම වශයෙන් වාර්ෂිකව කළමනාකරණය සමඟ සමාලෝචනය කර සාකච්ඡා කිරීම.
29. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඉල්ලා ඇති පරිදි ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු ප්‍රඥප්තියට අදාළ වෙනත් කටයුතු ඉටු කිරීම.

ප්‍රඥප්තියට අනුව, මෙම කමිටුවේ **අනෙකුත් වගකීම්** පහත පරිදි වේ.

1. කමිටුව විසින් විගණන කමිටුවට එහි ව්‍යවස්ථාපිත, නියාමන සහ අනෙකුත් වගකීම් සුදුසු පරිදි ඉටු කිරීමට ඉඩ ලබාදීම සඳහා අවශ්‍ය පරිදි තොරතුරු හුවමාරුව සහ සන්නිවේදනය පවත්වාගෙන යෑම.
2. කමිටුව විසින් කමිටුවේ විෂයපථය තුළ ඇති කරුණු සම්බන්ධයෙන් නියාමන පරීක්ෂණ වාර්තා පිටපත් සහ ඒ සඳහා කළමනාකරණයේ ප්‍රතිචාරයද ලබාගනී.

අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු රැස්වීම්

අධ්‍යක්ෂ මණ්ඩල අවදානම් කළමනාකරණ කමිටුව කාර්තුමය පදනමක් මත රැස්වන අතර, කමිටු සාමාජිකයින්ගේ පැමිණීම පහත පරිදි වේ.

1,2,3, හා 4 වන කාර්තු සඳහා -

අධ්‍යක්ෂවරයාගේ නම	සහභාගීවූ රැස්වීම් ගණන/ සහභාගීවූ වියයුතු රැස්වීම් ගණන
එච්.සී.ඩී.එල්. සිල්වා මහතා (කමිටුවේ සභාපති)	4/4
එස්. ගලප්පත්ති මහතා	4/4
බී. ආර්. මඩිහේවා මහතා	4/4
මහාචාර්ය ඩී. ඒ. එම්. පෙරේරා (විකල්ප සාමාජික)	සහභාගිවීමෙන් වැලකී සිටීමට කාරණා ඉදිරිපත් කරන ලදී.

වසර තුළ අධ්‍යක්ෂ මණ්ඩල අවදානම් කළමනාකරණ කමිටුව වෙත පවරා ඇති වගකීම් ඉටු කිරීමේදී, ව්‍යාපාර මෙහෙයුම් සිදුකරමින් හා අවදානම් කළමනාකරණ කරමින් ජේෂ්ඨ කළමනාකරණ කාර්ය මණ්ඩලය සමඟ ඉතා සමීපව කටයුතු කර ඇත.

වාර්තාකරණය

අධ්‍යක්ෂ මණ්ඩල අවදානම් කළමනාකරණ කමිටු රැස්වීම්වලදී යෝජනා කළ හා සාකච්ඡාවට ලක්කළ කරුණු අධ්‍යක්ෂ මණ්ඩලයේ අදහස් ලබා ගැනීම එකඟතා හා විශේෂිත මඟ පෙන්වීම් සඳහා අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවේ නිර්දේශ සමගින් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කර ඇත. සමාලෝචිත වර්ෂය තුළදී අධ්‍යක්ෂ මණ්ඩල අවදානම් කළමනාකරණ කමිටුව විසින් සිදුකළ නිර්දේශ අධ්‍යක්ෂ මණ්ඩල මට්ටමේදී සාකච්ඡා කර අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර ඇත. අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු රැස්වීම් වාර්තා අවශ්‍ය විස්තර ද සමග අධ්‍යක්ෂ මණ්ඩලයේ දැන ගැනීම පිණිස ඔවුන් වෙත ඉදිරිපත් කර ඇත.



එච්.සී.ඩී.එල්. සිල්වා මහතා
සභාපති - අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව



ආයතනික සමඟිය තුළින් සහයෝගීතාවය ගොඩනැඟීම

අවදානම් කළමනාකරණය 51
මානව සම්පත් කළමනාකරණය 55
2023 -සීමා අභිබවා: ආයතනික සහ සේවා සන්නාම පිළිබඳ සමාලෝචනය 57

අවදානම් කළමනාකරණය

රට ආර්ථික අර්බුදයකට පත් කරමින් ක්‍රියා පටිපාටියේ දිගු කාලයක් පැවති දුර්වලතා තවදුරටත් ඉහළ ගිය බැවින් 2023 වසර ශ්‍රී ලංකා ආර්ථිකයට අභියෝගාත්මක වසරක් විය. දුර්වල පාලනය, සීමා සහිත වෙළඳ කටයුතු, දුර්වල ආයෝජන වාතාවරණය, ලිහිල් මුදල් ප්‍රතිපත්ති සහ පරිපාලන විනිමය අනුපාතය ආදී කරුණු මඟින් සාර්ව ආර්ථික අසමතුලිතතා ඇති කරන ලදී. මූල්‍ය දුෂ්කරතාවයන් හේතුවෙන් ඉහළ රාජ්‍ය මූල්‍ය හිඟයන් සහ විශාල දළ මූල්‍ය අවශ්‍යතා ඇති වූ අතර, ඒ අනුව අවදානම් සහිත වාණිජ ණය ගැනීම් හේතුවෙන් ණය අවදානම් ඉහළ ගියේය. 2023 වසරේ මුල් භාගයේ සමස්ත රාජ්‍ය මූල්‍ය හිඟය වැඩි විය. සමස්ත ආදායම ඉහළ මට්ටමක තිබියදීත්, ප්‍රාථමික හිඟය ආසන්න වශයෙන් අවසන් කොට තිබියදීත්, පොලී ගෙවීම්වල තියුණු වැඩිවීම මේ සඳහා බලපානු ලැබුණි. නව ආදායම් ක්‍රියාමාර්ග ඇතුළු අවශ්‍ය මූල්‍ය ප්‍රතිසංස්කරණ කිහිපයක් මඟින් සමස්ත ප්‍රගතිය වර්ධනය වූවද ණය හා වක්‍ර බදු සහ බලශක්ති පිරිවැය ඉහළ යාම හේතුවෙන් දුප්පත් සහ අවදානමට ලක්විය හැකි ජනතාව මත දැරිය නොහැකි පීඩනයන් ඇති කරයි.

මෙම අභියෝගාත්මක ආර්ථික තත්ත්වයන් යටතේ වූවද, බැංකුව සිය මෙහෙයුම් පවත්වා ගෙන ගියේය. එමෙන්ම බැංකුවට සිදුවන ඕනෑම බාධාවක බලපෑමක් අවම කරලීම සඳහා අභියෝග අවම කොට ඇති බවත් අවදානම් කළමනාකරණය කොට ඇති බවත් සහතික කිරීම සඳහා අවදානම් කළමනාකරණ ක්‍රියාමාර්ග පවත්වා ගෙන යන ලදී.

අවදානම් හඳුනා ගැනීම, තක්සේරු කිරීම, මැනීම, අවම කිරීම, අධීක්ෂණය සහ වාර්තාකරණය ක්‍රියාත්මක කරලීම සම්බන්ධයෙන් වූ බැංකුවේ අවදානම් කළමනාකරණ කටයුතු පුළුල් ඒකාබද්ධ අවදානම් කළමනාකරණ රාමුවක් ඔස්සේ සිදු වේ. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත රාමුව මඟින් පාලන ව්‍යුහයන් සහ බැංකුව විසින් මුහුණ දෙන අවදානම් හඳුනාගැනීම, මැනීම, අධීක්ෂණය සහ පාලනය කිරීමේ ක්‍රියාවලිය පැහැදිලිව නිර්වචනය කරයි. එකිනෙකට බැඳුණු කාණ්ඩ හතරකින් බැංකුවේ ඒකාබද්ධ අවදානම් කළමනාකරණ රාමුව සමන්විත වේ.

- අවදානම් භාරකාරත්වය සඳහා පැහැදිලි ක්‍රියාකාරී ව්‍යුහයක් පිහිටුවාලන අවදානම් පාලනය.
- අහිතකර බලපෑම්වලට විසඳුම් සෙවීමට මෙන්ම අවස්ථාවන්ගෙන් ප්‍රයෝජන ගැනීමට හැකිවන පරිදි ව්‍යාපාරික ඒකක සහ දෙපාර්තමේන්තුවලට මඟ පෙන්වීම සඳහා ප්‍රධාන අවදානම් පාලන ක්‍රියා පටිපාටි පිළිබඳ ඉදිරිපත් කරනු ලබන අවදානම් පාලන සැලසුම.
- බැංකුව මුහුණ දෙන සියලුම ප්‍රධාන අවදානම් හඳුනා ගැනීම, මැනීම, අධීක්ෂණය කිරීම සහ වාර්තා කිරීම සිදු කොට ඇති බැව් සහතික කරනු ලබන අවදානම් පිළිබඳ සටහන් කිරීම.
- බැංකුවේ සෑම තරාතිරමකම හවුල් වගකීම් සක්‍රීය කිරීම සහ අවදානම් වගවීම ප්‍රචලිත කිරීම සිදු කරනු ලබන අවදානම් පිළිබඳ දැනුවත් කිරීමේ සංස්කෘතිය.

ආරක්ෂක මට්ටම් තුනක් ඔස්සේ අවදානම් කළමනාකරණ රාමුව නිර්මාණය කොට ඇත. එමඟින් බැංකුව නිරාවරණය වන සියලුම අවදානම් කළමනාකරණය සඳහා ව්‍යුහගත යාන්ත්‍රණයක් සහතික කරනු ලබයි.

පළමු ආරක්ෂක උපක්‍රමය
ව්‍යාපාර/ශාඛා

- බැංකුවේ පිළිගත් අවදානම් රුචිකත්වය සහ අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති තුළ සෑම මට්ටමක අවදානම් හඳුනා ගැනීම, කළමනාකරණය සහ වාර්තාකරණය පිළිබඳ මූලික වගකීම


දෙවන ආරක්ෂක උපක්‍රමය
අවදානම් කළමනාකරණ අනුකූලතාව

- අවදානම් කළමනාකරණ ක්‍රියාකාරකම් මඟින් අවදානම් කළමනාකරණ රාමුව, ප්‍රතිපත්ති, පද්ධති, ක්‍රියා පටිපාටි සහ මෙවලම් සංවර්ධනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම සහ ප්‍රධාන අවදානම් විධායක ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව වෙත සමාලෝචනය කිරීම සහ වාර්තා කිරීම සිදු කරනු ලබයි.

තෙවන ආරක්ෂක උපක්‍රමය
අභ්‍යන්තර විගණනය

- අපගේ අභ්‍යන්තර විගණනය ක්‍රියාවලිය තුළින් ස්වාධීන තක්සේරුකරණය
- අධ්‍යක්ෂ මණ්ඩල කමිටුවක් වන විගණන කමිටුව වෙත විගණන වාර්තාව සෘජුවම ඉදිරිපත් කිරීම.

බැංකුවේ අවදානම් පාලනය සහ කළමනාකරණ ව්‍යුහය



අවදානම් කළමනාකරණය

අවධානම් රුචිය

බැංකුවේ අවදානම් රුචිය මඟින් අවදානම් මට්ටම සහ සිය උපායමාර්ගික සහ මූල්‍ය අරමුණු සාක්ෂාත් කර ගැනීමේදී අවදානම්වලට මුහුණ දීමට කෙතරම් හැකියාවක් පවතින්නේද යන්න නිර්වචනය කරයි. එමෙන්ම, මෙකී සීමාවන් ඉක්මවා ගියහොත් හෝ වර්ධනය වුවහොත් එවැනි අවස්ථාවකදී ගත් ක්‍රියාමාර්ග අවදානම් රුචිය සහ එකී තත්ත්වය වර්ධනය කරනු ලබන සාධක මඟින් පෙන්නුම් කරනු ලබයි.

මෙම ප්‍රතිපත්ති පිළිබඳව පහළ මට්ටම් දක්වා නිසි ලෙස සන්නිවේදනය වී ඇති බවට සහ සංවිධාන සංස්කෘතිය තුළ ක්‍රියාත්මක වන බවට සහතික කිරීම බැංකුවේ ජ්‍යේෂ්ඨ කළමනාකාරිත්වය සතු කාර්යභාරයකි. සාමාන්‍යයෙන් බැංකුව වෙනුවෙන් අවදානම් පිළිගන්නා අය වෙත මැනිය හැකි අවදානම්වලට අදාළ අවදානම් දැරීමේ හැකියාව පිළිබඳව සීමාවන් හෝ උප සීමාවන් ලෙස සන්නිවේදනය කෙරේ. මාර්ගෝපදේශ ආකාරයෙන් ගුණාත්මක අවදානම් පියවර පිළිබඳ දැනුවත් කරනු ලබන අතර, කළමනාකරණ ව්‍යාපාර තීරණ අනුව සමාලෝචනය කරනු ලබයි.

අවදානම් කළමනාකරණ කාර්යය මඟින් බැංකුවේ අවදානම් රුචිය අධීක්ෂණය කරනු ලබන අතර අධ්‍යක්ෂ මණ්ඩලය, ආයතනික කළමනාකාරිත්වය සහ අදාළ කමිටු වෙත නිරන්තරයෙන් වාර්තා කරනු ලබයි. අභ්‍යන්තර හා බාහිර පරිසරයේ සැලකිය යුතු වෙනස්කම්වලට අනුකූලව මෙම ප්‍රතිපත්ති පවත්වා ගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වරින් වර මෙම ප්‍රතිපත්ති සමාලෝචනය කරනු ලබන අතර අවශ්‍ය අවස්ථාවකදී සුදුසු වෙනස්කම් සිදු කරනු ලබයි.

අවදානම් කළමනාකරණ සංස්කෘතිය

රාජ්‍ය උකස් සහ ආයෝජන බැංකුව විසින් ක්‍රියාකාරී අවදානම් කළමනාකරණ සංස්කෘතියක් වර්ධනය කරලීම වැදගත් කොට සලකයි. පැහැදිලි අවබෝධයකින් අවදානම්වලට මුහුණ දීම හෝ ඒවා කළමනාකරණය කිරීම සහ අදාළ ඒකාබද්ධ අවදානම් කළමනාකරණ රාමුව අනුව අවදානම් කළමනාකරණය කිරීමට තීරණ ගැනීමට සේවකයින්ට හැකියාව පවතින අවදානම් පිළිබඳ දැනුවත් වූ සංස්කෘතියක් නිර්මාණය කිරීමට බැංකුව විසින් අරමුණු කරයි. පළමු මට්ටමේ ආරක්ෂාව ශක්තිමත් කිරීම, ක්‍රියාවලි කාර්යක්ෂමතාව සහ බැංකුවේ සමස්ත ස්ථාවරත්වය සක්‍රීය කිරීම සඳහා කාර්ය මණ්ඩලය විසින් ඉටු කරනු ලබන විශේෂිත භූමිකාවන්ට අදාළ අවදානම් පිළිබඳ මනා අවබෝධයක් ලබා දීම ඉතා වැදගත් අංගයකි. සංවිධානය තුළ අවදානම් දැනුවත් කිරීමේ සංස්කෘතියක් ඇති කිරීමට මෙකී ක්‍රියාමාර්ග උපකාරී වී ඇත.

අවදානම් වාර්තාකරණය

පැහැදිලි අවදානම් වාර්තාකරණ ක්‍රමවේදයන් මඟින් ප්‍රධාන අවදානම් නිරාවරණ හඳුනාගෙන ඇති බවත්, කාලෝචිත හා අදාළ ආකාරයකින් අදාළ පුද්ගලයින් වෙත සහ අවසාන වශයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඒ පිළිබඳ දැනුවත් කර ඇති බවත් තහවුරු කරනු ලබයි. අවදානම් වාර්තාකරණය සඳහා සියලුම ප්‍රධාන අවදානම් නිරාවරණ ඇතුළත් වන අතර, සංවිධානයේ සියලුම අදාළ සේවකයින්ට පැහැදිලිව සන්නිවේදනය කෙරේ.

ප්‍රාග්ධන කළමනාකරණය

බැංකුවේ මූල්‍ය තත්ත්වය සහ කීර්තිය ආරක්ෂා කිරීමටත්, බංකොලොත්භාවයෙන් බැංකුව ආරක්ෂා කිරීම සඳහා ඵලදායී ප්‍රාග්ධන කළමනාකරණය ඉතා වැදගත් වේ. බාසල් අවශ්‍යතාවලට අනුකූල වන අභ්‍යන්තර ප්‍රාග්ධන ප්‍රමාණවත්ව තක්සේරු කිරීමේ ක්‍රියාවලිය (ICAAP) මඟින් බැංකුවේ අවදානම්වලට අදාළ සමස්ත ප්‍රාග්ධනයේ ප්‍රමාණවත්භාවය තක්සේරු කිරීමේ ක්‍රියාවලියට මඟ පෙන්වයි. රාජ්‍ය බැංකුවක් ලෙස, උකස් සහ ආයෝජන බැංකුවට ප්‍රාග්ධනය රැස් කර ගැනීම සඳහා කොටස් වෙළඳ පොළට ප්‍රවේශ වීම සම්බන්ධයෙන් දැනට සීමිත හැකියාවක් පවතින අතර ප්‍රාග්ධනය වර්ධනය කරලීමට අභ්‍යන්තර ලාභ උත්පාදනය සහ රාජ්‍ය අනුග්‍රහය මත බලාපොරොත්තු තැබීමට සිදු වේ.

	අවම අවශ්‍යතාවය	2023	2022	2021
පොදු කොටස් 1 ස්ථරය	7%	23.46%	21.91%	23.95%
1 ස්ථරයේ අනුපාතය	8.5%	23.46%	21.91%	23.95%
මුළු ප්‍රාග්ධන අනුපාතය	12.5%	23.46%	23.80%	25.23%


අවදානම් කළමනාකරණය

ණය අවදානම

ණය අවදානම යනු ගනුදෙනුකරුවෙකු හෝ ප්‍රතිවිරුද්ධ පාර්ශ්වයක් බැංකුව වෙත තම ගිවිසුම්ගත බැඳීම් ගෙවීමට අපොහොසත් වීම නිසා සහ ඔවුන් ගෙවිය යුතු කාලය තුළදී ඇති විය හැකි අලාභයයි. අපි අඛණ්ඩ පදනම මත ණය අවදානම කළමනාකරණය කරනු ලබන අතර අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද ශක්තිමත් ණය අවදානම් කළමනාකරණ රාමුව යටතේ ණය අවදානම් කළමනාකරණය සිදු කරන්නෙමු. මේ සඳහා ණය ප්‍රතිපත්ති සහ ණය ක්‍රියා පටිපාටි අත්පොත, නියෝජිත අධිකාරිය වෙන් කිරීම, අවදානම් ශ්‍රේණිගත කිරීම්, ඇපකර කළමනාකරණය සහ ණය අධීක්ෂණය ඇතුළත් වේ. ආදායම් මූලාශ්‍රවල විශ්වසනීයත්වය තහවුරු කිරීම සඳහා ආදායම් ප්‍රභව තහවුරු කිරීමේ ආකෘතියක් සහ ණය තත්ත්වය තහවුරු කිරීම සඳහා පෙර වියපැහැදීම් සමාලෝචනය සඳහා වෙන් වූ අංශයක් ඇතුළු ආදායම් පිරික්සුම් පිළිබඳ විශේෂ අංශයක් සමඟින් පාරිභෝගිකයින් පරීක්ෂා කිරීමේ සම්පූර්ණ ක්‍රියාවලියක් අප සතුව පවතී. සෑම ණය නිෂ්පාදන කාණ්ඩයක් සඳහාම ඒවායේ අවදානම් ස්වභාවය අනුව අභ්‍යන්තර වත්කම් ප්‍රමාණ සැලසුම සකස් කොට ඇති අතර, ණය පහසුකම් සැලසීමට පෙර හෝ ණය සීමා ඉහළ නැංවීමට පෙර ක්‍රියාත්මක කරනු ලබයි. එය පැහැර හැරීම් සහ අලාභවල ලාභදායිත්වය පුරෝකථනය කිරීමට උපකාරී වේ. අපි අංශය, නිෂ්පාදන සහ අවදානම් ශ්‍රේණිගත කිරීම් හි නිරාවරණය අනුව නිෂ්පාදන කළඹ විශ්ලේෂණය කිරීම සහ දරා ගැනීමේ සීමාවලින් යුතු ප්‍රධාන අවදානම් සහ වෙනත් වැදගත් අනුපාතයන් පිළිබඳව නිරන්තරයෙන් අධීක්ෂණය කිරීම සිදු කරනු ලබන අතර ඒ පිළිබඳ අර්ථ දැක්වූ අවදානම් රැ
චිකත්වයන් සහ ප්‍රතිකර්ම සහ ප්‍රතිසාධන කාර්යයන්ට අනුකූලව බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩල අවදානම් කළමනාකරණ කමිටුව වෙත වාර්තා කරන්නෙමු. මේවා විකාශනය වන හොඳම භාවිතයන් සහ ඇතිවන අවදානම් සහ අවස්ථා මත පදනම්ව වරින් වර සමාලෝචනය කර යාවත්කාලීන කරනු ලබයි. .


නිෂ්පාදන කළඹ වැඩි වශයෙන්ම ආවරණය වනු ලබන්නේ පෞද්ගලික ණය කළඹ මඟිනි. ණය කළඹෙන් 48% ක ප්‍රමාණයක්, උකස් සහ සේවක අර්ථසාධක අරමුදල් ණය මඟින් පවත්වාගෙන යන මුදල් ඇපකරවලින් සමන්විත වේ. විවිධ අංශ සහ කර්මාන්තවලට විවිධාංගීකරණයක් එක් කිරීමේ අරමුණින් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර/ව්‍යාපාර ණය කෙරෙහි අවධානය යොමු කිරීමට බැංකුව පියවර කිහිපයක් ගෙන ඇත.

නිෂ්පාදන අනුව ආයෝජන කළඹේ සංයුතිය



අවදානම් පිළිවෙත් අනුකූල බවත්, යාවත්කාලීන බවත් සහ වෙනස්වන ව්‍යාපාරික අවශ්‍යතා සපුරාලන බවත් සහතික කරමින් වෙනස්වන සාධක සඳහා ප්‍රතිචාර වශයෙන් බැංකුව සිය ණය ප්‍රතිපත්ති සහ ක්‍රියාවලීන් සමාලෝචනය කිරීම සහ යාවත්කාලීන කිරීම අඛණ්ඩව සිදු කරයි. බැංකුව සිය ණය අවදානම් කළමනාකරණය ශක්තිමත් කිරීමේ අරමුණින් වර්ෂය තුළදී දුර්වලතා ප්‍රතිපත්ති සහ ණය අත්පොත සමාලෝචනය කරන ලද අතර, අධීක්ෂණ කටයුතු තවදුරටත් විධිමත්ව කරන ලදී. ප්‍රතිසාධන ක්‍රියාමාර්ග ශක්තිමත් කිරීමට සහ කළඹ, සමීපව පසු විපරම් කිරීමට බැංකුව පියවර ගත් අතර, කාර්ය සාධනයක් නොමැති ණය සීමා කිරීමට කටයුතු කළේය.

ක්‍රියාකාරී නොවූ ණය අනුපාතය සහ දුර්වලතා




- හානිකරණ ප්‍රතිපාදන
- හානිකරණයේ (අදියර 3) සිට අදියර 3 ණය අනුපාතය%
- සේවක අර්ථ සාධක අරමුදල හැර දළ ක්‍රියාකාරී නොවූ ණය

වෙළඳ පොළ අවදානම

වෙළඳ පොළ අවදානම යනු වෙළඳ පොළ අනුපාත හෝ මිල ගණන්වල වෙනස්වීම් හේතුවෙන් බැංකුවේ වත්කම් සහ වගකීම්වල වටිනාකම හෝ එයින් ලැබෙන ආදායම අහිතකර අන්දමින් වෙනස්වීමට භාජනයවීමේ අවදානමයි.


ද්‍රවශීලතා අවදානම යනු වර්තමාන හෝ අනාගත අවශ්‍යතා සහ අපේක්ෂාවන් සපුරාලීම සඳහා ප්‍රමාණවත් මුදල් ප්‍රවාහයක් නොමැති වීමේ අවදානමයි. රාජ්‍ය උකස් සහ ආයෝජන බැංකුවේ වත්කම් / බැරකම් කළමනාකරණ කමිටුව විසින් ද්‍රවශීලතා අවදානම් කළමනාකරණය සහ බැංකුවේ ද්‍රවශීලතා තත්ත්වය නිරන්තරව අධීක්ෂණය කිරීමේ වගකීම දරයි. අවශ්‍ය නිවැරදි කිරීමේ ක්‍රියා හඳුනා ගැනීමට සහ විධායක ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව, වත්කම් සහ වගකීම් කමිටුව සහ අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව වෙත වාර්තා කිරීම සඳහා අවදානම් කළමනාකරණ අංශය විසින් ද්‍රවශීලතා අවදානම සහ පොලී අනුපාත අවදානම් අඛණ්ඩව තක්සේරු කරනු ලබයි. මූල්‍ය අංශයට අනුයුක්ත භාණ්ඩාගාර ඒකකය මඟින් ද්‍රවශීලතා අවදානම කළමනාකරණය කිරීම සිදු කරනු ලබන අතර අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් සීමාවන් / නියාමන අනුපාත ආදිය පිළිපැදීම අධීක්ෂණය කිරීම සහ වෙනත් අදාළ විශ්ලේෂණ සිදු කිරීම සහතික කරයි.

වත්කම් සංයුතිය



- මුදල්
- ආයෝජන
- ණය සහ අත්තිකාරම්
- දේපළ, පිරියත සහ උපකරණ
- කල් බදු වත්කම්
- වෙනත්

වගකීම් සංයුතිය




- තැන්පතු
- ණය ගැනීම්
- වෙනත්

සාමාන්‍යයෙන් කෙටි කාලීන හා මධ්‍ය කාලීන ණය දීම සඳහා බැංකු තැන්පතු කළඹ අදාළ වන අතර, දිගු කාලීන ණය දීම සඳහා බැංකුවේ ප්‍රධාන ව්‍යාපාරය වන නිවාස මූල්‍යකරණය අදාළ වේ. මීට අමතරව, බැංකුව ප්‍රධාන වශයෙන් ස්ථාවර අනුපාත ණය දෙන පරිසරයක් තුළ ක්‍රියාත්මක වන අතර එහි වගකීම්වලින් බහුතරයක් නැවත මිල ගණන්වලට නිරන්තරයෙන් යටත් වේ. එබැවින්, ආන්තිකය කෙරෙහි සැලකිය යුතු ලෙස බලපෑම් රටේ ආර්ථික තත්ත්වය හේතුවෙන් වසර තුළ ඉහළ ගිය පොලී පිරිවැය මඟින් ඇති කළ අතර, මෙම නොගැලපීම් සඳහා ක්‍රියාමාර්ග ගැනීමට බැංකුව කටයුතු කරනු ලබයි.

ඍණ අනුපාත සහ අසමාන්තර වෙනස්කම් ඇතුළු විවිධාකාර පොලී අනුපාත අවස්ථාවලදී වෙළඳ පොළ අවදානම දරා ගත හැකි මට්ටමක පවතින බව් සහතික කිරීම සඳහා බැංකුව විසින් අභ්‍යන්තර තහවුරු පරීක්ෂණ මාලාවක් ක්‍රියාත්මක කරනු ලබයි. සාමාන්‍ය මුදල් ප්‍රවාහ පුරෝකථනයන්, ද්‍රවශීලතා අනුපාතය සහ කල්පිරීම් පරතරය විශ්ලේෂණය අනුව ද්‍රවශීලතා සංචලනයන් මනිනු ලැබේ.

Market Risk



- ව්‍යවස්ථාපිත ද්‍රවශීල වත්කම් අනුපාතය
- ශුද්ධ ස්ථාවර අරමුදල් අනුපාතය
- ද්‍රවශීලතා ආවරණ අනුපාතය
- ප්‍රාග්ධන ප්‍රමාණාත්මක අනුපාතය

ද්‍රවශීලතා ගැටළු සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා බැංකුව අවිනිශ්චිත අරමුදල් සැලැස්මක් පවත්වාගෙන යනු ලබයි. මහ බැංකුව විසින් නියම කර ඇති මට්ටමට වඩා ද්‍රවශීල වත්කම් අනුපාතය පවත්වාගෙන යාම සහ සහතික කිරීම භාණ්ඩාගාර දෙපාර්තමේන්තුවේ වගකීම වේ. පූර්වාරක්ෂාව ලෙස වසර තුළදී නව වත්කම් සහ වගකීම් නිෂ්පාදන හඳුන්වා දීමට බැංකුව පියවර කිහිපයක් ගෙන ඇත. කාලසීමාවේ නොගැලපීම් අවම කර ගැනීමට සහ පාරිභෝගික අවශ්‍යතා සහ වෙළඳ පොළ තත්ත්වයන් යහපත්ව පවත්වා ගැනීම මෙහි අරමුණ වේ.

ශාඛා ජාලය දියුණු කිරීම තුළින් සිල්ලර තැන්පතු සඳහා යොමු වීම වැඩි වී ඇත. එබැවින් තොග තැන්පතු මත යැපීම අඩු වී ඇත.

මීට අමතරව, බැංකුව සඳහා මූලික බැංකුකරණ විසඳුමක් ලබා ගැනීම වෙනුවෙන් ගත් උත්සාහයන් සාර්ථක වූ අතර, මෙකී ක්‍රියාත්මක කිරීම 2024 වර්ෂයේදී සිදු කෙරෙනු ඇත. බැංකුවේ පාරිභෝගික පදනම වෙත පිරිනැමීමට බලාපොරොත්තුවන අමතර සේවාවන් හේතුවෙන් මෙම වෙනස මඟින් පාරිභෝගිකයාගේ පහසුව ඉහළ නංවනු ඇත.

මෙහෙයුම් අවදානම

මෙහෙයුම් අවදානම යනු ප්‍රමාණවත් නොවන හෝ අසාර්ථක අභ්‍යන්තර ක්‍රියාවලීන්, පුද්ගලයින් සහ පද්ධති හෝ බාහිර සිදුවීම් හේතුවෙන් පාඩු ඇති වීමේ අවදානමයි. මෙහෙයුම් අවදානමට නෛතික අවදානම ඇතුළත් නමුත් උපායමාර්ගික සහ කීර්තිනාම අවදානම ඇතුළත් නොවේ.

පුළුල් මෙහෙයුම් අවදානම් කළමනාකරණ රාමුවක් මඟින් මෙහෙයුම් අවදානම් ඵලදායී ලෙස හඳුනා ගැනීම සහ කළමනාකරණය කිරීම පිළිබඳ මාර්ගෝපදේශ සපයයි. "පළමු ආරක්ෂක මට්ටම" ලෙස දැක්වෙන ශාඛා සහ අංශ මඟින් මූලාරම්භයේදී අවදානම් හඳුනාගැනීමේ වගකීම දරයි. දෙවන ආරක්ෂක මට්ටම වන අවදානම් කළමනාකරණ අංශය මෙහෙයුම් අවදානම් රාමුව ක්‍රියාත්මක කිරීම සහ අවදානම් රුචිය තුළ අර්ථ දක්වා ඇති පරාමිතීන්ට එරෙහිව අවදානම් ක්‍රියාකාරිත්වය අධීක්ෂණය කිරීම සඳහා වගකිව යුතුය. විගණන සහ අනුකූලතා ඒකක මඟින් මෙහෙයුම් අවදානම් කළමනාකරණ ක්‍රියාවලීන්හි ප්‍රමාණවත් බව සහ සඵලතාවය පිළිබඳ සහතික වනු ලබයි.

අවදානම් කළමනාකරණ අංශය විසින් සියලුම ව්‍යාපාරික ඒකක සඳහා අවදානම් හඳුනාගැනීම සහ මැනීම, අවදානම් පාලන ස්වයං ඇගයීම (RCSA) සිදු කරනු ලබයි. එය මෙහෙයුම් අවදානම් හඳුනාගැනීමේ ඵලදායී මෙවලමක් ලෙස කටයුතු කරනු ලබයි. එමෙන්ම මෙහෙයුම් අවදානම් වරින් වර හඳුනා ගැනීමට හැකි වන පරිදි සිද්ධි වාර්තාකරණය පිළිබඳ ක්‍රියාමාර්ග බැංකුව විසින් ආරම්භ කර ඇත. අනපේක්ෂිත සිදුවීම්වලින් ඇතිවන පාඩු අවම කරගනිමින්, ඉක්මන් ප්‍රතිසාධනයක් ලබා ගැනීම සඳහා බැංකුව සිය ව්‍යාපාර අඛණ්ඩ සැලැස්ම ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට කටයුතු කරනු ලබයි.

අවදානම් රුචියට අනුකූලව පිරිවැය ඵලදායී ආකාරයෙන් මෙහෙයුම් අවදානම කළමනාකරණය කිරීම, පාලනය කිරීම සහ අවම කිරීම බැංකුව විසින් අරමුණු කරයි. බැංකුව සිය මෙහෙයුම් අවදානම් කළමනාකරණ ප්‍රවේශයන් වලදී මෙහෙයුම්වල සංවේදී ක්ෂේත්‍ර සඳහා ඉහළ මට්ටමේ පරිපූර්ණත්වයක් යොදා ගෙන ඇත.

අවදානම් කළමනාකරණය

තහවුරු පරීක්ෂණය

තහවුරු පරීක්ෂණය යනු බැංකුවක ඔරොත්තු දීමේ හැකියාව කෙරෙහි අවදානම් සහිත වූවද පිළියම් යෙදිය හැකි අහිතකර අවස්ථාවල බලපෑම් තක්සේරු කිරීම අරමුණු කරගත් ඉදිරි දැක්මක් සහිත ක්‍රියාවලියක් වේ. නියාමන මාර්ගෝපදේශ සහ කර්මාන්තයේ හොඳම භාවිතයන්ට අනුකූලව බැංකුවේ තහවුරු පරීක්ෂණ ප්‍රතිපත්තිය සකස් කර ඇත. අනපේක්ෂිත පාඩු සහ ගිවිසුම්ගත බැඳීම් සපුරාලීම සඳහා බැංකුවට ප්‍රාග්ධනය සහ ද්‍රවශීලතාවයේ ප්‍රමාණවත් ස්වාරක්ෂකයක් ඇති බව සහතික කිරීම සඳහා තහවුරු පරීක්ෂණය වරින් වර පවත්වනු ලබන අතර එහි ප්‍රතිඵල අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලබයි. මෙහෙයුම් පරිසරයේ වෙනස්කම් සැලකිල්ලට ගනිමින්, උපකල්පන සවිස්තරව සමාලෝචනය කරන ලද අතර ප්‍රතිපත්ති සහ රාමුව සඳහා අවශ්‍ය පරිදි වෙනස්කම් ඇතුළත් කරන ලදී.

තහවුරු පරීක්ෂණ ක්‍රියාවලියේ ප්‍රතිඵලය මනාව නිරීක්ෂණය කරනු ලබන අතර, අවශ්‍ය අවස්ථාවලදී ප්‍රතිකර්ම ක්‍රියාමාර්ග ගනු ලබයි. බැංකුව විසින් ගනු ලබන වෙනත් අවදානම් කළමනාකරණ ප්‍රවේශයන් සඳහා අතිරේකයක් ලෙස මෙය භාවිත කරයි.

2023.12.31 දිනට සිදු කරන ලද තහවුරු පරීක්ෂණ පහත දැක්වේ.

ණය අවදානම	ක්‍රියාකාරී නොවන ණය කාණ්ඩවල වෙනස්කම්/ වත්කම්වල ගුණාත්මකභාවය පිරිහීමේ සහ පැහැර හැරීමේ සම්භාවිතාව ආදී ආර්ථික සාධකවල අහිතකර සංචලනයන් හේතුවෙන් දුර්වලතා වැඩි වීම. ඇපකරයේ වටිනාකම පහත වැටීම
ණය සංකේන්ද්‍රණ අවදානම	ණය දෙන ගෙවීම් පාර්ශවයන් සහ අංශවල HHI අගයන් වැඩි වීම
පොලී අනුපාත අවදානම	පොලී අනුපාතවල අහිතකර සංචලනයන්
ද්‍රවශීලතා අවදානම	බැංකුවේ වත්කම් සහ වගකීම් යන දෙකෙහිම අහිතකර ක්‍රියාකාරකම් මඟින් ද්‍රවශීලතා ආතති තත්වයන් ඇති කරයි. SLAR ල LCR සහ ප්‍රාග්ධනය මත බලපෑම්

මානව සම්පත් කළමනාකරණය

සංවිධානයේ ප්‍රතිලාභ සහ වටිනාකම් සඳහා මූලික දායකත්වය සපයනු ලබන්නේ සේවකයින්ය. සංවිධානයක ශේෂ පත්‍රයේ හෝ ගිණුම් පොත්වල "වත්කම්" යටතේ සේවකයින් දැක්විය හැකිය. කෙසේ වෙතත්, සේවකයින් යනු මූල්‍ය වටිනාකමක් ලබා දීමට අපහසු ඉතා වටිනා වත්කමක් වේ.

අපගේ සියලු පාරිභෝගිකයින්ට වටිනාකමක් ලබාදෙන අපගේ දැක්ම යථාර්යක් බවට පත් කරලනුයේ අපගේ සේවකයින්ය. එබැවින්, ඔවුන්ට විශිෂ්ටත්වය කරා පියමං කරන්නට සියලු පහසුකම් පිරි සහ ප්‍රබෝධමත් සේවා ස්ථානයක් ලබා දීමට අපි කටයුතු කරන්නෙමු. පුහුණු හා සංවර්ධන ක්‍රියාකාරකම් සහ සේවක ක්‍රියාකාරකම් තුළින් අපගේ සේවකයින්ගේ දැනුම, කුසලතා සහ හැකියාවන් වැඩිදියුණු කිරීම, පුද්ගලයින්ට දියුණුවන්නට සහ ඔපමට්ටම් වන්නට ඉඩ සලසන සේවා ස්ථානයක් නිර්මාණය කිරීම අපගේ ආයෝජන තුළින් අරමුණු කරයි. සමාගමේ වර්ධනය සහතික කරනු ලබන හොඳම දක්ෂතා ආකර්ෂණය කර ගැනීම, ශක්තිමත් කිරීම සහ රඳවා තබා ගැනීම සම්බන්ධයෙන් රාජ්‍ය උකස් සහ ආයෝජන බැංකුව තුළ නිරන්තරයෙන් අවධානය යොමු වේ.

කාර්ය මණ්ඩල සංඛ්‍යාව

වර්ෂය සඳහා මුළු කාර්ය මණ්ඩලය 356 ක් විය. එය සාපේක්ෂව කුඩා අගයක් වූවද, බැංකුවේ කාර්ය සාධනය සඳහා ඔවුන් ලබා දුන් දායකත්වය ඉමහත්ය. වර්ෂය තුළ කාර්ය මණ්ඩල සාමාජිකයින් 37 දෙනෙකු සේවයෙන් ඉවත් වූ අතරින්, 14 දෙනෙකු බැංකුවෙන් විශ්‍රාම ගනු ලැබුණ අතර; ඉල්ලා අස්වීම සහ වෙනත් හේතූන් මත කාර්ය මණ්ඩල සාමාජිකයින් 23 දෙනෙකු සේවයෙන් ඉවත් වනු ලැබුණි. බැංකුවේ බඳවා ගැනීමේ ප්‍රතිපත්තියට අනුව වසර තුලදී නව කාර් ය මණ්ඩල සාමාජිකයින් 08 දෙනෙකු පමණ බඳවා ගනු ලැබීය.

කාර්ය මණ්ඩල විචලනය

කළමනාකරණ මට්ටම	සේවක සංඛ්‍යාවේ විචලනය		
	විශ්‍රාමික	ඉල්ලා අස් වූ/ වෙනත්	බඳවා ගැනීම්
ආයතනික කළමනාකරණය		3	2
ජේෂ්ඨ කළමනාකරණය	1		1
විධායක		7	3
විධායක නොවන	13	10	2
කොන්ත්‍රාත් පදනම /පුහුණු බැංකු සහයක		3	0
එකතුව	14	23	8

මට්ටම් අනුව කාර්ය මණ්ඩල සංඛ්‍යාව

කළමනාකරණ මට්ටම	2023.12.31 දිනට සේවක සංඛ්‍යාව
ආයතනික කළමනාකරණය	11
ජේෂ්ඨ කළමනාකරණය	5
විධායක	109
විධායක නොවන	205
කොන්ත්‍රාත් පදනම /පුහුණු බැංකු සහයක	26
එකතුව	356

ස්ත්‍රී/පුරුෂභාවය

සමානාත්මතාවයට අනුව රැකියා අවස්ථා සපයන්නෙකු ලෙස, රාජ්‍ය උකස් සහ ආයෝජන බැංකුව ස්ත්‍රී සහ පුරුෂ යන දෙපාර්ශ්වය සඳහා සමසේ සලකමින් රැකියා අවස්ථා ලබා දී ඇත. 2023 වර්ෂයේදී රාජ්‍ය උකස් සහ ආයෝජන බැංකුවේ ස්ත්‍රී පුරුෂ සේවක ප්‍රතිශතයෙන් 49% ක් පුරුෂ පාර්ශ්වයෙන්ද, 51% ක් කාන්තා පාර්ශ්වයෙන්ද යුතු විය.

වයස් කාණ්ඩ අනුව සේවක සංඛ්‍යාව

වඩාත් පළපුරුදු සහ ජේෂ්ඨ කාර්ය මණ්ඩලයක් 'අප' බැංකුවබැංකුව සතුය. බැංකුවේ කාර්ය මණ්ඩලයෙන් 49% ක ප්‍රමාණයක් වයස අවුරුදු 40 ඉක්මවූ පිරිස වෙති.

වයස් කාණ්ඩය	2023.12.31 දිනට සේවක සංඛ්‍යාව
50 හෝ ඊට වැඩි	69
40 - 49	104
30 - 39	136
29 හෝ ඊට අඩු	47
එකතුව	356

කුසලතා කළමනාකරණය

අපගේ සියලුම පාරිභෝගිකයින්ට වඩා යහපත් දේ ලබා දීමට හැකියාව ඇති කරනු ලබන හෙයින් නිපුණත්ව කළමනාකරණය අපි ප්‍රමුඛ කොට සලකන්නෙමු. බැංකුවට එහි පූර්ණ හැකියාවන් යථාර්ථයක් බවට පත් කර ගැනීමට හැකි වන පරිදි බැංකුව තුළ හොඳම සම්පත් පවතින බවත් රඳවා ගන්නා බවත් අපි සහතික කරලන්නෙමු. අනාගත නායකයින් බවට පත්වීම සඳහා හැකියාවන් සංවර්ධනය කිරීමට අපගේ ක්‍රියාශීලි කණ්ඩායම වෙනුවෙන් අපි ආයෝජන සිදු කරන්නෙමු.

කුසලතා ආකර්ෂණය සහ අත්පත් කරගැනීම

අපගේ ව්‍යාපාරික අවශ්‍යතාවලට වඩාත් සුදුසු අපේක්ෂකයා තෝරා ගැනීම සඳහා සකස් කර ඇති බැංකුවේ බඳවා ගැනීමේ ක්‍රියා පටිපාටිය හරහා නව කුසලතා අත්පත් කර ගැනීම සිදු කරනු ලබයි. අප අපගේ සංස්කෘතියට ගැළපෙන සහ එය ශක්තිමත් කරනු ලබන කුසලතා, දැනුම, හැකියාවන් සහ හැසිරීම් සහිත දක්ෂයින් සඳහා ප්‍රමුඛත්වය ලබා දෙන්නෙමු. පුරප්පාඩු පවතින සෑම අවස්ථාවකදීම, අභ්‍යන්තර දක්ෂතා ඇති අය සඳහා වැඩි සැලකිල්ලක් දක්වන අතර, අභ්‍යන්තර දක්ෂතා නොමැති අවස්ථාවකදී බාහිර සේවකයින්ට 'බඳවා ගැනීමට' අවස්ථාව ලබා දේ.

පුහුණුව සහ සංවර්ධනය

සේවකයාගේ දැනුම, නිපුණතා, කුසලතා, ආකල්ප සහ කාර්ය සාධනය වැඩි දියුණු කිරීම සඳහා පුහුණුව සහ සංවර්ධනය ලබා දීම යනු රාජ්‍ය උකස් සහ ආයෝජන බැංකුව වෙත වර්ධනයක් අත්කර දෙනු ලබන මූලිකාංගයකි. අපගේ සේවකයින්ව ශක්තිමත් කරමින්, ඔවුන්ගේ කුසලතා සහ දැනුම වැඩි දියුණු කිරීම සඳහා පුහුණු සහ සංවර්ධන අවස්ථා පිරිනමනු ලබයි. රාජකාරී වඩාත් හොඳින් ඉටු කිරීම සහ අනාගත වගකීම් සඳහා සූදානම් කිරීම සඳහා සෑම තරාතිරමකම සේවකයින්ව පුහුණු කිරීමට සහ විවිධ කාර්යයන් තුළ සංවර්ධනය කිරීමට බැංකුව කටයුතු කරනු ලබයි.

2023 වර්ෂය තුළ අභ්‍යන්තර හා බාහිර 'පාර්ශවයන් මඟින්' පුහුණුව ලබාදීමට අප සමත් වූ අතර, සමාලෝචිත වර්ෂය තුළ අපගේ සේවකයින් සඳහා අභ්‍යන්තර පුහුණු වැඩසටහන් 02 ක් සහ බාහිර පුහුණු වැඩසටහන් 31 ක් පවත්වනු ලැබුණි.

මානව සම්පත් කළමනාකරණය

2023 වර්ෂයේදී ලබා දුන් විවිධ පුහුණු වැඩසටහන් සඳහා සේවක 'මහත්ම මහත්මීන්ගේ' සහභාගීත්වය පහත සඳහන් වගුවෙන් දැක්වේ.

ප්‍රධාන ක්ෂේත්‍රය	සේවක සංඛ්‍යාව
දැනුම සහ නිපුණතා සංවර්ධන පුහුණුව	51
ආකල්ප සංවර්ධන පුහුණුව / අභිප්‍රේරණ පුහුණුව	90
සම්මන්ත්‍රණ, වැඩමුළු, සාමාජික ගාස්තු, ප්‍රශ්න විචාරාත්මක තරඟ	42

සේවකයින් සේවයේ යෙදී සිටි වසර ගණන

සේවා කාණ්ඩය (වසර)	2023.12.31 දිනට සේවකයින් සංඛ්‍යාව
0-4	58
5-9	116
10-14	65
15-19	47
20 න් ඉහළ	70
එකතුව	356

බැංකුවේ සේවකයන්ගෙන් 84% ක් පමණ වසර 5 කට වැඩි සේවා කාලයක් සපුරමින් බැංකුවේ සංවර්ධනය උදෙසා දායක වී ඇත. සේවක මහත්ම මහත්මීන්ගේ රැකියා තෘප්තිය වැඩි කිරීම සඳහා කාර්ය මණ්ඩලයට මූල්‍ය මෙන්ම මූල්‍ය නොවන ප්‍රතිලාභ ලබා දීමට බැංකුව මඟින් කටයුතු කර ඇත.

කෙසේ වෙතත්, සේවකයින්ගේ නොපසුබස්නා සහ කැපවූ උත්සාහයන් තුළින් මෙකී බැංකුවේ සාර් ථකත්වය ලගා කරගැනීමට හැකියාව ලැබී ඇත.

ඉදිරි අපේක්ෂාවන්

නව විශ්ලේෂණය හරහා, සේවකයින්ගේ තාක්ෂණික සහ මෘදු කුසලතා අංශ ආවරණය වන පරිදි වඩාත් පුළුල් සහ සියල්ල ඇතුළත් පුහුණු සැලැස්මක් නිර්මාණය කිරීමට අපි බලාපොරොත්තු වන්නෙමු.

ආයතනයේ ඉහළ කළමණාකාරී පුද්ගලයන්ට අවශ්‍ය මට්ටමට ළඟාවීම සඳහා ඔවුන්ගේ කුසලතා සහ දැනුම වර්ධනය කර ගැනීමේදී අවධානය යොමු කිරීම තුළින් අනුප්‍රාප්තික සැලසුම් ක්‍රියාවලිය වැඩිදියුණු කිරීම සහ ශක්තිමත් කිරීම කෙරෙහි ඉදිරි වසරේදී අවධානය යොමු කරනු ඇත. වඩා හොඳ සේවා ස්ථානයක් සහ වඩාත් තෘප්තිමත් සේවකයින් නිර්මාණය කිරීමට අපි උත්සාහ සේවකයන් සඳහා පුහුණු සහ සංවර් ධන අවශ්‍යතාවයන් සවිස්තරාත්මක ලෙස විශ්ලේෂණය කරමින් පුහුණු වැඩසටහන් සැලැස්මක් නිර් මාණය කිරීම තුල සේවකයන්ගේ දැනුම තාක්ෂණික සහ මානව කුසලතා යන අංශ ආවරණය කරමින් පුහුණුව ලබාදෙමින් සේවකයන් ශක්තිමත් කිරීම සඳහා කටයුතු කිරීමට බලාපොරොත්තු වන්නමෙු.

2023 -සීමා අභිබවා: ආයතනික සහ සේවා සන්නාම පිළිබඳ සමාලෝචනය

2023 වර්ෂයේදී, පාරිභෝගිකයින් සහ පාර්ශවකරුවන් වැඩි වශයෙන් ඩිජිටල් මාධ්‍ය වෙත යොමු විය. විශේෂයෙන්ම ආර්ථික අපහසුතාවන් හේතුවෙන් පාරිභෝගිකයන් මුහුණ දුන් අභියෝග සහ සීමාවන් සැලකිල්ලට ගනිමින් නිෂ්පාදන සහ සේවා වෙත ප්‍රවේශ විය හැකි, යාවත්කාලීන තොරතුරු සඳහා පවතින ඉල්ලුම සපුරාලීම තීරණාත්මක විය.

පාරිභෝගිකයින් හට පහසු ප්‍රවේශයක් සහතික කිරීම සඳහා ඩිජිටල් මාධ්‍ය තුළින් නිෂ්පාදන සහ සේවා පිළිබඳ යාවත්කාලීන තොරතුරු ඉදිරිපත් කරන ලදී. බැංකුවේ වෙබ් අඩවිය, සමාජ මාධ්‍ය, කෙටි පණිවුඩ, ඍජු තැපැල් පණිවුඩ සහ ඩිජිටල් මහජන සම්බන්ධතා ප්‍රයත්නයන් ඔස්සේ සන්නාමය පිළිබඳ දැනුවත් කිරීම මෙහි අරමුණ විය.

බැංකුවේ සමාජ මාධ්‍ය වේදිකා ප්‍රධාන සන්නිවේදන මාධ්‍ය විය. ඒ හරහා නිෂ්පාදන හා සේවා තොරතුරු, බැංකුවේ මූලපිරීම් පිළිබඳ ප්‍රවෘත්ති මෙන්ම නිෂ්පාදන හා සේවා උත්පාදන සම්බන්ධයෙන් ගනුදෙනුකරුවන් සහ මහජනයා අඛණ්ඩව දැනුවත් කරනු ලැබුණි. බැංකුව ඩිජිටල්කරණය වෙත යොමු වීමත් සමඟ ඒ වෙනුවෙන් ආයෝජන කිරීමට කඩිනම් පියවර ගන්නා ලද අතර, ඒ තුළින් ප්‍රවේශය සහ සබඳතා ගොඩනැඟීම අරමුණු කරන ලදී. වසර පුරා සිදු කළ මෙම අඛණ්ඩ මූලපිරීම් මඟින් බැංකුවේ සමාජ මාධ්‍ය වේදිකා හරහා බලපෑම් ඇති කිරීම, ප්‍රවේශය සහ නියැලීම සම්බන්ධයෙන් සැලකිය යුතු වර්ධනයක් ඇති විය. තවද, සමාජ මාධ්‍ය වේදිකාවල අන්තර්ගතය උත්පාදකයන් ඇති කරන ආකාරයෙන් පවත්වා ගෙන යන ලද අතර එය වසර තුළදී ණය අංශය සහ ශාඛා සඳහා හිතකර දායකත්වයක් ලබා දෙන ලදී. ස්ථාවර තැන්පතු සහ සේවක අර්ථසාධක අරමුදලේ ණය නිෂ්පාදන කෙරෙහි මූලික අවධානය යොමු කරමින් නිශ්චිත කණ්ඩායමක් සහ භූගෝලීය ප්‍රදේශ සඳහා සමාජ මාධ්‍ය වේදිකාවල දැනුවත් කිරීම් සිදු කරන ලදී.

අභියෝගාත්මක ආර්ථික තත්ත්වයන් හේතුවෙන්, රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව විසින් වහාම ණය සහ තැන්පතු යන ද්විත්වය සඳහා පොලී අනුපාත ඉහළ නංවනු ලැබීය. බැංකුව ඩිජිටල් නාලිකා හරහා අනුපාත පිළිබඳ දත්ත නුවමාරු කර ගැනීම කෙරෙහි අවධානය යොමු කළේය. එමෙන්ම, පාරිභෝගිකයින්ට ඔවුන්ගේ ණය වාරිකවලට අදාළ ඕනෑම ගැටළුවක් හෝ දුක්ගැනවිලි සන්නිවේදනය කිරීමට මෙකී මාධ්‍ය භාවිත කිරීමට දිරිමත් කරන ලදී.

වර්ෂය තුළදී බැංකුව විසින් උපරි රේඛීය (ATL) සහ අධෝ රේඛීය (BTL) යන මාධ්‍ය ද්විත්වය හරහා විවිධ ප්‍රවර්ධන කටයුතු ක්‍රියාවට නංවමින්, සේවක අර්ථසාධක අරමුදලේ ණය කළඹ පුළුල් කිරීම කෙරෙහි අවධානය යොමු කරන ලදී. එමෙන්ම, බැංකුව විවිධ මාධ්‍ය සහ ප්‍රවර්ධන ක්‍රියාකාරකම් හරහා ස්ථාවර තැන්පතු අනුපාත පිළිබඳ දැනුවත් කිරීම් සිදු කරමින් රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව සමඟ ආයෝජනය කිරීමට ගනුදෙනුකරුවන් දිරිමත් කරන ලදී. බැංකුවේ නිෂ්පාදන සහ සේවා සම්බන්ධයෙන් දැනුවත් කිරීම් සිදු කිරීමට නගර කිහිපයක් පුරා සාර්ථක ශාඛා සහ විදි ප්‍රවර්ධන සංවිධානය කළ අතර, ඒ හරහා පාරිභෝගිකයින් ආකර්ෂණය කර ගැනීම මෙන්ම ශාඛාවල කාර්යසාධනය වර්ධනය කරලීම සිදු කරනු ලැබුණි. මෙකී මූලපිරීම් හේතුවෙන් සේවක අර්ථසාධක අරමුදලේ ණය කළඹ සහ බැංකුවේ ස්ථාවර තැන්පතු පදනම සැලකිය යුතු ලෙස වර්ධනය විය.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව මඟින් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සමඟ එක්ව කුරුණෑගල දිස්ත්‍රික්කයේ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් ඉලක්ක කර ගනිමින් සාර්ථක වැඩමුළුවක් සංවිධානය කරන ලදී. කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් මුහුණ දෙන ගැටළු සඳහා විසඳුම් ලබා දෙමින් ඔවුන්ගේ ව්‍යාපාර දියුණු කිරීමට සහයෝගය ලබා දීම හේතුවෙන් මෙකී කාර්යභාර්ය සාර්ථක විය. මීට අමතරව, රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව විසින් විවිධ ක්‍රියාකාරකම් හරහා කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් දිරිමත් කරන ලදී.

ආයතනික, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සහ පෞද්ගලික බැංකුකරණ අංශයන්ට මූල්‍ය විසඳුම් පිරිනැමීම හරහා බැංකුව සිය සන්නාමයේ පැවැත්ම තවදුරටත් ශක්තිමත් කරනු ලැබුණි. මෙකී ප්‍රයත්නය මුද්‍රිත සහ ඩිජිටල් මාධ්‍ය යන දෙඅංශයේම සිය පැවැත්ම ඉහළ නැංවීම අරමුණු කරගත් මහජන දැනුවත් කිරීමේ ක්‍රියාමාර්ග ඔස්සේ පවත්වාගෙන යන ලදී.

ආයතනික සමාජයීය වගකීම් (CSR)

පරිපූර්ණ දායකයත්වයක් ඔස්සේ දිගු කාලීන සහ තිරසාර ප්‍රතිඵල පවත්වා ගැනීම සහ යහපත් සබඳතා පෝෂණය කිරීම අරමුණු කර ගනිමින් රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව සිය සේවා ලබා ගන්නා ප්‍රජා කණ්ඩායම් වෙත නිරන්තරයෙන් සැලකිල්ලක් දක්වනු ලබයි.

ස්වභාවික විපත්, කාලගුණ සංසිද්ධි යනාදී අර්බුදකාරී අවස්ථාවන්හිදී සංවේදීව ප්‍රතිචාර දක්වමින්, ප්‍රදේශයන්හි සමාජය හා වෙළඳ කටයුතු සම්බන්ධ ක්‍රියාකාරකම්වල ක්‍රියාකාරී හවුල්කරුවෙකු ලෙස දිවයින පුරා ව්‍යාප්ත වී ඇති බැංකුවේ ශාඛා ජාලය මඟින් එහි ප්‍රජාව සමඟ ක්‍රියාකාරීව කටයුතු කරනු ලබයි. විශාල ප්‍රජාවක් සමඟ සම්බන්ධ වෙමින් රටේ දරුවන්ගේ සහ තරුණයන්ගේ අධ්‍යාපනය සහ යහපැවැත්ම කෙරෙහි අවධානය යොමු කරනු ලබන ආයතනික සමාජයීය වගකීම් පිළිබඳ උපාය මාර්ග බැංකුව විසින් ක්‍රියාත්මක කරනු ලබයි.


බැංකුවේ ප්‍රතිපත්තිවලට අනුකූලව සමාජ වගකීම් සහ තිරසාරභාවය වෙනුවෙන් කැපවීමේ කාර්යභාරයක් වශයෙන් ප්‍රජා සහ පාරිසරික ව්‍යාපෘති සඳහා බැංකුව අඛණ්ඩව සහය වනු ලබයි. එහි ආයතනික සහ සමාජයීය වගකීම්වල මූලපිරීමක් වශයෙන් රාජ්‍ය උකස් සහ ආයෝජන බැංකුව විසින් ශ්‍රී ලංකා සන්නාහ සන්නද්ධ බළකා කඳවුර - රොක් හවුස් සමඟ සහයෝගයෙන් කටයුතු කරනු ලැබුණි. යුද්ධයේදී සොල්දාදුවන් ලෙස සේවයේ නියැලීමෙන් දිවි අහිමි වූවන්ගේ දරුවන් වෙනුවෙන් බැංකුව විසින් පොත්පත් සහ ශිෂ්‍යත්ව ලබා දෙන ලදී. එමෙන්ම රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව විසින් පහත් ශ්‍රේණියේ හමුදා පවුල්වල දරුවන්ට පාසල් පොත් සහ අනෙකුත් ද්‍රව්‍ය සැපයීමෙන්, ඔවුන්ගේ අධ්‍යාපනය සහ යහපැවැත්ම වෙනුවෙන් තවදුරටත් දායක වනු ලැබුණි.

එසේම, රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව, ශ්‍රී ලංකා යුද හමුදා නිලධාරීන්ගේ දරුවන්ට ඔවුන්ගේ අධ්‍යාපන අභිලාසයන් සඳහා සහය දැක්වීමේ අරමුණින් ශ්‍රී ලංකා යුද හමුදා සුභසාධක සංගමය සමඟ කටයුතු කරනු ලැබුණි. උසස් අධ්‍යාපනය ලබන කාලය තුළ මූල්‍ය පීඩනයන් අවම කරලීමේ අරමුණින් විශ්වවිද්‍යාල ප්‍රවේශය ලද සිසුන් සඳහා බැංකුව විසින් ශිෂ්‍යත්ව ප්‍රදානය කරන ලදී. ශ්‍රී ලංකා යුධ හමුදා ප්‍රජාවේ සුදුසුකම් ලත් පිරිසගේ දරුවන්ට ඔවුන්ගේ අධ්‍යයන කටයුතු සඳහා සහය වීමට සහ සවිබල ගැන්වීමට රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව විසින් දක්වන ලද කැපවීම මෙකී සහයෝගීතාවයන් තුළින් පිළිබිඹු වේ.

ආයතනික සැලසුම් තුළින් ක්‍රියාත්මක වීම



අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව	60
මූල්‍ය වාර්තාකරණය සම්බන්ධයෙන් අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය	63
අභ්‍යන්තර පාලනය පිළිබඳ විගණකාධිපති වාර්තාව	65
මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ වගකීම	67
විගණකාධිපති වාර්තාව	69
මූල්‍ය තත්ත්ව ප්‍රකාශය	74
ආදායම් ප්‍රකාශය	75
විස්තීර්ණ ආදායම් ප්‍රකාශය	75
ස්කන්ධය වෙනස්වීම් ප්‍රකාශය	76
මුදල් ප්‍රවාහ ප්‍රකාශය	77
මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්	78
දස වසරක සංඛ්‍යාත්මක සාරාංශය	124



අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව

1975 අංක 13 දරන රාජ්‍ය උකස් සහ ආයෝජන බැංකු නීතිය මගින් රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව ශ්‍රී ලංකාව තුළ සංස්ථාපිත කරන ලද අතර, 1988 අංක 30 දරන බැංකු පනත සහ එහි සංශෝධන ප්‍රකාරව බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් ලෙස ප්‍රකාශයට පත් කර ඇත.

1988 අංක 30 දරන බැංකු පනත සහ එහි සංශෝධනවලට යටත්ව සහ 1975 අංක 13 දරන රාජ්‍ය උකස් සහ ආයෝජන බැංකු නීතිය හා එහි සංශෝධනයන්ගේ අවශ්‍යතාවයන්ට අනුකූල වන පරිදි, 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා බැංකුවේ විගණනය කරන ලද ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශ සහ මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපති වාර්තාව ඇතුළුව බැංකුවේ කටයුතු පිළිබඳව අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව සමඟින් බැංකුවේ කටයුතු පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව අධ්‍යක්ෂවරු ඉදිරිපත් කරන්නේ ඉමහත් සතුටිනි.

බැංකුවේ ප්‍රධාන ක්‍රියාකාරකම්

රාජ්‍ය උකස් සහ ආයෝජන බැංකුවේ ප්‍රධාන ක්‍රියාකාරකම් වූයේ නිවාස කටයුතු, කෘෂිකාර්මික හා කාර්මික සංවර්ධන මූල්‍ය සහ තැන්පතු භාවිතය ප්‍රවර්ධනය කිරීමයි. වර්ෂය තුළ ප්‍රධාන ක්‍රියාකාරකම්වල ස්වභාවයේ සැලකිය යුතු වෙනසක් සිදුවී නොමැත. බැංකුව, රටේ නීති සහ රෙගුලාසිවලට පටහැනි කිසිදු ක්‍රියාකාරකමක නිරත වී නැත. සංශෝධිත 1975 අංක 13 දරන රාජ්‍ය උකස් සහ ආයෝජන බැංකු නීතියේ විධිවිධාන යටතේ, සභාපතිවරයා ඇතුළු විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂවරු හත් දෙනෙකුගෙන් අධ්‍යක්ෂ මණ්ඩලය සමන්විත වන අතර, සංශෝධිත පරිදි 1975 අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු නීතියේ 7 වගන්තියට අනුකූලව අමාත්‍යවරයා විසින් ඔවුන් පත් කරනු ලබයි. විධායක අධ්‍යක්ෂවරු කිසිවෙකු බැංකුවේ නොමැත. එසේ පත් කරන ලද අධ්‍යක්ෂවරු තිදෙනෙකු පහත සඳහන් අමාත්‍යාංශවල නියෝජිතයින් වේ; (අ) කෘෂිකර්ම විෂයභාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශය; (ආ) නිවාස විෂයභාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශය; (ඇ) පශු සම්පත් සංවර්ධන විෂයභාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශය. එක් අධ්‍යක්ෂවරයෙකු භාණ්ඩාගාර නියෝජිතයා ලෙස පත්කර ඇත.

ඕනෑම අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමකදී ගණපූරණය සඳහා අධ්‍යක්ෂවරු නවදෙනෙකු අතුරින් සාමාජිකයින් තිදෙනෙකු ප්‍රමාණවත් වේ. රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු නීතිය සහ බැංකු පනත අනුව අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් අවම වශයෙන් මසකට එක් වතාවක් හෝ සභාපතිවරයාට අවශ්‍ය යැයි හැඟීයන විට නිතර නිතර වුවත් පැවැත්විය හැකිය. 2023 වසර තුළදී රැස්වීම් 11 පවත්වා ඇත.

අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා අධ්‍යක්ෂවරුන්ගේ පැමිණීම:

	අධ්‍යක්ෂවරයාගේ නම	සහභාගී විය යුතු රැස්වීම් ගණන	සහභාගී වූ රැස්වීම් ගණන
1	ජේ. එම් සුසෙදාසන් මහතා - සභාපති	11	11
2	එස්. කේ. ඒ. ගලප්පත්ති මහතා		10
3	බී. ආර් මාඩිහහේවා මහතා		11
4	එච්. සී. ඩී. එල් සිල්වා මහතා		11
5	මහාචාර්ය ඩී. ඒ. එම් පෙරේරා මහතා		11

කොන්ත්‍රාත් පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ උනන්දුව

සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු ප්‍රතිපත්තිය මඟින් විනිවිදභාවය සහ අතේ දුරින් වූ මිලකරණය මත පදනම්ව බැංකුව සහ ඊට අදාළ පාර්ශ්ව අතර ගනුදෙනු සිදු වන බව සහතික කිරීම අරමුණු කරයි.

මෙම ප්‍රතිපත්ති මඟින් සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනුවල ප්‍රමාණාත්මකභාවය තීරණය කරනු ලබන පදනම සහ බැංකුව විසින් සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු සමඟ කටයුතු කරන ආකාරය පෙන්වා දේ. බැංකුව විසින් බැංකු පනත යටතේ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත්කළ නියෝගවලට සමගාමීවන සම්බන්ධිත අදාළ ගනුදෙනු ප්‍රතිපත්තිය අනුගමනය කරනු ලබයි.

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ගනුදෙනු කරන ලද හෝ ගනුදෙනු කිරීමට යෝජනා කර ඇති යම්කිසි ව්‍යාපාර ගනුදෙනුවක් පිළිබඳව සෘජුව හෝ වක්‍රව බැංකුවේ අධ්‍යක්ෂවරයෙකු හෝ ඔහුගේ කලත්‍රයා හෝ යැපෙන දරුවකු හෝ දරුවන් උනන්දුවක් දක්වා තිබේ නම්, එම ගනුදෙනුව සඳහා දක්වා තිබූ උනන්දුවේ ස්වාභාවය පිළිබඳ එවැනි ගනුදෙනු සාකච්ඡා කරන රැස්වීමක දී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් එළිදරවු කළ යුතු වේ.

අධ්‍යක්ෂවරුන් විසින් ඔවුන් බැඳියාවක් දක්වන කරුණු සම්බන්ධයෙන් ජන්දය ප්‍රකාශය කිරීමෙන් වැළකී සිටින බව සහතික කරලීමට අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී ඔවුන්ගේ අධ්‍යක්ෂ ධූර සහ සම්බන්ධතා අනාවරණය කළ යුතුය. බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය සම්බන්ධයෙන්, 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා බැංකුව සමඟ යම් ගිවිසුමක් හෝ යෝජිත ගිවිසුමක් තුළ කිසිදු අධ්‍යක්ෂවරයෙකු සෘජුව හෝ වක්‍රව බැඳියාවක් නොමැති බව වාර්තා කරමි.

මෙහෙයුම් සමාලෝචනය සහ අනාගත සංවර්ධන

2023 මූල්‍ය වර්ෂය තුළ බැංකුවේ මූල්‍ය සහ මෙහෙයුම් කාර්යසාධනය සහ අනාගත සංවර්ධනය පිළිබඳ සහ එම මෙහෙයුම්වල ප්‍රතිඵල පිළිබඳ දළ විශ්ලේෂණයක් මෙම වාර්ෂික වාර්තාවේ පිළිවෙලින් අංක 3 සිට 15 දක්වා පිටුවල දක්වා ඇති සභාපතිගේ වාර්තාව, සාමාන්‍යාධිකාරී/ ප්‍ර.වි.නි. ගේ වාර්තාව සහ මූල්‍ය සමාලෝචනය තුළ අන්තර්ගත වේ. එම වාර්තා මෙම වාර්ෂික වාර්තාවේ අත්‍යවශ්‍ය කොටසකි.

සාමාන්‍යාධිකාරී / ප්‍රධාන විධායක නිලධාරී (ප්‍ර.වි.නි.)

සාමාන්‍යාධිකාරී/ ප්‍රධාන විධායක නිලධාරී (ප්‍ර.වි.නි.) යනු බැංකුව තුළ ඉහළම ශ්‍රේණියේ පුද්ගලයා වන අතර අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඔහුව පත් කරනු ලැබේ. ඔහුගේ මූලික වගකීම් අතරට බැංකුවේ කළමනාකරණ සහ මෙහෙයුම් කටයුතු ඇතුළත් වේ. බැංකුවේ තිරසාර සංවර්ධනය සාක්ෂාත් කර ගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද ක්‍රමෝපායික අරමුණු, ආයතනික සාරධර්ම සහ සමස්ත අවදානම් ප්‍රතිපත්ති සහ අවදානම් කළමනාකරණ ක්‍රියා පටිපාටිවලට අනුකූලව බැංකුවේ ව්‍යාපාරයේ එදිනෙදා කළමනාකරණ කටයුතු ඔහු විසින් සිදු කරයි.

දැක්ම, මෙහෙවර සහ වටිනාකම්

දැක්ම, මෙහෙවර සහ වටිනාකම් මඟින් බැංකුව ගමන් කරන දිශාව සහ සාක්ෂාත් කර ගැනීමට උත්සාහ කරන දෑ පිළිබඳ සියලු දෙනාගේ අවධානය යොමු කරයි. තවද එමඟින් බැංකුවේ මූලික සාරධර්ම සහ සේවකයින්ගේ හැසිරීම අපේක්ෂා කරන ආකාරය පැහැදිලි කරයි. බැංකුව එහි දැක්ම සාක්ෂාත් කර ගැනීම උදෙසා ඉහළ මට්ටමක සදාචාර ප්‍රමිතීන් අනුව සිය ව්‍යාපාරික කටයුතු පවත්වනු ලබයි. බැංකුවේ දැක්ම, මෙහෙවර සහ ආචාර ධර්ම පිළිබඳ මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 02 හි දක්වා ඇත.

ආයතනික පාලනය

ඵලදායී ආයතනික පාලන ව්‍යුහයක් සහ ක්‍රියාවලියක් වෙනුවෙන් අධ්‍යක්ෂ මණ්ඩලය කැපවී සිටී. ඵලදායී පාලනය මඟින් තිරසාර වගකීම් සහගත වර්ධනය සඳහා මඟ පෙන්වන බැව් අධ්‍යක්ෂ මණ්ඩලය විශ්වාස කරයි. ආයතනික පාලන ප්‍රතිපත්ති මඟින් බැංකුවේ මූල්‍ය, මෙහෙයුම් සහ අනුකූලතා කාර්යයන් ඵලදායී ලෙස මෙහෙයවීම සහ පාලනය කිරීම සිදු කරනු ලබයි. ආයතනික පාලන වාර්තාව මෙම වාර්ෂික වාර්තාවේ 22 සිට 42 දක්වා පිටුවල දක්වා ඇත.

අධ්‍යක්ෂ මණ්ඩල අනු කමිටු

බැංකුවේ කටයුතු පාලනය කිරීම සහතික කිරීම සඳහා බැංකු පනතේ විධානයන්ට අනුකූලව අනු කමිටු හතරක් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත්කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව

බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව මඟින් බැංකුවේ මූල්‍ය තොරතුරු සමාලෝචනය කරයි. බැංකුවේ මූල්‍ය ප්‍රකාශනවල අඛණ්ඩතාව, එහි වාර්ෂික වාර්තාව, ගිණුම් සහ හෙළිදරව් කිරීම සඳහා සකස් කරන ලද ත්‍රෛමාසික වාර්තා, බැංකුවේ නෛතික සහ නියාමන අවශ්‍යතා සමඟ අනුකූල වීම, බැංකුවේ බාහිර විගණන කාර්යයන්හි වාර්ෂික වැඩ වැඩසටහන සහ බැංකුවේ අභ්‍යන්තර විගණන කටයුතු සිදු කිරීම සහ මූල්‍ය වාර්තාකරණය, තොරතුරු තාක්ෂණ ආරක්ෂාව සහ මෙහෙයුම් කටයුතු පිළිබඳ පාලනය ආදිය කමිටුවේ විෂය පථය යටතට ගැනේ.

අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරුන් හතර දෙනෙකුගෙන් සමන්විත වන අතර, එක් අයෙකු විකල්ප සාමාජිකයෙකි. කමිටුවේ සභාපතිවරයා ගණකාධිකරණය පිළිබඳ සුදුසුකම් ඇති ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරයෙකි. එකී අධ්‍යක්ෂ මණ්ඩලයෙන් අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව වෙත සේවය කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම්, කුසලතා සහ පළපුරුද්ද ඇති සාමාජිකයින් අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව සඳහා පත් කරනු ලබයි.

අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවේ ලේකම්වරයා ලෙස අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් කටයුතු කරයි.

සාමාන්‍යාධිකාරී, සහකාර සාමාන්‍යාධිකාරී (මූල්‍ය), සහකාර සාමාන්‍යාධිකාරී (මානව සම්පත් සහ ප්‍රසම්පාදන) සහ ප්‍රධාන කළමනාකාර (ශාඛා මෙහෙයුම්) ආරාධිතයන් ලෙස රැස්වීම්වලට සහභාගී වූ අතර, රජයේ විගණන අධිකාරී නිරීක්ෂකයෙකු ලෙස සියලුම රැස්වීම්වලට සහභාගී විය.

2023 වර්ෂයේදී මණ්ඩල විගණන කමිටු රැස්වීම් හයක් පවත්වන ලදී. අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු වාර්තාව මෙම වාර්ෂික වාර්තාවේ 44 සිට 45 දක්වා පිටුවල ඉදිරිපත් කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් සහ පරිශ්‍රමික කමිටුව

බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව (BHRRC) බැංකුව වෙනුවෙන් මානව සම්පත් ප්‍රතිපත්ති, ක්‍රමෝපායන් සහ සැලසුම් සංවර්ධනය කර ක්‍රියාත්මක කිරීමේදී මඟ පෙන්වීම් හා උපදෙස් ලබා දේ, බැංකුවේ සාමාන්‍යාධිකාරී/ප්‍ර.වි.නි., සහ ප්‍රධාන කාර්ය මණ්ඩලයට අදාළ සියලුම පාරිශ්‍රමික ප්‍රතිපත්ති, වැඩසටහන්, වැටුප් ව්‍යූහයන් සහ නියමයන් හා කොන්දේසි සමාලෝචනය කරයි, එමෙන්ම සියලුම කාර්ය මණ්ඩලයට අදාළ කරුණු ඇතුළුව සියලුම මානව සම්පත් ගැටලු සම්බන්ධයෙන් අනෙකුත් අධ්‍යක්ෂ මණ්ඩල උපකමිටු සමඟ උපයෝගී කාර්යභාරයක් පවත්වා ගෙන යයි, එමෙන්ම මේවා කමිටුව වෙත පැවරී ඇති මූලික වගකීම් වේ.

බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව ස්වාධීන, විධායක නොවන අධ්‍යක්ෂවරුන් හතර දෙනෙකුගෙන් සමන්විතවන අතර, එක් අයෙකු විකල්ප සාමාජිකයෙකි. අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්, අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුවේ ලේකම් ලෙස කටයුතු කරයි. සාමාන්‍යාධිකාරී/ ප්‍රධාන විධායක නිලධාරියා සම්බන්ධ කරුණු සාකච්ඡා කෙරෙන විට හැර සාමාන්‍යාධිකාරී/ ප්‍රධාන විධායක නිලධාරී කමිටුවේ සියලුම රැස්වීම් සඳහා සහභාගී වේ.

කාරක සභාව අවම වශයෙන් වසරකට වරක් රැස්විය යුතු අතර, 2023 වර්ෂයේදී කාරක සභාව එක් වරක් රැස්විය. අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටු වාර්තාව මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 47 හි දක්වා ඇත.

අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව (BIRMC)

බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව (BIRMC) මඟින් සියලු අවදානම් තක්සේරු කරනු ලබයි; එනම් සුදුසු අවදානම් දර්ශක සහ කළමනාකරණ තොරතුරු ඔස්සේ ණය, වෙළෙඳපොළ, ද්‍රවශීලතාව, මෙහෙයුම් සහ උපාය මාර්ග තක්සේරු කරනු ලබන අතර, බැංකුවට අදාළ අවදානම් සහ අනුකූලතාව පිළිබඳ ප්‍රතිපත්ති, වාර්තා සහ යෝජනා සමාලෝචන කරයි. අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව මඟින් විශේෂිත අවදානම් ආමන්ත්‍රණය කිරීමට සහ කමිටුව විසින් නිශ්චිතව දක්වා ඇති පරිදි ප්‍රමාණාත්මක සහ ගුණාත්මක අවදානම් සීමාවන් තුළ එම අවදානම් කළමනාකරණය කිරීමට ණය කමිටුව වැනි සියලුම කළමනාකරණ මට්ටමේ කමිටුවල ප්‍රමාණවත්භාවය සහ සඵලතාවය සමාලෝචනය කරයි.

අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව විසින් බැංකුවේ නීති, රෙගුලාසි, නියාමන මාර්ගෝපදේශ, අභ්‍යන්තර පාලන සහ ව්‍යාපාරික මෙහෙයුම්වල සියලුම ක්ෂේත්‍රවල අනුමත ප්‍රතිපත්තිවලට අනුකූල වීම තක්සේරු කිරීම සඳහා ස්වාධීන අනුකූලතා කාර්යයක් ස්ථාපිත කර ඇත. එමෙන්ම බැංකුවේ ප්‍රතිපත්ති සහ නියාමන සහ අධීක්ෂණ අවශ්‍යතා මත පදනම්ව කමිටුව විසින් තීරණය කරන ලද විචක්ෂණ මට්ටම් ඉක්මවා යන මට්ටම්වලදී විශේෂිත අවදානම්වල බලපෑම් අවම කිරීම සඳහා කඩිනම් නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරයි.

අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව, විධායක නොවන අධ්‍යක්ෂවරුන් හතර දෙනෙකුගෙන් සමන්විත වේ; අයෙකු විකල්ප සාමාජිකයෙකු වන අතර, සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී සහ පුළුල් අවදානම් කාණ්ඩ භාරව කටයුතු කරනු ලබන අවදානම් කළමනාකරණ ප්‍රධානියා මේ අතර වේ. අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්, මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවේ (ඊෂසාඒක) ලේකම් ලෙස කටයුතු කරයි.

2023 වර්ෂයේදී අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු රැස්වීම් හතරක් පවත්වන ලදී. අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු වාර්තාව මෙම වාර්ෂික වාර්තාවේ පිටු 48 සිට 49 දක්වා පිටුවල දක්වා ඇත.

අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා කමිටුව (BNC)

සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන කළමනාකරණ පිරිස් තෝරා ගැනීම/ පත්කිරීමේ ක්‍රියා පටිපාටියක් ක්‍රියාත්මක කිරීම, සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන කළමනාකරණ පිරිස් යන තනතුරු සඳහා පත්කිරීම් හෝ උසස්කිරීම් සම්බන්ධයෙන් සලකා බැලිය යුතු සුදුසුකම්, පළපුරුද්ද සහ ප්‍රධාන ගුණාංග වැනි නිර්ණායක සැකසීම සඳහා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා කමිටුව (BNC) වගකීම දරයි. අධ්‍යක්ෂ මණ්ඩල නමයෝජනා කමිටුව එහි ක්‍රියාකාරකම් සහ තීරණ පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කරයි.

අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා කමිටුව, විධායක නොවන අධ්‍යක්ෂවරුන් හතර දෙනෙකුගෙන් සමන්විත වන අතර, අයෙකු විකල්ප සාමාජිකයෙකි. කමිටුවේ සභාපතිවරයාගේ මඟපෙන්වීම මත ආරාධිතයන් ලෙස සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී, සහකාර සාමාන්‍යාධිකාරී (මානව සම්පත් සහ ප්‍රසම්පාදන) රැස්වීම්වලට සහභාගි විය. අධ්‍යක්ෂ මණ්ඩල නාම යෝජනා කමිටුවේ (BNC) ලේකම් ලෙස අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් ලෙස කටයුතු කරයි.

අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා කමිටුව අවම වශයෙන් වසරකට වරක් හමුවීමට අවශ්‍ය වන අතර, අවශ්‍යතා මත පදනම්ව, තවත් රැස්වීම් පැවැත්විය හැකිය. 2023 වර්ෂයේදී කමිටු රැස්වීම් හයක් පවත්වන ලදී. අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා කමිටු වාර්තාව මෙම වාර්ෂික වාර්තාවේ 44 සිට 45 දක්වා පිටුවල දක්වා ඇත.

ප්‍රාග්ධන ප්‍රමාණවත්තා අනුපාතය (CAR)

ප්‍රාග්ධන ප්‍රමාණවත්තා අනුපාතය (CAR) යනු බැංකුවක පවතින ප්‍රාග්ධනය මැනීමකි. එය බැංකුවේ බර තැබූ අවදානම් ණය නිරාවරණවල ප්‍රතිශතයක් ලෙස දක්වනු ලබයි. බැංකුව සෑම විටම අවම ප්‍රාග්ධන ප්‍රමාණවත් අවශ්‍යතා පවත්වා ගෙන යයි.

බැංකුවේ වත්කම් සහ වගකීම් කළමනාකරණ කමිටුව (ALCO) විසින් ප්‍රාග්ධන ප්‍රමාණවත්තා අනුපාතය නිතිපතා අධීක්ෂණය කරනු ලැබේ.

අවදානම් කළමනාකරණය

අවදානම් කළමනාකරණය කිරීමේ සමස්ත වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය භාර ගනී. අවදානම් අවම කිරීම සඳහා බැංකුව විසින් ගනු ලබන නිශ්චිත ක්‍රියාමාර්ග පිළිබඳ මෙම වාර්ෂික වාර්තාවේ 96 සිට 104 දක්වා පිටුවල විස්තර කර ඇත.

අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව

අභ්‍යන්තර පාලනය

ගිණුම්කරණය සහ විගණනය මගින් අර්ථ දක්වා ඇති පරිදි, අභ්‍යන්තර පාලනය යනු මෙහෙයුම් ඵලදායීතාවය සහ කාර්යක්ෂමතාව, විශ්වාසනීය මූල්‍ය වාර්තාකරණය සහ නීති, රෙගුලාසි සහ ප්‍රතිපත්තිවලට අනුකූලව බැංකුවේ අරමුණු සහතික කිරීමේ ක්‍රියාවලියකි.

එදිනෙදා ව්‍යාපාර කළමනාකරණයේදී ආයතනික කළමනාකාරිත්වයට මගපෙන්වීමක් දක්වන ඵලදායී හා පුළුල් අභ්‍යන්තර පාලන පද්ධතියක් බැංකුව තුළ ක්‍රියාත්මක වන බවට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සහතික කර ඇත.

අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව මෙම වාර්ෂික වාර්තාවේ 63 සිට 64 දක්වා පිටුවල දක්වා ඇත.

ලාභ සහ විසර්ජන

2023 වර්ෂය සඳහා බැංකුවේ මුළු ආදායම රු. මිලියන 9,322 කි. බැංකුවට අදාළ ලාභය පිළිබඳ විස්තර පහත වගුවේ දක්වා ඇත.

විස්තර	රු. මිලියන
සංචිත	5,020
ප්‍රාග්ධන වියදම්	115
නිශ්චල දේපළවල වෙළඳ පොළ/ සාධාරණ වටිනාකම	-
දායක ප්‍රාග්ධනය	889
සැලකිය යුතු කොටස් හිමිකම සහ තොරතුරු බෙදාගැනීම	-
රජයට දායක මුදල් ව්‍යවස්ථාපිත ගෙවීම්	124
බදු අය කිරීම	අදාළ නොවේ
ශේෂ පත්‍ර දිනයෙන් පසුව සිදුවන සිදුවීම්	අදාළ නොවේ
පසු ශේෂ පත්‍ර සිදුවීම්	අදාළ නොවේ
අඛණ්ඩ පැවැත්ම අදාළ නොවේ	අදාළ නොවේ

අදාළ නීති, රීති සහ රෙගුලාසිවලට අනුකූල වීම

බැංකුව සෑම අවස්ථාකදීම 1975 අංක 13 දරන රාජ්‍ය උකස් සහ ආයෝජන බැංකු නීතියට සංශෝධන සහ අනෙකුත් අදාළ සියලුම නීති, රීති සහ රෙගුලාසිවලට අනුකූල බවට තහවුරු කර ඇත.

සියලුම පාර්ශවකරුවන්ට සාධාරණ සැලකීම

බැංකුව සෑම පාර්ශ්වකරුවන් කණ්ඩායමකටම එක හා සමානව වැදගත්කමක් ලබා දෙයි. සාධාරණ මිලකරණය; සේවාවන්හි ගුණාත්මකභාවය; මෙන්ම අවංකභාවය සහ සම්පූර්ණත්වය තුළින් බැංකුව සිය සේවාවන්හි කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීමට කැපවී සිටී.

ගනුදෙනුකරුවන් සහ ණය ගැතියන්

බැංකුවේ ප්‍රධාන අරමුණක් වන්නේ දැරිය හැකි මිලකට ජනතාව වෙනුවෙන් නිවාස ණය ලබාදීමයි. මේ සම්බන්ධයෙන් නිරන්තර සමීක්ෂණ සිදු කිරීමට බැංකුව විශේෂ උත්සාහයක් ගෙන ඇත. කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ට, රැකියා වියුක්තිය තුරන් කිරීමට රජයට සහය දක්වන කර්මාන්තකරුවන්ට උපකාර කිරීම සඳහා බැංකුව විසින් ණය යෝජනා ක්‍රම කිහිපයක් හඳුන්වා දී ඇත.

තැන්පත්කරුවන් සහ සැපයුම්කරුවන්

තැන්පත්කරුවන් බැංකුවේ ප්‍රධාන අරමුදල් සපයන්නන් වේ. තැන්පතු අනුපාත ප්‍රකාශයට පත් කර ඇති අතර තරඟකාරී වේ. ප්‍රාග්ධනය සහ පොලී නියමිත දිනට ගෙවනු ලැබේ. බැංකුව භාණ්ඩ හා සේවා සැපයීම සඳහා මිල ගණන් කැඳවන අතර, කඩිනම් ගෙවීම් සහතික කරයි.

විගණක වාර්තාව

විගණකාධිපතිවරයා රාජ්‍ය උකස් සහ ආයෝජන බැංකුවේ විගණකවරයා වේ. 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (1) වගන්තිය සමඟ කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) වගන්තියේ විධිවිධාන අනුව විගණකාධිපතිවරයාගේ උපදෙස් අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා රාජ්‍ය උකස් සහ ආයෝජන බැංකුවේ ගිණුම් විගණනය සිදු කරන ලදී.

2023 දෙසැම්බර් 31 දිනට බැංකුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව මෙම වාර්ෂික වාර්තාවේ 63 සිට 73 දක්වා පිටුවේ දක්වා ඇත.

ස්තුතිය

අධ්‍යක්ෂවරු බැංකුවේ වටිනා ගනුදෙනුකරුවන් වෙත බැංකුව කෙරෙහි දක්වන සහයෝගය සහ විශ්වාසය වෙනුවෙන් සිය අවංක අගය පළ කරන අතර, අනාගතයේදී මෙම අන්‍යෝන්‍ය සහයෝගී සබඳතාව අඛණ්ඩව පවත්වාගෙන යාමට අපේක්ෂා කරති. ඔබේ බැංකුවේ සාර්ථකත්වය සඳහා සේවකයින් විසින් ලබා දුන් දායකත්වය වෙනුවෙන් අධ්‍යක්ෂවරුන් විසින් ස්තුතිය පළ කර සිටී. එමෙන්ම ශ්‍රී ලංකාවේ නියාමන සහ රාජ්‍ය බලධාරීන්ගෙන් ලැබුණු සහයෝගය සහ සහය පිළිබඳව අධ්‍යක්ෂවරු ස්තුතිවන්ත වෙති.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියෝගය අනුව,



දිලානි අලහකෝන්
අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්

මූල්‍ය වාර්තාකරණය සම්බන්ධයෙන් අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය

වගකීම

2007 අංක 12 දරන බැංකු පනත් නියෝගයේ 03 වන පරිච්ඡේදයේ (8) (සස) (ඉ) වගන්තියට අනුකූලව, මූල්‍ය වාර්තාකරණය සම්බන්ධයෙන් අභ්‍යන්තර පාලනය පිළිබඳ මෙම වාර්තාව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඉදිරිපත් කරයි.

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් බැංකුව තුළ මනා අභ්‍යන්තර පාලන පද්ධතියක් ක්‍රියාත්මක වන බව සහතික කිරීම සහ එහි ප්‍රමාණාත්මකභාවය සහ කාර්යසාධනය සමාලෝචනය කිරීම සම්බන්ධයෙන් වගකීම දරයි. බැංකුකරණ ව්‍යාපාර පාලිත පදනමක් යටතේ අවදානම් සහ ප්‍රතිලාභ සමතුලිත වීම අවශ්‍ය බව එවැනි ප්‍රමාණාත්මකභාවය සහ කාර්යසාධනය සලකා බැලීමේ දී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් හඳුනාගෙන ඇත. බැංකුවේ අවදානම් දැරීමේ හැකියාව අනුව සැඳුම් ලත් සීමා සහ දර්ශක මඟින් පෙන්නුම් කරනු ලබන නොගැළපීම් ඉස්මතු කරලීමට එවැනි අභ්‍යන්තර පාලන පද්ධති මූලික වශයෙන් සකස් කොට ඇත. මෙහිදී පාලකවල ප්‍රමාණාත්මකභාවය සහ කාර්යසාධනය සැලකිල්ලට ගනිමින් වත්කම් නිසි ලෙස ආරක්ෂා කිරීම, නිසි ගිණුම් පොත් පවත්වාගෙන යාම සහ මූල්‍ය වාර්තාකරණ පද්ධතියේ විශ්වසනීයත්වය සැපයීම සම්බන්ධයෙන් සාධාරණ සහතිකයක් ලබා දීම සඳහා අභ්‍යන්තර පාලන පද්ධතිය සැලසුම් කර ඇති බව අධ්‍යක්ෂ මණ්ඩලය හඳුනාගෙන ඇත. කෙසේ වෙතත්, මූල්‍ය තොරතුරු සහ වාර්තාවල ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ට එරෙහිව හෝ ආවේනික සීමාවන් හේතුවෙන් අක්‍රමිකතා සහ වංචා ඉවත් කිරීම සඳහා මෙම පද්ධතිය මඟින් පූර්ණ සහතිකයක් ලබා නොදේ.

බැංකුව මුහුණ දෙන සැලකිය යුතු අවදානම් හඳුනා ගැනීම, ඇගයීම සහ කළමනාකරණය කිරීම සඳහා අඛණ්ඩ ක්‍රියාවලියක් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ස්ථාපිත කර ඇත. ව්‍යාපාරික පරිසරයේ හෝ නියාමන අවශ්‍යතා සහ වෙනත් මාර්ගෝපදේශ වෙනස් වන විට සහ වෙනස් කරන විට අභ්‍යන්තර පාලන පද්ධතිය වැඩිදියුණු කිරීම මෙම ක්‍රියාවලිය සඳහා ඇතුළත් වේ. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනය විසින් නිකුත් කරන ලද අභ්‍යන්තර පාලන පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය සම්බන්ධයෙන් බැංකු අධ්‍යක්ෂවරුන් සඳහා වන මාර්ගෝපදේශයට අනුකූලව මෙම ක්‍රියාවලිය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිතිපතා අධීක්ෂණය කරනු ලබයි. එම මාර්ගෝපදේශයේ දක්වා ඇති පරිදි අභ්‍යන්තර පාලන පද්ධතිය තක්සේරු කිරීම සඳහා මූලධර්මවලට අනුකූලව අභ්‍යන්තර පාලන පද්ධතිය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තක්සේරු කර ඇත.

මූල්‍ය වාර්තාකරණයේ විශ්වසනීයත්වය සහ බාහිර අරමුණු සඳහා මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සම්බන්ධයෙන් සාධාරණ සහතිකයක් ලබාදීම සඳහා ක්‍රියාත්මක වන අභ්‍යන්තර පාලන පද්ධතිය යහපත් සහ ප්‍රමාණවත් මට්ටමින් පවතින බවත්, අදාළ ගිණුම්කරණ මූලධර්ම හා නියාමන අවශ්‍යතාවලට අනුකූල බවත් අධ්‍යක්ෂ මණ්ඩලයේ අදහසයි.

බැංකුව විසින් මුහුණ දෙනු ලබන අවදානම් හඳුනාගෙන තක්සේරු කිරීම ඔස්සේ අවදානම් සහ පාලනය පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයේ ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි ක්‍රියාත්මක කිරීමේදී මෙන්ම මෙම අවදානම් අවම කිරීම සහ පාලනය කිරීම සඳහා සුදුසු අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ අධීක්ෂණය කිරීම සඳහා කළමනාකාරිත්වය විසින් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත සහය වේ.

මූල්‍ය වාර්තාකරණය සම්බන්ධයෙන් අභ්‍යන්තර පාලන පද්ධතියේ සැලසුම සහ ඵලදායීත්වය යොදා ගැනීම සහ සමාලෝචනය කිරීමේදී භාවිත කරන ක්‍රියාවලියේ ප්‍රධාන ලක්ෂණ

අභ්‍යන්තර පාලන ක්‍රමයේ සැලැස්ම සහ කාර්යසාධනය වරින් වර සමාලෝචනය කිරීමේ ක්‍රමවේදය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පිහිටුවා ඇත. එහි ප්‍රධාන ක්‍රියාවලි සඳහා පහත දෑ ඇතුළත් වේ.

- බැංකුවේ අභ්‍යන්තර පාලන ක්‍රමයේ ප්‍රමාණවත්භාවය සහ පරිපූර්ණත්වය සහතික කරලීමට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විවිධ අනුකමිටු පිහිටුවා ඇත. ආයතනික අරමුණු, උපාය මාර්ග සහ වාර්ෂික අයවැය සාක්ෂාත් කර ගැනීම මෙන්ම බැංකුව විසින් මුහුණ දෙන අවදානම් තක්සේරු කිරීම සහ කළමනාකරණය කිරීම සඳහා ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි ක්‍රියාත්මක කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට සහය වීමට එහි අධිකාරිය ආයතනික කළමනාකාරිත්වය, ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය සහ බැංකුවේ කළමනාකරුවන් යන මට්ටම් අතර පවරා ඇත.
- ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගෙන් අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව සමන්විත වේ. බැංකුවේ අවදානම් ස්වරූප සමාලෝචනය කිරීම, බැංකුව විසින් මුහුණ දෙන ප්‍රධාන අවදානම හඳුනා ගැනීම සහ බැංකුවේ අවදානම් ස්වරූපය සහ අවදානම් දැරීමේ හැකියාව මත පදනම්ව ප්‍රතිපත්ති සකස් කිරීම කමිටුවේ වගකීම වේ.
- බැංකුවේ අභ්‍යන්තර පාලන ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි සමඟ එහි මූල්‍ය, පරිපාලන සහ මෙහෙයුම් ක්‍රියාකාරකම් ගැළපෙන්නේද යන්න සහතික කිරීම සඳහා අවදානම් මත පදනම් වූ විගණන ප්‍රවේශය අනුව බැංකුවේ අභ්‍යන්තර විගණන අංශය පරීක්ෂණ සිදු කරයි. ක්‍රියාකාරී ඒකක සහ බැංකුවේ නිෂ්පාදන හා සම්බන්ධ අවදානම් මට්ටම අනුව නිරන්තරයෙන් සියලුම ක්‍රියාකාරී ඒකක සහ ශාඛා සඳහා විගණන සිදු කෙරේ. බැංකුවේ අක්‍රමිකතා, සාවද්‍ය ප්‍රකාශන, වංචා, පරිපාලනය සහ මෙහෙයුම් කටයුතු පිළිබඳ විගණන නිරීක්ෂණවලට අදාළව අභ්‍යන්තර පාලන පද්ධතිය පිළිබඳ විෂයමූලික සහ ස්වාධීන තක්සේරුව සහ අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව වෙත නිරන්තර වාර්තා ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් ප්‍රධාන අභ්‍යන්තර විගණක වගකීම දරයි.
- සාමාන්‍යයෙන්, අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව විසින් අභ්‍යන්තර පාලන පද්ධතියේ සමස්ත කාර්යක්ෂමතාව සමාලෝචනය කරන අතර, අභ්‍යන්තර පාලන දුර්වලතා පිළිබඳ නිශ්චිත නිරීක්ෂණ සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත නිරන්තරයෙන් වාර්තා කරයි. මේ සම්බන්ධයෙන්, කමිටුව විසින් භාවිත කරන යාන්ත්‍රණය සඳහා විගණකාධිපති වාර්තාව, අභ්‍යන්තර විගණන වාර්තා, නියාමන වාර්තා, වාර්ෂික/මාසික මූල්‍ය ප්‍රකාශන සහ ප්‍රගති වාර්තා සමාලෝචනය කිරීම ඇතුළත් වේ.
- 2012 දී බැංකුව විසින් LKAS සහ SLFRS ඇතුළත් නව ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිතීන් සම්මත කරන ලදී. එවැනි ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් යොදා ගැනීමත් සමඟ, හඳුනාගැනීම, ඇගයීම, වර්ගීකරණය සහ හෙළිදරව් කිරීම පිළිබඳ නව අවශ්‍යතාවලට අනුකූල වීම සහතික කිරීමට බැංකුව විසින් ක්‍රියාවලි අබණ්ඩව අධීක්ෂණය කිරීම සහ ප්‍රගතිශීලී ලෙස වැඩිදියුණු කිරීම සිදු කරනු ලබයි.
- 2018 ජනවාරි 1 දින සිට බලපැවැත්වෙන පරිදි ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් SLFRS 9 "මූල්‍ය සාධනපත්‍ර" බැංකුව විසින් අනුගමනය කරනු ලබයි. SLFRS 9 හි අවශ්‍යතාවලට අනුකූල වීම සඳහා, විවිධාකාර ආර්ථික පුරෝකථන භාවිත කරමින් බැංකුව විසින් අපේක්ෂිත ණය අලාභ (ECL) ආකෘතියක් සකස් කරන ලදී. වර්ෂය තුළදී වරලත් ගණකාධිකාරීවරුන්ගේ ජාත්‍යන්තර සමාගමෙන් හානිකරණ ප්‍රතිපත්තියේ ආදර්ශ වලංගුභාවය ලබාගත් අතර අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සමාලෝචනය කරන ලදී. SLFRS 9 යටතේ ණය පහසුකම් වර්ගීකරණය, හඳුනා ගැනීම සහ ඇගයීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද උපදෙස් වලට අනුකූල වීමට බැංකුව සුදුසු පියවර ගෙන ඇත.
- ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් සහ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද වාර්තාකරණ අවශ්‍යතා පිළිබඳ මාර්ගෝපදේශයන්ට අනුකූලව වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇති බවට බැංකුවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලි මඟින් සහතික කරන්නේද යන්න අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සමාලෝචනය කර ඇත.
- එදිනෙදා ව්‍යාපාර මෙහෙයුම් සම්බන්ධයෙන් බැංකුවේ මූලික ක්ෂේත්‍රවල ඵලදායී කළමනාකරණය සහ අධීක්ෂණය සහතික කිරීම සඳහා කළමනාකරණ මට්ටමේ කමිටු අදාළ බලතල අනුව ක්‍රියාත්මකව පවතී.
- මූල්‍ය වාර්තාකරණය පිළිබඳ බැංකුවේ අභ්‍යන්තර පාලනයේ සැලසුම් සහ කාර්යසාධනය පිළිබඳ විධිමත් වාර්ෂික සමාලෝචනයක් සිදු කර ඇත. අභ්‍යන්තර පාලනවල කාර්යසාධනය සමාලෝචනය කිරීමට පහසුකම් සලසන බැංකුවේ අභ්‍යන්තර පාලන පද්ධතියේ ලියකියවිලි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර ඇත.

මූල්‍ය වාර්තාකරණය සම්බන්ධයෙන් අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය

- තොරතුරු පද්ධති පාලනය ශක්තිමත් කරලීමට වරලත් ගණකාධිකාරිවරුන්ගේ ජාත්‍යන්තර සමාගම විසින් සකස් කරන ලද තොරතුරු පද්ධති ආරක්ෂණ පාලන ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි සමාලෝචනය කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය ඵලදායී පියවර ගෙන ඇත.
- කර්මාන්තයේ හොඳම භාවිතයන් හඳුනා ගැනීමට සහ පාරිභෝගික සේවාව වැඩිදියුණු කිරීමට ව්‍යාපාර ක්ෂේත්‍රයේ තාක්ෂණික සහ තොරතුරු පද්ධති පරිසරයේ සිදුවන වෙනස්කම් ඉතා වැදගත් බව අධ්‍යක්ෂ මණ්ඩලයේ මතයයි. මෙකී කාරණයට විසඳුමක් ලෙස නව මූලික බැංකු පද්ධතියක් සඳහා ආයෝජනය කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය ඵලදායී මූලපිරීමක් ගෙන ඇත. සංවිධානයේ සංවර්ධන අරමුණු සඳහා ඉහළ ප්‍රතිඵලයන් අත් කර ගැනීමට ව්‍යාපාර මෙහෙයුම්වල ඵලදායිතාව ඉහළ නැංවීම සහ පාරිභෝගික අත්දැකීම් ප්‍රයෝජනයට ගැනීම මෙහි අරමුණ විය.
- පසුගිය වසරේ සහ වර්ෂය තුළ අභ්‍යන්තර පාලන දුර්වලතා පිළිබඳව බාහිර විගණකවරයා සහ මහ බැංකුව විසින් ඉදිරිපත් කරන ලද අදහස් ද සලකා බැලූ අතර, අවශ්‍ය අවස්ථාවලදී ඒවා විසඳීමට නිසි පියවර ගන්නා ලදී.

තහවුරුකරණය

ඉහත ක්‍රියාදාමයන් මත පදනම්ව, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ නියාමන අවශ්‍යතාවලට අනුකූලව මූල්‍ය වාර්තාකරණයේ විශ්වසනීයත්වය සහ බාහිර අරමුණු සඳහා මූල්‍ය ප්‍රකාශන සැකසීම සම්බන්ධයෙන් සාධාරණ සහතිකයක් ලබාදීම සඳහා බැංකුවේ මූල්‍ය වාර්තාකරණ පද්ධතිය සකස් කොට ඇති බව අධ්‍යක්ෂ මණ්ඩලය තහවුරු කරයි.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියෝගය අනුව

මහාචාර්ය ඩී. ඒ. එම් පෙරේරා
සභාපති - අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව/ස්වාධීන අධ්‍යක්ෂ

එච්. සී. ඩී. එල් සිල්වා මහතා
සාමාජික - අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව/ විධායක නොවන අධ්‍යක්ෂ

එස්. කේ. ඒ ගලප්පත්ති
සාමාජික - අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව/ ස්වාධීන අධ්‍යක්ෂ

අභ්‍යන්තර පාලනය පිළිබඳ විගණකාධිපති වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. BAN/F/SMIB/CG/2023/16
ඔබේ අංකය / உமது இல. / Your No.
දිනය / திகதி / Date 16 May 2024

සභාපති
රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

රාජ්‍ය උකස් සහ ආයෝජන බැංකුවේ මූල්‍ය වාර්තාකරණයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් වන අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කරන ස්වාධීන සහතික කිරීමේ වාර්තාව.

හැඳින්වීම

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වාර්ෂික වාර්තාවට ඇතුළත් කර ඇති රාජ්‍ය උකස් සහ ආයෝජන බැංකුවේ මූල්‍ය වාර්තාකරණයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධ වාර්තාවට ("ප්‍රකාශය") අදාලව අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය පිළිබඳ සහතිකයක් ලබා දීම මෙම වාර්තාව මගින් සිදු වේ.

කළමණාකාරිත්වයේ වගකීම

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය මගින් නිකුත්කර ඇති 2007 අංක 12 දරණ බැංකු පනත් නියෝග යේ 3(8)(11)(ආ) වගන්තිය අනුකූලව නිකුත්කරන ලද "අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය සම්බන්ධයෙන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩල සඳහා මාර්ගෝපදේශය" ට අනුව මෙම ප්‍රකාශය පිළියෙල කිරීම සහ ඉදිරිපත් කිරීම සඳහා කළමණාකරණය වගකිමට බැඳි සිටී.

මාගේ වගකීම සහ SLSAE 3050 (ප්‍රතිශෝධිත) සමග අනුකූලතාවය

මාගේ වගකීම වන්නේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පිළියෙල කරන ලද මෙම ප්‍රකාශය ලේඛනවලින් තහවුරු වන්නේද යන්න සහ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවෙහි අභ්‍යන්තර පාලනයේ සැලැස්ම සහ ඵලදායිත්වය සමාලෝචනය කිරීමේදි අධ්‍යක්ෂවරුන් විසින් යොදාගෙන ඇති ක්‍රියාවලිය පිළිබිඹු කරන්නේද යන්න සම්බන්ධයෙන් තක්සේරු කිරීමයි.

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය මගින් නිකුත්කර ඇති අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය පිළිබඳ බැංකුව සඳහා සහතික කිරීමේ වාර්තාව වන, සහතික කිරීමේ කාර්යය පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රමිතිය ඊෑ* 3050 (ප්‍රතිශෝධිත) අනුකූලව මම මෙම කාර්යය පැවැත්වූයෙමි.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்ல, இலங்கை.
No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34
+94 11 2 88 72 23
ag@auditorgeneral.gov.lk
www.naosl.gov.lk

අභ්‍යන්තර පාලනය පිළිබඳ විගණකාධිපති වාර්තාව

සියලුම වැදගත් අංශයන් හිදී කළමනාකරණය අභ්‍යන්තර පාලනය පිළිබඳ ප්‍රකාශය පිළියෙල කර ඇති බවට සීමිත සහතිකයක් ලබාගැනීමේ ක්‍රියාපටිපාටි මම විසින් සැලසුම් කර ඉටුකිරීම මෙම ප්‍රමිතියෙන් අවශ්‍ය වේ.

මෙම කාර්යයේ අරමුණ සඳහා, කිසිදු වාර්තාවක් යාවත්කාලීන කිරීම හෝ නැවත නිකුත් කිරීම සඳහා මම වගකීමට බැඳී නොමැති අතර, මෙම කාර්යය සම්බන්ධයෙන් මූල්‍ය තොරතුරු පිළිබඳ විගණනයක් හෝ සමාලෝචනයක් සිදුකර නොමැත.

ක්‍රියාවට නංවන ලද කාර්යයන් පිළිබඳ සාරාංශය

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පිළියෙල කරන ලද මෙම ප්‍රකාශය ලේඛනවලින් තහවුරු වන්නේද යන්න සහ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවෙහි අභ්‍යන්තර පාලනයේ සැලැස්ම සහ ඵලදායීත්වය සමාලෝචනය කිරීමේදී අධ්‍යක්ෂවරුන් විසින් යොදාගෙන ඇති ක්‍රියාවලිය පිළිබිඹු කරන්නේද යන්න සම්බන්ධයෙන් තක්සේරු කිරීම සඳහා මාගේ කාර්යය මම ඉටු කළෙමි.

නියැදියකින් ප්‍රශ්න කිරීම් මගින් ලබාගත් තොරතුරු සහ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුගමනය කර ඇති ක්‍රියාවලියට සහයවන නියැදි පදනමක් මත, ඉටුකරන කරන ලද ක්‍රියාපටිපාටි මූලික වශයෙන් බැංකුවෙහි කාර්යය මණ්ඩලය සහ ලේඛණවල පැවැත්ම පරීක්ෂා කිරීම සඳහා සීමා විය.

SLSAE 3050 (ප්‍රතිශෝධිත) අනුව මෙම ප්‍රකාශය මගින් සියලුම අවදානම් සහ පාලනයන් ආවරණය කරන්නේද යන්න හෝ බැංකුවෙහි අවදානම සහ පාලන ක්‍රියාපටිපාටිවල ඵලදායීතාව පිළිබඳ මතයක් සකස් කරන්නේද යන්න සලකා බැලීමක් අවශ්‍ය නොවනු ඇත. SLSAE 3050 (ප්‍රතිශෝධිත) අනුව වාර්ෂික වාර්තාව තුළ හෙලිදරව් කරන ලද කිසියම් සැලකිය යුතු ගැටළු පිළිබඳ වැදගත් අභ්‍යන්තර පාලන අංගයන් සමඟ කටයුතු කිරීම සඳහා විස්තර කරන ලද ක්‍රියාවලි සැබැවින්ම ගැටළුවලට පිළියම් කරන්නේද යන්න සලකා බැලීමක් මාහට අවශ්‍ය නොවනු ඇත.

තෝරාගත් ක්‍රියාපටිපාටි බැංකුවේ ස්වභාවය, ප්‍රකාශය පිළියෙල කර ඇති සිදුවීම හෝ ගනුදෙනුව පිළිබඳ මාගේ අවබෝධය සැලකිල්ලට ගත් මාගේ විනිශ්චය මත රඳා පවතී.

මගේ නිගමනය සඳහා පදනමක් ලබා ගැනීමට සුදුසු හා ප්‍රමාණවත් කරුණු මා ලබාගෙන ඇති බව මම විශ්වාස කරමි.

නිගමනය

ඉටුකරන ලද ක්‍රියාපටිපාටි අනුව, බැංකුවෙහි මූල්‍ය වාර්තාකරණය සඳහා වන අභ්‍යන්තර පාලන ක්‍රමයෙහි සැකැස්ම සහ එහි ඵලදායීත්වය පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය මගින් ක්‍රියාවට නගනු ලබන අගය කිරීමේ ක්‍රියාවලිය, අපගේ අවබෝධයට අනුව සහ වාර්ෂික වාර්තාවෙහි ඇතුලත් ප්‍රකාශයන්ගේ අනුකූලතාවයේ පැහැදිලි බවක් හෝ විශ්වාස කටයුතුභාවයෙහි සැකයක් ඇති බවට කිසිඳු සාක්ෂියක් හමුවී නොමැත.

ඩබ්.පී.සි. වික්‍රමරත්න
විගණකාධිපති

මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ වගකීම

කළමනාකාරිත්වය විසින් සිදු කරනු ලබන මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලීන් අධීක්ෂණය කිරීමේ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පැවරී ඇත. එහිදී මූල්‍ය වාර්තාකරණයට අදාළ ව්‍යවස්ථාදායක අවශ්‍යතා සකස් කිරීමේදී ඒවා පිළිපැදීම සහතික කිරීමේ අවසාන වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පැවරී ඇත. ඒ අනුව රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම මෙම ප්‍රකාශයේ දක්වා ඇත.

බැංකුවේ මූල්‍ය ප්‍රකාශන මගින් 2023 දෙසැම්බර් 31 වන දිනට පවතින තත්ත්වය සහ ඉන් අවසන් වූ මූල්‍ය වර්ෂය සඳහා බැංකුවේ මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ සත්‍ය සහ සාධාරණ දැක්මක් පිළිබිඹු වන බව බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තහවුරු කරයි. මෙම වාර්ෂික වාර්තාවේ ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශවල විශ්වාසනීයත්වය හා විෂයමූලිකත්වය පිළිබඳ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් භාර ගනු ලබයි.

මූල්‍ය ප්‍රකාශ

1971 අංක 38 දරන මූල්‍ය පනත, 1988 අංක 30 දරන බැංකු පනත සහ එහි සංශෝධන සමඟ කියවිය යුතු 1975 අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු නීතිය සහ එහි සංශෝධන හි දක්වා ඇති විධිවිධාන සහ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද සංශෝධන සහ උපදෙස්වලට අනුකූලව අවබෝධ කර ගැනීමට, අධීක්ෂණය කිරීමට සහ මෙහෙයවීමට ප්‍රමාණවත් මූල්‍ය සාක්ෂරතාවක් පවතින බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් බැංකුවේ කටයුතු සහ ව්‍යාපාර පාලනය කිරීම සහ පරිපාලන කටයුතු සිදු කළ යුතුය.

මෙම වාර්ෂික වාර්තාවේ සකස් කර ඉදිරිපත් කර ඇති 2023 වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශන, පවතින ගිණුම් පොත්වලට අනුකූලවන අතර, පොදුවේ පිළිගත් ගිණුම්කරණ ප්‍රමිති, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති සහ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතිවල අවශ්‍යතාවන්ට අනුකූලවන අතර අදාළ ව්‍යවස්ථාපිත අවශ්‍යතාවලට අනුකූලව එක් එක් මූල්‍ය වර්ෂය අවසානයේ බැංකුවේ මූල්‍ය තත්ත්වය පිළිබඳ සත්‍ය සහ සාධාරණ දැක්මක් ලබා දේ.

මෙම වාර්ෂික වාර්තාවේ ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශයේ විශ්වසනීයත්වය සහ විෂයමූලිකත්වය පිළිබඳ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් දරනු ලබයි. මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී අධ්‍යක්ෂවරු පහත දෑ තහවුරු කරති;

1. පවතින මූල්‍ය වාර්තාකරණ රාමුවට අනුකූලව මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සඳහා යෝග්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිත කර ඇත, වැදගත් අපගමනයක් පවතින්නේ නම් ඒවා අනාවරණය කර, පැහැදිලි කර ඇත;
2. අදාළ සියලුම ගිණුම්කරණ ප්‍රමිතීන් අනුගමනය කර ඇත;
3. සාධාරණ සහ විචක්ෂණශීලී විනිශ්චයන් සහ ඇස්තමේන්තු සිදු කර ඇත.

මූලික කාර්යසාධන දර්ශක ඇතුළුව කාර්තුමය වශයෙන් විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන බැංකුව විසින් එක් එක් කාල සීමාව අවසනයේදී මාස දෙකක් ඇතුළත හාෂා තුනෙන්ම පුවත්පත්වල ප්‍රකාශයට පත් කරනු ලබයි. එමෙන්ම බැංකුවේ වෙබ් අඩවියේද ප්‍රකාශයට පත් කරයි.

අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවේ සමාලෝචනයකින් සහ නිර්දේශයකින් පසුව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අන්තර්වාර මූල්‍ය ප්‍රකාශ නිකුත් කිරීමට පෙර ඒවා අනුමත කරනු ලබයි. මෙම වාර්ෂික වාර්තාවේ 44 සිට 45 දක්වා පිටුවල අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු වාර්තාව දක්වා ඇත. මූල්‍ය ප්‍රකාශන, බලපත්‍රලාභී විශේෂිත බැංකු සඳහා මහ බැංකුව විසින් නිකුත් කරන ලද නියමිත ආකෘතියට අනුකූල වන බව අධ්‍යක්ෂ මණ්ඩලය මඟින් සහතික කරයි.

අඛණ්ඩතා පැවැත්ම

නුදුරු අනාගතය සඳහා සිය මෙහෙයුම් අඛණ්ඩව සිදු කිරීම සඳහා සහ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කළ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට (LKAS සහ SLFRS) අනුකූලව සහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී අඛණ්ඩ පැවැත්ම පදනම යොදා ගැනීම සාධාරණය කිරීමට ප්‍රමාණවත් සම්පත් බැංකුව සතු බවත්, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද නියෝගවලට අනුකූලව අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇති බවත් රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවෙහි අධ්‍යක්ෂ මණ්ඩලයේ මතය වේ.

අභ්‍යන්තර පාලන සහ අවදානම් කළමනාකරණය

බැංකුවේ වත්කම් ආරක්ෂා කිරීම, වංචා සහ වැරදි හඳුනා ගැනීම සඳහා සැලකිය යුතු ක්‍රියාමාර්ග ගැනීම සම්බන්ධයෙන් රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවෙහි අධ්‍යක්ෂ මණ්ඩලය වගකිව යුතුය. එමෙන්ම ඔවුන් කාර්යක්ෂම සහ පරිපූර්ණ අභ්‍යන්තර මූල්‍ය පාලන පද්ධතියක් සහ අභ්‍යන්තර විගණනය සහ අවදානම් කළමනාකරණය හරහා එහි සඵලතාවය අධීක්ෂණය කරනු ලබන ඵලදායී පද්ධතියක් ස්ථාපිත කර ඇති අතර, බැංකුවේ වත්කම් ආරක්ෂා කරනු ලබන, සුරක්ෂිත කරනු ලබන සහ වංචා සහ අවපාලනය වළක්වාලනු ලබන ශක්තිමත් පාලන පරිසරයක් පවත්වා ගැනීම සඳහා වැදගත් අවධානයක් යොමු කරනු ලබයි.

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නියම කර ඇති ඉලක්ක සපුරා ගන්නා ඵලදායී සංවිධානයක් සාක්ෂාත් කර ගැනීම අභ්‍යන්තර පාලනයේ පරමාර්ථය වේ. එමඟින් බැංකුවේ ව්‍යාපාර නිසි ලෙස ඵලදායී ලෙස පවත්වා ගෙන යාම, නීති සහ රෙගුලාසි සඳහා අනුකූලව කටයුතු කිරීම, සහ මූල්‍ය වාර්තාකරණයේ විශ්වසනීයත්වය පිළිබඳ සාධාරණ සහතිකයක් ලබා දීම සිදු කරනු ලබයි.

විගණන කමිටුවේ මගපෙන්වීම යටතේ අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව විසින් අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කරන අතර, අවශ්‍ය අවස්ථාවලදී වෙනස් කිරීම් නිර්දේශ කරයි.

අධ්‍යක්ෂවරුන් විසින් ඔවුන්ගේ සාමාන්‍ය රැස්වීම්වලදී සහ අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවලදී මූල්‍ය ප්‍රකාශන ඔවුන් විසින් සෘජුවම සමාලෝචනය කරන බවට සහතික වේ.

මෙම වාර්ෂික වාර්තාවේ 63 පිටුවේ 64 පිටුවල බැංකුවේ අභ්‍යන්තර පාලන යාන්ත්‍රණය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව පිළිබඳ දක්වා ඇත.

අනුකූලතා වාර්තාව

අධ්‍යක්ෂවරුන්ගේ දැනුම සහ විශ්වාසය පරිදි මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දිනයට බැංකුව විසින් ගෙවිය යුතු සියලුම බදු සහ බැංකුවේ සේවකයින් සම්බන්ධයෙන් හා ඒ වෙනුවෙන් ගෙවියයුතු සියලුම දායකත්වයන් සහ බදු සහ බැංකුව විසින් රජයට සහ අනෙකුත් නියාමන හා ව්‍යවස්ථාපිත ආයතනයන්ට ගෙවීමට බැඳී සිටින හා ගෙවිය යුතුව තිබූ සියළුම ව්‍යවස්ථාපිත ගෙවීම් සිදුකර ඇති බවට අධ්‍යක්ෂවරු තහවුරු කර සිටී.

විගණන වාර්තාව

විගණකාධිපතිවරයා බැංකුවේ විගණකවරයා වන අතර බැංකුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අවසන් මතය ප්‍රකාශ කරයි.

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ලබා දී ඇති මූල්‍ය ප්‍රකාශන ඇතුළු බැංකුවේ සියලුම වාර්තා විගණකාධිපතිවරයාට ලබා දී ඇති අතර, ඔවුන් හට සුදුසු යැයි හැඟී යන පරීක්ෂා කිරීම් සිදු කිරීමට අවස්ථාව ලබා දෙමින් විගණකාධිපති දෙපාර්තමේන්තුව විසින් සියලුම දේ පරීක්ෂා කර විගණකාධිපතිවරයා අවසන් මතය ප්‍රකාශ කර ඇත.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණකවරයාගේ වගකීම් මෙම වාර්ෂික වාර්තාවේ 69 පිටුවේ විගණකාධිපතිවරයාගේ වාර්තාවේ දක්වා ඇත.

වැදගත් ගිවිසුම් පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ බැඳියාව

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය සම්බන්ධයෙන් බැංකුව පාර්ශ්වකරුවෙකු වූ වැදගත් ගිවිසුම් සමඟ බැංකුවේ අධ්‍යක්ෂවරයෙකු හෝ හිටපු අධ්‍යක්ෂවරයෙක්ට වසර අවසානයේදී හෝ වසරේ කිසියම් අවස්ථාවක සෘජුව හෝ වක්‍රව කිසිදු බැඳියාවක් නොතිබූ බව සහ බැංකුව පාර්ශ්වකරුවෙකු වූ වැදගත් ගිවිසුම් සමඟ බැංකුවේ අධ්‍යක්ෂවරයෙකුට වසර අවසානයේදී හෝ වසරේ කිසියම් අවස්ථාවක සෘජුව හෝ වක්‍රව කිසිදු බැඳියාවක් නොතිබූ බව සහතික කළ යුතුව ඇත.

මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ වගකීම

ව්‍යවස්ථාපිත ගෙවීම්

අධ්‍යක්ෂවරුන්ගේ දැනුම හා විශ්වාසය පරිදි, මූල්‍ය තත්ව ප්‍රකාශනයේ දිනට බැංකුව විසින් සියලුම නියාමන හා ව්‍යවස්ථාපිත ආයතනයන්ට ගෙවිය යුතුව තිබූ අදාළ සියලුම ව්‍යවස්ථාපිත ගෙවීම් සිදු කොට ඇති බවට අධ්‍යක්ෂවරු සෑහීමකට පත්වෙති. මෙම ප්‍රකාශයේ දක්වා ඇති පරිදි ඔවුන්ගේ වගකීම් ඉටුකර ඇති බව අධ්‍යක්ෂවරුන් දරන මතය වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

දිලානි අලහකෝන්
අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්

විගණකාධිපති වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. BAN/F/SMIB/CG/2023/16
ඔබේ අංකය உமது இல. Your No.
දිනය திகதி Date 16 May 2024

සභාපති
රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වගන්තිය ප්‍රකාර 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වූ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ මූල්‍ය ප්‍රකාශන සහ අනෙකුත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව විගණකාධිපති වාර්තාව.

1. මූල්‍ය ප්‍රකාශ

1.1. මතය

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශය, විස්තීර්ණ ආදායම් ප්‍රකාශය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශ පිළිබඳ 1971 අංක 38 දරන මුදල් පනත සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර පාර්ලිමේන්තුව සඳහා මාගේ වාර්තාව යථාකාලයේදී සභාගත කරනු ලැබේ.

මේ සමග ඉදිරිපත්කර ඇති මූල්‍ය ප්‍රකාශ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්වය හා එදිනෙන් අවසන් වූ වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුව සත්‍ය හා සාධාරණ නිරූපණයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.
No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34
+94 11 2 88 72 23
ag@auditorgeneral.gov.lk
www.naosl.gov.lk

විගණකාධිපති වාර්තාව

1.2. මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට්ඛ්මී* අනුකූලව මම මාගේ විගණනය පැවැත්වූයෙමි. මෙම ප්‍රමිති යටතේ මාගේ වගකීම් මාගේ වාර්තාවේ මූල්‍ය ප්‍රකාශ කොටසේ විගණනය සඳහා විගණකගේ වගකීම් යටතේ තවදුරටත් විස්තරකර ඇත. මම ලබාගත් විගණන සාක්ෂිය මගේ මතය සඳහා පදනමක් ලබාදීමට ප්‍රමාණවත් සහ සුදුසු බවට මම විශ්වාස කරමි.

1.3. බැංකුවේ 2023 වාර්ෂික වාර්තාවේ අඩංගු වෙනත් තොරතුරු

අනෙකුත් තොරතුරු සඳහා බැංකුවේ 2023 වාර්ෂික වාර්තාවේ ඇතුලත් තොරතුරු අන්තර්ගත නමුත් ඒවා මූල්‍ය ප්‍රකාශවල හා මාගේ විගණන වාර්තාවේ ඇතුලත් නොවන අතර එම තොරතුරු මෙම විගණක වාර්තාව ඉදිරිපත් කළ දිනට පසුව මා වෙත ලබා දීමට අපේක්ෂා කෙරේ. අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුවෙයි.

මූල්‍ය ප්‍රකාශ පිළිබඳ මාගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොවන අතර එහිදී සහතික කරන ලද කිසිදු නිගමනයන් මම ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශ පිළිබඳ මාගේ විගණනය සම්බන්ධයෙන් ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු පවතිනවිට ඒවා කියවමින් මූල්‍ය ප්‍රකාශ සමග එම අනෙකුත් තොරතුරු ප්‍රමාණාත්මකව නොගැලපේද? හෝ විගණනයේදී මා ලබාගත් තොරතුරු සාවද්‍ය ලෙස ප්‍රකාශවී තිබේද යන්න සලකා බැලීම සිදු කිරීමයි.

මා විසින් 2023 වාරෂයට අදාල බැංකු වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වශයෙන් සාවද්‍ය ප්‍රකාශ ඇති බව මා නිගමනය කරන්නේ නම්, නිවැරදි කිරීම සඳහා එම කාරණය පාලනය සම්බන්ධයෙන් චෝදනා ලැබ සිටින අයට දැනුම් දීමට මා හට අවශ්‍ය වේ. තවදුරටත් ප්‍රමාණාත්මකව නිවැරදි නොකළ සාවද්‍ය ප්‍රකාශ තිබේ නම් ඒවා නියමිත වේලාවට සභාගත කෙරෙන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) වගන්තියේ විධිවිධාන අනුව මා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

1.4. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය පකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය පකාශ පිළියෙල කිරීමට හැකිවීම පිණිස අවශ්‍ය යයි කලමනාකරණය තීරණය කරන අභ්‍යන්තර පාලනයක් හා ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිති අනුව සත්‍ය හා සාධාරණ නිරූපණයක් ලැබෙන පරිදි මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම සඳහා කළමනාකරණය වගකිවයුතු වෙයි.

මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේ දී කළමනාකරණය එක් පසකින් බැංකුව ඈවර කිරීමට හෝ මෙහෙයුම් නැවත්වීමට හෝ තත්ත්‍ය විකල්පයක් නොමැතිනම් එසේ සිදුකිරීම නැතහොත් ගිණුම්කරණයේ දී ප්‍රවර්ථන ව්‍යාපාර සංකල්පයට සම්බන්ධ කරුණු සුදුසු පරිදි හෙළි කිරීම ප්‍රවර්ථන ව්‍යාපාරයක් ලෙස ඉදිරියටත් පවත්ගෙන යෑමේ බැංකුවේ හැකියාව තක්සේරු කිරීම සඳහා කළමනාකරණය වගකිව යුතු වෙයි.

පාලනය සඳහා වගකිවයුතු පිරිස බැංකුවේ මූල්‍ය ප්‍රකාශ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම සඳහා වගකිවයුතු වෙයි.

2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව බැංකුව එහි අන්තර්වාර හා වාර්ෂික මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමට හැකිවීම පිණිස බැංකුවේ සියලුම ආදායම්, වියදම්, වත්කම් හා වගකීම් වාර්තා කිරීම සඳහා යෝග්‍ය පොත්පත් පවත්වාගෙනයෑම අවශ්‍යවෙයි.

1.5. මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා විගණකගේ වගකීම්

මගේ පරමාර්ථය වන්නේ සමස්ථයක් ලෙස වංචා හෝ දෝෂ හේතුකොට ගෙන මූල්‍ය ප්‍රකාශන වැදගත් වැරදි ප්‍රකාශයන්ගෙන් නිදහස්ද යන්න පිළිබඳ සාධාරණ සහතිකය ලබාගැනීම සහ මගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාවක් නිකුත් කිරීමයි. සාධාරණ සහතිකය ඉහළ මට්ටමේ සහතිකයක් වුවද, ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනයකින් වැදගත් වැරදි ප්‍රකාශයක් එහි පැවතියද සෑම අවස්ථාවකදීම එය සොයා ගන්නා බවට වගවීමක් නොමැත. වැරදි ප්‍රකාශ වංචාව හෝ දෝෂය තුළින් ඇතිවිය හැකි අතර තනි තනිව හෝ එකතුව මෙම මූල්‍ය ප්‍රකාශවල පදනම මත ගනු ලබන ආර්ථික තීරණවලට බලපෑම් කිරීමට ඉන් සාධාරණව අපේක්ෂා කරන්නේනම් වැදගත් ලෙස සලකනු ලබයි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව විගණනයක කොටසක් ලෙස, මම වෘත්තීය විනිශ්චය ක්‍රියාවේ යොදවන අතර, විගණනය පුරා වෘත්තීය සංශයවාදය පවත්වා ගනිමි. එමෙන්ම මම :

- වංචාව හෝ දෝෂ හෝ සැලැස්ම හේතු කොට ගෙන මූල්‍ය ප්‍රකාශවල වැදගත් වැරදි පකාශ පිළිබඳ අවදානම් හඳුනාගෙන තක්සේරු කරන අතර, එවැනි අවදානම්වලට ප්‍රතිචාරාත්මක විගණන ක්‍රියාපටිපාටි ඉටුකරමින් මගේ මතය සඳහා පදනමක් ලබාදීමට ප්‍රමාණවත් සහ සුදුසුවන විගණන සාක්ෂිය ලබා ගනිමු. වංචාවෙන් ඇතිවන වැදගත් වැරදි ප්‍රකාශයක් සොයා නොගැනීමේ අවදානම වංචාව කුමන්ත්‍රණය, ව්‍යාජ ලේඛන සෑදීම, සිතාමතා ඉවත්කිරීම්, ව්‍යාජ නියෝජන, හෝ අභ්‍යන්තර පාලනය ප්‍රතික්ෂේප කිරීම හා සම්බන්ධවන බැවින් දෝෂයකින් ඇතිවන දෙයකට වඩා විශාලය.

- බැංකුවේ අභ්‍යන්තර පාලනයේ ඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමේ අරමුණ සඳහා හැර අවස්ථාවන්ට සුදුසුවන විගණන ක්‍රියාපටිපාටිය සැලසුම් කිරීම පිණිස විගණනයට අදාළ අභ්‍යන්තර පාලනය පිළිබඳ අවබෝධයක් ලබා ගනිමු.

විගණකාධිපති වාර්තාව

- කළමනාකරණය විසින් භාවිතා කළ ගිණුම්කරණ ප්‍රතිපත්තිවල යෝග්‍යතාව සහ ඔවුන් විසින් සිදුකරක ගිණුම්කරණ ඇස්තමේන්තු සහ අදාළ අනාවරණවල සාධාරණත්වය අගය කරමි.

- ගිණුම්කරණය පිළිබඳ අඛණ්ඩතා පදනම සම්බන්ධ කළමනාකරණයේ භාවිතයේ යෝග්‍යතාව සහ ලබාගත් විගණන සාක්ෂිය මත පදනම්වී, ප්‍රවර්ථන ව්‍යාපාරයක් ලෙස ඉදිරියට යාම පිළිබඳ බැංකුවේ හැකියාව සම්බන්ධව වැදගත් සැකයක් ඇතිකළ හැකි සිදුවීම් සහ තත්ත්වයන් සම්බන්ධයෙන් වැදගත් අවිනිශ්චිතතාවක් පවතීද යන්න නිශ්චය කරමි. වැදගත් අවිනිශ්චිතතාවක් පවතින බවට මම නිශ්චය කරන්නේනම් මූල්‍ය ප්‍රකාශ තුළ අදාළ අනාවරණයන්ට මගේ විගණක වාර්තාව පිළිබඳ අවධානය යොමු කිරීම අවශ්‍ය වන අතර, එවැනි අනාවරණ ප්‍රමාණවත් නොවන්නේනම් මගේ මතය වෙනස් කිරීමට අවශ්‍ය වේ. මගේ විගණක වාර්තාවේ දිනය දක්වා ලබාගත් විගණන සාක්ෂිය මත මාගේ නිගමන පදනම් වේ. කෙසේවෙතත්, අනාගත සිදුවීම් හෝ තත්ත්වයන් ප්‍රවර්ථන ව්‍යාපාරයක් ලෙස බැංකුව ඉදිරියට යාම නතර කිරීමට හේතු විය හැකිය.

- සමස්ත ඉදිරිපත් කිරීම, අනාවරණ ඇතුළුව මූල්‍ය ප්‍රකාශවල ව්‍යුහය සහ අන්තර්ගතය සහ මූල්‍ය ප්‍රකාශ සාධාරණව ඉදිරිපත් කිරීම අත්කර ගන්නා ආකාරයකින් පාදක වූ ගනුදෙනු හා සිදුවීම් නියෝජනය කරන්නේද යන්න ඇගයීමට ලක් කළෙමි.

අනෙකුත් කරුණු අතර මගේ විගණනය තුළ මම හඳුනාගත් අභ්‍යන්තර පාලනය තුළ යම් වැදගත් අඩුපාඩු ඇතුළුව වැදගත් විගණන සොයා ගැනීම් සම්බන්ධයෙන් වගකියන පුද්ගලයින් සමඟ මම අදහස් හුවමාරු කර ගනිමි.

2. අනෙකුත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනත තුළ පහත අවශ්‍යතා සඳහා විශේෂ විධිවිධාන ඇතුළත්ය:

2.1.1 විගණනය සඳහා අවශ්‍ය සියලුම තොරතුරු සහ පැහැදිලි කිරීම මම ලබාගෙන ඇති අතර, මගේ පරීක්ෂණයෙන් පෙන්නුම්වන ආකාරයට, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ අවශ්‍යතා පරිදි සුදුසු ගිණුම්කරණ වාර්තා බැංකුව විසින් තබා ගෙන ඇත.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) :සසස* වගන්තියේ අවශ්‍යතා පරිදි ඉදිරිපත් කළ මූල්‍ය ප්‍රකාශ පූර්වාසන්න වසර සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) ඃසඩ* වගන්තියේ අවශ්‍යතා පරිදි ඉදිරිපත් කළ මූල්‍ය ප්‍රකාශවල පෙර වසරේ මා විසින් සිදුකළ සියලුම නිර්දේශ ඇතුළත් වේ.

2ග2 ඉටුකල ක්‍රියාමාර්ග හා ලබාගත් තොරතුරු මත පදනම්ව ප්‍රමාණාත්මක කරුණු සඳහා පමණක් සීමා වෙමින් මාගේ අවධානය සඳහා කිසිවක් හමුවී නොමැත.

2.2.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12(ඈ) පරිච්ඡේදයේ අවශ්‍යතාවයන් ප්‍රකාරව සාමාන්‍ය ව්‍යාපාරික ක්‍රියාවලියෙන් බැහැරව බැංකුව විසින් ගිවිසගත් කිසියම් කොන්ත්‍රාත්තුවක් සඳහා බැංකුවේ පාලන තන්ත්‍රයෙ සිටින කිසියම් සාමාජිකයකු කිසියම් සෘජු හෝ වක්‍ර උනන්දුවක් ඇති බව දක්වා තිබීම ප්‍රකාශ කිරීම.

2.2.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 1, 2 (ඊ) පරිච්ඡේදයේ අවශ්‍යතාවයන් ප්‍රකාරව බැංකුවේ පාලන තන්ත්‍රය විසින් නිකුත්කර ඇති සාමාන්‍ය හා විශේෂ විධිවිධාන කිසියම් අදාල ලිඛිත නීතියක් සමග බැංකුව අනුකූල නොකරගත් බව ප්‍රකාශ කිරීම.

2.2.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12(උ) පරිච්ඡේදයේ අවශ්‍යතාවයන් ප්‍රකාරව කාර්යයන් සහ රාජකාරීන් එහි බලතල අනුව බැංකුව විසින් සිදුකර නොමැති බව ප්‍රකාශ කිරීම.

2.2.4 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12(උෆ) පරිච්ඡේදයේ අවශ්‍යතාවයන් ප්‍රකාරව අදාල නීති සමග අනුකූලව හා කාල සීමාවන් තුල පිරිමැසුම්දායක ලෙස, කාර්යක්ෂමව හා ඵලදායී ලෙස බැංකුවේ සම්පත් ප්‍රසම්පාදනය හා භාවිතා කිරීම සිදුකර නොමැති බව ප්‍රකාශ කිරීම.

ඩබ්ලිව් පී සී වික්‍රමරත්න
විගණකාධිපති

මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

2023 දෙසැම්බර් 31න් අවසන් දිනට	සටහන්	2023 (රු.)	2022 (රු.)
වත්කම්			
මුදල් සහ මුදල් හා සමාන දෑ	13	**122,600,853**	126,480,437
බැංකු තැම්පතු	14	**2,923,132,097**	13,002,272,044
මූල්‍ය වත්කම් - ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගය	15	**3,552,533,227**	-
මූල්‍ය වත්කම් - ක්‍රමක්ෂය පිරිවැයට			
- ණය සහ අත්තිකාරම්	16.1	**38,603,322,207**	39,267,237,754
- ණය සහ අනෙක් උපකරණ	17	**12,162,743,730**	2,574,993,439
මූල්‍ය වත්කම්- වෙනත් විස්තීර්ණ ආදායම තුළින් සාධාරණ අගයට	18	**5,379,078**	5,379,078
දේපළ පිරියත සහ උපකරණ	19	**171,651,164**	78,212,808
භාවිතයට අයිතිය ඇති වත්කම්	33.1	**156,519,188**	201,736,713
පමාකළ බදු වත්කම්	20	**745,677,898**	632,156,451
වෙනත් වත්කම්	21	**622,951,236**	1,076,476,258
මුළු වත්කම්		**59,066,510,678**	56,964,944,983
වගකීම්			
බැංකුවලට ගෙවිය යුතු	22	**2,732,792**	23,380,935
ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය වගකීම්			
- තැන්පත්කරුවන්ට ගෙවිය යුතු	23	**52,138,134,453**	49,139,971,357
- ණය සුරැකුම්පත් හිමිකරුවන්ට ගෙවිය යුතු		**-**	-
- අනෙකුත් ණයකරුවන්ට ගෙවිය යුතු	23	**178,986,770**	278,050,561
සේවක ප්‍රතිලාභ වගකීම	24	**597,674,223**	521,826,703
ආදායම් බදු වගකීම	25	**-**	134,000,281
වෙනත් වගකීම්	25	**694,813,406**	393,230,439
මුළු වගකීම්		**53,612,341,643**	50,490,460,277
ස්කන්ධය			
ප්‍රකාශිත ප්‍රාග්ධනය/පවරන ලද ප්‍රාග්ධනය	26	**889,812,899**	889,812,899
ව්‍යවස්ථාපිත සංචිත අරමුදල	27	**306,650,839**	306,650,838
රඳවාගත් ඉපැයීම්	28	**3,179,896,294**	4,200,211,965
අනෙකුත් සංචිත	29	**1,077,809,004**	1,077,809,004
මුළු ස්කන්ධය		**5,454,169,036**	6,474,484,706
මුළු ස්කන්ධය හා වගකීම්		**59,066,510,678**	56,964,944,983

සහතික කිරීම:

මෙම මූල්‍ය ප්‍රකාශ මගින් 2023 දෙසැම්බර් 31 දිනට රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ තත්ත්වය සහ ඉන් අවසන් වූ වර්ෂය සඳහා එහි ලාභය පිළිබඳ සත්‍ය සහ සාධාරණ දැක්මක් ලබා දේ.

කේ. එල්. එන්. ඒ. පෙරේරා මහතා
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - මූල්‍ය සහ සැලසුම්

මෙම මූල්‍ය ප්‍රකාශ සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වගකීමෙන් බැඳේ. අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අනුමත කොට අත්සන් කරන ලදී.

ජේ. එම්. සුසෙදාසන් මහතා
සභාපති

මහාචාර්ය ඩී. ඒ. එම් පෙරේරා
අධ්‍යක්ෂ

අයි. ටී. අසුරමාන්න
සාමාන්‍යාධිකාරී/ප්‍ර.වි.නි

29.04.2024

ආදායම් ප්‍රකාශය

2023 දෙසැම්බර් 31න් අවසන් දිනට	සටහන්	2023 (රු.)	2022 (රු.)
පොලී ආදායම	4	**9,324,132,408**	7,401,968,299
පොලී වියදම	4	**(8,732,594,619)**	(5,462,981,408)
ශුද්ධ පොලී ආදායම	4	**591,537,789**	1,938,986,892
ගාස්තු සහ කොමිස් ආදායම	5	**96,293,245**	91,724,320
ගාස්තු සහ කොමිස් වියදම		**-**	-
ශුද්ධ, ගාස්තු සහ කොමිස් ආදායම	5	**96,293,245**	91,724,320
ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයේ මූල්‍ය වත්කම්වලින් ශුද්ධ සාධාරණ ලාභය/(අලාභය)	6	**157,533,227**	(2,134,408)
ශුද්ධ, අනෙකුත් මෙහෙයුම් ආදායම	7	**21,943,478**	25,569,713
මුළු මෙහෙයුම් ආදායම		**867,307,739**	2,054,146,517
හානිකරණ ගාස්තු	8	**(561,392,330)**	(365,747,028)
ශුද්ධ මෙහෙයුම් ආදායම		**305,915,409**	1,688,399,489
සේවක වියදම්	9	**(1,015,292,893)**	(1,089,955,263)
ක්ෂයකිරීමේ හා ක්‍රමක්ෂය වියදම්	10, 33.2	**(99,608,144)**	(96,575,584)
අනෙකුත් වියදම්	10	**(355,869,747)**	(353,428,278)
එ. අ. බදු, ජා. ගො. බදු හා ණය ආ. ගෙ. බදුවලට පෙර මෙහෙයුම් ලාභය / (අලාභය)		**(1,164,855,374)**	148,440,364
මූල්‍ය සේවා මත එකතුකළ අගය මත බදු	34	**(5,125,869)**	(231,066,646)
සමාජ සුරක්ෂිතතා බද්ද		**5,200,577**	(6,378,836)
බදු පෙර ලාභය / (අලාභය)		**(1,164,780,667)**	(89,005,118)
ආදායම් බදු වියදම්	11	**161,649,247**	290,803,108
වසර සඳහා ලාභය / (අලාභය)		**(1,003,131,419)**	201,797,990

විස්තීර්ණ ආදායම් ප්‍රකාශය

2023 දෙසැම්බර් 31න් අවසන් දිනට	2023 රු.	2022 රු.
වර්ෂය සඳහා ලාභය / (අලාභය)	**(1,003,131,419)**	201,797,990
ආදායම් ප්‍රකාශයට නැවත වර්ගීකරණය කරනු ලබන අයිතම		
මූල්‍ය වත්කම් නැවත තක්සේරු කිරීම මත ලාභය හෝ අලාභය	**-**	-
ආදායම් ප්‍රකාශයට නැවත වර්ගීකරණය කරනු නොලබන අයිතම		
පශ්චාත් සේවක ප්‍රතිලාභ බැඳීම නැවත තක්සේරු කිරීම	**(24,548,931)**	(45,905,377)
නිශ්චිත ප්‍රතිලාභ බැඳීම මත ආයුගණක ලාභය හෝ අලාභය මත විලම්බිත බදු බලපෑම	**7,364,679**	13,771,613
වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම	**(1,020,315,671)**	169,664,226

ස්කන්ධය වෙනස්වීම් ප්‍රකාශය

2023 දෙසැම්බර් 31න් අවසන් වර්ෂය සඳහා	පවරන ලද ප්‍රාග්ධනය	ව්‍යවස්ථාපිත සංචිතය	ප්‍රාග්ධන සංචිතය	පොදු සංචිතය	හිමිකම් හානිපූර්ණ අරමුදල	රඳවාගත් ඉපයීම්	එකතුව
2021.12.31 දිනට ශේෂය	889,812,899	296,560,939	393,498,004	683,280,000	1,031,000	4,019,389,735	6,283,572,576
පෙර කාලසීමාවේ ගැලපීම්						21,247,904	21,247,904
වර්ෂය සඳහා ශුද්ධ ලාභය						201,797,990	201,797,990
වෙනත් විස්තීර්ණ ආදායම්						(32,133,764)	(32,133,764)
වර්ෂය තුළ මාරු කිරීම්		10,089,899				(10,089,899)	-
ඒකාබද්ධ අරමුදලට මාරු කිරීම්						-	-
2022.12.31 දිනට ශේෂය	889,812,899	306,650,838	393,498,004	683,280,000	1,031,000	4,200,211,965	6,474,484,706
පෙර කාලසීමාවේ ගැලපීම්							-
වර්ෂය සඳහා ශුද්ධ ලාභය						(1,003,131,419)	(1,003,131,419)
වෙනත් විස්තීර්ණ ආදායම්						(17,184,252)	(17,184,252)
වර්ෂය තුළ මාරු කිරීම්		-				-	-
ඒකාබද්ධ අරමුදලට මාරු කිරීම්						-	-
2023.12.31 දිනට ශේෂය	889,812,899	306,650,838	393,498,004	683,280,000	1,031,000	3,179,896,294	5,454,169,035

මුදල් ප්‍රවාහ ප්‍රකාශය

2023 දෙසැම්බර් 31න් අවසන් වර්ෂය සඳහා	2023/01/01 සිට 2023/12/31 දක්වා (රු.)	2022/01/01 සිට 2022/12/31 දක්වා (රු.)
මෙහෙයුම් කටයුතුවලින් ලද මුදල් ප්‍රවාහය		
ලද පොලිය	**8,921,615,611**	6,532,818,744
ගෙවූ පොලිය	**(9,337,465,140)**	(3,983,524,366)
ශුද්ධ කොමිස් ලැබීම්	**96,293,245**	110,156,617
සේවකයින්ට ගෙවීම්	**(846,574,251)**	(1,139,105,522)
මූල්‍ය සේවා මත එ. අ. බදු, ණ. ආ. ගෙ. බදු හා ජා. ගො බදු	**(5,125,869)**	(224,608,218)
අනෙකුත් මෙහෙයුම් කටයුතුවලින් ලැබීම්	**5,250,254**	3,852,616
අනෙකුත් මෙහෙයුම් කටයුතු මත ගෙවීම්	**(302,959,071)**	(393,178,818)
මෙහෙයුම් වත්කම් හා වගකීම් වෙනස්වීමට පෙර මෙහෙයුම් ලාභය	**(1,468,965,222)**	906,411,053
මෙහෙයුම් වත්කම් (වැඩිවීම්)/අඩුවීම්		
ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය වත්කම් - ණය හා අත්තිකාරම්	**448,871,346**	(1,413,593,730)
අනෙකුත් වත්කම්	**473,203,052**	(259,037,405)
	922,074,398	(1,672,631,135)
මෙහෙයුම් වගකීම් (වැඩිවීම්)/අඩුවීම්		
ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය වගකීම් - තැන්පත්කරුවන්ට ගෙවිය යුතු	**3,607,292,902**	1,996,748,599
ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය වගකීම් - අනෙකුත් ණය හිමියන්ට ගෙවිය යුතු	**(96,420,481)**	(90,186,677)
අනෙකුත් වගකීම්	**228,785,113**	(56,713,935)
	3,739,657,534	1,849,847,988
ආදායම් බද්දට පෙර මෙහෙයුම් කටයුතුවලින් ශුද්ධ මුදල් ප්‍රවාහය	**3,192,766,710**	1,083,627,905
ගෙවූ පාරිතෝෂික	**(62,358,388)**	
ගෙවූ ආදායම් බදු	**(78,507,801)**	(85,810,622)
මෙහෙයුම් කටයුතුවලින් ශුද්ධ මුදල් ප්‍රවාහය	**3,051,900,521**	997,817,283
ආයෝජන කටයුතුවලින් ලද මුදල් ප්‍රවාහය		
ලද ලාභාංශ	**18,765,120**	21,324,000
දේපළ, පිරියත සහ උපකරණ විකිණීමෙන් ලද මුදල	**885,920**	554,282
දේපළ, පිරියත සහ උපකරණ මිලට ගැනීම	**(151,172,660)**	(40,389,658)
මූල්‍ය ආයෝජන විකිණීමෙන් සහ කල්පිරීමෙන් ලද මුදල්	**(2,903,610,343)**	(1,004,675,159)
ආයෝජන කටයුතුවලින් ලැබූ ශුද්ධ ආදායම (භාවිත කළ)	**(3,035,131,963)**	(1,023,186,536)
මූල්‍ය කටයුතුවලින් මුදල් ප්‍රවාහය		
යටත් ණය ආපසු ගෙවීම	**-**	-
ඒකාබද්ධ අරමුදල වෙත ගෙවීම්	**-**	-
මූල්‍ය කටයුතුවලින් ශුද්ධ මුදල	**-**	-
මුදල් හා මුදල් හා සමාන දෑ වල ශුද්ධ වැඩිවීම / (අඩුවීම)	**16,768,559**	(25,369,253)
වර්ෂය ආරම්භයේ මුදල් සහ මුදල් හා සමාන දෑ	**103,099,502**	128,468,755
වර්ෂය අවසානයේ මුදල් සහ මුදල් හා සමාන දෑ	**119,868,061**	103,099,502
මුදල් සහ මුදල් හා සමාන දෑ සැසඳීම		
මුදල් සහ කෙටිකාලීන අරමුදල්	**122,600,853**	126,480,437
බැංකුවලින් ණයට ගැනීම් (අයිරා ගිණුම)	**(2,732,792)**	(23,380,935)
කාලසීමාව අවසානයේ මුදල් සහ මුදල් හා සමාන දෑ	**119,868,062**	103,099,502

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

1. ආයතනික තොරතුරු

1.1. සාමාන්‍ය තොරතුරු

1931 අංක 16 දරන ආඥාපනත මගින් 1931 දෙසැම්බර් 06 වැනි දින ලංකා රාජ්‍ය උකස් බැංකුව ලෙස, රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව ආරම්භ කරන ලදී. ලංකා රාජ්‍ය උකස් බැංකුව හා වර්ෂ 1943 දී පිහිට වූ කෘෂිකාර්මික හා කර්මාන්ත ණය සංස්ථාව ඒකාබද්ධ කරමින්, වර්ෂ 1975 අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනත මඟින් රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව ස්ථාපිත කරන ලදී. 1979 ජනවාරි 1 දින බැංකුවේ මෙහෙයුම් කටයුතු ආරම්භ කරන ලදී. මෙම බැංකුව බලපත්‍රලාභී විශේෂ බැංකුවක් ලෙස නම් කළ අතර 1988 අංක 30 දරන බැංකු පනතේ විධිවිධාන ප්‍රකාරව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 1998 අප්‍රේල් 27 දින බලපත්‍රය නිකුත් කරන ලදී.

1.2. ප්‍රධාන කාර්යයන් සහ මෙහෙයුම් ස්වභාවය

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව ප්‍රධාන වශයෙන් නිවාස ණය ලබාදීමේ කටයුතුවල නියැලී සිටී අතර, වර්ධනය වන තරඟකාරීත්වයට මුහුණ දෙනු පිණිස මෑතක සිට සිය කටයුතු සඳහා විවිධාංගීකරණයක් එක් කරමින් රථවාහන ණය හා පුද්ගල ණය වැනි අනෙකුත් ණය පහසුකම් ලබාදීමේ කටයුතුවල ද නිරත වෙමින් සිටී.

1.3. අධ්‍යක්ෂවරුන්ගේ වගකීම් ප්‍රකාශය

1975 අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනත, 1988 බැංකු පනත සහ එහි සංශෝධනවල විධිවිධාන සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට (SLFRS සහ LKAS) අනුකූලව බැංකුවේ මෙම මූල්‍ය ප්‍රකාශ පිළියෙළ කිරීම සහ ඉදිරිපත් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වගකිව යුතු වේ.

1.4. බලය ලබාදීමේ දිනය

2023 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා බැංකුවේ මෙම විගණනය කළ මූල්‍ය ප්‍රකාශ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී ගත් තීරණයට අනුව නිකුත් කිරීම සඳහා අනුමැතිය ලබාදෙන ලදී.

2023 දෙසැම්බර් 31 වන දිනට බැංකුවේ කාර්ය මණ්ඩල සංඛ්‍යාව 354ක් විය. (2022 දෙසැම්බර් 31 දිනට කාර්ය මණ්ඩල සංඛ්‍යාව 387 ක් විය.)

2. ගිණුම්කරණ ප්‍රතිපත්ති

වෙනත් ආකාරයක් පිළිබඳ සඳහන් කළ අවස්ථාවකදී හැර, මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කරන විට පහත සඳහන් ගිණුම්කරණ ප්‍රතිපත්ති සියලුම කාල පරිච්ඡේද සඳහා භාවිත කොට ඇත.

2.1 පිළියෙල කිරීමේ පදනම

2.1.1 අනුකූලතා ප්‍රකාශය

1988 අංක 30 දරන බැංකු පනත හා එහි සංශෝධනවලට අවශ්‍ය තොරතුරුවලට අනුකූලව, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කර ඇති ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අනුව (SLFRS සහ LKAS) 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කර ඉදිරිපත් කර ඇත. මුදල් ප්‍රවාහයේ තොරතුරු හැර, මූල්‍ය ප්‍රකාශන ගිණුම්කරණයේ උපචිත පදනම යටතේ සකස් කර ඇත. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බලපත්‍රලාභී බැංකුවල වාර්ෂික විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශය පළ කිරීම හා පිළියෙල කිරීම සම්බන්ධයෙන් නියම කරන ලද විශේෂිත ආකෘතියට අනුව මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ එහි එළිදරව් කිරීම සිදුකර ඇත.

2.1.2 මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීම

බැංකුව එහි මූල්‍ය තත්ත්ව ප්‍රකාශය ද්‍රවශීලතාවයේ අනුපිළිවෙළට ඉදිරිපත් කරයි. හඳුනාගත් වටිනාකම් නිරවුල් කිරීම වෙනුවෙන් නෛතිකව බැඳී ඇති විටක සහ ශුද්ධ අගය පදනමින් නිරවුල් කිරීමට අරමුණක් ඇති විටක දී හෝ වත්කම් උපලබ්ධි කිරීමත් සමඟ වගකීම් නිරවුල් කිරීමත් එක්වර සිදු කරන අවස්ථාවේ දී මූල්‍ය වත්කම් සහ මූල්‍ය වගකීම් එකිනෙකට හිලව් කර ඇති අතර ශුද්ධ අගය මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ වාර්තා කර ඇත. බැංකුවේ ගිණුම්කරණ ප්‍රතිපත්තීන් මඟින් විශේෂිතව හෙළිදරව් කිරීම යටතේ සහ කිසියම් ගිණුම්කරණ ප්‍රතිපත්ති හෝ අර්ථකථනයක් අනුව අවශ්‍යවන හෝ ඉඩ දී ඇති විටක දී හැර ආදායම් සහ වියදම් ආදායම් ප්‍රකාශවල හිලවු කොට නොමැත.

සමාන අයිතමවල එක් එක් වැදගත් කාණ්ඩ මූල්‍ය ප්‍රකාශනවල වෙන වෙනම ඉදිරිපත් කරයි. සමාන නොවන ස්වභාවයේ අයිතම හෝ කාර්යයන්, ඒවා "මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීම" පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති - LKAS 01 විසින් අවසර දී ඇති පරිදි නොවැදගත් වන්නේ නම් හැර, වෙන වෙනම ඉදිරිපත් කෙරේ.

2.1.3 සැලකිය යුතු ගිණුම්කරණ විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පන

බැංකුවේ ගිණුම්කරණ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලියේදී, කළමනාකාරීත්වය විසින් මූල්‍ය ප්‍රකාශනවල වාර්තා කර ඇති අගයන් හඳුනා ගැනීම සඳහා විනිශ්චය සහ ඇස්තමේන්තු භාවිත කර ඇත. අවිනිශ්චිතතාවය මත පදනම් වූ ප්‍රධාන සැලකියයුතු ගිණුම්කරණ විනිශ්චයන්, ඇස්තමේන්තු හා උපකල්පන පහත සාකච්ඡාකර ඇති අතර, එවැනි වත්කම් හා වගකීම්වල ධාරණ අගයන් අදාළ සටහන්වල දක්වා ඇත.

2.1.3.1 මූල්‍ය වත්කම් හා වගකීම් වර්ගීකරණය

SLFRS 9 අනුව බැංකුවේ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති මඟින් මූල්‍ය වත්කම් විවිධ වර්ගවලට වර්ගීකරණය කිරීම හා ගණනය කිරීම සිදු කරනු ලබයි. එම වර්ගීකරණය සඳහා ක්‍රමක්ෂය පිරිවැය, අනෙකුත් විස්තීරණ ආදායම් තුළින් සාධාරණ අගය (FVOCI) හා ලාභ සහ අලාභ තුළින් සාධාරණ අගය (FVPL) අදාළ වේ. මූල්‍ය වත්කම් කළමනාකරණය සඳහා ආයතනයේ ව්‍යාපාර ආකෘතිය මත පදනම්ව මෙම කාණ්ඩ තීරණය කරනු ලැබේ.

2.1.3.2 මූල්‍ය උපකරණවල සාධාරණ අගය

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ වාර්තාකර ඇති මූල්‍ය වත්කම් හා වගකීම්වල සාධාරණ අගය ක්‍රියාකාරී වෙළෙඳපළ තුළින් ලබාගත නොහැකි අවස්ථාවේදී, ගණිත ක්‍රම අඩංගු තක්සේරු ශිල්පීය ක්‍රම උපයෝගීකර ගනිමින් ඒවා තීරණය කරනු ලබයි. හැකි අවස්ථාවන්හිදී නිරීක්ෂණය කළ හැකි වෙළඳපළ දත්ත මගින් මෙම ආකෘති සඳහා යෙදවුම් ලබා ගනී.

2.1.3.3 මූල්‍ය වත්කම්වල හානිකරණ අලාභ

SLFRS 9 සහ LKAS 39 යටතේ මූල්‍ය වත්කම්වල සියලුම කාණ්ඩ සඳහා හානිකරණ අලාභ තීරණය කරන විට, විශේෂයෙන්ම හානිකරණ අලාභවල ප්‍රමාණය සහ කාලය හඳුනාගැනීමේදී වැදගත් වන අනාගත මුදල් ප්‍රවාහ සහ අතිරේක වටිනාකම් ගණනය කිරීමේදී, විනිශ්චයන් අවශ්‍ය වේ. ඒ අනුව ආදායම් ප්‍රකාශයේ හානිකරණ අලාභ දැක්විය යුතුද යන්න තක්සේරු කිරීම සඳහා සෑම වාර්තාකරණ දිනකටම බැංකුව වෙන් වෙන් වශයෙන් වැදගත්වන ණය සහ අත්තිකාරම් සමාලෝචනය කරයි. විශේෂයෙන්ම හානිකරණ අලාභ තීරණය කරන විට ප්‍රමාණය ඇස්තමේන්තු කිරීමේ දී හා අනාගත මුදල් ප්‍රවාහයන්ගේ කාල ගණනය කිරීම සඳහා කළමනාකරණයේ විනිශ්චයන් අවශ්‍ය වේ. මෙම ඇස්තමේන්තු, කරුණු කීපයක් මත පදනම්වූ උපකල්පනයන් වන අතර එම හේතුවෙන් සැබෑ ප්‍රතිඵල වෙනස්විය හැකි වේ. එහි ප්‍රතිඵලයක් ලෙස වෙන්කර ඇති හානිකරණ දීමනාවේ අනාගත වෙනස්කම් ඇතිවිය හැකිය. ඒකලන හානිකරණ සඳහා තනි තනිව තක්සේරු කරන ලද මූල්‍ය වත්කම් සඳහා තනි හානිකරණ ප්‍රතිපාදන අදාළ වේ. එය ලැබීමට අපේක්ෂා කරන අනාගත මුදල් ප්‍රවාහවල වර්තමාන වටිනාකම පිළිබඳ කළමනාකාරිත්වයේ හොඳම තක්සේරුව මත පදනම් වේ. මෙම මුදල් ප්‍රවාහයන් ඇස්තමේන්තු කිරීමේදී ණය ගැනුම්කරුගේ මූල්‍ය තත්ත්වය හා ඇප සුරැකුම් ලෙස තබා ඇති වත්කමේ ශුද්ධ උපලබ්ධි වටිනාකම පිළිබඳ කළමනාකරණය විනිශ්චයන් සිදු කරයි. සියලුම හානිකරණය වත්කම් එහි ගුණාත්මකභාවය මත තක්සේරු කරයි. එහිදී මුදල් ප්‍රවාහයන්ගේ ගණනය කිරීමේ උපායමාර්ග සහ ඇස්තමේන්තු අයකර ගතහැකි දෑ ලෙස සලකනු ලබයි. තනි ස්වරූපයෙන් වැදගත් ලෙස සලකනු නොලබන සමජාතීය ණය හා අත්තිකාරම් සඳහා සාමූහික හානිකරණ ප්‍රතිපාදන පිහිටුවා ඇත. එසේම එමඟින් වෙන වශයෙන් වැදගත්වන නමුත් තනි ස්වරූපයෙන් හානිකරණය වී නොමැති වත්කම් කාණ්ඩ සඳහාද යොදා ගනී.

SLFRS 9 ට අනුව, අපේක්ෂිත ණය හානි ගණනය කිරීම (ECL) යනු විවල්‍ය යෙදවුම් තෝරාගැනීම සහ ඒවායේ අන්තර් රඳා පැවැත්ම සම්බන්ධයෙන් පවතින උපකල්පන ගණනාවක් සහිත සංකීර්ණ සැලසුම්වල ප්‍රතිඵල වේ. ගිණුම්කරණ විනිශ්චයන් සහ ඇස්තමේන්තු ලෙස සලකනු ලබන අපේක්ෂිත ණය හානි ආකෘතිවල පහත මූලික අංග දැක ගත හැකිය.

- ණය අවදානමේ සැලකිය යුතු වැඩිවීමක් සිදුවී තිබේද යන්න පිළිබඳ ගුණාත්මකව තක්සේරු කිරීම සඳහා වන නිර්ණායක සහ එසේ වන්නේ නම් ජීව කාලය තුළ අපේක්ෂිත ණය හානි පදනම මත මනිනු ලබන මූල්‍ය වත්කම් සඳහා දීමනා.
- අපේක්ෂිත ණය හානි සාමූහික පදනමක් මත තක්සේරු අවස්ථාවේදී මූල්‍ය වත්කම් බෙදා වෙන් කිරීම.
- විවිධ සංඛ්‍යාත්මක සූත්‍ර සහ යෙදවුම් තේරීම ඇතුළුව අපේක්ෂිත ණය හානි ආකෘති සංවර්ධනය කිරීම.
- දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනය හා උද්ධමනය වැනි සාර්ව ආර්ථික යෙදවුම් අතර සම්බන්ධතාවය නිර්ණය කිරීම.

- පොලී අනුපාත, විනිමය අනුපාත සහ විරැකියාව හා පැහැර හැරීමේ සම්භාවිතාව (PDs)
- පැහැර හැරීමේ නිරාවරණය (EAD) හා පැහැර හැරීමේ අලාභ වීම (LGD)
- අපේක්ෂිත ණය හානි ආකෘතිවලට ආර්ථික යෙදවුම් යොදා ගැනීම සඳහා ඉදිරි දැක්මක් සහිත සාර්ව ආර්ථික අවස්ථා තෝරාගැනීම සහ ඒවායේ සම්භාවිතාව.

2.1.4 *ආසන්නම රුපියලට දැක්වීම*

"මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත්කිරීම" පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම් ගිණුම්කරණ ප්‍රමිති (LKAS 1) මඟින් අවසර ලබා දී ඇති පරිදි, මූල්‍ය ප්‍රකාශනවල ඇති වටිනාකම් ආසන්නම රුපියලට දක්වා ඇත. එසේ නොමැති අවස්ථා සඳහන් කරනු ලබයි.

2.1.5 *ඇගයීම් පදනම*

සාධාරණ අගයට මනිනු ලබන මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ පහත සඳහන් අයිතමයන් හැර, ඓතිහාසික පිරිවැය පදනම මත මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇත.

i. වෙනත් විස්තීරණ ආදායමක් තුළින් සාධාරණ වටිනාකමකින් මනිනු ලබන මූල්‍ය වත්කම්
ii. ලාභ හෝ අලාභ තුළින් හඳුනාගන්නා මූල්‍ය වත්කම් හා වගකීම්
iii. ලාභය හෝ අලාභය හරහා සාධාරණ වටිනාකමකින් නම් කරන ලද මූල්‍ය වත්කම් සහ වගකීම්
iv. නිර්වචිත ප්‍රතිලාභ බැඳීම්වල වර්තමාන වටිනාකමෙන් සැලසුම් වත්කමේ සාධාරණ අගයෙන් අඩු කිරීමෙන් සේවක නිර්වචිත ප්‍රතිලාභ බැඳීම්වල වගකීම හඳුනාගනු ලබයි.

2.1.6 *අඛණ්ඩ පැවැත්ම*

අඛණ්ඩ පැවැත්ම ලෙස ඉදිරියටත් කටයුතු කරගෙන යෑමේ හැකියාව පිළිබඳ බැංකුවේ කළමනාකරණය තක්සේරුවක් සිදුකර ඇති අතර, ඉදිරි කාලය තෙක් ව්‍යාපාර කටයුතු සිදු කරගෙන යෑම සඳහා අවශ්‍ය සම්පත් ඇති බවට සෑහීමකට පත්වෙයි. එමෙන්ම අඛණ්ඩ ව්‍යාපාරයක් ලෙස ඉදිරියටත් කටයුතු කරගන යෑමේ බැංකුවේ හැකියාව පිළිබඳ සාධාරණ සැකයක් ඇතිවිය හැකි කිසියම් ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් පිළිබඳව කළමනාකරණය දැනුවත් වී නොමැත. එම නිසා මූල්‍ය ප්‍රකාශන සකස් කොට ඇත්තේ අඛණ්ඩ පැවැත්මේ පදනම මතයි. මෙම තක්සේරුකරණයේදී බැංකුවේ ව්‍යාපාර මෙහෙයුම්වලට කොවිඩ්-19 වසංගතය හේතුවෙන් ඇති විය හැකි පසු බැසීම පිළිබඳ කළමනාකරණය විසින් සැලකිල්ලට ගෙන ඇත. ඒ අනුව, අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම සුදුසු බවට කළමනාකරණය සෑහීමකට පත් වෙයි.

2.1.7 *ප්‍රමාණාත්මකභාවය හා සමාහරණය*

සමාන අයිතමයන්ගේ සෑම ප්‍රමාණාත්මක කාණ්ඩයක්ම මූල්‍ය ප්‍රකාශනයන්හි වෙන් වශයෙන් ඉදිපත්කර ඇත. "මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම" සඳහා වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති LKAS 01 මගින් අවසර දී ඇති පරිදි ප්‍රමාණාත්මක නොවේ නම් සමාන ස්වභාවයේ නොවන අයිතම හා ක්‍රියාකාරකම් වෙන් වශයෙන් ඉදිරිපත් කර ඇත.

2.1.8 *සංසන්දනාත්මක තොරතුරු*

වත්මන් කාලපරිච්ඡේදයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අවබෝධය වැඩි කිරීම සඳහා සහ අන්තර් කාලාන්තර සංසන්දනාත්මක බව වැඩි කිරීම සඳහා මූල්‍ය ප්‍රකාශනවල පෙර කාලසීමාව සම්බන්ධයෙන් ප්‍රමාණාත්මක සහ විස්තරාත්මක තොරතුරු ඇතුළු සංසන්දනාත්මක තොරතුරු අනාවරණය කර ඇත. වර්තමාන වර්ෂයේ ඉදිරිපත් කිරීමට අනුගතවීම සඳහා සංසන්දනාත්මක තොරතුරු වඩා ගුණාත්මක ඉදිරිපත් කිරීමක් වෙනුවෙන් නැවත වර්ගීකරණය කරයි.

2.2 වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති - මූල්‍ය උපකරණ සඳහා ආදායම් සහ වියදම් හඳුනාගැනීම

2.2.1 *පොලී ආදායම සහ වියදම*

ආර්ථික ප්‍රතිලාභ බැංකුව වෙත ගලා ඒමට ඉඩ ඇති බව සහ ආදායම විශ්වාසදායක ලෙස මැනිය හැකි බව මත ආදායම් හඳුනාගෙන ඇත. "ආදායම් හා වියදම්" පිළිබඳ විස්තර සටහන් අංක 3 හා 4 හි දක්වා ඇත.

සවල පොලී අනුපාත ක්‍රමය

ක්‍රමක්ෂය පිරිවැයට තක්සේරු කර ඇති සියලුම මූල්‍ය උපකරණ හි සඵල පොලී අනුපාතය (EIR) උපයෝගී කරගනිමින් පොලී ආදායම වාර්තා කරනු ලබන අතර, මූල්‍ය උපකරණ ලාභ හෝ අලාභ මඟින් සාධාරණ අගයට (FVPL) වර්ගකර ඇත. පොලී දරන මූල්‍ය වත්කම්වල පොලී ආදායම SLFRS 9 යටතේ සාධාරණ අගයට තක්සේරු කර ඇත. එලෙසම පොලී දරන මූල්‍ය වත්කම් විකිණීම සඳහා ඇති හෝ කල්පිරීම තෙක් රඳවාගත් ලෙස LKAS 39 යටතේ වර්ගීකරණය කර EIR ක්‍රමයට වාර්තා කර ඇත. EIR යනු මූල්‍ය උපකරණයේ අපේක්ෂිත ආයු කාලය තුළින් ඇස්තමේන්තුගත අනාගත මුදල් ලැබීම් හෝ, සුදුසු වූ විට, කෙටි කාලසීමාවක් තුළ, මූල්‍ය වත්කම්වල ශුද්ධ රැගෙන යන අගයට වට්ටම් කරන අනුපාතයයි.

EIR (සහ එම නිසා වත්කමේ ක්‍රමක්ෂය පිරිවැය) ගණනය කරනු ලබන්නේ EIR හි අනිවාර්ය අංගයක් වන අත්පත්කර ගැනීම් ගාස්තු සහ පිරිවැය පිළිබඳ කිසියම් වට්ටමක් හෝ වාරිකයක් සැලකිල්ලට ගනිමිනි. ණය මුදලක අපේක්ෂිත ජීව කාලයට වඩා ස්ථාවර ප්‍රතිලාභ අනුපාතයක හොඳම ඇස්තමේන්තුව නියෝජනය කරන ප්‍රතිලාභ අනුපාතයක් භාවිතා කරමින් බැංකුව පොලී ආදායම හඳුනාගනී. එබැවින් විවිධ කාල සීමාවන් වල අයකළ හැක හැකි පොලී අනුපාතවල බලපෑම සහ නිෂ්පාදනයේ ජීවන චක්‍රයේ අනෙකුත් ලක්ෂණ (පෙර ගෙවීම්, දඩ පොලී සහ ගාස්තු ඇතුළුව) මත එය හඳුනාගනී.

ණය අවදානම හැර වෙනත් හේතු මත මූල්‍ය වත්කම්වල මුදල් ප්‍රවාහයන් පිළිබඳ අපේක්ෂාවන් සංශෝධනය කරන්නේ නම් පොලී ආදායමේ වැඩිවීමක් හෝ අඩුවීමක් සමඟ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ වත්කමේ ඉදිරියට ගෙනයන ශේෂයට ගැළපීම ධන හෝ ඍණ ලෙස වෙන්කර ඇත. ගැළපීම ආදායම් ප්‍රකාශයේ පොලී සහ ඒ හා සමාන ආදායමක් මගින් පසුව ක්‍රමක්ෂය කරනු ලැබේ.

2.2.2 *ලාභාංශ ආදායම*

ගෙවීම් ලැබීම සඳහා බැංකුවේ හිමිකාරිත්වය තහවුරු කරන අවස්ථාවේදී ලාභාංශ ආදායම හඳුනා ගනු ලබයි. සටහන් අංක 7.

2.2.3 *ශුද්ධ වෙළඳ ආදායම*

මූල්‍ය වත්කම් ලෙස වර්ගීකරණය කළ ස්කන්ධ හා ස්ථාවර ආදායම් සුරැකුම්පත්වල ආයෝජනය තුළින් හටගන්නා ලද වෙළඳ ක්‍රියාකාරකම් ප්‍රතිඵලවල හි ලාභය හෝ අලාභය - සාධාරණ වටිනාකමකින් සහ එවැනි උපකරණවල සාධාරණ වටිනාකමේ වෙනස්වීම් හේතුවෙන් සාක්ෂාත් කර නොගත් ලාභය හෝ අලාභය ශුද්ධ වෙළඳ ආදායම ලෙස හඳුනා ගැනේ.

2.2.4 *වෙනත් ආදායම්*

වෙනත් ආදායම් උපචිත පදනමින් හඳුනාගනු ලබයි. සටහන් අංක 7.

2.2.5 *අනෙකුත් වියදම්*

සියළුම අනෙකුත් වියදම් ඒවා දරනු ලැබූ කාලයට අදාළව සහ ඒවායේ සම්බන්ධතාවය අනුව මූල්‍ය ප්‍රකාශනවල හඳුනා ගනු ලබයි. ව්‍යාපාරික කටයුතු මෙහෙයවීමේ දී හා කාර්යක්ෂම තත්ත්වයකින් ප්‍රාග්ධන වත්කම් පවත්වාගෙන යෑම සඳහා දරනු ලබන සියලුම වියදම් වර්ෂය සඳහා වන බැංකුවේ ලාභය සෙවීමේ දී, ආදායමට අයකර ඇත. වෙනත් වියදම් පිළිබඳ සටහන් අංක 10 හි දක්වා ඇත.

2.2.6 *SLFRS 15 – ගනුදෙනුකරුවන් සමඟ ඇති කොන්ත්‍රාත් වලින් ලැබෙන ආදායම*

SLFRS 15 මඟින් ආදායම හඳුනා ගන්නේද, එය කොපමණ ප්‍රමාණයක්ද සහ කවදාද යන්න තීරණය කිරීම සඳහා පුළුල් රාමුවක් ස්ථාපිත කරයි. නව ගුණාත්මක හා ප්‍රමාණාත්මක හෙළිදරව් කිරීමේ අවශ්‍යතා මූල්‍ය ප්‍රකාශන පරිශීලකයන්ට සිය පාරිභෝගිකයන් සමඟ ඇතිවන ගිවිසුම් වලින් පැන නගින ආදායමේ සහ මුදල් ප්‍රවාහයේ ස්වභාවය, ප්‍රමාණය, කාල සීමාව සහ අවිනිශ්චිතතාවය අවබෝධ කර ගැනීමට උපකාරී වේ. ආයතන විසින් ආදායම හඳුනා ගන්නේ කවදාද සහ කොපමණ ප්‍රමාණයකින්ද යන්න තීරණය කිරීමට පියවර පහකින් යුත් ආකෘතියක් යොදාගනු ලබයි. ආයතනය අපේක්ෂා කරන මුදල ලබා ගනිමින් භාණ්ඩ හා සේවා අයිතිය පාරිභෝගිකයෙකුට පැවරීමේදී හෝ අදාළ මොහොතේදී ආදායම හඳුනා ගන්නා බව ආකෘතිය සඳහන් කරයි. යම් නිර්ණායක සපුරා තිබේද යන්න මත පදනම්ව, ආදායම හඳුනා ගැනේ.

2.3 බදු වියදම්

මූල්‍ය සේවා මත වැට බඳ්ද ඇතුළුව ආදායම් බදු හා වෙනත් බදු ගෙවීම සඳහා බැංකුව යටත් වේ. වර්තමාන, විලම්බිත සහ අනෙකුත් බදු සඳහා කරනු ලබන මුළු බදු ප්‍රතිපාදන පිළිබඳ සැලකිය යුතු විනිශ්චයක් අවශ්‍ය විය. මන්ද යත් මූල්‍ය ප්‍රකාශවල ශ්‍රී.ල.මූ.වා.ප්‍ර. (SLFRS) යොදා ගැනීම පිළිබඳ නිකුත් කර ඇති බදු මාර්ගෝපදේශය සහ බදු අය කළ හැකි ලාභ තීරණය කිරීමට අවිනිශ්චිතතාවයක් පැවතුණ බැවිනි. මෙම මූල්‍ය ප්‍රකාශ සකස් කිරීමේදී බදු නීතිවල අදාළත්වය පිළිබඳ අර්ථ නිරූපණය සම්බන්ධයෙන් අවිනිශ්චිතතා පවතී.

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

බැංකුව අමතර බදු ගෙවිය යුතුද යන්න පිළිබඳ ඇස්තමේන්තු මත පදනම්ව බැංකුව විසින් ජංගම, විලම්බිත සහ වෙනත් බදු සඳහා වත්කම් හා වගකීම් හඳුනා ගනු ලබයි. ආරම්භයේදී වාර්තා කරන ලද වටිනාකමට වඩා කරුණුවල අවසාන බදු ප්‍රතිඵලයන් වෙනස් වන්නේ නම්, එවැනි වෙනස්කම් නිර්ණයන් සිදු කරනු ලබන එකී කාලයේ ආදායම් සහ විලම්බිත බදු අගයන්ට බලපෑම් ඇති කරනු ලබයි.

2.3.1 IFRIC 23 – ආදායම් බදු ගැළපීම් සම්බන්ධයෙන් පවතින අවිනිශ්චිතතාවය

LKAS 12 "ආදායම් බදු" යෙදවීමට බලපාන ආදායම් බදු ගැළපීමට සම්බන්ධ අවිනිශ්චිතතාවයන් ගණනය කිරීමට මෙම අර්ථ දැක්වීම් පාදකකර ගනී. ඊට LKAS 12 විෂය පථයට පිටින් පවතින බදු හා ගාස්තු සඳහා අදාළ නොවේ. නිශ්චිත බදු ගැළපීම් සඳහා අදාළ වන දඩ හා පොලිය පිළිබඳ අවශ්‍යතාවයන් විශේෂයෙන්ම අඩංගු නොවේ. අර්ථදැක්වීම මඟින් පහත සඳහන් කරුණු කෙරෙහි විශේෂයෙන්ම අවධානය යොමු කරයි.

- ආයතනය අවිනිශ්චිත බදු ගැළපීම් වෙන් වශයෙන් සලකා බලා තිබේද යන්න.
- බදු අධිකාරීන් විසින් බදු ගැළපීම් පරීක්ෂා කිරීම සම්බන්ධයෙන් ආයතනය විසින් සිදු කරන උපකල්පන.
- ආයතනයක් බදු අයකළ හැකි ලාභය (බදු අලාභ), බදු පදනම්, භාවිත නොකළ බදු අලාභ, භාවිත නොකළ බදු බැර ශේෂ සහ බදු අනුපාත තීරණය කරන ආකාරය.
- ආයතනයක් කරුණු සහ අවස්ථාවාන්හි වෙනස්කම් සලකා බලන ආකාරය - බැංකුව විසින් එක් එක් අවිනිශ්චිත බදු ගැළපීම් වෙන් වෙන් වශයෙන් හෝ වෙනත් අවිනිශ්චිත බදු ගැළපුමක් හෝ කීපයක් සමඟ සලකා බැලිය යුතුද යන්න තීරණය කරන අතර, අවිනිශ්චිතතාවයේ විසඳුම යෝග්‍ය ලෙස පුරෝකථනය කරනු ලබන ක්‍රමවේදය භාවිත කරයි.

ආදායම් බදු ගැළපීම්වල අවිනිශ්චිතතාවයන් හඳුනා ගැනීමේදී බැංකුව වැදගත් විනිශ්චයන් යොදා ගනියි. බැංකුව සංකීර්ණ පසුබිමක ක්‍රියාත්මකවන බැවින්, අර්ථ නිරූපණය මූල්‍ය ප්‍රකාශනවලට බලපාන ආකාරය ඇගයීමට ලක් කරයි. අර්ථකථනය කිරීම් යොදා ගැනීමෙන් පසු, අවිනිශ්චිත බදු තත්ත්වයක් තිබේදැයි බැංකුව සලකා බලා ඇත. විවිධ අධිකරණ බල ප්‍රදේශවල බදු අධිකාරීන් විසින් බදු ගොනු කිරීමේදී බැංකුව විසින් අනුගමනය කරන ලද බදු ප්‍රතිකාර පිළිබඳව ප්‍රශ්න කළ හැකිය. බදු අනුකූලතාවය මත පදනම්ව බදු බලධාරීන් විසින් එහි බදු ක්‍රමය පිළිගනු ඇතැයි බැංකුව විශ්වාස කරයි. අර්ථදැක්වීම බැංකුවේ මූල්‍ය ප්‍රකාශන සඳහා බලපෑමක් ඇති නොකළේය. ඉහත දැක්වූ වෙනස්කම් හැරුණු කොට, මෙම මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත්කර ඇති සියලුම කාලසීමාවන් සඳහා වන ගිණුම්කරණ ප්‍රමිති බැංකුව විසින් යොදා ගෙන ඇත.

2.3.2 රජය විසින් ප්‍රකාශයට පත් කර ඇති ආදායම් බදු නීතිය සඳහා සංශෝධන

"2017 අංක 24 දරන ආදායම් බදු නීතියට යෝජිත සංශෝධන ක්‍රියාත්මක කිරීම" පිළිබඳව 2020 ජනවාරි 01 දින සිට බලපැවැත්වෙන පරිදි දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් නිකුත්කර ඇති 2020 අප්‍රේල් 08 දින දරන නිවේදනයට අනුව ආයතනික ආදායම් බදු අනුපාතය 24% සිට 30% දක්වා සංශෝධනය කරන ලදී.

2022 ඔක්තෝබර් 01 සිට බලපැවැත්වෙන පරිදි ආයතනික ආදායම් බදු අනුපාතය 24% සිට 30% දක්වා සංශෝධනය කරන ලදී.

වර්තමාන ආදායම් බදු පිළිබඳ විස්තර 11වන සටහනේ දක්වා ඇත.

2.3.3 විලම්බිත බදු වත්කම්

අනාගතයේ දී බදු අය කළ හැකි ලාභයන්ට හිලව් කිරීම් වශයෙන් යොදා ගත හැකි අලාභයන්ගේ ප්‍රතිඵලයක් ලෙස හඳුනාගත හැකි, බදු අලාභයේ ප්‍රමාණයට විලම්බිත බදු වත්කම් හඳුනාගනී. අනාගත බදු සැලසුම්කරණ ක්‍රමෝපායන් සමඟ අනාගත බදු අය කළ හැකි ලාභවල කාලය සහ මට්ටම මත පදනම්ව, විලම්බිත බදු වත්කම් හඳුනා ගැනීමේදී විනිශ්චයන්ට එළැඹීම සිදු කිරීමට අවශ්‍ය වේ.

මෙම විලම්බිත බදු පිළිබඳ විස්තර සටහන් අංක 20 හි දක්වා ඇත.

2.3.4 මූල්‍ය සේවා මත එකතු කළ අගය මත බදු (VAT)

2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ 25 ඇ පරිච්ඡේදය සහ එම පනතට පසුව කරන ලද සංශෝධනයන්ට අනුව, එකතුකළ අගය මත බදු (VAT) ගණනය කරනු ලබයි. මූල්‍ය සේවා මත වැට් බද්ද 18% ක් වන අතර එකතුකළ අගය මත බදුවලට පෙර මෙහෙයුම් ලාභය සහ ජාතිය ගොඩනැගීමේ බදු මත ගනනය කරනු ලබයි. සේවක පාරිශ්‍රමික සහ ආර්ථික පහතවැටීම් වෙත ගැළපීම් සඳහා ගණනය කිරීම් සිදු කර ඇත.

එකතුකළ අගය මත බදු වියදම් පිළිබඳව, සටහන් අංක 34 හි දක්වා ඇත.

2.3.5 මූල්‍ය සේවා මත සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද (SSCL)

2022 අංක 25 දරන සමාජ ආරක්ෂණ දායකත්ව බද්දේ (SSCL) පනතට අනුකූලව, 2022 ඔක්තෝබර් 1 දින සිට බලපැවැත්වෙන පරිදි මූල්‍ය සේවා මත වැට් බදු සඳහා භාවිත කරන ලද අගය එකතු කිරීමේ ප්‍රමාණයෙන් 2.5%ක් ලෙස බැංකුව විසින් මූල්‍ය සේවා සඳහා සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද ගණනය කර ගෙවා ඇත.

2.3.6 මූල්‍ය සේවා මත ණය ආපසු ගෙවීමේ බද්ද (DRL)

2018 අංක 35 දරන මුදල් පනතට අනුව, 2018 ඔක්තෝබර් 01 දින සිට බලපැවැත්වෙන පරිදි සෑම මූල්‍ය ආයතනයකින්ම ණය ආපසු ගෙවීමේ බදු (DRL) අයකරනු ලබයි. මූල්‍ය සේවා සඳහා අදාළ වන වටිනාකම් එකතු කිරීමෙන් 7% ක ප්‍රමාණයක් ණය ආපසු ගෙවීමේ බද්ද ලෙස ගණනය කරයි. 2020 ඔක්තෝම්බර් 12 දිනැති, 2020 අංක 02 දරන මූල්‍ය (සංශෝධන) පනත අනුව 2020 ජනවාරි 01 දින සිට බලපැවැත්වෙන පරිදි ණය ආපසු ගෙවීමේ බද්ද අවලංගු කරන ලදී.

2.3.7 ආර්ථික සේවා ගාස්තු (ESC)

2006 අංක 13 දරන ආර්ථික සේවා ගාස්තු (ESC) පනතේ ප්‍රතිපාදන හා ඉන්පසු සිදුකළ සංශෝධනයන්ට අනුව බැංකුවේ වගකීම් පිරිවැටුමෙන් 0.5% ක ප්‍රමාණයක් ගෙවිය යුතු වන අතර, ගෙවිය යුතු ආදායම් බද්දෙන් මෙම ප්‍රමාණය අඩු කළ හැකි වේ. 2020 ඔක්තෝම්බර් 12 දින දරන 2020 අංක 04 දරන ආර්ථික සේවා ගාස්තු (සංශෝධන) පනත මඟින් 2020 ජනවාරි 01 දින සිට බලපැවැත්වෙන පරිදි ආර්ථික සේවා ගාස්තු අවලංගු කර ඇත.

2.3.8 වගා රක්ෂණ බද්ද (CIL)

2013 අංක 12 දරන මුදල් පනතේ ප්‍රතිපාදනයන්ට අනුව 2013 අප්‍රේල් 01 දින සිට බලපැවැත්වෙන පරිදි වගා රක්ෂණ බද්ධ (CIL) හඳුන්වා දුන් අතර, බදුවලට පසු ලාභයෙන් 1% ක ප්‍රමාණයක් ජාතික රක්ෂණ භාර අරමුදල වෙත ගෙවිය යුතු වෙයි.

2.4 වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති - වත්කම් හා වගකීම් හඳුනාගැනීම

2.4.1 සේවක ප්‍රතිලාභ වගකීම් - පාරිතෝෂික

1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීමේ පනත යටතේ පාරිතෝෂික ලැබීම් සඳහා බැංකුවේ සියලුම සේවකයෝ සුදුසුකම් ලබති. අවුරුදු 5 ට වඩා වැඩි සේවා කාලයක් සපුරා ඇති අයට සේවය සිදුකර ඇති සෑම වර්ෂයක් වෙනුවෙන්ම, සේවය අවසන් කළ හෝ ඉල්ලා අස් වූ මූල්‍ය වර්ෂයේ අවසන් මාසයට අදාළ වන පරිදි දළ වැටුපනෙන් හරි අඩක පාරිතෝෂික ලබාගැනීමට, 1983 අංක 12 පාරිතෝෂික ගෙවීමේ පනත යටතේ විශ්‍රාම යාම හැරුණු කොට ඉල්ලා අස් වූ හෝ සේවය අවසන් කළ සේවකයින් සුදුසුකම් ලබයි. වර්තමාන වටිනාකම ආයුගණක තක්සේරු ක්‍රමය උපයෝගී කරමින්, නිශ්චිත දායකත්වය සැලැස්ම වන පොරොන්දු වූ පාරිතෝෂික විශ්‍රාම ප්‍රතිලාභ බැංකුව විසින් ගණනය කරයි.

සාමාන්‍ය සහ කලින් විශ්‍රාම ගැනීම

අයෙකු වයස අවුරුදු 55 දී සාමාන්‍ය විශ්‍රාම යාමට සුදුසුකම් ලබන්නේ ඔහු/ඇය වසර 3ක සේවා කාලයක් තිබේ නම් පමණි. සියලුම සහභාගිවන්නන්ට දීර්ඝ කිරීම වයස අවුරුදු 60 දක්වා ලබා ගත හැකිය.

පොලී පිරිවැය
පොලී පිරිවැය යනු ප්‍රතිලාභ ගෙවීමට ආසන්න වන විට, කාලයාගේ අවෑමෙන් ඇති වන සැලසුම් වගකීම්වල වර්තමාන අගයෙහි අපේක්ෂිත ඉහළ යාමයි.

අරමුදල් විධිවිධාන
පාරිතෝෂික වගකීම සඳහා බාහිරව අරමුදල් සපයන්නේ නැත.

සත්‍ය තක්සේරුව
ක්‍රියාකාරී තක්සේරුවක් භාවිතයෙන් නිර්වචනය කරන ලද ප්‍රතිලාභ සැලසුම් පාරිතෝෂිකයේ පිරිවැය තීරණය කරනු ලැබේ. සත්‍ය තක්සේරුකරණය සඳහා අන්තර්-අන්‍ය වට්ටම් අනුපාත, අනාගත වැටුප් වැඩිවීම්, සේවකයින්ගේ ඉතිරි සේවා කාලය සහ මරණ අනුපාත පිළිබඳ උපකල්පන සිදු කිරීම ඇතුළත් වේ. මෙම බැඳීම්වල දිගුකාලීන ස්වභාවය හේතුවෙන්, එවැනි ඇස්තමේන්තු සැලකිය යුතු අවිනිශ්චිතතාවයකට යටත් වේ. භාවිත කරන උපකල්පන පහත පරිදි වේ.

	2023	2022
පොලී අනුපාතය	13.00%	18.00%
වාර්ෂික වැටුප් වැඩිවීම් අනුපාතය	10%	6.50%
විශ්‍රාම ගන්නා වයස	අවුරුදු 55-60	අවුරුදු 55-60

පාරිතෝෂික ප්‍රතිපාදනවල රැකියා ප්‍රතිලාභ වගකීම, සටහන අංක 24 හි දක්වා ඇත.

2.4.2 සේවක ප්‍රතිලාභ වගකීම් - වෛද්‍ය ප්‍රතිලාභ

වෛද්‍ය ප්‍රතිලාභයන්ගේ ආයුගණක තක්සේරුව පිළිබඳ විස්තර සටහන් අංක 24 හි ඉදිරිපත් කොට ඇත. වෛද්‍ය ප්‍රතිලාභ සඳහා ස්ථිර සේවකයින් හා ඔවුන්ගේ පවුලේ සාමාජිකයන් සහ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ විශ්‍රාමිකයින් සුදුසුකම් ලබන අතර, ඔවුන් යෝජනා ක්‍රමය සඳහා දායක වී සාමාජික මුදල් ගෙවා තිබිය යුතුවේ. විශ්‍රාම ගිය සාමාජිකයින්ගේ පවුලේ සාමාජිකයින් විශේෂ අවස්ථාවක් යටතේ ප්‍රතිලාභ සඳහා සුදුසුකම් ලබයි (විශ්‍රාම ගිය සාමාජිකයන්ගෙන් කිසියම් අයෙකු හෝ ඔහුගේ /ඇයගේ පවුලේ සාමාජිකයෙකු සුදුසුකම් ලබයි).

අරමුදල් ආයුගණක තක්සේරු මත පදනම්ව වෛද්‍ය ප්‍රතිලාභ ආවරණය කිරීම සඳහා ඇති නිශ්චිත ප්‍රතිලාභ සැලසුම සම්බන්ධයෙන් පිරිවැය තීරණය කර ඇත. ආයුගණක තක්සේරු කිරීම සඳහා වට්ටම් අනුපාතය, වෛද්‍ය උද්ධමනය සහ මරණ අනුපාතය පිළිබඳව උපකල්පනයන් පදනම් වී ඇත. මෙම බැඳීම්වල දීර්ඝකාලීන ස්වභාවය හේතුවෙන්, එවැනි උපකල්පන සැලකිය යුතු අවිනිශ්චිතතාවන්ට යටත් වේ.

උපකල්පන පහත පරිදි වේ.

	2023	2022
වට්ටම් අනුපාතය	13.00%	18.00%
වෛද්‍ය වියදම් ඉහළයාම	12%	6.5%
සහභාගීත්ව දත්ත (ක්‍රියාකාරී) සංගණන තොරතුරු	31.12.2023	31.12.2022

ආයුගණක අලාභ / ලාභ හඳුනාගැනීම - වෙනත් විස්තීර්ණ ආදායම් තුළ ආයුගණක අලාභ / ලාභ හඳුනාගනු ලබයි.

වත්කම් මත අපේක්ෂිත ප්‍රතිලාභ - සැලසුම පූර්ව අරමුදල් නොලබන බැවින් වත්කම් මත අපේක්ෂිත ප්‍රතිලාභය ශූන්‍ය වේ.

පොලී පිරිවැය - පොලී පිරිවැය යනු නිශ්චිත ප්‍රතිලාභ බැඳීම් ඡඩඃඊධ* සහ වර්තමාන සේවා පිරිවැය (CSC) හි වර්තමාන අගයේ කාල වටිනාකම් වේ.

අරමුදල් සැපයීමේ පියවර - වෛද්‍ය ප්‍රතිලාභ යෝජනා ක්‍රමයට බාහිරින් අරමුදල් සපයනු නොලබයි.

2.4.3 නිශ්චිත දායකත්ව සැලසුම

බැංකුව නිශ්චිත දායකත්ව සැලසුමක්ද ක්‍රියාත්මක කරයි. සේවකයින් බැංකුවට සේවය ලබා දෙන ලද සේවා කාලයට අනුපාතිකව නිශ්චිත දායකත්ව සැලසුමකට අනුව ගෙවිය යුතු දායකත්වය හඳුනාගනු ලබන අතර, එය 'පිරිස් පාලන වියදම' යටතේ වාර්තා ගත කරනු ලබයි. නොගෙවන ලද දායකත්වයන්, වගකීමක් ලෙසටම වාර්තා කරනු ලබයි. බැංකුව පහත දැක්වෙන යෝජනා ක්‍රමයන්ට දායක වී ඇත.

2.4.3.1 සේවක අර්ථසාධක අරමුදල

බැංකුව සහ කාර්යය මණ්ඩලය වැටුපෙන් (අතිකාල ගෙවීම් හැර) පිළිවෙලින් 15% සහ 10% බැගින් අර්ථසාධක අරමුදලට දායක වෙයි. බැංකුවේ අර්ථසාධක අරමුදල සේවක අර්ථසාධක අරමුදල් පනත යටතේ අනුමත අරමුදලකි.

2.4.3.2 සේවක භාරකාර අරමුදල

සේවකයින්ගේ අතිකාල හැර දළ මාසික වැටුපෙන් 3%ක අරමුදලට බැංකුව දායක වන අතර, එම අරමුදල සේවක භාරකාර අරමුදල් මණ්ඩලය මඟින් කළමනාකරණය කරනු ලබයි. 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනත යටතේ සේවකයින් පාරිතෝෂික අරමුදල් ලැබීමට හිමිකම් කියයි.

2.4.4 කල්බදු

2019 ජනවාරි 01 දින සිට පෙර කාලයේ සිට බලපැවැත්වෙන පරිදි, බැංකුව පළමු වරට මෙම මූල්‍ය ප්‍රකාශ සඳහා SLFRS 16 කල්බදු යොදාගෙන ඇත. 2019 ජනවාරි 1 සිට අතීතානුයෝගීව SLFRS 16 කල්බදු බැංකුව විසින් යොදා ගෙන ඇත. නමුත් සම්මතවල විශේෂ අන්තර් කාලීන විධිවිධාන යටතේ අවසර දී ඇති පරිදි, 2018 වාර්තාකරණ කාලය සඳහා සංසන්දනාත්මක මූල්‍ය තොරතුරු නැවත ප්‍රකාශ කොට නැත.

2018 මූල්‍ය වර්ෂය තෙක්, කල්බදු මූල්‍ය කල්බදු හෝ මෙහෙයුම් කල්බදු යටතේ දේපළ, පිරියත සහ උපකරණ වර්ගීකරණය කරන ලදී. 2019 ජනවාරි 1 දින සිට, SLFRS 16 කල්බදුවලට අනුව, බැංකුව වෙත කල්බදු වත්කම් භාවිතය සඳහා පවතින දිනයට, වත්කම් භාවිත කිරීමේ අයිතියක් ලෙස සහ අනුරූප බදු ලෙස කල්බදු හඳුනාගනු ලබයි.

කල්බදු ගිවිසුමකින් ඇතිවන වත්කම් සහ වගකීම්, වර්තමාන වටිනාකම් පදනම මත පළමුවෙන් මනිනු ලබයි. කල්බදු වගකීම් සඳහා පහත බදු ගෙවීම්වල ශුද්ධ වර්තමාන වටිනාකම ඇතුළත් වේ.

- කල්බදු දිරිදීමනා ලැබීම්වලින් ස්ථිර ගෙවීම් (ප්‍රධාන ස්ථිර ගෙවීම් ඇතුළුව) අඩු කිරීම.
- දර්ශකයක් හෝ අනුපාතයක් මත පදනම් වන විවිධ කල්බදු ගෙවීම, මූලිකව ආරම්භක දිනයට දර්ශකය හෝ අනුපාතය භාවිත කරමින් මනිනු ලබයි.
- ශේෂ වටිනාකමේ ඇප යටතේ සමූහය විසින් ගෙවීමට ඇති අපේක්ෂිත ප්‍රමාණ
- සමූහය විසින් එම මතය ක්‍රියාත්මක කිරීමට සාධාරණව නිශ්චිත නම්, මිලදී ගැනීමේ මතය පිළිබඳ ප්‍රායෝගික මිල

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

- කල්බදු කාලය මඟින් එම විකල්පය ක්‍රියාවට නංවන බව පිළිබිඹු කරනුයේ නම්, කල්බදු අවසන් කිරීම සඳහා දඩමුදල් ගෙවීම

කල්බදු තුළ පොලී අනුපාත භාවිත කරමින් කල්බදු ගෙවීම් වට්ටම් කෙරේ. එම අනුපාතය පහසුවෙන් තීරණය කළ නොහැකි නම්, සමූහය තුළ කල්බදු සඳහා සාමාන්‍යයෙන් යොදා ගන්නා කල්බදුකරුගේ වර්ධිත ණය ගැනීමේ අනුපාතය භාවිත කෙරේ.

කල්බදු ගෙවීම්, මුල් මුදල සහ මූල්‍ය පිරිවැය අතර වෙන් කෙරේ. එක් එක් කාලසීමාව සඳහා වගකීමේ ඉතිරි ශේෂය මත නියත ආවර්තික පොලී අනුපාතිකය සහතික වන ආකාරයෙන්, කල්බදු කාලය පුරාවට, ලාභය හෝ අලාභය සඳහා මූල්‍ය පිරිවැය සටහන් කරනු ලබයි.

2.4.4.1 කල්බදු හඳුනාගැනීම

සලකා බැලීම සඳහා හුවමාරු කරගැනීම පිළිබඳ කාලසීමාවක් තුළ හඳුනාගත් වත්කමක් පාලනය කිරීමේ අයිතිය ගිවිසුමකින් පැවරෙන්නේ නම් එම ගිවිසුම, කල්බද්දකි. එමනිසා ගිවිසුමක මූලාරම්භයේදීම බැංකුව මඟින්, හඳුනාගත් වත්කමක් පැවතීම, හඳුනාගත් වත්කමේ පාලනය කිරීමට ඇති අයිතිය, හඳුනාගත් වත්කමේ භාවිතයෙන් සියලුම ආර්ථික ප්‍රතිලාභ සැලකියයුතු ලෙස ලබාගැනීමට ඇති අයිතිය, හඳුනාගත් වත්කම භාවිතය අධීක්ෂණය කිරීමට ඇති ඇති අයිතිය යන කරුණු වලින් ගිවිසුම සමන්විත වන්නේද යන්න පිළිබඳ තක්සේරු කරනු ලබයි. ඒ අනුව බැංකුව මඟින් SLFRS 16 කල්බදු යටතේ, ශාඛා මෙහෙයවීම සඳහා සහ යන්ත්‍රෝපකරණ සඳහා සමූහය විසින් ඇති කර ගත් සියලුම කුලී ගිවිසුම් (කෙටි කාලීන ගිවිසුම්, මාස 12 ට අඩු සහ අඩු වටිනාකම් ඇති ගිවිසුම් හැර) හඳුනාගනු ලබයි.

භාවිතයේ අයිතිය වත්කම් පහත සඳහන් දෑ ඇතුළත්ව ඒවායේ මූලික පිරිවැය මත පදනම්ව තක්සෙරු කරනු ලබයි.

- කල්බදු වගකීම්වල මූලික මැනීමේ ප්‍රමාණය
- ආරම්භක දිනයට හෝ පෙර සිදුකළ යම් කල්බදු ගෙවීම්වලින් ලද යම් කල්බදු දිරිදීමනා අඩු කිරීම
- යම් මූලික සෘජු පිරිවැය
- ප්‍රතිසංස්කරණ පිරිවැය

භාවිතයට අයිතිය ඇති වත්කම්, වත්කමේ ඵලදායී ජීවකාලයේ කෙටි කාලය සහ සරල මාර්ගික ක්‍රමයක් මත කල්බදු කාලය පුරා පොදුවේ ක්ෂය කෙරේ.

ලාභය හෝ අලාභය තුළ කෙටි කාලීන කල්බදු ආශ්‍රිත ගෙවීම් සහ අඩු වටිනාකම් වත්කම්වල සියලුම කල්බදු, වියදමක් ලෙස සරල මාර්ගික පදනමක් මත හඳුනාගනී. කෙටි කාලීන කල්බදු යනු මාස 12 හෝ ඊට අඩු කාලයක් සහිත කල්බදු වේ. මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක 33 යටතේ මුදල් හා කෙටිකාලීන අරමුදල් පිළිබඳ දක්වා ඇත.

2.4.5 *මුදල් සහ මුදල් හා සමාන දෑ*

මුදල් සහ කෙටිකාලීන අරමුදල් සඳහා අතැති මුදල්, බැංකුවල ඇති ශේෂයන්, බැංකු සමඟ ස්ථාපනයන්, සහ ඉල්ලුම් කළ හැකි මුදල් සහ කෙටිකාලීන දැනුම්දීමක් මත ලබා ගත හැකි මුදල් ඇතුළත් වෙයි. මුදල් සහ කෙටිකාලීන අරමුදල් පිළිබඳ විස්තර මූල්‍ය ප්‍රකාශන සඳහා වන සටහන් අංක 13 හි දක්වා ඇත.

2.4.6 *දේපළ, පිරියත හා උපකරණ*

දේපළ, පිරියත උපකරණ පිළිබඳ විස්තරයක් සටහන් අංක 19 හි ලබා දී ඇත. දේපළ, පිරියත හා උපකරණ, පිරිවැය හෝ එදිනෙදා නඩත්තු වියදම අඩුකළ පසු අගය කිරීම් වලින් වටිනාකමේ සමුච්චිත ක්ෂයකිරීම සහ සමුච්චිත හානිකරණය අඩු කළ වටිනාකමට මත ප්‍රකාශ කරනු ලබයි. අපේක්ෂිත ඵලදායී ජීව කාලයෙහි වෙනස්වීම් සුදුසු පරිදි ක්ෂය කිරීම් කාලය හෝ ක්ෂය ක්‍රමය වෙනස් කිරීම මඟින් ගණනය කරන අතර, ගිණුම්කරණ ඇස්තමේන්තුවල වෙනස්වීම් ලෙසට ද හඳුනාගනු ලබයි.

2.4.6.1 දේපළ, පිරියත උපකරණ සහ අස්පෘශ වත්කම්වල ප්‍රයෝජනවත් ආයු කාලය

සෑම වාර්තාකරණ දිනයකටම දේපළ, පිරියත උපකරණවල ඉතිරි වටිනාකම, ප්‍රයෝජනවත් ජීව කාලය හා ක්ෂය කිරීමේ ක්‍රමය බැංකුව මඟින් සමාලෝචනය කරයි. කළමනාකරණයේ විනිශ්චයන් මෙම වටිනාකම්, අනුපාත හා ක්‍රමවේද ඇස්තමේන්තු කිරීමේදී ප්‍රයෝජනයට ගන්නා අතර, එහෙයින් ඒවා අවිනිශ්චිතතාවයන්ට යටත් වෙයි. සෑම වත්කම් කාණ්ඩයක් සඳහාම භාවිත කළ ක්ෂය කිරීමේ ක්‍රම හා අනුපාත පිළිබඳ විස්තර සටහන් අංක 2.4.6.4. හි දැක්වේ.

2.4.6.2 හඳුනාගැනීමේ පදනම

වත්කම හා බැඳුණු අනාගත ආර්ථික ප්‍රතිලාභ බැංකුව වෙත ලැබෙන සහ වත්කමක පිරිවැය පහසුවෙන් අගය කළ හැකි අවස්ථාවේදී දේපළ, පිරියත හා උපකරණ හඳුනාගනී. එදිනෙදා සේවා කිරීමේ පිරිවැය රහිතව දේපළ පිරියත හා උපකරණ පිරිවැයට සඳහන් කරයි.

2.4.6.3 අගය කිරීමේ පදනම

දේපළ, පිරියත හා උපකරණ සමුච්චිත ක්ෂයකිරීම අඩුකළ පිරිවැයට සඳහන් කරන අතර, පහත සඳහන් විශේෂිත පදනම සඳහා එය ලබා දේ.

2.4.6.4 ක්ෂයකිරීම

දේපළ, පිරියත හා උපකරණ ඒවායේ ඇස්තමේන්තුගත ඵලදායී ජීවකාලය පුරා ඒවායේ සුන්බුන් වටිනාකමට ලියා හැරීමට සරල මාර්ග ක්‍රමය භාවිත කරමින් ක්ෂයකිරීම ගණනය කරන අතර, වත්කමක් ක්ෂය කිරීම, එය භාවිතයට ගන්නා අවස්ථාවේදී ආරම්භ කරයි.

ඇස්තමේන්තුගත ඵලදායී ජීවකාලය පහත පරිදි වේ:

වත්කම් වර්ගය	ක්ෂයකිරීමේ අනුපාතය (වාර්ෂිකව)
මෝටර් රථ	25.00% p.a.
ගෘහභාණ්ඩ හා සවිකිරීම්	12.50% p.a.
කාර්යාල උපකරණ	12.50% p.a.
පරිගණක	25.00% p.a.
වෙනත්	12.50% p.a.

කාර්යාල ගොඩනැගිලි පුළුල් කිරීම සඳහා වෙනස් කිරීම හෝ නවීකරණය වෙනුවෙන් දරන පිරිවැය, වසර 4 ක් හෝ මූල් කල්බදු කාලය යන දෙකෙන් අඩු කාලයට ක්‍රමක්ෂය කර ඇත.

2.4.6.5 පසුව දරනු ලබන පිරිවැය

දේපළ, පිරියත හා උපකරණ යන අයිතමයක කොටසක් අලුත් කිරීම සඳහා දරනු ලබන පිරිවැය, එම කොටස එකතු කිරීමත් සමඟ එහි අනාගත ආර්ථික ප්‍රතිලාභයන් බැංකුවට ගලා එන්නේ නම් සහ එහි පිරිවැය පහසුවෙන් අගය කිරීමට ද හැකි නම්, එම අයිතමයේ ධාරණ අගයට හඳුනාගනු ලබයි.

2.4.6.6 යළි ස්ථාපනය කිරීමේ පිරිවැය

දේපළ, පිරියත සහ උපකරණවල අනාගත ආර්ථික ප්‍රතිලාභයන් පවත්වාගෙන යෑම සඳහා වන අලුත්වැඩියා සහ නඩත්තුව සඳහා දරන වියදම එම අවස්ථාවේ දී ආදායම් ප්‍රකාශයට ලියාහරිනු ලබයි.

2.4.6.7 කාරක ප්‍රාග්ධනය

ගොඩනැගිලි ඉදි කිරීම්, විශාල යන්ත්‍ර හා පිරියත සහ පද්ධති සංවර්ධනය, ප්‍රාග්ධනීකරණය අපේක්ෂාව සඳහා සෘජුව දරනු ලබන ප්‍රාග්ධන ස්වරූපයේ වියදම් ඇත. මෙවැනි වියදම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ පිරිවැයට සඳහන් කරනු ලබයි.

2.4.6.8 ඉවත් කිරීම

බැහැර කිරීම මත හෝ එම වත්කම් භාවිතයෙන් අනාගත ආර්ථික ප්‍රතිලාභයන් බලාපොරොත්තු නොවන විට දේපළ, පිරියත හා උපකරණ ඉවත් කරනු ලබයි. එවැනි වත්කම් ඉවත්කිරීමක් මත හට ගන්නා ලාභය හෝ අලාභය (ශුද්ධ විකුණුම් ආදායම සහ වත්කමෙහි ධාරණ වටිනාකම අතර වෙනස ගණනය කරනු ලබයි) වත්කම ඉවත්කරන වර්ෂයේ ආදායම් ප්‍රකාශනය තුළ වෙනත් මෙහෙයුම් ආදායම් ලෙසට හඳුනාගනු ලැබේ. සටහන් අංක 19 හි විස්තර ඉදිරිපත් කොට ඇත.

2.4.7 *අස්පෘෂ්‍ය වත්කම්*

බැංකුවේ අනිකුත් අස්පෘෂ්‍ය වත්කම් සඳහා පරිගණක මෘදුකාංගවල වටිනාකම ඇතුළත් වේ. පිරිවැය විශ්වාසදායී ලෙස තක්සේරු කළ හැකි අවස්ථාවේදී සහ ඉන් ඇති විය හැකි අනාගත ආර්ථික ප්‍රතිලාභ බැංකුව වෙත ගලා එන අවස්ථාවේදී අස්පෘෂ්‍ය වත්කමක් හඳුනාගනී.

වෙන් වෙන් වශයෙන් අත්පත් කර ගන්නා ලද අස්පෘෂ්‍ය වත්කම් මූලික හඳුනාගැනීම මත පිරිවැයට අගය කරනු ලබයි. මූලික හඳුනාගැනීමෙන් අනතුරුව, අස්පෘෂ්‍ය වත්කම්වල සමුච්චිත ක්‍රමක්ෂය සහ සමුච්චිත හානිකරණය, අලාභයෙන් අඩු කළ පිරිවැයට ඉදිරියට ගෙන යනු ලබයි.

අස්පෘෂ්‍ය වත්කම්වල ඵලදායී ජීව කාලය නිශ්චිත හෝ අවිනිශ්චිතව අගය කිරීමක් සිදු කරනු ලබයි. නිශ්චිත ජීව කාලයක් ඇති අස්පෘෂ්‍ය වත්කම්, ඵලදායී ජීව කාලය පුරා ක්‍රමක්ෂය කරනු ලබයි. නිශ්චිත ඵලදායී ජීව කාලයක් ඇති අස්පෘෂ්‍ය වත්කමක් සඳහා ක්‍රමක්ෂය කාලසීමාව සහ ක්‍රමක්ෂය ක්‍රමය අඩු වශයෙන් සෑම වර්ෂයක් අවසානයේදීම සමාලෝචනයට ලක් කරනු ලබයි. අපේක්ෂිත ඵලදායී ජීව කාලය තුළ හෝ වත්කම් සමඟ ඇති අනාගත ආර්ථික ප්‍රතිලාභ භාවිතයේ අපේක්ෂිත රාටාවන්හි වෙනස්වීම් සුදුසු පරිදි ක්‍රමක්ෂය කාලසීමාව සහ ක්‍රමක්ෂය ක්‍රමය වෙනස් කරමින් ගණනය කරන අතර, ඒවා ගිණුම්කරණ ඇස්තමේන්තුවල වෙනස්කම් ලෙස සලකනු ලැබේ. නිශ්චිත ජීව කාලයක් ඇති අස්පෘෂ්‍ය වත්කම් මත ක්‍රමක්ෂය වියදම, එම අස්පෘෂ්‍ය වත්කමේ ක්‍රියාකාරීත්වයට අනුරූප වන වියදම් වර්ගීකරණය යටතේ ආදායම් ප්‍රකාශනය තුළ හඳුනාගනී.

පහත පරිදි ඇස්තමේන්තු ගත ඵලදායී ජීව කාලය පුරා ඉතිරි වටිනාකමට අස්පෘෂ්‍ය වත්කම්වල පිරිවැය ලියා හැරීම සඳහා සරල මාර්ග ක්‍රමය භාවිත කරමින් ක්‍රමක්ෂය ගණනය කරනු ලැබේ.

අස්පෘෂ්‍ය වත්කම් කාණ්ඩය	ඵලදායී ජීව කාලය	ක්‍රමක්ෂය ක්‍රමය
පරිගණක මෘදුකාංගය	අවුරුදු 4	සරල මාර්ග ක්‍රමය

2.4.8 මූල්‍ය නොවන වත්කම්වල හානිකරණය

බැංකුව සෑම වාර්තාකරණ දිනයකදීම වත්කමෙහි හානිකරණය පිළබඳ ඇඟවීමක් පවතින්නේද යන්න තක්සේරු කරනු ලබයි. යම් ඇඟවීමක් පවතින්නේ නම් හෝ වාර්ෂික හානිකරණ පරීක්ෂණයක් අවශ්‍ය වන්නේ නම්, වත්කම කොපමණ ප්‍රමාණයකට ආපසු අයකරගත හැකිද යන්න බැංකුව ගණනය කරයි. වත්කමක අයකරගත හැකි වටිනාකම යනු වත්කමක හෝ මුදල් උත්පාදන ඒකකයේ (සඒඔ) සාධාරණ වටිනාකමේ වඩා වැඩි අගයෙන් විකුණුම් පිරිවැය සහ එහි භාවිත පිරිවැයෙන් අඩු කළ විට ලැබෙන වටිනාකම වේ. වත්කමක හෝ මුදල් උත්පාදන ඒකකයේ රැගෙන යා හැකි ප්‍රමාණය, අයකරගත හැකි වටිනාකම ඉක්මවන විට, වත්කම හානිකරණ ලෙස සලකනු ලබන අතර, එහි ආපසු ලබාගත හැකි අගයට සටහන් කරයි.

භාවිත වටිනාකම් තක්සේරු කිරීමේ දී, මුදල්වල කාල වටිනාකම සහ වත්කමට විශේෂිත වූ අවදානම් පිළිබඳ වර්තමාන වෙළඳ පොළ තක්සේරු කිරීම් පිළිබිඹු කරන පෙර බදු වට්ටම් අනුපාතයක් යොදා ගනිමින්, ඇස්තමේන්තුගත අනාගත මූල්‍ය ප්‍රවාහයන් ඒවායේ වර්තමාන වටිනාකමට වට්ටම් කරනු ලබයි. විකිණීමට වන පිරිවැය අඩු කළ සාධාරණ අගය හඳුනාගැනීම සඳහා සුදුසු තක්සේරුකරණ ආකෘතියක් භාවිත කරනු ලබයි. ඇගයීමේ ගුණාකාර, ප්‍රසිද්ධියේ වෙළඳම් කරන අනුබද්ධිත සමාගම් සඳහා ප්‍රකාශ කළ මිල හෝ වෙනත් සාධාරණ වටිනාකම් දර්ශක මඟින් මෙම ගණනය කිරීම් සනාථ කරනු ලබයි.

2.4.9 මූල්‍ය සුරැකුම්

සාමාන්‍ය ව්‍යාපාරික කටයුතුවල දී, බැංකුව මුල්‍ය ඇපවීම් ලබා දේ. අදාළ වාරිකයන් ලැබෙන විට, සාධාරණ අගයට මූල්‍ය ප්‍රකාශනවලින් (වෙනත් වගකීම් යටතේ) මූල්‍ය ඇපවීම් මූලිකවම හඳුනාගැනේ. එම මූලික අවස්ථාවේ හඳුනාගැනීමෙන් අනතුරුව, එක් එක් ඇපය යටතේ බැංකුවේ වගකීම තීරණය කරනු ලබන්නේ, මූලිකව හඳුනාගත් ප්‍රමාණයෙන් ආදායම් ප්‍රකාශයේ හඳුනාගත් සමුච්චිත ක්‍රමක්ෂය අඩු කිරීම සහ ඇපකරයේ ප්‍රතිඵලයක් ලෙස පැන නගින ඕනෑම මූල්‍ය වගකීමක් පියවීමට අවශ්‍ය සුදුසුම වියදම් ඇස්තමේන්තුව යන්නෙන් ලැබෙන ඉහළම අගය යොදා ගනිමිනි.

මූල්‍ය ඇපවීම් සම්බන්ධයෙන් ඇති වගකීම්වල කිසියම් වැඩිවීමක් 'ණය අලාභ වියදම' යටතේ ආදායම් ප්‍රකාශනයෙහි වාර්තා කරනු ලබයි. වාරික ලැබීම් 'ශුද්ධ ගාස්තු සහ කොමිස් ආදායම' ලෙස සරල මාර්ග ක්‍රමයට එම ඇපවීම අදාළ වන කාලය පුරා ආදායම් ප්‍රකාශනයට හඳුනාගනු ලබයි.

2.4.10 වෙන්කිරීම්

පසුගිය සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස බැංකුවට වර්තමාන බැඳීමක් (නෛතික හෝ ගිවිසුම්ගත) ඇති අවස්ථාවකදී සහ වගකීම් පියවීම සඳහා ආර්ථික ප්‍රතිලාභයක් ඇතුළත් සම්පත් ගලායාමක් අවශ්‍ය වන විට සහ වගකීමෙහි ප්‍රමාණය විශ්වාසදායී ලෙසට ඇස්තමේන්තු කිරීමක් ද කළ හැකි විට වෙන්කිරීම් හඳුනාගනියි. කිසියම් වෙන්කිරීමකට අදාළ වියදම ආදායම් ප්‍රකාශනයෙහි කිසියම් ප්‍රතිපූරණයකින් ශුද්ධව ඉදිරිපත් කර ඇත.

2.4.11 මූල්‍ය උපකරණ - මූලික හඳුනාගැනීම

2.4.11.1. හඳුනාගැනීමේ දිනය

ගනුදෙනුකරුවන්ට ණය සහ අත්තිකාරම් සහ ගනුදෙනුකරුවන්ට ගෙවියයුතු ශේෂ අත්හරිමින්, මූල්‍ය වත්කම් සහ වගකීම් මූලිකවම වෙළඳ දිනයේදී, එනම් උපකරණයේ ගිවිසුම්ගත විධිවිධාන සමඟ බැංකුව පාර්ශ්වකරුවෙකු වන දිනයේදී හඳුනාගනු ලබයි. මේ සඳහා නිතිපතා වියදම් ඇතුළත් වේ: වෙළඳ පොළේ රෙගුලාසියක් හෝ ගිවිසුමක් මඟින් පොදුවේ ස්ථාපිත කාලරාමුවක් තුළ වත්කම බෙදා හැරීම සඳහා අවශ්‍ය මූල්‍ය වත්කම් මිලදී ගැනීම සහ විකිණීම. ගනුදෙනුකරුවන්ගේ ගිණුම්වලට අරමුදල් මාරු කරන අවස්ථාවේදී, ගනුදෙනුකරුවන් වෙත ණය සහ අත්තිකාරම් හඳුනාගනී. අරමුදල් බැංකුව වෙත මාරු කරන අවස්ථාවේදී ගනුදෙනුකරුවන්ට ගෙවියයුතු ශේෂ බැංකුව මඟින් හඳුනාගනී.

2.4.11.2 මූල්‍ය උපකරණයන්ගේ මූලික තක්සේරු කිරීම

මූලික හඳුනාගැනීමේ දී මූල්‍ය උපකරණයන් වර්ගීකරණය, එහි ගිවිසුම්ගත කාලය සහ එම උපකරණය කළමනාකරණය සඳහා වන ව්‍යාපාර ආකෘතිය මත පදනම් වේ. මූල්‍ය උපකරණ මූලිකවම ඒවායේ සාධාරණ වටිනාකමට මනිනු ලබන අතර, මූල්‍ය වත්කම් සහ මූල්‍ය වගකීම් ලාභ හෝ අලාභ තුළින් සාධාරණ වටිනාකමට වාර්තා කර ඇති අවස්ථාවේදී මෙම අගය සඳහා ගනුදෙනු පිරිවැය එකතු කිරීම හෝ අඩු කිරීම කරනු ලබයි. වෙළඳ ලැබිය යුතු දෑ, ගනුදෙනු මිලට ගණනය කරනු ලබයි. මූලික හඳුනාගැනීමේදී මූල්‍ය උපකරණවල සාධාරණ වටිනාකම, ගනුදෙනු මිලට වඩා වෙනස් වන විට, පහත දක්වා ඇති පරිදි, බැංකුව විසින් පළමු දිනයේ ලාභය හෝ අලාභය වෙත ගිණුම්ගත කරයි.

2.4.11.3 දින 1 ලාභය හෝ අලාභය

උපකරණයේ ගනුදෙනු මිල, සංවිධානයේ සාධරණ වටිනාකමෙන් වෙනස් වන විට සහ වෙළඳ පොළ ගනුදෙනු දැකගත හැකි යෙදවුම් පමණක් භාවිත කරන තක්සේරුකරණ ශිල්පයක් මත සාධාරණ වටිනාකම පදනම් වන අවස්ථාවක, බැංකුව විසින් ශුද්ධ වෙළෙඳ පොළ ආදායම්වල ගනුදෙනු මිල හා සාධාරණ අගය තුළ වෙනස හඳුනාගනී. ඇතැම් යෙදවුම් නිරීක්ෂණය කළ නොහැකි ආදර්ශ මත සාධාරණ අගය පදනම් වන අවස්ථාවන්හිදී, ගනුදෙනු මිල හා සාධාරණ අගය තුළ වෙනස සොයා ගන්නා අතර, යෙදවුම් නිරීක්ෂණය කළ හැකි බවට පත්වන හෝ උපකරණය ඉවත්කරන අවස්ථාවේදී ලාභය හෝ අලාභය තුළ පමණක් හඳුනාගනී.

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

2.4.11.4 මූල්‍ය වත්කම් සහ මූල්‍ය වගකීම් තත්සේරු කිරීමේ ප්‍රභේදන

2018 ජනවාරි 1 දින සිට, වත්කම් කළමනාකරණය සඳහා වන ව්‍යාපාරික ආකෘතිය සහ වත්කම් ගිවිසුම් කොන්දේසි මත පදනම්ව බැංකුව එහි සියලුම මූල්‍ය වත්කම් වර්ග කරනු ලබයි. එය පහත දෑ අනුව මනිනු ලබයි.

- ක්‍රමක්ෂය පිරිවැය
- වෙනත් විස්තීර්ණ ආදායම් මගින් සාධාරණ අගය (FVOCI)
- ලාභ සහ අලාභ මගින් සාධාරණ අගය (FVPL)

2018 ජනවාරි 1 දිනට පෙර, ණය සහ ලැබිය යුතු (ක්‍රමක්ෂය පිරිවැය), ලාභ සහ අලාභ මගින් සාධාරණ අගය, විකුණුම් සඳහා පවතින හෝ කල්පිරීම සඳහා රඳවා ගත් (ක්‍රමක්ෂය පිරිවැය) ලෙස බැංකුව එහි මූල්‍ය වත්කම් වර්ග කරනු ලැබිණි. ණය බැඳීම් සහ මූල්‍ය ඇපවීම් හැරුණු කොට මූල්‍ය වගකීම් ක්‍රමක්ෂය පිරිවැයට ගණනය කරනු ලබයි.

2.4.12 මූල්‍ය වත්කම් සහ මූල්‍ය වගකීම්

2.4.12.1 බැංකුවලින් ලැබිය යුතු, ගනුදෙනුකරුවන්ට ණය සහ අත්තිකාරම් ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය ආයෝජන

2018 ජනවාරි 1 දින සිට, බැංකුව විසින් පහත සඳහන් කොන්දේසි දෙකම සපුරා ඇත්නම් පමණක් බැංකු, ණය සහ ගනුදෙනුකරුවන්ට අත්තිකාරම් සහ අනෙකුත් මූල්‍ය ආයෝජන ක්‍රමක්‍රමයෙන් ගෙවනු ලැබේ.

- ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ එකතු කිරීම සඳහා මූල්‍ය වත්කම් දරා ගැනීමේ පරමාර්ථය සහිතව මූල්‍ය වත්කම් ව්‍යාපාර ආකෘතියක් තුළ පවත්වා ගනී.
- මූල්‍ය වත්කමේ ගිවිසුම්ගත කොන්දේසි, හිඟව පවත්නා ප්‍රධාන මුදල් මත, මූල් මුදල සහ පොලියේ පමණක් වන මුදල් ප්‍රවාහ සඳහා විශේෂ දිනවල ඇති වේ.

මෙම කොන්දේසි පිළිබඳ විස්තර පහත දැක්වේ.

2.4.12.2 ව්‍යාපාර ආදර්ශ තක්සේරුව

බැංකුව තම ව්‍යාපාරික අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා මූල්‍ය වත්කම් සමූහ කළමනාකරණය කරන ආකාරය වඩාත් හොඳින් පිළිබිඹු කරන මට්ටමින් එහි ව්‍යාපාර ආකෘතිය තීරණය කරයි. බැංකුවේ ව්‍යාපාර ආකෘතිය තක්සේරු කරනු ලබන්නේ උපකරණය මගින් උපකරණ පදනම මත නොව, සමූහගත කළඹවල ඉහළ මට්ටමකින් වන අතර, පහත දැක්වෙන නිරීක්ෂණ සාධක මත පදනම් වේ:

- ව්‍යාපාර ආදර්ශයේ සහ එම ව්‍යාපාර ආදර්ශය තුළ දරන මූල්‍ය වත්කම්වල කාර්යසාධනය අගය කරන සහ ආයතනයේ ප්‍රධාන කළමනාකරණය වෙත එය වාර්තා කරනු ලබන ආකාරය
- ව්‍යාපාර ආදර්ශයේ කාර්යසාධනය සඳහා බලපානු ලබන අවදානම් (සහ එම ව්‍යාපාර ආදර්ශය තුළ පවතින මූල්‍ය වත්කම්) සහ විශේෂයෙන් එකී අවදානම් කළමනාකරණය කරනු ලබන ආකාරය
- ව්‍යාපාරයේ කළමනාකරුවන්ට ගෙවනු ලබන ආකාරය (නිදසුනක් ලෙස, ගෙවීම කළ වත්කම්වල සාධාරණ අගය හෝ එකතුකළ ගිවිසුම්ගත මුදල් ප්‍රවාහය මත පදනම් වේ)
- විකුණුම්වල අපේක්ෂිත වාර ගණන, වටිනාකම සහ කාලය යනු බැංකුවේ තක්සේරුවේ වැදගත් අංග වේ.

ව්‍යාපාර ආදර්ශ තක්සේරුව, අයහපත් සිදුවීම් හෝ පීඩන සිදුවීම් පිළිබඳ සැලකිල්ලට නොගනිමින්, සාධාරණව අපේක්ෂිත ක්‍රියාදාම මත පදනම් වේ. මූලික හඳුනාගැනීමෙන් පසු මුදල් ප්‍රවාහ බැංකුවේ මුල් අපේක්ෂාවන්ගෙන් වෙනස් වන ආකාරයකින් මුදාහරිනුයේ නම්, එම ව්‍යාපාර ආදර්ශය තුළ දරන ඉතිරි මූල්‍ය වත්කම්වල වර්ගීකරණය බැංකුව වෙනස් නොකරයි. නමුත් ඉදිරියට ගෙනියන අලුතින් උත්පාදිත හෝ අලුතින් මිලදිගත් මූල්‍ය වත්කම් තක්සේරු කිරීමේදී එවැනි තොරතුරු ඇතුළත් කරයි.

2.4.12.3 SPPI පරීක්ෂණය

වර්ගීකරණ ක්‍රියාවලියේ දෙවැනි පියවර ලෙස, SPPI පරීක්ෂණය සපුරා ඇතිද යන්න හඳුනා ගැනීම සඳහා මූල්‍ය උපකරණවල ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ බැංකුව තක්සේරු කරයි. මෙම පරීක්ෂණයේ අරමුණවල "ප්‍රධාන මුදල" යන්න, මූලික හඳුනා ගැනීමේදී මූල්‍ය වත්කම්වල සාධාරණ අගය ලෙස නිර්වචනය කරන අතර, මූල්‍ය වත්කමේ ජීව කාලය පුරා වෙනස් විය හැකිය (නිදසුනක් ලෙස මුල් මුදලේ ආපසු ගෙවීම හෝ වාරිකය/ වට්ටම ක්‍රමක්ෂය කිරීම ඇත්නම්).

ණයදීමේ වැඩපිළිවෙළ තුළ පොලියේ වඩාත් වැදගත් අංග වන්නේ මුදල සහ ණය අවදානමේ කාල වටිනාකම සඳහා නියමානුකූල සලකා බැලීමයි.ඡඡඡ තක්සේරු කිරීම සිදු කිරීම සඳහා බැංකුව විනිශ්චයන් යොදා ගන්නා අතර, මූල්‍ය වත්කම නම් කරනු ලබන ව්‍යවහාර මුදල සහ පොලී අනුපාතය නියම කරන කාලසීමාව වැනි අදාළ සාධක සලකා බලයි.

මූලික ණයදීමේ විධිවිධානයකට සම්බන්ධ නොවන ගිවිසුම්ගත මුදල් ප්‍රවාහවල අවදානම් හෝ අස්ථාවරත්වයට නිරාවරණය වීම අවම කිරීමට වඩා වැඩි ප්‍රමාණයක් හඳුන්වා දෙන ගිවිසුම් නියමයන්, මූලික සහ හිඟ මුදල් සඳහා වන පොලී පමණක් ගිවිසුම්ගත මුදල් ප්‍රවාහයන් ඇති නොකරයි. එවැනි අවස්ථාවන්හිදී මූල්‍ය වත්කම්, ලාභ සහ අලාභ මගින් සාධාරණ අගය මත මැනිය යුතුය.

2.4.12.4 අනෙකුත් විස්තීර්ණ ආදායම් තුළින් සාධාරණ අගයේදී ණය උපකරණ

පහත සඳහන් කොන්දේසි ද්විත්වය සපුරාලන අවස්ථාවේදී, SLFRS 9 යටතේ අනෙකුත් විස්තීර්ණ ආදායම් මගින් සාධාරණ අගයට මනිනු ලබන නව ණය උපකරණ බැංකුව විසින් යොදා ගනු ලබයි.

- මෙම උපකරණය ව්‍යාපාර ආදර්ශයක් තුළ දරා ගැනීම, සාමූහික ගිවිසුම්ගත මූල්‍ය ප්‍රවාහ සහ අලෙවිකරණ මූල්‍ය වත්කම් යන දෙවර්ගය විසින් අත්කර ගැනීම එහි පරමාර්ථය වේ.
- මූල්‍ය වත්කම්වල ගිවිසුම් නියමයන් SPPI පරීක්ෂණයට අනුකූල වේ.

මෙම උපකරණ බොහෝ දුරට, LKAS 39 යටතේ අලෙවිය සඳහා තබා ඇති මූල්‍ය ආයෝජන ලෙස පෙර වර්ගීකරණය කළ වත්කම් වලින් සමන්විත වේ.

අනෙකුත් විස්තීර්ණ ආදායමේ හඳුනාගත් සාධාරණ අගයේ වෙනස්වීම් හේතුවෙන් ඇතිවන්නා වූ ලාභ හෝ අලාභ සහිත සාධාරණ අගයට, අනෙකුත් විස්තීර්ණ ආදායම තුළින් සාධාරණ වටිනාකමේ ණය උපකරණ මනිනු ලැබේ. සමාන සුරැකුම්වල බැංකුව එක් ආයෝජනයකට වඩා දරන අවස්ථාවේදී, ඒවා පෙර පිවිසි පෙර පිටවුම් LKAS මත බැහැර කළ යුතුයැයි සලකනු ලැබේ. හඳුනාගැනීමෙන් බැහැර කිරීම මත, අනෙකුත් විස්තීර්ණ ආදායම තුළ පෙර හඳුනාගත් සමුච්චිත ලාභය හෝ අලාභ, අනෙකුත් විස්තරාත්මක ආදායමේ සිට ලාභ හෝ අලාභය වෙත නැවත වර්ගීකරණය කෙරේ. 2022ත් අවසන් වූ වසර සඳහා අනෙකුත් විස්තීර්ණ ආදායම් තුළින් සාධාරණ අගයට තක්සේරු කළ ණය උපකරණ බැංකුව රඳවාගෙන නොමැත.

2.4.12.5. අනෙකුත් විස්තීර්ණ ආදායම තුළින් සාධාරණ අගයේදී ස්කන්ධ උපකරණ

මූලික හඳුනා ගැනීම මත, LKASAS 32 මූල්‍ය උපකරණ යටතේ ස්කන්ධය පිළිබඳ නිර්වචන සපුරාලන විට, බැංකුව අවස්ථානුකූලව අනෙකුත් විස්තීර්ණ ආදායම තුළින් සාධාරණ අගයෙන්, ස්කන්ධ උපකරණ ලෙස එහි ඇතැම් ස්කන්ධ කොටස් ආයෝජන වෙනස් කළ නොහැකි ලෙස වර්ගීකරණය කිරීමට තෝරා ගනී: ඉදිරිපත් කිරීම සහ වෙළඳාම සඳහා පවත්වනු ලබන. උපකරණයක් තනි පදනමක් ලෙස ගෙන එවැනි වර්ගීකරණ සිදු කරනු ලබයි.

මෙම ස්කන්ධ උපකරණ මත ලාභ හෝ අලාභ, ලාභයට නැවත ප්‍රතිචක්‍රිය නොකරයි. ගෙවීම් ලැබීමේ අයිතිය නිශ්චිත වූ පසු, වෙනත් මෙහෙයුම් ආදායමක් ලෙස ලාභ හෝ අලාභවල ලාභාංශය සටහන් වේ; ආයෝජන පිරිවැයේ කොටසක් ආපසු අයකර ගැනීමක් ලෙස, බැංකුව ප්‍රතිලාභ ලබන්නේ නම් පමණක් එවැනි ප්‍රතිලාභ වෙනත් විස්තීර්ණ ආදායම් ලෙස සටහන් කරනු ලබයි. අනෙකුත් විස්තීර්ණ ආදායම තුළින් සාධාරණ අගයේ ස්කන්ධ උපකරණ, හානිකරණ තක්සේරුවකට යටත් නොවේ. 2002ත් අවසන් වූ වසර සඳහා පිළි ශ්‍රේණිගත කිරීමේ සමාග මේ සහ ණය තොරතුරු කාර්යාංශයේ සඳහන් නොකළ ස්කන්ධ උපකරණ බැංකුව රඳවාගෙන ඇත. සටහන් අංක 18

2.4.12.6 නිකුත්කළ ණය හා අනෙකුත් ණයටගත් අරමුදල්

මූලික අගය කිරීමෙන් පසු, නිකුත්කළ ණය හා අනෙකුත් ණයට ගත් අරමුදල් පසුකාලීනව ක්‍රමක්ෂය පිරිවැයට අගය කෙරේ. නිකුත්කළ අරමුදල් පිළිබඳ යම් වට්ටම් හෝ වාරික සහ ඵලදායී පොලී අනුපාතයේ අත්‍යවශ්‍ය කොටසක් වන පිරිවැය සැලකිල්ලට ගනිමින් ක්‍රමක්ෂය පිරිවැය ගණනය කෙරේ. වගකීමක් සහ ස්කන්ධ සංරචකයක් අඩංගු සංකීර්ණ මූල්‍ය උපකරණයක් නිකුත් කරන දිනයට වෙන් කෙරේ.

2.4.12.7 ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයේදී මූල්‍ය වත්කම් හා වගකීම්

මෙම වර්ගය තුළ මූල්‍ය වත්කම සහ මූල්‍ය වගකීම යනු අලෙවිය සඳහා තබා ඇති සහ මූලික හඳුනාගැනීම මත කළමනාකරණය විසින් පත් කළ හෝ SLFRS 9 යටතේ සාධාරණ අගයට මැනීමට අනිවාර්යය වූවකි. පහත නිර්ණායක අතරින් එකක් සපුරා ඇති විට පමණක්, මූලික හඳුනාගැනීම මත කළමනාකරණය විසින් ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයේදී උපකරණයක් නම් කරයි. එවැනි නම් කිරීම්වලදී උපකරණ තනි පදනමක් ලෙස ගෙන තීරණය කරනු ලබයි.

- විවිධ ක්‍රම භාවිත කරමින් වත්කම් හෝ බැරකම් මැනීමෙන් හෝ ඒවායේ ලාභ හෝ අලාභ හඳුනාගැනීමෙන් සිදුවන යම් නොගැළපීම් ඉවත් කිරීමට හෝ විශාල වශයෙන් අඩු කිරීම සඳහා නම් කිරීම උපකාරී වේ.

හෝ

- වගකීම් (සහ LKAS 39 යටතේ 2018 ජනවාරි 1 දක්වා වත්කම්) මූල්‍ය වගකීම් සමූහයක (හෝ LKAS 39 යටතේ මූල්‍ය වත්කම් හෝ දෙකම) කොටසක් වන අතර, ලේඛනගත අවදානම් කළමනාකරණය හෝ ආයෝජන ක්‍රමෝපායට අනුකූලව සාධාරණ පදනමක් මත කළමනාකරණය සහ ඒවායේ කාර්යසාධනය අගයනු ලබයි.

සාධාරණ වටිනාකම ඔස්සේ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ ලාභය හෝ අලාභය හරහා සාධාරණ වටිනාකමේ මූල්‍ය වත්කම් සහ මූල්‍ය වගකීම් පිළිබඳව සටහන් කර ඇත. බැංකුවට අයත් ණය අවදානම්වල වෙනස්වීම් හේතුවෙන්, ලාභය හෝ අලාභය හරහා සාධාරණ වටිනාකම මත නම් කළ වගකීම්වල සාධාරණ අගය වෙනස්වීම් හැරදැම්ම සමඟ, සාධාරණ අගයේ වෙනස්වීම් ලාභය සහ අලාභය තුළ වාර්තා කෙරේ. සාධාරණ වටිනාකමේ එවැනි වෙනස්වීම් අනෙකුත් විස්තීර්ණ ආදායම් තුළින් සිය ණය සංචිතයේ සටහන් කරනු ලබන අතර ලාභය සහ අලාභයට ප්‍රතිචක්‍රීය නොකරයි. ඵලදායී පොලී අනුපාතය යොදා ගනිමින්, ඕනෑම වට්ටමක්/වාරිකයක් සහ සුදුසුකම් ලැබීමේ ගනුදෙනු පිරිවැය උපකරණයේ අත්‍යවශ්‍ය අංගයක් ලෙස සලකමින්, ලාභය හෝ අලාභය හරහා සාධාරණ වටිනාකමේ නම් කර ඇති උපකරණ සඳහා උපයන ලද හෝ දරන ලද පොලිය, පිළිවෙළින් පොලී ආදායමෙන් හෝ පොලී වියදමෙන් උපචිත වේ. ගෙවීම් අයිතිය තහවුරු කර ඇති විට, ලාභය හෝ අලාභය හරහා සාධාරණ වටිනාකමට ගණනය කළ යුතු වත්කම් මත උපයන පොලිය, කොන්ත්‍රාත් පොලී අනුපාතිකය භාවිතයෙන් සටහන් කිරීම සහ ලාභය හෝ අලාභය හරහා සාධාරණ වටිනාකමට ගණනය කරනු ලබන සාධාරණ උපකරණවල ලාභාංශ ආදායම වෙනත් මෙහෙයුම් ආදායමක් ලෙස ලාභ හෝ අලාභවල වාර්තා කරනු ලබයි. 2023 දෙසැම්බර් 31 දිනට රඳවා ගත් ඒකක භාරය ලාභය හෝ අලාභය හරහා සාධාරණ වටිනාකමට ගණනය කරන ලදී.

2.4.12.8 මූල්‍ය වත්කම් හා වගකීම් නැවත වර්ගීකරණය

ව්‍යාපාර මාර්ගයක් අත්කරගන්නා, බැහැර කරන හෝ අවසන් කරන විශේෂ වාතාවරණයකදී හැර, බැංකුව ඒවායේ මූලික හඳුනාගැනීමෙන් පසු එහි මූල්‍ය වත්කම් නැවත වර්ගීකරණය නොකරයි. මූල්‍ය වගකීම් නැවත වර්ගීකරණය කරනු නොලබයි. 2022 සහ 2023 වර්ෂවලදී බැංකුව එහි මූල්‍ය වත්කම් හෝ වගකීම් වර්ගීකරණය කර නොමැත.

2.4.12.9 මූල්‍ය වත්කම් හා වගකීම් හඳුනාගැනීමෙන් බැහැර කිරීම

2.4.12.9.1 නියමයන් හා කොන්දේසිවල සැලකියයුතු වෙනස්වීම් අනුව හඳුනාගැනීමෙන් බැහැර කිරීම

ගනුදෙනුකරුවන්ට ණය වැනි මූල්‍ය වත්කමක්, හානිකරණ අලාභය දැනට වාර්තා කර නොමැති ප්‍රමාණය දක්වා, ප්‍රතිලාභ හෝ අලාභ ඉවත් කිරීමක් ලෙස හඳුනාගන්නා වෙනස සමඟ, එය අලුත් ණයක් බවට පත්වන පරිදි සැලකියයුතු ප්‍රමාණයට එහි නියමයන් හා කොන්දේසි නැවත සාකච්ඡා කර ඇති අවස්ථාවේදී, බැංකුව විසින් හඳුනා ගැනීමෙන් බැහැර කරනු ලබයි. අලුතින් හඳුනාගත් ණයමුදල් අපේක්ෂිත ණය අලාභ මැනීමේ අරමුණ සඳහා 1 අදියර ලෙස වර්ගීකරණය කරනු ලබන්නේ එම ණය මිලදීගත් හෝ උත්පාදිත හානිකරණය වූ ණය බවට සලකන්නේනම් පමණි.

අනෙකුත් කරුණු අතර, ගනුදෙනුකරුවන්ට ණයක් හඳුනා ගන්නේද යන්න තක්සේරු කිරීමේදී, බැංකුව පහත සඳහන් සාධක සලකා බලයි.

- ණය මුදලෙහි ව්‍යවහාර මුදලේ වෙනස
- ස්කන්ධ ලක්ෂණයක් හඳුන්වාදීම
- ඇපයක වෙනස්වීම
- වෙනස් කිරීම හේතුවෙන් උපකරණයක් තවදුරටත් SPPI නිර්ණායක සපුරාලන්නේ නැති වීම.

වෙනස්වීම පසුකාලීනව වෙනස් වන මුදල් ප්‍රවාහවලට හේතු නොවේ නම්, එකී වෙනස්වීම හඳුනාගැනීමෙන් බැහැර කිරීම සඳහා බලපාන්නේ නැත. මුල් ඵලදායී පොලී අනුපාතයට වට්ටම් කළ මුදල් ප්‍රවාහ තුළ වෙනස මත පදනම්ව, හානිකරණ අලාභයක් දැනට වාර්තා කර නොමැති ප්‍රමාණයට බැංකුව මඟින් වෙනස්වීමේ ලාභයක් හෝ අලාභයක් වාර්තා කරයි.

2.4.12.9.2 සැලකියයුතු නවීකරණය හැර හඳුනාගැනීමෙන් බැහැර කිරීම

මූල්‍ය වත්කම්

මූල්‍ය වත්කම්වලින් මුදල් ප්‍රවාහ ලබා ගැනීමේ අයිතිය කල් ඉකුත් වූ විට මූල්‍ය වත්කම් (මූල්‍ය වත්කමක කොටසක් හෝ සමාන මූල්‍ය වත්කම් කාණ්ඩයක කොටසක් හෝ අදාළ වන පරිදි) හඳුනාගැනීමෙන් බැහැර කරයි. මූල්‍ය වත්කම් මාරු කර ඇත්නම් සහ පැවරීම් හඳුනාගැනීමෙන් බැහැර කිරීමට සුදුසුකම් ලබන්නේ නම් බැංකුව මූල්‍ය වත්කම් හඳුනාගැනීමෙන් බැහැර කරනු ලබයි. බැංකුව මූල්‍ය වත්කම් පවරනු ලබන්නේ පහත අවස්ථා අතුරින් එක් අවස්ථාවක් සපුරා ඇත්තේනම්ය.

- මූල්‍ය වත්කමකින් මුදල් ගලාඒම ලබාගැනීමට ඇති ගිවිසුම්ගත අයිතිය බැංකුව පවරා ඇතිවිටකදී

හෝ

- මුදල් ප්‍රවාහයන් සඳහා හිමිකම් රඳවා තබා ගන්නා නමුදු "ගලා යෑමේ" ගිවිසුමක් යටතේ තුන්වන පාර්ශ්වයකට ප්‍රමාණාත්මක ප්‍රමාදයකින් තොරව ලැබුණු මුදල් ප්‍රවාහයන් සම්පූර්ණයෙන් ගෙවීමේ වගකීමක් භාර ගෙන ඇතිවිටකදී.

ගලා යෑමේ ක්‍රියාමාර්ග යනු මූල්‍ය වත්කමක (ආරම්භක වත්කම) මුදල් ගලා ඒම ලබාගැනීම සඳහා ගිවිසුම් අයිතිය බැංකුව විසින් රඳවා ගන්නා ගනුදෙනු වේ. නමුත් මෙම මූල්‍ය ප්‍රවාහ එකක් හෝ ආයතන වැඩි ගණනකට (අවසාන ලබන්නා) ගෙවීමට හැකි ගිවිසුම්ගත අයිතිය පහත සඳහන් තත්ත්වයන්ට යෝග්‍යවේ නම් පිළිගනු ලබයි.

- ණයට දුන් මුදලට වෙළඳ පොළ අනුපාතයට ඇති උපචිත පොලිය එකතුකර සම්පූර්ණයෙන්ම අයකර ගැනීමට අයිතිය සමඟ කෙටිකාලීන අත්තිකාරම් හැර, මූලික වත්කමින් සමාන වටිනාකමක් ලබාගෙන නොමැති නම් අවසාන ලබන්නාහට වටිනාකම් ගෙවීමට බැංකුවට බැඳීමක් නොමැත.
- අවසාන ලබන්නාහට ඇති සුරැකුම් හැර මූලික වත්කම විකිණීමට හෝ ඇපයට තැබීමට බැංකුවට නොහැක.
- එකතු කරනු ලබන මුදල් ප්‍රවාහයන් ප්‍රමාණාත්මක ප්‍රමාදයකින් තොරව අවසාන ලබන්නන් වෙත බැංකුව ප්‍රේෂණය කරයි.

මීට අමතරව, රැස්කිරීමේ දිනය හා අවසාන ලබන්නන්ට ප්‍රේෂණය කිරීමට අවශ්‍ය දිනය අතර කාලය තුළ දී, ඉපැයූ පොලී ඇතුළත්ව මුදල් හෝ මුදල් සමාන දෑ වල ආයෝජනය කිරීම හැර එවැනි මුදල් ප්‍රවාහයන් ආයෝජනය කිරීමට බැංකුවට අයිතියක් නොමැත.

පැවරීමක් හඳුනාගැනීමෙන් බැහැර කිරීම සඳහා සුදුසුකම් ලබන්නේ පහත කොන්දේසි අතරින් එකක් සපුරා ඇත්නම් පමණි:

- බැංකුව වත්කමේ සියලුම අවදානම් හා ලැබීම් සැලකියයුතු ලෙස පවරා ඇතිවිට

හෝ

- බැංකුව සැලකියයුතු ලෙස වත්කමේ සියලු අවදානම් හා ලැබීම් පැවරීමක් හෝ රඳවාගැනීමක් සිදුකර නොමැති නමුත් වත්කමේ පාලනය පවරා ඇත.

බැංකුව විසින් පාලනය පැවරිය යුතු යැයි සලකනු ලබන්නේ, පැවරුම්කරුට සම්පූර්ණ වත්කම් අසම්බන්ධ තෙවන පාර්ශවයකට විකිණීමේ ප්‍රායෝගික හැකියාව තිබේ නම් සහ එම හැකියාව ඒකපාර්ශ්විකව සහ පැවරීම සඳහා අතිරේක සීමාවන් පැනවීමකින් තොරව ක්‍රියාත්මක කළ හැකි නම් පමණි.

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

සියලුම අවදානම් හා ලැබීම් සැලකියයුතු ලෙස රඳවා තබා ගැනීමක් හෝ පැවරීමක් බැංකුව සිදු නොකරනවිට, වත්කම්වල පාලනය රඳවාගෙන ඇති විට, බැංකුවේ සිදුකරගෙන යන මැදිහත්වීමේ ප්‍රමාණයට වත්කම හඳුනාගන්නා අතර, එවැනි අවස්ථාවක බැංකුව ආශ්‍රිත වත්කම් ද හඳුනාග නී. බැංකුව රඳවාගෙන ඇති අයිතීන් හා බැඳීම් නිරූපණයවන පදනම මත පවරන ලද වත්කම හා ආශ්‍රිත වගකීම් තක්සේරු කරනු ලබයි.

පවරන ලද වත්කම සඳහා ඇපයක ස්වරූපය ගන්නා අඛණ්ඩ මැදිහත්වීම, වත්කමේ මූලික රැගෙනයාමේ වටිනාකමේ අඩු අගයට තක්සේරු කරන අතර, බැංකුවට ගෙවිය යුතු උපරිම වටිනාකම සලකා බැලීම සිදුකරයි.

අඛණ්ඩ මැදිහත්වීම, පවරන ලද වත්කම මත ලිඛිත හෝ මිලදී ගැනීම් විකල්පයක ස්වරූපය (හෝ එම විකල්ප දෙකම) ගන්නේ නම්, ප්‍රතිමිලදී ගැනීම් සඳහා බැංකුවට ගෙවීමට අවශ්‍යවන අගයට අඛණ්ඩ මැදිහත්වීම තක්සේරු කරනු ලබයි. සාධාරණ වටිනාකමකින් යුත් වත්කමක් මත ලිඛිත විකල්පයකදී, ආයතනයේ අඛණ්ඩ මැදිහත්වීමේ ප්‍රමාණය, පැවරූ වත්කමේ සාධාරණ වටිනාකමට සහ විකල්ප ක්‍රමවේද මිල අතර වඩා අඩු අගයකට සීමා වේ.

මූල්‍ය වගකීම්

වත්කමක් යටතේ ඇති බැඳීම් නිදහස් කරනු ලැබීම, අවලංගු කිරීම හෝ කල් ඉකුත්වීම සිදුවූ අවස්ථාවක මූල්‍ය වගකීමක් හඳුනාගැනීමෙන් බැහැර කරයි. එකම ණය ගනුදෙනුකරුවෙකු සැලකියයුතු වෙනසක් සහිත කොන්දේසිවලට යටත්ව පවත්නා මූල්‍ය වගකීමක් අලුත් කිරීම හෝ, දැනට පවත්නා වගකීම්වල කොන්දේසි සැලකිය යුතු ලෙසින් අලුත් කිරීමේ දී, එවැනි හුවමාරුවක් හෝ අලුත් කිරීමක් ප්‍රාරම්භක වගකීම් හඳුනාගැනීමෙන් බැහැර කිරීමක් ලෙසට හා නව වගකීමක් හඳුනාගැනීමක් ලෙසද ගැළපීම් කර ඇත. ප්‍රාරම්භක මූල්‍ය වගකීම්වල ධාරණ අගය සහ ඊට ගෙවන ලද වටිනාකම අතර වෙනස ලාභා හෝ අලාභ ගිණුමේ හඳුනාගෙන ඇත.

2.4.12.10 මූල්‍ය වත්කම් හානිකරණය

බැංකුවේ මූල්‍ය ප්‍රකාශනවල මූල්‍ය උපකරණ හඳුනා ගැනීම හා අගයකිරීම පිළිබඳ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති (SLFRS) අංක 09 ට අනුකූලව, ගනුදෙනුකරුවන්ට සියලුම ණය සහ අත්තිකාරම් සම්බන්ධයෙන් වියහැකි හානිකරණ අලාභ සඳහා වෙන් කිරීම් සිදු කෙරේ. අවශ්‍ය පරිදි ණයවල සාධාරණ අගය ගණනය කිරීමට පහත සඳහන් තක්සේරු ශිල්ප භාවිත කරන ලදී.

2.4.12.10.1 වෙන් වෙන් වශයෙන් සිදුකරන හානිකරණ ක්‍රමය

i. වෙන් වෙන් වශයෙන් හානිකරණ ක්‍රමය ණය සඳහා යොදාගන්නා අතර, එහිදී මුදල් ආපසු ණය ඉවත්කරන අතර, රු.මිලියන 5ට වැඩි සියලුම ණය ඇතුළත් කරයි. නැතිනම් ප්‍රාග්ධන පදනමෙන් 0.1%ක් තනි තනිව සැලකියයුතු ලෙස සලකනු ලබයි. හානිකරණයේ අරමුණුගත සාක්ෂි ලබාගැනීම මත පදනම් වී තනි තනි හානිකරණ පරීක්ෂණය සඳහා පහසුකම් තෝරා ගනු ලැබේ.

ii. වෙන් වෙන් වශයෙන් වැදගත් තක්සේරු සහ වෙන් වෙන් වශයෙන් හානිකරණය නොවූ

වෙන් වෙන් වශයෙන් වැදගත් වූවද හානිකරණය නොවූ ණය, ආරම්භයේ සිටම සැලකිය යුතු ණය පිරිහීමක් සිදුවී තිබෙද යන නිර්ණායක මත පදනම්ව අදියර 1 හෝ 2 අදියර යටතේ හානිකරණය සඳහා සාමූහිකව තක්සේරු කරනු ලබයි. වෙන් වශයෙන් වූ හානිකරණ යටතේ වර්ගීකරණය කර ඇති පහසුකම් සඳහා සැලකිය යුතු ණය පිරිහීම ස්ථාපිත කිරීමේදී පහත සඳහන් නිර්ණායක සලකා බලනු ලැබේ.

නිකුත් කරන්නා හෝ ණය ගැණුම්කරු සැලකිය යුතු මූල්‍ය දුෂ්කරතාවලට මුහුණදෙනවිට, ණය ගැණුම්කරු බංකොලොත්භාවයට හෝ වෙනත් මූල්‍ය ප්‍රතිසංවිධානයකට යොමු වීමට ඉඩ ඇත. මූල්‍ය දුෂ්කරතා හේතුවෙන් එම මූල්‍ය වත්කම් සඳහා වූ ක්‍රියාකාරී වෙළෙඳ පොළ අතුරුදහන් වේ. ණය ගැනුම්කරු වංචනික ලේඛන ඉදිරිපත් කර ඇති බවට පැහැදිලි හෝ සම්භාවිතාවක් ඇති විට සහ හිඟ ශේෂය අයකර ගැනීම සැක සහිතවන විට, එම ණයගැතියාගේ අනෙකුත් මූල්‍ය උපකරණවල ණය අවදානම සැලකිය යුතු ලෙස වැඩි වීම.

2.4.12.10.2 සාමූහික හානිකරණ ක්‍රමය

බැංකුවේ මූල්‍ය ප්‍රකාශනවල මූල්‍ය උපකරණ හඳුනාගැනීම හා අගයකිරීම පිළිබඳ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති අංක 09 ට අනුකූලව වියහැකි ණය අලාභ සඳහා සාමූහික හානිකරණ වෙන් කිරීම් සිදු කෙරේ. අපේක්ෂිත ණය අලාභ මූලධර්මයට අනුව සාමූහික හානිකරණ වෙන්කිරීම බැංකුව සිදුකර ඇත. එහිදී වෙන් වෙන් වශයෙන් සිදුකරන හානිකරණය වැදගත් නොවේ.

2.4.12.10.2.1 අපේක්ෂිත ණය අලාභ මූලධර්මය පිළිබඳ විශ්ලේෂණය

ඉදිරිය දකින අපේක්ෂිත ණය අලාභ ප්‍රවේශයක් සහිතව SLFRS 39 හි දරන ලද අලාභ ප්‍රවේශය වෙනුවට SLFRS 9 යොදා ගැනීම මූලිකවම මඟින් බැංකුවේ ණය අලාභ හානිකරණ ක්‍රමය මූලිකවම වෙනස් කර ඇත. බැංකුව විසින් 2018 ජනවාරි 1 සිට, 'මූල්‍ය උපකරණ' ලෙස මෙම සෑම කොටසකම සඳහන් කරන, ණය බැඳීම් සහ මූල්‍යමය ඇප ගිවිසුම් සමඟ ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයට නොදරන සියලුම ණය සහ අනෙකුත් ණය මූල්‍ය වත්කම් සඳහා අපේක්ෂිත ණය අලාභ වෙනුවෙන් අත්තිකාරම වාර්තා කරනු ලබයි. SLFRS 9 යටතේ හානිකරණය සඳහා ස්කන්ධ උපකරණ යටත් නොවේ.

මාස 12 අපේක්ෂිත ණය අලාභ යනු ජීවකාල අපේක්ෂිත ණය අලාභයේ කොටස වේ; එය වාර්තාකරණ දිනයෙන් පසු මාස 12ක් ඇතුළත වියහැකි මූල්‍ය උපකරණයක් මත පැහැර හැරීමේ සිදුවීම් ඇතිවන අපේක්ෂිත ණය අලාභය නියෝජනය කරයි. ජීවකාල අපේක්ෂිත ණය අලාභ සහ මාස 12 අපේක්ෂිත ණය අලාභ යන ද්විත්වය, මූල්‍ය උපකරණවල පාදක කළඹේ ස්වභාවය මත රැඳෙමින්, වෙන් වශයෙන් වූ පදනමක් හෝ සාමූහික පදනමක් මත ගණනය කෙරේ. මූල්‍ය වත්කම් කාණ්ඩකරණය සඳහා බැංකුවේ ප්‍රතිපත්තිය සාමූහික පදනමක් මත අගය කර ඇත.

මූල්‍ය උපකරණයක ඉතිරි ජීව කාලය තුළ සිදුවන පැහැර හැරීමේ අවදානම තුළ වෙනස සැලකිල්ලට ගනිමින්, මූලික හඳුනා ගැනීමේ සිට මූල්‍ය උපකරණයේ ණය අවදානම සැලකියයුතු ලෙස වැඩිවී තිබේද යන්න පිළිබඳ එක් එක් වාර්තාකරණ කාලසීමාව අවසානයේදී තක්සේරුවක් සිදු කිරීමට ප්‍රතිපත්තියක් බැංකුව ස්ථාපිත කර ඇත.

ඉහත ක්‍රියාවලිය මත පදනම්ව, පහත දැක්වෙන පරිදි අදියර 1, අදියර 2, අදියර 3 සහ මිලදීගත් හෝ උත්පාදිත හානිකරණය වූ ණය යනුවෙන් බැංකුව එහි ණය කාණ්ඩ කරනු ලබයි.

අදියර 1 ණය මුලින්ම පිළිගත් විට, බැංකුව මාස 12 අපේක්ෂිත ණය අලාභ මත පදනම් වූ දීමනාවක් හඳුනා ගනී. අදියර 1 ණයවලට ණය අවදානම වැඩිදියුණු වූ පහසුකම් ඇතුළත්වන අතර, එම ණය අදියර 2 සිට නැවත වර්ගීකරණය කර ඇත.

අදියර 2 ණයමුදලක්, ආරම්භයේ සිට ණය අවදානම තුළ සැලකියයුතු වැඩිවීමක් පෙන්නුම්කර ඇති අවස්ථාවක, බැංකුව ජීවකාල අපේක්ෂිත ණය අලාභ සඳහා දීමනාවක් වාර්තා කරයි. අදියර 2 ණයවලට ණය අවදානම වැඩිදියුණු වූ පහසුකම් ඇතුළත්වන අතර, එම ණය අදියර 3 සිට නැවත වර්ගීකරණය කර ඇත.

අදියර 3 ණය හානිකරණය වී ඇති බවට සලකන ණය (සටහන 13 හි සඳහන් පරිදි). බැංකුව ජීවකාල අපේක්ෂිත ණය අලාභ සඳහා අත්තිකාරමක් වාර්තා කරයි.

POCI මිලදීගත් හෝ උත්පාදිත හානිකරණය වූ ණය (POCI) වත්කම් යනු මූලික හඳුනාගැනීම මත ණය හානිකරණයවන මූල්‍ය වත්කම්ය. මිලදීගත් හෝ උත්පාදිත හානිකරණය වූ ණය වත්කම් මුල් හඳුනාගැනීමේදී සාධාරණ අගයට වාර්තා කරන අතර, ණය ගළපන ලද ඵලදායී පොලී අනුපාත පදනම් කරගනිමින් පොලී ආදායම පසුව හඳුනා ගනේ. අපේක්ෂිත ණය අලාභ හඳුනාගැනීම හෝ නිකුත් කිරීම සිදු කරනු ලබන්නේ අපේක්ෂිත ණය අලාභවල පසුකාලීන වෙනසක් ඇති ප්‍රමාණයට පමණි.

බැංකුවට හිඟව ඇති මුළු ප්‍රමාණය හෝ එයින් කොටසක් අයකර ගැනීමේ සාධාරණ අපේක්ෂාවන් නොමැති මූල්‍ය වත්කම් සඳහා, මූල්‍ය වත්කමේ දළ ධාරණ අගය අඩු කරනු ලබයි. මෙය මූල්‍ය වත්කම් (අර්ධ වශයෙන්) හඳුනාගැනීමෙන් බැහැර කිරීමක් ලෙස සලකනු ලබයි.

2.4.12.10.2.3 අපේක්ෂිත ණය අලාභ ගණනය කිරීම

ඵලදායී පොලී අනුපාතයට ආසන්නවීමට වට්ටම් කරන ලද අපේක්ෂිත මුදල් හිඟය මැනීම සඳහා සම්භාවිතාව බර තබන ලද ක්‍රියාදාම හතරක් මත පදනම් වී බැංකුව අපේක්ෂිත ණය අලාභ ගණනය කරයි. මුදල් හිඟයක් යනු ගිවිසුමකට අනුකූලව ආයතනයකට ගෙවිය යුතු මුදල් ප්‍රවාහ සහ ආයතනය

ලබාගැනීමට අපේක්ෂා කරන මුදල් ප්‍රවාහ අතර වෙනස වේ. අපේක්ෂිත ණය අලාභ ගණනය කිරීමේ ක්‍රම පිළිබඳ කෙටියෙන් පහතින් දැක්වෙන අතර එහි ප්‍රධාන අංග පහත පරිදි වේ.

PD පැහැර හැරීමේ සම්භාවිතාව යනු දෙන ලද කාල සීමාවක් තුළ පැහැර හැරීම සිදුවියහැකි බව පිළිබඳ ඇස්තමේන්තුවකි. මූල්‍ය පහසුකම මෙයට පෙර හඳුනා ගෙන නොමැතිනම් සහ තවමත් කළඹ තුළ පවතින්නේ නම් තක්සේරු කාලසීමාව තුළ එක්තරා අවස්ථාවකදී පමණක් පැහැර හැරීමක් සිදුවිය හැක.

EAD පැහැර හැරීමේදී නිරාවරණය යනු අනාගත පැහැරහැරීමේ දිනයක නිරාවරණය පිළිබඳ තක්සේරුවකි. එහිදී ගිවිසුම්ගතව හෝ වෙනත් ආකාරයකින් උපලේඛනගත කළ මූලික සහ පොලීවල ආපසු ගෙවීම ඇතුළු, වාර්තා කළ දිනට පසුව නිරාවරණයේ අපේක්ෂිත වෙනස්කම් සැලකිල්ලට ගනු ලබයි. එය බැඳුණු පහසුකම් මත අපේක්ෂිත පෙළඹවීම්, සහ මඟ හැරුණු ගෙවීම් වලින් උපචිත පොලී සැලකිල්ලට ගනු ලබයි.

LGD අලාභ ලබන පැහැර හැරීම යනු දෙනලද යම් කාලයක් තුළ පැහැර හැරීම සිදුවන අවස්ථාවක ඇතිවන අලාභය පිළිබඳ තක්සේරුවකි. ගිවිසුම්ගත ගෙවිය යුතු මුදල් ප්‍රවාහ හිඟ සහ යම් ඇප මුදාහැරීම ඇතුළුව ණයකරු ලබාගැනීමට අපේක්ෂා කරන ප්‍රමාණය අතර වෙනස මත එය පදනම් වේ. එය සාමාන්‍යයෙන් පැහැර හැරීමේදී නිරාවරණයෙහි ප්‍රතිශතයක් ලෙස ප්‍රකාශ කරයි.

අපේක්ෂිත ණය අලාභ ගණනය කිරීමේදී, බැංකුව විසින් මූලික සිදුවීම, හොඳම සිදුවීම සහ නරකම සිදුවීම ලෙස ක්‍රියාදාම තුනක් සලකා බලයි. මේවා එකිනෙකට වෙනස් පැහැර හැරීමේ සම්භාවිතාවල පැහැර හැරීමේදී නිරාවරණය සහ අලාභ ලබන පැහැර හැරීම සමඟ බැඳේ. අදාළ වන අවස්ථාවේදී, ණය අයකර ගැනීමේ හැකියාව සහ ඇපවල වටිනාකම හෝ වත්කම විකිණීමෙන් ලබාගතහැකි ප්‍රමාණය ඇතුළුව, පැහැර හැරි ණය අයකර ගැනීමට අපේක්ෂා කරන ආකාරය පිළිබඳ විවිධ ක්‍රියාදාම පිළිබඳ තක්සේරු සඳහා ඇතුළත් වේ.

මූල්‍ය වත්කම්වල දළ ධාරණ අගයේ ගැළපීමක් ලෙස ගණනය කරනු ලබන වෙනස්කිරීමේ අලාභ හෝ ලාභවලින් වෙනම හානිකරණ අලාභ සහ මුදාහැරීම් වෙන් වශයෙන් ගණනය කිරීම සහ අනාවරණය කිරීම සිදු කරනු ලබයි.

2.4.12.10.2.4 අපේක්ෂිත ණය අලාභ ක්‍රමයේ ක්‍රියාවලිය පිළිබඳ කෙටියෙන් පහතින් දක්වා ඇත:

අදියර 1 වාර්තාකරණ දිනයෙන් පසු මාස 12 තුළ සිදුවියහැකි මූල්‍ය උපකරණයක් මත පැහැර හැරීමේ සිදුවීම්වලින් ඇතිවන අපේක්ෂිත ණය අලාභ නියෝජනය කරන ජීවකාල අපේක්ෂිත ණය අලාභවල කොටසක් ලෙස මාස 12 අපේක්ෂිත ණය අලාභ ගණනය කරනු ලබයි. වාර්තාකරණ දිනයෙන් පසු මාස 12 තුළ සිදුවියහැකි පැහැර හැරීමක් සම්බන්ධයෙන් අපේක්ෂාවන් මත පදනම්ව මාස 12 තුළ අපේක්ෂිත ණය අලාභ දීමනා බැංකුව විසින් ගණනය කරනු ලබයි. මෙම අපේක්ෂිත මාස 12 පැහැර හැරීම් සම්භාවිතාවන්, පුරෝකථනය කරන ලද පැහැර හැරීමේදී නිරාවරණය සඳහා අදාළ කරන අතර, අපේක්ෂිත අලාභ ලබන පැහැර හැරීමෙන් ගුණ කොට මුල් ඵලදායී පොලී අනුපාතය වෙත ආසන්න වශයෙන් වට්ටම් කොට ඇත. ඉහත දක්වා ඇති පරිදි, එක් එක් ක්‍රියාදාමයන් හතර සඳහා මෙම ගණනය කිරීම සිදු කරයි.

අදියර 2 ණය මුදලක් ආරම්භයේ සිට ණය අවදානම තුළ සැලකියයුතු වැඩිවීමක් පෙන්නුම්කර ඇති අවස්ථාවක, බැංකුව ජීවකාල අපේක්ෂිත ණය අලාභය සඳහා දීමනා වාර්තා කරයි. ක්‍රියාවලි, විවිධ අවස්ථා භාවිතය ඇතුළුව ඉහත විස්තර කළ දෑට සමාන වේ. නමුත් උපකරණයේ ආයු කාලය මත පැහැර හැරීමේ සම්භාවිතාව සහ අලාභ ලබන පැහැර හැරීම තක්සේරු කරනු ලබයි. මුල් ඵලදායී පොලී අනුපාතයට වෙත ආසන්න වශයෙන් අපේක්ෂිත මුදල් හිඟයන් වට්ටම් කරනු ලබයි.

අදියර 3 ණය හානිකරණය වී ඇති බවට සලකන ණය සඳහා ඒවායේ ජීවකාල අපේක්ෂිත ණය අලාභ බැංකුව හඳුනා ගනී. මෙම ක්‍රමය 100%ට පැහැර හැරීමේ සම්භාවිතාව සහිත අදියර 3 වත්කම්වල සමානය.

POCI මිලදීගත් හෝ උත්පාදිත හානිකරණය වූ ණය වත්කම් යනු මූලික හඳුනාගැනීම මත ණය හානිකරණය වන මූල්‍ය වත්කම්ය. ණය ගළපන ලද ඵලදායී පොලී අනුපාතය මගින් වට්ටම් කළ, ක්‍රියාදාම හතරේ සම්භාවිතා බර තැබීමක් මත පදනම් වී, මූලික හඳුනා ගැනීමේ සිට ජීවකාල අපේක්ෂිත ණය අලාභවල සමුච්චිත වෙනස්වීම් පමණක් බැංකුව හඳුනා ගනී.

2.4.12.11 අනෙකුත් විස්තරාත්මක ආදායම තුළින් සාධාරණ වටිනාකමට මනිනු ලබන ණය උපකරණ

අනෙකුත් විස්තීර්ණ ආදායම තුළින් සාධාරණ වටිනාකමට මනිනු ලබන ණය උපකරණ සඳහා අපේක්ෂිත ණය අලාභය මඟින් සාධාරණ අගයට පවතින මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ මෙම මූල්‍ය වත්කම්වල ධාරණ වටිනාකම අඩු නොකරයි. ඒ වෙනුවට, වත්කම්, පිරිවැය ක්‍රමක්ෂය මනින ලබන්නේනම් ඇතිවිය හැකි දීමනාවට සමාන ප්‍රමාණයක් ආදායම් ප්‍රකාශනයට අනුරූප අයකිරීමක් සමඟ සමුච්චිත හානිකරණ ප්‍රමාණයක් ලෙස, අනෙකුත් විස්තරාත්මක ආදායම තුළ හඳුනා ගනී. අනෙකුත් විස්තරාත්මක ආදායම තුළ හඳුනාගත් සමුච්චිත අලාභ, වත්කම හඳුනාගැනීමෙන් බැහැර කිරීම මත ලාභ හෝ අලාභයට ප්‍රතිවක්‍රිය කෙරේ.

2.4.12.12 මිලදීගත් හෝ උත්පාදිත ණය හානිකරණය කළ මූල්‍ය වත්කම් (POCI)

මිලදීගත් හෝ උත්පාදිත ණය හානිකරණය කළ මූල්‍ය වත්කම් සඳහා, අලාභ දීමනාව තුළ මූලික හඳුනා ගැනීමේ සිට ජීවකාල අපේක්ෂිත ණය අලාභවල සමුච්චිත වෙනස්වීම් පමණක් බැංකුව හඳුනා ගනී.

2.4.12.13 ඉදිරිය දැක්ම පිළිබඳ තොරතුරු

අපේක්ෂිත ණය අලාභ ආදර්ශය තුළ, පහත පරිදි බැංකුව ආර්ථික යෙදවුම් ලෙස පුළුල් පරාසයක ඉදිරි දැක්ම මත රඳා පවතී.

- දළ දේශීය නිෂ්පාදිත වර්ධනය
- උද්ධමන අනුපාතය
- පොලී අනුපාතය
- විනිමය අනුපාතය
- විරැකියා අනුපාතය

අපේක්ෂිත ණය අලාභ ගණනය කිරීම සඳහා භාවිත කරන යෙදවුම් සහ ආදර්ශ, මූල්‍ය ප්‍රකාශනවල දිනයට වෙළඳ පොළේ සියලුම ගතිලක්ෂණ සැමවිටම ග්‍රහණය කර නොගනී. මෙය පිළිබිඹු කිරීම සඳහා, එවැනි වෙනස්වීම් සැලකියයුතු ලෙස වැදගත් වන අවස්ථාවේදී ගුණාත්මක ගැළපීම් හෝ ආවරණ තාවකාලික ගැළපීම් ලෙස අවස්ථානුකූලව සිදු කෙරේ. එමනිසා, බැංකුව පහත සඳහන් ගුණාත්මක සාධක සැලකිල්ලට ගනී.

- සාමාන්‍ය LTV
- රජයේ ප්‍රතිපත්ත
- ක්ෂේත්‍රයේ ව්‍යාපාරයේ තත්ත්වය
- නියාමන බලපෑම

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

2.4.12.14 ඇප තක්සේරුකරණය

මූල්‍ය වත්කම් මත ණය අවදානම් අවම කිරීම සඳහා, හැකි සෑම අවස්ථාවකදීම බැංකුව ඇප භාවිතා කිරීමට උත්සාහ දරයි. මුදල්, සුරැකුම්, ණයවර ලිපි/ඇප, නිශ්චල දේපළ, ලැබීම්, භාණ්ඩ තොග, අනෙකුත් මූල්‍ය නොවන වත්කම් සහ ජාලකරණ ගිවිසුම් වැනි ණය වර්ධනයන් ආදී ඇප විවිධ ආකාරයේ ස්වරූපයක් ගනී. SLFRS 9 යටතේ ණයදීමේ විධිවිධාන හරහා පවරා ඇති ඇපකරය සඳහා බැංකුවේ ගිණුම්කරණ ප්‍රතිපත්තිය එය LKAS 39 යටතේ පැවති ස්වරූපයම ගනී.

2.4.12.15 නැවත අත්කරගත් ඇප

SLFRS 9 යටතේ බැංකුවේ ගිණුම්කරණ ප්‍රතිපත්තිය, LKAS 39 යටතේ බැංකුව තුළ පැවති ප්‍රතිපත්තියට සමාන වේ. බැංකුවේ ප්‍රතිපත්තිය වනුයේ නැවත අත්කරගත් වත්කමක් එහි අභ්‍යන්තර මෙහෙයුම් සඳහා වඩා හොඳින් භාවිත කළ හැකිය යන්න හෝ විකිණිය යුතුය යන්න තීරණය කිරීමයි. අභ්‍යන්තර මෙහෙයුම් සඳහා ප්‍රයෝජනවත්යැයි තීරණය කළ වත්කම්, ඒවා නැවත අත්කරගත් වටිනාකම හෝ මුල් සුරැකුම් වත්කමේ ධාරණ අගය යන දෙකින් අඩු අගයට ඒවාට අදාළ වත්කම් වර්ගීකරණයට මාරු කෙරේ. විකිණීම වඩාත් හොඳ විකල්පයක් වන බවට තීරණය කරනු ලබන වත්කම්, ඒවායේ සාධාරණ අගයට (මූල්‍ය වත්කම්නම්) සහ බැංකුවේ ප්‍රතිපත්තියට සමගාමීව නැවත අත්කර ගත් දිනයට මූල්‍ය නොවන වත්කම් සඳහා විකිණීමේ පිරිවැය අඩුකළ සාධාරණ අගයට අලෙවිය සඳහා තබා ඇති වත්කම්වලට මාරු කරනු ලබයි.

බැංකුවේ සාමාන්‍ය ව්‍යාපාර රටාවට අනුව, බැංකුව එහි පාරිභෝගික කළඹ තුළ දේපළ හෝ අනෙකුත් වත්කම් භෞතිකව නැවත අත්කර නොගන්නා නමුත් පොදුවේ වෙන්දේසියකදී හිඟ ණය නිරවුල් කිරීමට අරමුදල් අයකර ගැනීම සඳහා බාහිර නියෝජිතයින් සේවයේ යොදවනු ලබයි. යම් අතිරික්ත අරමුදල් ගනුදෙනුකරුවන්ට/වගකිවයුත්තන්ට ආපසු ගෙවනු ලැබේ. මෙම ව්‍යවහාරයේ ප්‍රතිඵලයක් ලෙස, නෛතිකව නැවත අත්කරගැනීමේ ක්‍රියාවලීන් යටතේ නේවාසික දේපළ මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ වාර්තා නොකෙරේ.

2.4.12.16 ලියාහැරීම්

SLFRS 9 යටතේ බැංකුවේ ගිණුම්කරණ ප්‍රතිපත්තිය, බණී 39 යටතේ බැංකුව තුළ පැවති ප්‍රතිපත්තියට සමාන වේ. බැංකුව අයකරගැනීමේ කාර්යය නවතා ඇති අවස්ථාවේදී පමණක් කොටස් වශයෙන් හෝ සම්පූර්ණයෙන්ම මූල්‍ය වත්කම් ලියා හරිනු ලබයි. ලියාහරිනු ලබන මුදල සමුච්චිත අලාභ දීමනාවට වඩා ඉහළ නම්, දළ ධාරණ අගයට අනුව යොදා ගනු ලබන දීමනාවට එකතු කිරීමක් ලෙස වෙනස පළමුව සලකනු ලැබේ. යම් පසුකාලීන අයකර ගැනීම් ණය අලාභ වියදමට බැර කෙරේ.

2.4.13 වාර්තාකරණ කාලසීමාවෙන් පසු සිදුවීම්

වාර්තාකරණ කාලසීමාවෙන් පසු සියලුම වැදගත් සිදුවීම් සලකා බලා ඇති අතර, සුදුසු පරිදි ගැළපීම් හෝ අනාවරණ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වල සිදු කෙරේ. කෝවිඩ් 19 උවදුරේ තුන්වන රැල්ල හේතුවෙන් ව්‍යාපාරිකයන් සහ පුද්ගලයන් මුහුණ දුන් අභියෝගවලට පහසුකම් සැලසීමේ අරමුණින් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2021 මැයි මස අංක 05 දරන චක්‍රලේඛය නිකුත් කරන ලදී. 2021 අංක 08 දරන චක්‍රලේඛයට අනුව එය 2021 සැප්තැම්බර් මස තවදුරටත් එය දීර්ඝ කරන ලදී. ඒ අනුව බැංකුව 2021 මැයි මාසය වනවිටත් සහන ලබා දී ඇති අතර, දැනට බැංකුව විසින් දීර්ඝ සහන පියවර සඳහා සුදුසුකම් ලත් ණය ගැනියන් විසින් එවන ලද ඉල්ලීම් තක්සේරු කිරීමේ ක්‍රියාවලියක නිරතව සිටී.

මූල්‍ය සේවා මත වැට් බදු අනුපාතය වෙනස් කිරීම

2022 ජනවාරි 7 වන දින නිකුත් කරන ලද රාජ්‍ය පනත් කෙටුම්පතේ විධිවිධාන අනුව මූල්‍ය සේවා මත වැට් බද්ද වැඩි කිරීමට යෝජනා කර ඇත.

නව අක්‍රිය ණය ක්‍රියාවලිය

නව අක්‍රිය ණය ක්‍රියාවලිය, 2022 ජනවාරි 1 සිට බලපැවැත්වෙන වන පරිදි ණය පහසුකම් වර්ගීකරණය, හඳුනාගැනීම සහ මැනීම සඳහා නව උපදෙස් මාලාවක් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කර ඇත. අවිනිශ්චිතභාවයේ පොලී අවසන් කිරීම,"බසල් 9 අදියර වර්ගීකරණය යොදා ගැනීම, පවතින හරස් පැහැර හැරීමේ නීති වෙනස් කිරීම, පළමු අදියර ණය සඳහා අනිවාර්ය ප්‍රතිපාදන අනුපාතය සහ මූල්‍ය වත්කම් අදියර අතරට ගෙන යාම සඳහා නව නීති යනු අක්‍රිය ණය වර්ගීකරණය වේ. කෙසේ වෙතත්, නව මගපෙන්වීම් අදාළ වන්නේ 2022 ජනවාරි 1 වන දිනට පසුව අක්‍රිය ණය බවට පත්වන ණය සඳහා පමණක් වන අතර, පියවන තෙක්, පෙර උපදෙස් යටතේ අක්‍රිය ණය ලෙස වර්ගීකරණය කරන ලද පැරණි ණය පවතිනු ඇත.

2.4.14 රජය හා රජයට අදාළ ආයතන සමඟ සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු

LKAS 24 හි 32 පරිච්ඡේදය යටතේ, අනාවරණයෙන් නිදහස්වීම බැංකුව තෝරාගෙන නැත.

2.5 වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති - මූල්‍ය උපකරණ සඳහා ආදායම් හා වියදම් හඳුනාගැනීම්

2.5.1 පොලී ආදායම

පොලී ආදායම් විස්තර පිළිබඳ සටහන අංක 3 හි දක්වා ඇත.

2.5.2 පොලිය සහ සමාන ආදායම

බැංකුව ණය හානිකරණ වත්කම් හැර මූල්‍ය වත්කම්වල දළ ධාරණ වටිනාකම වෙත ඵලදායී පොලී අනුපාතය යෙදීමෙන් පොලී ආදායම ගණනය කරනු ලබයි. මූල්‍ය වත්කමක් ණය හානිකරණ බවට පත්වන සහ එම නිසාම අදියර 3 ලෙස සලකන අවස්ථාවක, මූල්‍ය වත්කමේ ශුද්ධ ක්‍රමක්ෂය පිරිවැයට ඵලදායී පොලී ආදායම ගණනය කරනු ලබයි.

ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයේදී අනිවාර්යයෙන් මැනීමට අවශ්‍ය සියලුම වෙළඳ වත්කම් සහ මූල්‍ය වත්කම් මත පොලී ආදායම පිළිවෙලින් ශුද්ධ වෙළෙඳ ආදායම සහ ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයේදී මූල්‍ය වත්කම් මත ශුද්ධ ලාභ/(අලාභ) තුළ ගිවිසුම්ගත පොලිය භාවිතයෙන් හඳුනා ගනී.

2.5.3 ගාස්තු සහ කොමිස් ආදායම

කොමිස් ආදායම හා වියදම පිළිබඳ විස්තර සටහන් අංක 5 හි දක්වා ඇත.

2.6 ප්‍රමිති නිකුත් කළ නමුත් 2020 දෙසැම්බර් 31 දිනට බලාත්මක නොවන

2020 ජනවාරි 01 දින සිට බලපැවැත්වෙන දැනට ක්‍රියාත්මක වන පහත සඳහන් ගිණුම්කරණ ප්‍රමිතීන්ට සිදුකරන සංශෝධන බැංකුවේ මූල්‍ය ප්‍රකාශන සඳහා ප්‍රමාණාත්මක බලපෑමක් සිදුකර නොතිබිණි.

2.6.1 2020.01.01. දින සිට බලපැවැත්වෙන පරිදි LKAS 1 සහ LKAS 8 සඳහා සංශෝධන

ප්‍රමිතිය හරහා "ප්‍රමාණාත්මකභාවයේ" නිර්වචනය පෙළගැස්වීමට සහ නිර්වචනයේ කිසියම් පැහැදිලි කිරීමක් තහවුරු කිරීමට LKAS 1 "මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම" සහ LKAS 8 "ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තු හා දෝෂ වෙනස්වීම" හි ප්‍රමාණාත්මක සංශෝධනයක් සිදුකරයි. තොරතුරු ප්‍රමාණාත්මකවන වන්නේ මග හැරීම් හෝ සැගවීම් හේතුවෙන්, විශේෂිත වාර්තාකරණ ආයතනයක් පිළිබඳ මූල්‍ය තොරතුරු සපයන එම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගෙන සාමාන්‍ය

අරමුණු සඳහා මූල්‍ය ප්‍රකාශන පරිශීලකයින් විසින් ගනු ලබන තීරණ කෙරෙහි සාධාරණ ලෙස බලපෑම් එල්ල කිරීම, පිළිබඳ නව අර්ථකථනය මගින් ප්‍රකාශ වෙයි. ප්‍රමාණාත්මක පිළිබඳ අර්ථකථන සඳහා සිදුකරන සංශෝධන බැංකුවේ මූල්‍ය ප්‍රකාශනවලට සැලකිය යුතු බලපෑමක් එල්ල කරන බව අපේක්ෂා නොකරයි.

2.6.2 SLFRS 16 කල්බදු සඳහා සංශෝධන - කොවිඩ්-19 හා සම්බන්ධ කුලී සහන

කොවිඩ්-19 වසංගතයේ සෘජු බලපෑමේ ප්‍රතිඵලයක් ලෙස ඇතිවන්නා වූ කුලී සහන ගණනය කිරීම සඳහා කල්බදු නවීකරණය කිරීමේ ගිණුම්කරණය පිළිබඳ SLFRS16 මාර්ගෝපදේශය යෙදීමෙන් සංශෝධන මගින් බදුකරුවන්ට සහන සපයයි. ප්‍රායෝගික ක්‍රියාමාර්ගයක් ලෙස බදු දෙන්නෙකුගෙන් ලැබෙන COVID-19 ආශ්‍රිත කුලී සහනයක් කල්බදු වෙනස් කිරීමක් දැයි තක්සේරු නොකිරීමට බදුකරු තෝරා ගත හැකිය. කොවිඩ්-19 ට සම්බන්ධ කුලී සහනවල ප්‍රතිඵලයක් ලෙස ඇතිවන කල්බදු ගෙවීමේ කිසියම් වෙනසක් සඳහා කල්බදුකරු මෙම තෝරා ගැනීමේ ගිණුම් සකස් කරන අතර, එලෙසම වෙනස කල්බදු නවීකරණය කිරීමක් නොවන්නේ නම් එය SLFRS 16 යටතේ වෙනස සඳහා ගණනය කරයි. සංශෝධන ප්‍රකාශනය, බැංකුවේ මූල්‍ය ප්‍රකාශන සඳහා ප්‍රමාණාත්මක බලපෑමක් සිදුකරන බව අපේක්ෂා නොකරයි.

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

03. දළ ආදායම

ගිණුම්කරණ ප්‍රතිපත්තිය
ආදායම විශ්වාසදායි ලෙස තක්සේරු කිරීමට හැකිවීම සහ ආර්ථික ප්‍රතිලාභ බැංකුවට ගලා ඒම සිදුවිය හැකි ප්‍රමාණයට දළ ආදායම හඳුනාගනී. ආදායම හඳුනාගැනීමට ප්‍රථම විශේෂිත හඳුනාගැනීම් නිර්ණායකයන් ද සැලකිල්ලට ගතයුතු වෙයි.

2023 දෙසැම්බර් 31න් අවසන් වර්ෂය සඳහා	2023 (රු.)	2022 (රු.)
පොලී ආදායම	9,324,132,408	7,401,968,299
ගාස්තු සහ කොමිස් ආදායම	96,293,245	91,724,320
ලාභ හා අලාභ තුළින් සාධාරණ අගයට මූල්‍ය වත්කම්වලින් ශුද්ධ සාධාරණ අගයේ ලාභ/ (අලාභ)	157,533,227	(2,134,408)
වෙනත් ශුද්ධ මෙහෙයුම් ආදායම්	21,943,478	25,569,713
දළ ආදායම	9,599,902,358	7,517,127,924

04. ශුද්ධ පොලී ආදායම

ගිණුම්කරණ ප්‍රතිපත්තිය සටහන් අංක 2.2.1 හි දක්වා ඇත.

2023 දෙසැම්බර් 31න් අවසන් වර්ෂය සඳහා	2023 (රු.)	2022 (රු.)
පොලී ආදායම		
බැංකු තැන්පතු (ස්ථාවර + ඉතුරුම් + ගිණුම්)	1,975,533,930	2,330,660,489
ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය වත්කම්		
- ණය සහ අත්තිකාරම්	5,600,330,194	4,709,774,315
ණය සහන කාල ලබාදුන් ණයවල එක් දින බලපෑම	3,031,481	1,478,839
5වැනි කොවිඩ් රැල්ල සඳහා ණය සහන පොලී මත 7%ක විලම්බිත පොලී ආදායම	-	1,097,973
අඩුකළා - 1,3,4,5 වැනි කොවිඩ් රැල්ලෙන් 7%ක බැංකුව අයකළ ණය සහන	(532,942)	(1,576,156)
- ණය සහ වෙනත් උපකරණ	1,745,769,745	360,532,839
මුළු පොලී ආදායම	9,324,132,408	7,401,968,299
පොලී වියදම		
බැංකුවලට ගෙවිය යුතු	51,052	68,915
ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය වගකීම්		
- තැන්පතුකරුවන්ට ගෙවිය යුතු	8,706,701,092	5,433,421,943
- අනෙකුත් ණය ගැනුම්කරුවන්ට ගෙවිය යුතු	25,842,475	29,490,550
මුළු පොලී වියදම	8,732,594,619	5,462,981,408
ශුද්ධ පොලී ආදායම	591,537,789	1,938,986,892
අ. ශ්‍රී ලංකා රජයේ සුරැකුම් වලින් ලද ශුද්ධ ආදායම		
පොලී ආදායම	1,286,407,489	262,575,535
(අඩු කළා): පොලී වියදම	-	-
ශුද්ධ පොලී ආදායම	1,286,407,489	262,575,535

05. ශුද්ධ ගාස්තු සහ කොමිස් ආදායම

බැංකුව, කාල සීමාව තුළ සිදුකළ සේවාවන් සමූහයකින් ගාස්තු සහ කොමිස් ආදායම උපයා ගනී.

2023 දෙසැම්බර් 31න් අවසන් වර්ෂය සඳහා	2023 (රු.)	2022 (රු.)
ගාස්තු හා කොමිස් ආදායම	**96,293,245**	91,724,320
ශුද්ධ ගාස්තු හා කොමිස් ආදායම	**96,293,245**	91,724,320
ඇතුළත් වේ		
බැංකු සේවා ගාස්තු - ණය හා අත්තිකාරම්	**84,074,511**	84,406,618
නෛතික හා තාක්ෂණ ගාස්තු - ණය හා අත්තිකාරම්	**1,841,929**	80,317
වෙනත් අයකිරීම්	**10,376,804**	7,237,386
ශුද්ධ ගාස්තු හා කොමිස් ආදායම	**96,293,245**	91,724,320

06. ලාභ හා අලාභ තුළින් සාධාරණ අගයට ඇති මූල්‍ය උපකරණයන්ගේ ශුද්ධ සාධාරණ ලාභය / (අලාභය)

ගිණුම්කරණ ප්‍රතිපත්තිය
පොලී ආදායම හැර, "ලාභ හෝ අලාභ තුළින් හඳුනාගත් මූල්‍ය උපකරණ" වෙත සියලුම ලාභ හා අලාභ සහ අදාළ ලාභාංශ ශුද්ධ වෙළඳ ආදායම සඳහා ඇතුළත් වේ.

2023 දෙසැම්බර් 31න් අවසන් වර්ෂය සඳහා	2023 (රු.)	2022 (රු.)
ලාභ හා අලාභ තුළින් සාධාරණ අගයට ඇති මූල්‍ය වත්කම් සඳහා ලාභ	**157,533,227**	-
ලාභ හා අලාභ තුළින් සාධාරණ අගයට ඇති මූල්‍ය වත්කම් සඳහා අලාභ	**-**	(2,134,408)
මුළු ගණන	**157,533,227**	(2,134,408)

07. වෙනත් මෙහෙයුම් ආදායම් (ශුද්ධ)

ගිණුම්කරණ ප්‍රතිපත්තිය
සමූහයේ ගෙවීම් ලබා ගැනීමට ඇති අයිතිය තහවුරු වූ විට, වෙනත් විස්තීර්ණ ආදායමක් තුළින් සාධාරණ අගයට මනිනු ලබන මූල්‍ය වත්කම්වලින් උපයන ලාභාංශ හඳුනා ගැනේ.

2023 දෙසැම්බර් 31න් අවසන් වර්ෂය සඳහා	2023 (රු.)	2022 (රු.)
ලාභාංශ ආදායම	**15,950,352**	21,324,000
විවිධ ආදායම්	**5,993,126**	4,245,713
වෙනත් මෙහෙයුම් ආදායම් (ශුද්ධ)	**21,943,478**	25,569,713

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

08. ණය සහ වෙනත් අලාභ සඳහා හානිකරණ ගාස්තු (ප්‍රතිවර්තන)

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

"මූල්‍ය උපකරණ" සඳහා වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති SLFRS -9 අනුව තක්සේරු කරනු ලබන, සියලු මූල්‍ය උපකරණ සඳහා වන හානිකරණ ප්‍රතිපාදනවල වෙනස්වීම් බැංකුව හඳුනාගෙන ඇත. SLFRS 9 යටතේ සියලු කාණ්ඩවල මූල්‍ය වත්කම් හානිකරණ මැනීම සඳහා විනිශ්චයක් අවශ්‍ය වේ; විශේෂයෙන් හානිකරණ අලාභ හඳුනාගැනීමේදී සහ ණය අවදානම්වල සැලකිය යුතු වර්ධනය තක්සේරු කිරීමේදී ප්‍රමාණය තීරණය කිරීම සහ අනාගත මුදල් ප්‍රවාහයන්ගේ සහ ඇපසුරුකුම්වල කාල නිර්ණය කිරීම සඳහා අවශ්‍ය වේ. අදාළ කරගත් විනිශ්චයන් මූල්‍ය ප්‍රකාශනයේ සටහන් අංක 16හි විස්තර කොට ඇත.

2023 දෙසැම්බර් 31න් අවසන් වර්ෂය සඳහා	2023 (රු.)	2022 (රු.)
ක්‍රමක්ෂය පිරිවැයට ඇති මූල්‍ය වත්කම් - ණය හා අත්තිකාරම්		
අදියර 1	(34,814,940)	130,450,499
අදියර 2	167,142,810	114,418,254
අදියර 3	423,926,677	119,179,592
ක්‍රමක්ෂය පිරිවැයට ඇති අනෙකුත් මූල්‍ය වත්කම්		
අදියර 1	5,137,783	2,691,805
අදියර 2	-	(993,122)
අදියර 3	-	-
එකතුව	561,392,330	365,747,028

09. පුද්ගල වියදම්

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

01. නිශ්චිත දායකත්ව සැලසුම්

2023 මූල්‍ය වර්ෂය තුළ බැංකුව මඟින් පහත සඳහන් නිශ්චිත දායකත්ව සැලසුම් ක්‍රියාත්මක කරයි. ලබාදුන් දායකත්වය "පුද්ගල වියදම්" යටතේ වියදමක් ලෙස වාර්තා කර ඇත. නොගෙවූ දායකත්වයන් වගකීමක් ලෙස වාර්තා කරයි.

(අ) සේවක අර්ථසාධක අරමුදල

2.4.1 හි ගිණුම්කරණ ප්‍රතිපත්තිය එළිදරව් කර ඇත.

(ආ) සේවක භාරකාර අරමුදල

2.4.1 හි ගිණුම්කරණ ප්‍රතිපත්තිය එළිදරව් කර ඇත.1

2023 දෙසැම්බර් 31න් අවසන් වර්ෂය සඳහා කාර්ය මණ්ඩල වියදම්	2023 (රු.)	2022 (රු.)
වැටුප් හා ප්‍රසාද දීමනා	717,390,410	830,283,079
නිශ්චිත දායකත්ව සැලසුම EPF සහ ETF	126,556,908	118,346,815
නිශ්චිත ප්‍රතිලාභ සැලසුම - පාරිතෝෂික ප්‍රතිපාදන	59,542,589	41,353,107
ලබා නොගත් අසනීප නිවාඩු සඳහා මුදල් ගෙවීම්	29,964,922	31,020,486
අතිකාල සහ සේවකයා දැරූ වියදම් ප්‍රතිපූර්ණය	5,850,366	8,648,568
කාර්ය මණ්ඩල අධ්‍යයන සහ පුහුණු ගෙවීම්	1,944,205	1,044,050
වෛද්‍ය යෝජනා - ගෙවීම්	62,874,231	70,936,477
වෛද්‍ය යෝජනා ක්‍රමය - ප්‍රතිපාදන (IFRS)	54,114,387	15,568,572
සුභසාධන	7,171,626	4,128,876
රක්ෂණ	469,387	1,061,997
කාර්ය මණ්ඩල ණයවල පළමු දින වෙනස (IFRS)	(51,453,677)	(38,525,209)
හානිපූරණය	867,538	459,558
සේවා නියුක්ති ආදායම උ.වි.ගෙ බදු	-	5,628,889
එකතුව	1,015,292,893	1,089,955,263

2023 දෙසැම්බර් 31න් අවසන් වර්ෂය සඳහා කාර්ය මණ්ඩල වියදම්	2023 (රු.)	2022 (රු.)
අඩු කළා- IFRS ප්‍රතිපාදන		
කාර්ය මණ්ඩල ණයවල පළමු දින වෙනස (IFRS)	**51,453,677**	38,525,209
වෛද්‍ය යෝජනා ක්‍රමය - ප්‍රතිපාදන (IFRS)	**(54,114,387)**	(15,568,572)
සැබෑ එකතුව	**1,012,632,183**	1,112,911,900

09.1 දායකත්වය- විශ්‍රාමික කාර්ය මණ්ඩල වෛද්‍ය යෝජනා ක්‍රමය

2023 දෙසැම්බර් 31න් අවසන් වර්ෂය සඳහා	2023 (රු.)	2022 (රු.)
වියදම් ලෙස හඳුනාගත් ප්‍රමාණය	**54,114,387**	30,993,049

09.2 විශ්‍රාමික කාර්ය මණ්ඩල වෛද්‍ය යෝජනා ක්‍රමය බැංකුවේ සියලුම සේවකයින් සඳහා ස්ථාපිත කොට ඇත. 2023 දෙසැම්බර් 31 දින, වෘත්තීය ආයුගණක සමාගමක් වන Actuarial) ඒබ්ටැපැබළු ඤබ්මකළබවී :ඡඩඑ* බඵා හි, ’ෂ් සාමාජිකයෙකු වන එම්. පූපාලනාතන් මහතා විසින් ආයුගණක තක්සේරුව සිදුකර ඇත. (සටහන් බලන්න)

දායකත්වය - පාරිතෝෂික

2023 දෙසැම්බර් 31න් අවසන් වර්ෂය සඳහා	2023 (රු.)	2022 (රු.)
වියදම් ලෙස හඳුනාගත් ප්‍රමාණය	**59,542,589**	41,353,107

10. වෙනත් වියදම්

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

නිශ්චිත ආදායම් අයිතම ඉපැයීම සහ දැරූ පිරිවැය අතර සෘජු සම්බන්ධතාවයේ පදනම මත ලාභ හෝ අලාභ ප්‍රකාශනයේ වෙනත් මෙහෙයුම් ආදායම් හඳුනාගනී. ව්‍යාපාරය පවත්වා ගැනීමේදී සහ දේපළ, පිරියත සහ උපකරණ කාර්යක්ෂමව පවත්වාගෙන යාමේදී දරන ලද සියලුම වියදම්, වර්ෂයේ ලාභය ගණනය කිරීම සඳහා ලාභ හා අලාභ ප්‍රකාශය වෙත අයකරනු ලැබේ. පසුගිය සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස බැංකුව වර්තමාන බැඳීමක් (නෛතික හෝ වුහුහාත්මක) ඇතිවිට වෙනත් වියදම්වලට අදාළ ප්‍රතිපාදන හඳුනාගනී. වගකීම් පියවීම සඳහා ආර්ථික ප්‍රතිලාභ ඇතුළත් සම්පත් පිටතට ගලායාම අවශ්‍ය වනු අතර, වගකීමේ වටිනාකමට විශ්වාසදායක ඇස්තමේන්තු පිළියෙල කළ හැකි වේ. දේපළ, පිරියත සහ උපකරණ හා අස්පෘශ්‍ය වත්කම්වල ක්ෂයවීමේ හා ක්‍රමක්ෂය වියදම්, අනෙකුත් වියදම් වෙන් කොට ආදායම් ප්‍රකාශයේ දක්වා ඇත.

2023 දෙසැම්බර් 31න් අවසන් වර්ෂය සඳහා	2023 (රු.)	2022 (රු.)
අධ්‍යක්ෂවරුන්ගේ පාරිශ්‍රමික	**1,998,974**	3,565,629
විගණකවරුන්ගේ පාරිශ්‍රමික	**5,564,435**	3,000,000
වෘත්තීය හා නෛතික වියදම්	**7,399,866**	4,338,676
කාර්යාල පරිපාලන හා ආයතනික වියදම්	**156,567,575**	135,892,205
ප්‍රචාරණ සහ ප්‍රවර්ධන වියදම්	**9,359,051**	17,329,178
රථ වාහන නඩත්තු හා ගමන් වියදම්	**7,984,571**	11,084,248
සාමාන්‍ය වියදම්	**11,690,094**	20,042,587
වෙනත් අලාභ, බොල් ණය හා ලියා හැරීම්	**-**	-
ශ්‍රී ලංකා මහ බැංකු තැන්පතු රක්ෂණය	**51,678,387**	47,776,181
වෙනත් වියදම්	**103,626,794**	110,399,574
එකතුව	**355,869,747**	353,428,278

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

10. වෙනත් වියදම් (තවදුරටත්)

2023 දෙසැම්බර් 31න් අවසන් වර්ෂය සඳහා	2023 (රු.)	2022 (රු.)
දේපළ, පිරියත සහ උපකරණ ක්ෂය කිරීම/ක්‍රමක්ෂය කිරීම		
ක්ෂය කිරීම - දේපළ, පිරියත සහ උපකරණ	**21,007,983**	17,994,398
ක්ෂය - කල්බදු වත්කම්	**78,600,161**	78,581,186
	99,608,144	96,575,584

11. බදු වියදම්

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

ප්‍රවර්තන බදු වියදම් - බදු අනුපාතය 24% සහ 30%

ප්‍රවර්තන බදු වත්කම් හා වගකීම් සඳහා පසුගිය වසර මෙන්ම මෙම වසර වෙනුවෙන් දේශීය ආදායම් බදු කොමසාරිස් ජනරාල් වෙත ගෙවූ හෝ අයකර ගැනීමට අපේක්ෂිත වටිනාකම් අඩංගු වේ. වටිනාකම් ගණනය කිරීම සඳහා භාවිත කළ බදු අනුපාත හා බදු නීති යනු වාර්තාකරණ දිනයට බලාත්මක කර තිබූ හෝ බලාත්මක කළ ඒවා වේ. ඒ අනුව 2017 අංක 24 දරන දේශීය ආදායම් බදු පනතේ විධිවිධාන හා එහි සංශෝධන අනුව, සටහන 2.3 හි නිශ්චිතව දක්වා ඇති අනුපාතවලට බදු අරමුණු සඳහා වෙනස්කළ පරිදි, වර්ෂය සඳහා ගිණුම්කරණ ලාභය මත පදනම්ව බදු සඳහා ප්‍රතිපාදන සලසා ඇත.

විලම්බිත බදුකරණය - බදු අනුපාතය 30%

වාර්තාකරණ දිනයට මූල්‍ය වාර්තාකරණ අරමුණු සඳහා වත්කම් සහ වගකීම් බදු පදනම් සහ ඒවායේ රැගෙනයාමේ වටිනාකම අතර තාවකාලික වෙනස්කම් මත වගකීම් ක්‍රමවේද භාවිතයෙන් විලම්බිත බදු සපයනු ලැබේ. ප්‍රයෝජනයට ගතහැකි ප්‍රමාණයට එදිරිව බදු අයකළ හැකි ලාභ ප්‍රමාණයට, අඩු කළ හැකි තාවකාලික වෙනස්කම්, භාවිත නොකළ ඉදිරියට ගෙන ආ බදු බැර ශේෂ සහ භාවිත නොකළ බදු අලාභ සියල්ල සඳහා විලම්බිත බදු වත්කම් හඳුනා ගනු ලබයි.

විලම්බිත බදු වත්කමේ කොටසක් හෝ සම්පූර්ණයෙන්ම භාවිතයට ගැනීමට ඉඩදීමට ප්‍රමාණවත් බදු ගෙවිය හැකි ලාභයක් තවදුරටත් නොපැවතීමේ ප්‍රමාණයට අඩුකර, විලම්බිත බදු වත්කමේ ඉදිරියට ගෙන ආ වටිනාකම සෑම වර්තාකරණ දිනකදීම සමාලෝචනයට ලක් කරයි. හඳුනානොගත් විලම්බිත බදු වත්කම් සෑම වර්තාකරණ දිනකදීම නැවත තක්සේරු කරන අතර, ඉදිරියේදී තිබිය හැකි බදු අය කළ හැකි ලාභයක් මගින් විලම්බිත බදු වත්කම අයකර ගැනීමට ඉඩ ලබා දීමේ ප්‍රමාණයට හඳුනාගනු ලබයි.

වාර්තාකරණ දිනට පසුව පැනවූ හෝ දැනට පනවා ඇති බදු අනුපාත හා බදු නීති මත පදනම්ව, වත්කම් උපලබ්ධිවනවිට හෝ වගකීම් නිරාකරණය කරනවිට වර්ෂය තුළ දී උපයෝගී කර ගැනීමට අපේක්ෂා කරන බදු අනුපාත උපයෝගී කරගනිමින් විලම්බිත බදු වත්කම් හා වගකීම් ගණනය කරයි.

2022 වර්ෂයේදී බැංකුවේ සම්මත බදු අනුපාතය 24.0% සිට 30.0% දක්වා වැඩි වූ අතර, අලුතින් ක්‍රියාත්මක කරන ලද 2.5%ක සමාජ ආරක්ෂණ දායක බද්දක් බලාත්මක විය. 2022 ජනවාරි 1 වැනි දින සිට බලාත්මකවන පරිදි මූල්‍ය සේවා මත වැට බද්ද 15.0% සිට 18.0% දක්වා වර්ධනය විය. භාවිතයට නොගත් බදු අලාභ සහ සැලකිය යුතු හානිකරණ ගාස්තු හේතුවෙන් විලම්බිත බදු වත්කම්වල වැඩි වීම සහ පසුගිය වසරවල බදු ප්‍රතිපාදන ආපසු හැරවීමෙන් පසුගිය බදු වරිපනම් පියවීම සමඟ බැංකුව වත්මන් වර්ෂය සඳහා රුපියල් මිලියන 442 ක බදු බැරකමක් හඳුනාගනු ලබයි.

2023 දෙසැම්බර් 31න් අවසන් වර්ෂය සඳහා	2023 (රු.)	2022 (රු.)
ප්‍රවර්තන බදු වියදම්		
ප්‍රවර්තන වර්ෂය	**(55,492,480)**	104,722,527
විලම්බිත බදු වියදම් (බැර)	**(106,156,767)**	(395,525,635)
එකතුව	**(161,649,247)**	(290,803,108)

11.1 බදු වියදම් සැසඳීම

2023 දෙසැම්බර් 31න් අවසන් වර්ෂය සඳහා	2023 (රු.)	2022 (රු.)
බදු පෙර ලාභය/ (අලාභ)	(1,164,780,667)	147,105,580
ඉකුත් කාලයේ ප්‍රවර්තන ආදායම් බදු ගැළපීම්		
එකතු කළ: බදු අරමුණු සඳහා අඩු කළ නොහැකි වියදම්/ආදායම් අඩුකිරීම්වල බදු බලපෑම	615,883,520	566,927,276
(අඩු කළ): බදු අරමුණුවලට අඩු කළ හැකි වියදම්වල බදු බලපෑම	(606,532,475)	(150,683,823)
වත්කම් බැහැර කිරීම	885,920	-
ලාභාංශ	15,950,352	(19,189,592)
වර්ෂය සඳහා ගළපන ලද ලාභය	(1,138,593,349)	544,159,441
වර්ෂය සඳහා ලාභය මත පදනම් වූ බදු	-	146,923,049
14%ක ලාභාංශ ආදායම මත පදනම් වූ බදු	-	2,985,360
විලම්බිත බදුකරණයට/ බදුකරණයෙන් මාරු කිරීම්	(106,156,767)	(395,525,635)
පසුගිය වර්ෂයේ (අධි)/ ඌන වෙන්කිරීම්	(55,492,480)	(45,185,882)
කාලපරිච්ඡේදය සඳහා බදු වියදම්	(161,649,247)	(290,803,108)

11.2 ආදායම් ප්‍රකාශයේ හා වෙනත් විස්තීර්ණ ආදායම්වල ඇති විලම්බිත බදු (බැර)/ අයකිරීම්වල පහත සඳහන් වෙනස්කම් ඇතුළත්ය.

2023 දෙසැම්බර් 31න් අවසන් වර්ෂය සඳහා	2023 (රු.)	2022 (රු.)
විලම්බිත බදු		
දේපළ, පිරියත හා උපකරණ	(35,613,577)	(7,264,080)
සේවක ප්‍රතිලාභ බැඳීම්	179,302,267	156,548,011
හානිකරණ වෙන් කිරීම්	257,809,511	480,556,755
භාවිතය සඳහා අයිතිය ඇති වත්කම්	(1,552,645)	(2,748,015)
ණය සහන පළමු දින බලපෑම	4,154,337	5,063,781
භාවිතයට නොගත් බදු අලාභ	341,578,005	-
විලම්බිත බදු	745,677,898	632,156,452

12. අගය කිරීමේ පදනම් මත මූල්‍ය උපකරණ විශ්ලේෂණය - බැංකුව- ප්‍රවර්තන වර්ෂය (2023)

ගිණුම්කරණ ප්‍රතිපත්තිය
මූල්‍ය තත්ත්ව ප්‍රකාශය යන මාතෘකා යටතේ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතිය,"බසසී 9 හි "මූල්‍ය උපකරණ"වල අර්ථ දක්වා ඇති පරිදි කාණ්ඩ අනුව මූල්‍ය උපකරණවල ධාරණ වටිනාකම පහත සාරාංශගත කර ඇත.

රු. වලින්	ක්‍රමක්ෂය පිරිවැයට	ලාභ/ අලාභ තුළින් සාධාරණ අගයට	වෙනත් විස්තීරණ ආදායම් තුළින් සාධාරණ අගයට	එකතුව
වත්කම්				
මුදල් හා මුදල් සමාන දෑ	122,600,853	-	-	122,600,853
බැංකු තැන්පතු	2,923,132,097	-	-	2,923,132,097
ණය සහ අත්තිකාරම්	38,603,322,207	-	-	38,603,322,207
ණය උපකරණ	781,224,416	-	-	781,224,416
ප්‍රතිමිලදී ගැනීම්	970,572,268	-	-	970,572,268
භාණ්ඩාගාර බිල්පත්	9,840,233,022	-	-	9,840,233,022
භාණ්ඩාගාර බැඳුම්කර	415,464,023	-	-	415,464,023
වාණිජ පත්‍ර	155,250,000	-	-	155,250,000
ඒකක භාර	-	3,552,533,227	-	3,552,533,227
ලැයිස්තුගත නොකළ කොටස්	-	-	5,379,078	5,379,078
මුළු මූල්‍ය වත්කම්	53,811,798,887	3,552,533,227	5,379,078	57,369,711,192

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

12. අගය කිරීමේ පදනම් මත මූල්‍ය උපකරණ විශ්ලේෂණය - බැංකුව- ප්‍රවර්තන වර්ෂය (2023) (තවදුරටත්)

රු. වලින්	ක්‍රමක්ෂය පිරිවැයට	ලාභ/ අලාභ තුළින් සාධාරණ අගයට	වෙනත් විස්තීරණ ආදායම් තුළින් සාධාරණ අගයට	එකතුව
වගකීම්				
බැංකුවලට ගෙවිය යුතු	2,732,792	-	-	2,732,792
මූල්‍ය වගකීම්				
- තැම්පතුකරුවන්ට ගෙවිය යුත	52,138,134,453	-	-	52,138,134,453
- වෙනත් ණයකරුවන්ට ගෙවිය යුත	178,986,770	-	-	178,986,770
මුළු මූල්‍ය වගකීම්	52,319,854,014	-	-	52,319,854,014

AC - ක්‍රමක්ෂය පිරිවැය - ක්‍රමක්ෂය පිරිවැයට මනින ලද මූල්‍ය වත්කම්/ වගකීම්
FVPL - ලාභ හෝ අලාභ තුළින් සාධාරණ අගයට මනිනු ලබන මූල්‍ය වත්කම්/වගකීම්
FVOCI - වෙනත් විස්තීරණ ආදායම් තුළින් සාධාරණ අගයට මනිනු ලබන මූල්‍ය වත්කම්

12. අගය කිරීමේ පදනම් මත මූල්‍ය උපකරණ විශ්ලේෂණය - බැංකුව - ඉකුත් වර්ෂය (2022)

රු. වලින්	ක්‍රමක්ෂය පිරිවැයට	ලාභ/ අලාභ තුළින් සාධාරණ අගයට	වෙනත් විස්තීරණ ආදායම් තුළින් සාධාරණ අගයට	එකතුව
වත්කම්				
මුදල් හා මුදල් සමාන දෑ	126,480,437	-	-	126,480,437
බැංකු තැම්පතු	13,002,272,044	-	-	13,002,272,044
ණය හා අත්තිකාරම්	39,267,237,754	-	-	39,267,237,754
ණය උපකරණ	300,476,712	-	-	300,476,712
ප්‍රතිමිලදී ගැනීම්	70,055,770	-	-	70,055,770
භාණ්ඩාගාර බිල්පත්	1,819,859,101	-	-	1,819,859,101
භාණ්ඩාගාර බැඳුම්කර	384,601,856	-	-	384,601,856
ලැයිස්තුගත නොකළ කොටස්	-	-	5,379,078	5,379,078
මුළු මූල්‍ය වත්කම්	54,970,983,675	-	5,379,078	54,976,362,753
වගකීම්				
බැංකුවලට ගෙවිය යුතු	23,380,935	-	-	23,380,935
මූල්‍ය වගකීම්				
- ගනුදෙනුකරුවන්ට ගෙවිය යුතු	49,139,971,357	-	-	49,139,971,357
- වෙනත් ණය ගැනුම්කරුවන්ට ගෙවිය යුතු	278,050,561	-	-	278,050,561
මුළු මූල්‍ය වගකීම්	49,441,402,853	-	-	49,441,402,853

13. මුදල් සහ මුදල් සමාන දෑ

ගිණුම්කරණ ප්‍රතිපත්තිය
මුදල් හා මුදල් සමාන දෑ සඳහා වටිනාකමෙහි නොසැලකිය යුතු වෙනස්වීමේ අවදානමට යටත්වන අතැති මුදල්, බැංකුවල ඇති ශේෂ, ඒක්ෂණ මුදල් සහ කෙටිකාල දැන්වීම් අඩංගු වේ. මුදල් හා මුදල් සමාන දෑ, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ක්‍රමක්ෂය පිරිවැයෙන් හානිකරණ අඩු කර ලබා ගනී. "මූල්‍ය උපකරණ" සඳහා වන SLFRS 9 අනුව බැංකුවල ඇති ශේෂ, ඒක්ෂණ මුදල් සහ කෙටිකාල දැන්වීම් හානිකරණයට යටත් වේ.

2023 දෙසැම්බර් 31න් අවසන් වර්ෂය සඳහා	2023 (රු.)	2022 (රු.)
අතැති මුදල්	**62,943,092**	67,855,968
බැංකුවල ඇති ශේෂ	**59,657,762**	58,624,470
එකතුව	**122,600,853**	126,480,437

14. බැංකුවල ඇති තැම්පතු

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

සාධාරණ අගයේ වැදගත් නොවන මට්ටමේ වෙනස්වීමේ අවදානමකට යටත්වන බැංකුවල ඇති තැම්පතු සඳහා, තැම්පත්කර ඇති කෙටිකාලීන තැම්පතු අඩංගුවන අතර, කෙටිකාලීන බැඳීම් කළමනාකරණය කිරීම සඳහා බැංකුව සහ සමූහය ඒවා යොදා ගනු ලබයි. සුදුසු පරිදි හානිකරණය අඩුකර ඒවා මූල්‍ය ප්‍රකාශනයන්හි ප්‍රකාශිත අගයට හෝ දළ වටිනාකමට වාර්තා කරනු ලබයි. විශේෂ බැංකුවක බාහිර ශ්‍රේණිගත කිරීම මත පදනම්ව SLFRS 9 හි මූල්‍ය උපකරණවලට අනුව සමූහය විසින් හානිකරණ ප්‍රතිපාදන ගණනය කරනු ලබයි.

14.1

2023 දෙසැම්බර් 31න් අවසන් වර්ෂය සඳහා	2023 (රු.)	2022 (රු.)
ස්ථාවර තැන්පතු		
ජාතික සංවර්ධන බැංකුව		-
ජාතික කිරීමේ බැංකුව	-	2,871,326,932
මහජන බැංකුව	2,929,999,099	3,981,240,459
සණස සංවර්ධන බැංකුව	-	876,057,140
ලංකා බැංකුව	-	4,222,567,216
Call Deposit		
ලංකා බැංකුව	-	302,268,493
ඉතුරුම් ගිණුම් - ආයෝජන		
සණස සංවර්ධන බැංකුව	1,213,045	203,033,575
ජාතික සංවර්ධන බැංකුව	4,770	548,725,264
දළ එකතුව	2,931,216,914	13,005,219,079

14.2

2023 දෙසැම්බර් 31න් අවසන් වර්ෂය සඳහා	2023 (රු.)	2022 (රු.)
අදියර 1		
2023.01.01 දිනට ආරම්භක ශේෂය	2,947,034	255,230
ආදායම් ප්‍රකාශනයට අයකිරීම්/ (ආපසු ලිවීම්)	5,137,783	2,691,805
වර්ෂය තුළ ලියාහැරීම්	-	-
අනෙකුත් වෙනස්වීම්	-	-
2023.12.31 දිනට අවසාන ශේෂය	8,084,817	2,947,034
අදියර 2		
2023.01.01 දිනට ආරම්භක ශේෂය	-	993,122
ආදායම් ප්‍රකාශනයට අයකිරීම් / (ආපසු ලිවීම්)	-	(993,122)
වර්ෂය තුළ ලියාහැරීම්	-	-
අනෙකුත් වෙනස්වීම්	-	-
2023.12.31 දිනට අවසාන ශේෂය	-	-
අදියර 3		
2023.01.01 දිනට ආරම්භක ශේෂය	-	-
ආදායම් ප්‍රකාශනයට අයකිරීම් / (ආපසු ලිවීම්)	-	-
වර්ෂය තුළ ලියාහැරීම්	-	-
අනෙකුත් වෙනස්වීම්	-	-
2023.12.31 දිනට අවසාන ශේෂය	-	-
ඇ. බැංකුවල ඇති ශුද්ධ තැම්පතු	2,923,132,097	13,002,272,044

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

15. ලාභ හෝ අලාභ මගින් හඳුනාගත් මූල්‍ය වත්කම්

2023 දෙසැම්බර් 31න් අවසන් වර්ෂය සඳහා	2023 (රු.)	2022 (රු.)
ඒකක භාර (NDB)	3,552,533,227	-
එකතුව	**3,552,533,227**	-

අ. විශ්ලේෂණය

2023 දෙසැම්බර් 31න් අවසන් වර්ෂය සඳහා	2023 (රු.)	2022 (රු.)
ඇප අනුව වර්ග කිරීම		
සුරැකුම් ලෙස තබා ඇති ඇප	-	-
බැඳීම් රහිත දේපළ	3,552,533,227	-
දළ එකතුව	**3,552,533,227**	-

16. ක්‍රමක්ෂය පිරිවැය ඇති මූල්‍ය වත්කම් - ණය හා අත්තිකාරම්

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

ණය සහ අත්තිකාරම් සඳහා සක්‍රීය වෙළඳ පොළක සඳහන් කර නොමැති ස්ථාවර හෝ තීරණය කළ හැකි ගෙවීම් සහිත ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් ඇතුළත් වන අතර, වහාම හෝ නුදුරු කාලීනව විකිණීම සඳහා අදහස් කරන දෑ ඇතුළත් නොවේ. ඇතැම් වත්කම් මූලික හඳුනාගැනීමේදී ලාභ අලාභ තුළින් සාධාරණ අගයට නම් කරන අතර අනෙකුත් වත්කම් මූලික හඳුනාගැනීමේදී වෙනත් විස්තීර්ණ ආදායම තුළින් සාධාරණ අගයට මනිනු ලබන මූල්‍ය වත්කම්වලට නම් කරයි. ණය පිරිහීම හේතුවෙන් හැර, එම අයිතමය එහි මූලික ආයෝජන සියල්ලම සැලකිය යුතු ලෙස ආපසු අයකරගත නොහැක.

ණය සහ අත්තිකාරම් සඳහා බැංකු සහ වෙනත් පාරිභෝගිකයින්ට ගෙවිය යුතු වටිනාකම් අඩංගු වේ. ඉන්පසුව ණය සහ අත්තිකාරම්, මූලික ඇගයීම්වලින් පසු හානිකරණ සඳහා දීමනාවලින් අඩු කළ ඵලදායී පොලී අනුපාතය භාවිත කරමින් ක්‍රමක්ෂය පිරිවැයට ගණනය කරනු ලබයි. අත්කර ගැනීමේදී කිසියම් වට්ටමක් හෝ වාරිකයක් සහ ඵලදායී පොලී අනුපාතයේ අනිවාර්ය අංගයක්වන පිරිවැය සැලකිල්ලට ගනිමින් ක්‍රමක්ෂය පිරිවැය ගණනය කරනු ලබයි. ක්‍රමක්ෂය, ආදායම් ප්‍රකාශයේ "පොලී ආදායම"හි අඩංගු වේ. හානිකරණයෙන් ඇතිවන අලාභ, ආදායම් ප්‍රකාශයේ "ණය සහ වෙනත් අලාභයන්වල හානිකරණ ගාස්තු"වල හඳුනාගැනේ.

16.1

2023 දෙසැම්බර් 31න් අවසන් වර්ෂය සඳහා	2023 (රු.)	2022 (රු.)
දළ ණය හා අත්තිකාරම්	**41,006,647,925**	41,117,340,406
අදියර 1	**25,022,039,747**	28,514,541,265
අදියර 2	**5,325,583,522**	3,548,045,184
අදියර 3	**10,659,024,656**	9,054,753,958
(අඩු කළ): සමුච්චිත හානිකරණය	**2,389,477,929**	1,833,223,382
අදියර 1	**428,135,938**	462,950,878
අදියර 2	**431,229,101**	264,086,290
අදියර 3	**1,530,112,891**	1,106,186,214
ශුද්ධ ණය හා අත්තිකාරම්	**38,617,169,996**	39,284,117,024
අඩු කළ - ණය සහන කාල ලබාදුන් ණයවල එක් දින බලපෑම	**13,847,789**	16,879,270
ධාරණ අගයට ණය හා අත්තිකාරම්	**38,603,322,207**	39,267,237,754

16.2 විශ්ලේෂණය

2023 දෙසැම්බර් 31න් අවසන් වර්ෂය සඳහා	2023 (රු.)	2022 (රු.)
නිෂ්පාදන අනුව		
උකස්	**10,179,549,598**	10,836,307,405
සේ.අ.ඇ	**8,857,459,543**	6,644,199,224
රථවාහන	**-**	-
කාර්ය මණ්ඩල ණය	**1,208,081,194**	1,360,479,032
පුද්ගල ණය	**19,295,356,966**	20,751,939,449
වෙනත්	**1,864,188,107**	1,973,856,456
අඩුකළ -		
පළමු දින වෙනස සඳහා දීමනාව - කාර්ය මණ්ඩල ණය	**(397,987,482)**	(449,441,159)
දළ එකතුව	**41,006,647,925**	41,117,340,406
ඇප සුරැකුම් අනුව		
සුරැකුම් ලෙස රඳවාගත් ඇප	**19,037,009,141**	17,480,506,629
අනෙකුත් ණය වැඩි වීම	**21,969,638,784**	23,636,833,777
දළ එකතුව	**41,006,647,925**	41,117,340,406

16.3 වර්ෂය තුළ හානිකරණයේ සංචලනය

අරමුණුගත සාක්ෂි පවතින විට හානිකරණ අලාභයක් දැරීමට වන අවස්ථාවේදී, වත්කමේ ධාරණ අගය හා ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයන් අතර වෙනස මත පදනම්ව අලාභයේ ප්‍රමාණය ගණනය කරන අතර, වත්කමේ ධාරණ අගය අඩුකර වෙන්කිරීම් ගිණුමකට අයකරමින්, අලාභයේ ප්‍රමාණය ආදායම් ප්‍රකාශයේ දී හඳුනාගනී.

ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහවල වර්තමාන වටිනාකම, මූල්‍ය වත්කම්වල මුල් ඵලදායී පොලී අනුපාතයට වට්ටම් කරනු ලබයි. ඇපකර මූල්‍ය වත්කම්වල තක්සේරු කළ අනාගත මූල්‍ය ප්‍රවාහවල වර්තමාන අගය ගණනය කිරීමේදී විකිණීමට ඇති වටිනාකම්වල මූල්‍ය ප්‍රවාහයෙන් පෙර වරණවල පිරිවැයෙන් අඩු කළ ප්‍රමාණය සැලකිල්ලට ගනු ලබයි.

අ. සාමූහික හානිකරණ තක්සේරුව

වෙන්වෙන් වශයෙන් තක්සේරුකළ මූල්‍ය වත්කම් සඳහා හානිකරණයවීමට අරමුණුගත සාක්ෂි නොපවතින බව බැංකුව තීරණය කරන්නේ නම්, වත්කමේ නිෂ්පාදන ලක්ෂණවල සමජාතීය බව මත පදනම්ව තක්සේරු කිරීම් සිදු කරනු ලබයි. ඊට අමතරව සමාන ණය අවදානම් ලක්ෂණ සහිත මූල්‍ය වත්කම් සාමූහිකව හානිකරණ සඳහා ඇගයීමට ලක් කෙරේ.

ආ. හානිකරණවල තනි තක්සේරුකරණය

ක්‍රමක්ෂය කළ පිරිවැය යටතේ ගෙන යන මූල්‍ය වත්කම් (බැංකුවලින් ලැබිය යුතු මුදල්, ණය සහ ගනුදෙනුකරුවන්ට අත්තිකාරම් මෙන්ම මූල්‍ය වත්කම්වලට ක්‍රමක්ෂය පිරිවැය - ණය සහ වෙනත් උපකරණ වැනි) සඳහා බැංකුව පළමුවෙන් හානිකරණවල විෂයබද්ධ සාක්ෂි පවතින්නේද යන්න තනි වැදගත්කමක් ඇති මූල්‍ය වත්කම් සඳහා තනිව තක්සේරු කරන අතර, තනි වැදගත්කමක් නොමැති මූල්‍ය වත්කම් සඳහා සාමූහිකව තක්සේරු කරනු ලබයි. තනි තනිව තක්සේරු කරන ලද මූල්‍ය වත්කම් සඳහා හානිකරණ පිළිබඳ විෂයබද්ධ සාක්ෂි නොමැති බව බැංකුව තීරණය කරන්නේ නම්, වත්කම් ඊට සමාන ණය අවදානම් ලක්ෂණ සහිත මූල්‍ය වත්කම් සමූහයක දක්වනු ලබන අතර හානිකරණ සඳහා සාමූහිකව තක්සේරු කරනු ලබයි. හානිකරණ අලාභ හඳුනාගෙන ඇති හෝ නිරන්තයෙන් හඳුනාගැනෙන හානිකරණ සඳහා තනි තනිව තක්සේරු කරන ලද වත්කම්, සාමූහික තක්සේරුවකට ඇතුළත් නොවේ. හානිකරණ අලාභ සිදු වී ඇති බවට විෂයමූලික සාක්ෂි පවතී නම්, අලාභ ප්‍රමාණය මනිනු ලබන්නේ වත්කම්වල ධාරණ වටිනාකම් සහ තක්සේරු කළ අනාගත මූල්‍ය ප්‍රවාහ අතර වෙනස්කම අනුවය (තවමත් නොදැරූ ඉදිරියේදී අපේක්ෂිත ණය අලාභ හැර). හානිකරණ ප්‍රතිපාදන ගිණුමෙන් වත්කම්වල ධාරණ වටිනාකම අඩු වන අතර, අලාභ ප්‍රමාණය ආදායම් ප්‍රකාශයේ හඳුනා ගැනේ. හානිකරණ මැනීමේ අරමුණු සඳහා ඉදිරි මූල්‍ය ප්‍රවාහ වට්ටම් කිරීමට භාවිත කරන පොලී අනුපාත අනුව රැගෙන යන මුදල මත පොලී ආදායම අඛණ්ඩව උපචිත වේ. පොලී ආදායම "පොලී සහ සමාන ආදායම"හි කොටසක් ලෙස වාර්තා කරනු ලබයි. තක්සේරු කළ අනාගත මූල්‍ය ප්‍රවාහයේ වර්තමාන වටිනාකම මූල්‍ය වත්කම්වල සඵල පොලී අනුපාතයට වට්ටම් කෙරේ.

ණයක් සඳහා විචල්‍ය පොලී අනුපාතයක් ඇත්නම්, කිසියම් හානිකරණ අලාභයක් මැනීම සඳහා වට්ටම් අනුපාතය වනුයේ වත්මන් සඵල පොලී අනුපාතය වේ. බැංකුව විසින් ණය සහ ලැබිය යුතු දේ වෙත වෙළඳ වත්කම් නැවත වර්ගීකරණය කර ඇත්නම්, කිසියම් හානිකරණ අලාභයක් මැනීම සඳහා වන වට්ටම් අනුපාතය වනුයේ නැවත වර්ගීකරණ දිනයේ දී තීරණය කරනු ලබන නව සඵල පොලී අනුපාතය වේ. ඇපකරගත මූල්‍ය වත්කමක ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහවල වර්තමාන අගය ගණනය කිරීම මගින්, පෙරවරණ සම්භාව්‍යතාවක් තිබුණත් නැතත්, ඇපකරය ලබා ගැනීම සහ විකිණීම සඳහා පිරිවැය අඩුකළ පෙර වරණවලින් මූල්‍ය ප්‍රවාහයන් පිළිබිඹු කරයි. අනාගත ප්‍රතිසාධනය පිළිබඳ යථාර්ථවාදී අපේක්ෂාවක් නොමැති විට සහ සියලු ඇපකර සාක්ෂාත් කර ඇති විට හෝ බැංකුව වෙත මාරු කර ඇති විට, අදාළ දීමනාව සමඟ ණය කපා හරිනු ලැබේ. පසු වසරක දී, හානිකරණ හඳුනා ගැනීමෙන් පසු සිදු වූ සිදුවීමක් හේතුවෙන් ඇස්තමේන්තුගත හානිකරණ අලාභයේ ප්‍රමාණය වැඩි වී හෝ අඩු වී ඇත්නම්, දීමනා ගිණුම ගැළපීමෙන් කලින් හඳුනාගත් හානිකරණ අලාභ වැඩි හෝ අඩු කරනු ලැබේ. ලියා හැරීමක් පසුව අයකරගනු ලැබුවහොත්, ආපසු අයකර ගැනීම "ණය අලාභ වියදම" වෙත බැර කෙරේ.

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

16.3 ණය සහ අත්තිකාරම් ලියාහැරීම (තවදුරටත්)

ණය සහ අත්තිකාරම් ලියාහැරීම

SLFRS 9 යටතේ කපා හැරීම සඳහා වන බැංකු ගිණුම්කරණ ප්‍රතිපත්තිය බණ්ඩී 39 යටතේ පැවති ආකාරයටම පවතී. යථා තත්ත්වයට පත් වීමේ යථාර්ථවාදී අපේක්ෂාවක් නොමැති විට සාමාන්‍යයෙන් ණය (සහ අදාළ හානිකරණ දීමනා ගිණුම්) අර්ධ වශයෙන් හෝ සම්පූර්ණයෙන් ලියා හරිනු ලබන අතර ගෙවිය යුතු මුදල් අයකර ගැනීමේ දී ගත හැකි සියලු පියවර අවසන් වී ඇත. ණය සුරක්ෂිත කර ඇති විට, මෙය සාමාන්‍යයෙන් සිදුවන්නේ සුරැකුම සාක්ෂාත් කර ගැනීමෙන් ලැබෙන යම් ආදායමක් ලැබීමෙන් පසුවය. ලියා හැරිය යුතු මුදල, සමුච්චිත අලාභ දීමනාවට වඩා වැඩි නම්, වෙනස මුලින්ම සලකනු ලබන්නේ දීමනාවට එකතු කිරීමක් ලෙසය, පසුව එය දළ ධාරණ අගයට යොදනු ලැබේ. ලියා හැරීමක් පසුව අයකර ගනු ලැබුවහොත්, ප්‍රතිසාධනය "වෙනත් මෙහෙයුම් ආදායමට" බැර කෙරේ.

2023 දෙසැම්බර් 31න් අවසන් වර්ෂය සඳහා	2023 (රු.)	2022 (රු.)
අදියර 1		
2023.01.01 දිනට ආරම්භක ශේෂය	**462,950,878**	247,904,755
ආදායම් ප්‍රකාශනයට අයකිරීම් / (ආපසු ලිවීම්)	**(34,814,940)**	84,595,623
වර්ෂය තුළ ලියාහැරීම්	**-**	-
2023.12.31 දිනට අවසාන ශේෂය	**428,135,938**	462,950,878
අදියර 2		
2023.01.01 දිනට ආරම්භක ශේෂය	**264,086,290**	89,207,499
ආදායම් ප්‍රකාශනයට අයකිරීම් / (ආපසු ලිවීම්)	**167,142,810**	60,460,538
වර්ෂය තුළ ලියාහැරීම්	**-**	-
2023.12.31 දිනට අවසාන ශේෂය	**431,229,101**	264,086,290
අදියර 3		
2023.01.01 දිනට ආරම්භක ශේෂය	**1,106,186,214**	766,340,454
ආදායම් ප්‍රකාශනයට අයකිරීම් / (ආපසු ලිවීම්)	**423,926,677**	220,666,168
වර්ෂය තුළ ලියාහැරීම්	**-**	-
2023.12.31 දිනට අවසාන ශේෂය	**1,530,112,891**	1,106,186,214
එකතුව	**2,389,477,929**	1,833,223,382

17. මූල්‍ය වත්කම් ක්‍රමක්ෂය පිරිවැයට - ණය සහ අනෙකුත් උපකරණ

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

ක්‍රමක්ෂ වියදම් සහිත මූල්‍ය වත්කම් - ණය සහ අනෙකුත් උපකරණ යනු, ස්ථාවර හෝ තීරණය කළ හැකි ගෙවීම් සහ ස්ථාවර කල්පිරීමක් සහිත ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් වන අතර, ඒවා කල්පිරීම දක්වා රඳවා ගැනීමට බැංකුවට අභිප්‍රාය සහ හැකියාව ඇත. මූලික ඇගයීමෙන් පසු ක්‍රමක්ෂය පිරිවැය - ණය සහ වෙනත් උපකරණවල මූල්‍ය වත්කම, පසුව හානිකරණවලින් අඩු කළ, සඵල පොලී අනුපාත භාවිත කරමින් ක්‍රමක්ෂය පිරිවැයට ගණනය කරනු ලබයි. සඵල පොලී අනුපාතයේ වැදගත් කොටසක්වන ගාස්තු හා අත්පත් කර ගැනීමේ දී කිසියම් වට්ටමක් වාරිකයක් සැලකිල්ලට ගනිමින් ක්‍රමක්ෂය පිරිවැය ගණනය කරනු ලබයි. ආදායම් ප්‍රකාශයේ "පොලී සහ සමාන ආදායම්" තුළ හානිකරණ ගාස්තු ඇතුළත් වේ. හානිකරණ ගාස්තු යටතේ එවැනි ආයෝජන හෝ හානිකරණයෙන් පැන නගින අලාභය ආදායම් ප්‍රකාශනයේ හඳුනාගනු ලබයි.

2023 දෙසැම්බර් 31න් අවසන් වර්ෂය සඳහා	2023 (රු.)	2022 (රු.)
භාණ්ඩාගාර බිල්පත	9,840,233,022	1,819,859,101
භාණ්ඩාගාර බැඳුම්කර	415,464,023	384,601,856
ණයකර	781,224,416	300,476,712
ප්‍රති විකුණුම්	970,572,268	70,055,770
වාණිජ පත්‍රිකා	155,250,000	-
දළ එකතුව	**12,162,743,730**	2,574,993,439

17.1 විශ්ලේෂණය

2023 දෙසැම්බර් 31න් අවසන් වර්ෂය සඳහා	2023 (රු.)	2022 (රු.)
ඇප අනුව වර්ගීකරණය		
ඇප ලෙස හිලව්කළ	-	-
බැඳීම් නොමැත	12,162,743,730	2,574,993,439
දළ එකතුව	**12,162,743,730**	2,574,993,439

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

17. මූල්‍ය වත්කම් ක්‍රමක්ෂය පිරිවැයට - ණය සහ අනෙකුත් උපකරණ (තවදුරටත්)

17.2

2023 දෙසැම්බර් 31න් අවසන් වර්ෂය සඳහා	2023 (රු.)	2022 (රු.)
අදියර 3		
2023.01.01 දිනට ආරම්භක ශේෂය	-	-
ආදායම් ප්‍රකාශය වෙත අයකිරීම/(ආපසු ලිවීම)	-	-
වර්ෂය තුළ කපා හැරීම	-	-
වෙනත් වෙනස්වීම්	-	-
2023.12.31 දිනට අවසන් ශේෂය	-	-
ඇග ශුද්ධ මූල්‍ය වත්කම් ක්‍රමක්ෂය පිරිවැයට	**12,162,743,730**	2,574,993,439

18. අනෙකුත් විස්තීර්ණ ආදායම් තුළින් සාධාරණ අගයට ඇති මූල්‍ය වත්කම්

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

අනෙකුත් විස්තීර්ණ අදායම තුළින් සාධාරණ අගයට ඇති මූල්‍ය වත්කම් යටතේ ස්කන්ධ හා ණය සුරුකුම් වර්ගීකරණය කරනු ලබයි. අනෙකුත් විස්තීර්ණ අදායම තුළින් සාධාරණ අගය ලෙස වර්ගීකරණය කරනු ලබන ස්කන්ධ ආයෝජන යනු උපායමාර්ගික ආයෝජන ලෙස රඳවාගත් දෑය. මෙම කාණ්ඩයේ ණය සුරුකුම්පත් අවිනිශ්චිත කාල පරිච්ඡේදයක් සඳහා රඳවා ගැනීමට අදහස් කරන දෑ වන අතර ද්‍රවශීලතාවේ අවශ්‍යතාවලට ප්‍රතිචාර වශයෙන් හෝ වෙළඳ පොළ තත්ත්වයන්වල වෙනස්කම් සඳහා ප්‍රතිචාර වශයෙන් අලෙවි කළ හැකිය.

වෙනත් විස්තීරණ ආදායම තුළින් ස්කන්ධ සාධන පත්‍ර සාධාරණ වටිනාකම

බැංකුව විසින් "මූල්‍ය උපකරණ: ඉදිරිපත් කිරීම" මත LKAS 32 යටතේ කොටස් අර්ථ දැක්වීම සපුරාලන විට සහ වෙළඳාම සඳහා රඳවා නොගන්නා විට වෙනත් විස්තීර්ණ ආදායමක් හරහා සාධාරණ වටිනාකම යටතේ ඇතැම් ස්කන්ධ ආයෝජන වර්ගීකරණය කළ යුතුය. එවැනි වර්ගීකරණ උපකරණ - උපකරණ පදනම යටතේ සිදු කරනු ලබයි.

වෙනත් විස්තීර්ණ ආදායම් හරහා සාධාරණ අගයට මූල්‍ය වත්කම්

2023 දෙසැම්බර් 31න් අවසන් වර්ෂය සඳහා	2023 (රු.)	2022 (රු.)
ලැයිස්තුගත නොකළ කොටස්		
ණය තොරතුරු කාර්යාංශය	**4,754,078**	4,754,078
ෆිච් ශ්‍රේණිගත කිරීම්	**625,000**	625,000
දළ එකතුව	**5,379,078**	5,379,078
අ. විශ්ලේෂණය		
ඇප අනුව වර්ගකිරීම		
ඇප ලෙස හිලව්කළ	-	-
බැඳීම් නොමැත	**5,379,078**	5,379,078
දළ එකතුව	**5,379,078**	5,379,078

19. දේපළ, පිරියත සහ උපකරණ

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

හඳුනා ගැනීමේ පදනම

වත්කම සමඟ තිබියහැකි අනාගත ප්‍රතිලාභ බැංකුව වෙත ගලා ඒමට සම්භාවිතාවක් තිබේ නම් සහ වත්කම් පිරිවැය විශ්වාසදායක ලෙස මැනිය හැකි නම් දේපළ, පිරියත සහ උපකරණ හඳුනාගනු ලබයි. වත්කම් අත්පත්කර ගැනීම සඳහා සෘජුවම අදාළ කර ගත හැකි පිරිවැය ඇතුළත්ව දේපළ, පිරියත සහ උපකරණ මූලිකව පිරිවැයට ගණනය කරනු ලබයි.

තක්සේරුකරණ පදනම

වත්කමක් ලෙස හඳුනාගැනීමට සුදුසුවන දේපළ, පිරියත සහ උපකරණ අයිතමයක් මූලිකවම පිරිවැයට තක්සේරු කරනු ලබයි. වත්කම් අත්පත් කර ගැනීම සහ පසුකාලීන වියදම් සඳහා සෘජුවම ආරෝපණය කළ හැකි වියදම් පිරිවැයට ඇතුළත් වේ. ස්වයං-සාදන ලද වත්කම් සඳහා ද්‍රව්‍යවල පිරිවැය සහ සෘජු ශ්‍රමය, වත්කම එහි අපේක්ෂිත භාවිතය සඳහා ක්‍රියාකාරී තත්ත්වයට ගෙන ඒම සඳහා සෘජුවම ආරෝපණය කළ හැකි වෙනත් ඕනෑම පිරිවැයක් සහ අයිතම විසුරුවා හැරීමට සහ ඉවත් කිරීමට සහ ඒවා පිහිටා ඇති සහ ණය ගැනීමේ පිරිවැය ප්‍රාග්ධනීකරණය කර ඇති වෙබ් අඩවිය ප්‍රතිසංස්කරණය කිරීමට යන පිරිවැය ඇතුළත් වේ.

පිරිවැය මාදිලිය

බැංකුව සිත්නක්කර ඉඩම් සහ ගොඩනැගිලි හැර දේපළ, කම්හල් සහ උපකරණ සඳහා පිරිවැය ආකෘතිය අදාළ කරන අතර ඒ මත සිදුවන වියදම්වලින් අඩු කළ සමුච්චිත ක්ෂය සහ සමුච්චිත හානිකරණ අලාභ සමඟ මිලදී ගැනීමේ හෝ ඉදිකිරීමේ පිරිවැයේ වාර්තා කරයි.

19.1.අ. දේපළ, පිරියත සහ උපකරණ

රුපියල් වලින්	මෝටර් රථ	ගෘහ භාණ්ඩ සහ උපාංග සහ කාර්යාල උපකරණ	පරිගණක උපකරණ	පරිගණක මෘදුකාංග	වෙබ් අඩවි සංවර්ධනය	එකතුව
2023 (වර්තමාන වසර						
පිරිවැය / සාධාරණ අගය						
2023.01.01 දිනට ආරම්භක ශේෂය	70,798,254	168,969,165	167,010,505	4,395,518	460,000	411,633,442
එකතු කිරීම්	-	9,022,113	12,722,520	-	92,844,755	114,589,387
බැහැරකිරීම් / ගැළපීම්	-	(4,284,184)	(2,398,948)	-	-	(6,683,132)
ගැළපීම්	-	-	-	-	-	-
2023.12.31 දිනට අවසාන ශේෂය	70,798,254	173,707,095	177,334,076	4,395,518	93,304,755	519,539,697
(අඩු කළ): සමුච්චිත ක්ෂය කිරීම						
2023.01.01 දිනට ආරම්භක ශේෂය	70,798,254	121,468,661	136,740,714	4,395,518	17,486	333,420,634
වර්ෂය සඳහා අයකිරීම	-	11,254,465	9,696,018	-	57,500	21,007,983
බැහැරකිරීම් / ගැළපීම්	-	(4,141,136)	(2,398,948)	-	-	(6,540,084)
ගැළපීම්	-	-	-	-	-	-
2023.12.31 දිනට අවසාන ශේෂය	70,798,254	128,581,991	144,037,784	4,395,518	74,986	347,888,533
2023.12.31. දිනට ශුද්ධ පොත් අගය	-	45,125,104	33,296,292	-	93,229,768	171,651,164

රුපියල් වලින්	මෝටර් රථ	ගෘහ භාණ්ඩ සහ උපාංග සහ කාර්යාල උපකරණ	පරිගණක උපකරණ	පරිගණක මෘදුකාංග	වෙබ් අඩවි සංවර්ධනය	එකතුව
2022 (පෙර වසර)						
පිරිවැය / සාධාරණ අගය						
2022.01.01 දිනට ආරම්භක ශේෂය	70,798,254	157,416,485	142,496,324	4,395,518	-	375,106,581
වර්ෂය සඳහා අයකිරීම	-	13,646,740	26,282,918	-	460,000	40,389,658
බැහැරකිරීම් / ගැළපීම්	-	(2,094,060)	(1,768,737)	-	-	(3,862,797)
ගැළපීම්	-	-	-	-	-	-
2023.12.31 දිනට අවසාන ශේෂය	70,798,254	168,969,165	167,010,505	4,395,518	460,000	411,633,442
(අඩු කළ): සමුච්චිත ක්ෂය කිරීම						
2022.01.01 දිනට ආරම්භක ශේෂය	70,798,254	112,487,293	131,569,752	4,395,518	-	319,250,817
වර්ෂය සඳහා අයකිරීම	-	11,037,212	6,939,699		17,486	17,994,398
බැහැරකිරීම් / ගැළපීම්	-	(2,092,564)	(1,768,737)	-	-	(3,861,301)
ගැළපීම්	-	36,720	-	-	-	36,720
2022.12.31 දිනට අවසාන ශේෂය	70,798,254	121,468,661	136,740,714	4,395,518	17,486	333,420,634
2022.12.31. දිනට ශුද්ධ පොත් අගය	-	47,500,504	30,269,790	-	442,514	78,212,808

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

19. දේපළ, පිරියත සහ උපකරණ (තවදුරටත්)

19.2 තවමත් භාවිතයේ පවතින සම්පූර්ණයෙන්ම ක්ෂය වූ දේපළ

තවමත් භාවිතයේ පවතින සම්පූර්ණයෙන්ම ක්ෂය වූ දේපළ, පිරියත සහ උපකරණ පහත පරිදි වේ.

දෙසැම්බර් 31 දිනට	2023 (රු.)	2022 (රු.)
වාහන	70,798,254	70,798,254
ගෘහ භාණ්ඩ සහ උපාංග සහ කාර්යාල උපකරණ	93,852,701	83,134,589
පරිගණක උපකරණ	120,030,133	122,429,081
පරිගණක මෘදුකාංග	4,395,518	4,395,518
එකතුව	**289,076,606**	280,757,442

19.3 තාවකාලික අක්‍රිය දේපළ, පිරියත සහ උපකරණ

වාර්තාකරණ දිනය වන විට තාවකාලික අක්‍රිය දේපළ, පිරියත සහ උපකරණ නොමැත.

19.4 සක්‍රිය භාවිතයෙන් ඉවත් කළ දේපළ, පිරියත සහ උපකරණ

SLFRS 5 ප්‍රකාරව විකිණීමට තබා ඇති - විකුණුම් සහ අත්හිටවූ මෙහෙයුම් සඳහා තබා ඇති ජංගම නොවන වත්කම් ලෙස වර්ගීකරණය නොකළ ක්‍රියාකාරී භාවිතයෙන් ඉවත් කළ දේපළ, පිරියත සහ උපකරණ නොතිබුණි.

20. විලම්බිත බදු වත්කම් / (වගකීම්)

ගිණුම්කරණ ප්‍රතිපත්තිය
විලම්බිත බදු පිළිබඳ ගිණුම්කරණ ප්‍රතිපත්තිය සටහන් අංක 11හි එළිදරව් කර ඇත.

2023 දෙසැම්බර් 31න් අවසන් වර්ෂය සඳහා	2023 (රු.)	2022 (රු.)
2023.01.01 ආරම්භක ශේෂය	**632,156,451**	222,859,204
අදාළ වසර සඳහා අය කිරීම		
- ලාභ/ (අලාභ) තුළින් හඳුනාගත් වසර සඳහා අය කිරීම්	106,156,767	339,810,834
- ලාභ/ (අලාභ) - බදු අනුපාතවල වෙනස්කම් මත බලපෑම	-	55,714,801
- වෙනත් විස්තීර්ණ ආදායම් (30% භාවිත කළ)	7,364,679	13,771,613
2023.12.31 දිනට අවසාන ශේෂය	**745,677,898**	632,156,451

21. වෙනත් වත්කම්

2023 දෙසැම්බර් 31න් අවසන් වර්ෂය සඳහා	2023 (රු.)	2022 (රු.)
ලිපි ද්‍රව්‍ය තොගය	15,038,906	14,174,317
තැම්පතු හා කලින් ගෙවීම්	35,210,838	2,067,702
කලින් ගෙවූ සේවක ණය	397,987,482	449,441,159
VAT අයවිය යුතු	27,952,433	-
NBT අයවිය යුතු	3,603,588	3,603,588
DRL අයවිය යුතු	15,591,023	15,591,023
WHT අයවිය යුතු	113,160,349	-
SSCL අයවිය යුතු	3,321,741	
ණය සහන පොලිය මත 7% ක ලැබිය යුතු පොලිය	6,209,879	6,742,821
අයවිය යුතු පොලිය - ජෙජ්ඨ පුරවැසි ස්ථිර තැම්පතු	-	571,719,963
වෙනත්	4,874,997	13,135,684
එකතුව	**622,951,236**	1,076,476,258

22. බැංකුවලට ගෙවිය යුතු

2023 දෙසැම්බර් 31න් අවසන් වර්ෂය සඳහා	2023 (රු.)	2022 (රු.)
ණය ගැනීම් (අයිරා)	2,732,792	23,380,935
නැවත මිලදී ගැනීමේ ගිවිසුම්	-	-
එකතුව	2,732,792	23,380,935

23. ක්‍රමක්ෂය පිරිවැයට ඇති මූල්‍ය වගකීම්

ගිණුම්කරණ ප්‍රතිපත්තිය
තැම්පත්කරුවන්ට ගෙවිය යුතු මුදල් සඳහා තැන්පතු හා කාල තැන්පතු අඩංගු වේ. මූලික හඳුනාගැනීමෙන් පසු තැම්පතු වනුයේ,

2023 දෙසැම්බර් 31න් අවසන් වර්ෂය සඳහා	2023 (රු.)	2022 (රු.)
තැම්පත්කරුවන්ට ගෙවිය යුතු	52,138,134,453	49,139,971,357
නැවත මිලදී ගැනීමේ ගිවිසුම්	-	-
වෙනත් ණයට ගැනීම්	178,986,770	278,050,561
එකතුව	52,317,121,222	49,418,021,919

23.1 තැම්පතුකරුවන්ට ගෙවියයුතු වටිනාකම් විශ්ලේෂණය

2023 දෙසැම්බර් 31න් අවසන් වර්ෂය සඳහා	2023 (රු.)	2022 (රු.)
නිෂ්පාදන අනුව		
ඉතුරුම් තැම්පතු	2,202,016,436	2,019,713,462
ස්ථාවර තැම්පතු	49,323,667,095	46,114,086,448
වෙනත් තැම්පතු (යෝජනා ක්‍රම)	612,450,922	1,006,171,448
එකතුව	52,138,134,453	49,139,971,357

23.2 වෙනත් ණයට ගැනීම් විශ්ලේෂණය

2023 දෙසැම්බර් 31න් අවසන් වර්ෂය සඳහා	2023 (රු.)	2022 (රු.)
බැංකු ණය	-	-
AHF	-	(2)
මහ බැංකුවේ ප්‍රතිමූල්‍ය ණය	22,029,668	79,948,078
කල්බදු වගකීම්	156,957,101	198,102,485
එකතුව	178,986,770	278,050,561

24. සේවක ප්‍රතිලාභ

ප්‍රක්ෂේපිත ඒකක ණය ක්‍රමය භාවිත කරමින් ආයුගණක උපදේශන සමගින් නිශ්චිත ප්‍රතිලාභ සැලසුමක්වන නිශ්චිත ප්‍රතිලාභ වගකීමෙහි (PVDBO) වර්තමාන අගය බැංකුව තක්සේරු කරයි.

වට්ටම් කිරීමේ අනුපාතය, අපේක්ෂිත වත්කම් මත ඉපැයීම් අනුපාතය, අනාගත වැටුප් වැඩිවීම් සහ මරණ අනුපාතය ආදිය පිළිබඳ උපකල්පනයන් මත මෙම අරමුදලේ ආයුගණක තක්සේරු කිරීම් පදනම්ව ඇත. මෙම සැලසුම්වල දීර්ඝකාලීන ස්වරූපය හේතුවෙන් එම ඇස්තමේන්තු කිරීම් සැලකියයුතු අවිනිශ්චිතතාවයන්ට ලක් වේ. Actuarial & Management Consultants (Pvt) Ltd විසින් සිදු කරන ලද 2023 දෙසැම්බර් 31 දිනට ක්‍රියාකාරී තක්සේරු වාර්තාව මත පදනම්ව 2023 දෙසැම්බර් 31 දිනට සේවක ප්‍රතිලාභ වගකීම ගණනය කරනු ලබයි.

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

24. සේවක ප්‍රතිලාභ (තවදුරටත්)

ආයුගණක විසින් භාවිත කරන ප්‍රධාන උපකල්පනවලට පහත දැ ඇතුළත් වේ.

2023 දෙසැම්බර් 31න් අවසන් වර්ෂය සඳහා	2023 (රු.)	2022 (රු.)
පොලී අනුපාතය	13.00%	18.00%
වැටුප් වැඩිවීමේ අනුපාතය	10.00%	10.00%
විශ්‍රාම ගැනීමේ වයස	55-60 years	55-60 years

2023 දෙසැම්බර් 31න් අවසන් වර්ෂය සඳහා	2023 (රු.)	2022 (රු.)
පාරිතෝෂිකය සඳහා වෙන් කිරීම		
වර්ෂයේ ආරම්භක ශේෂය	245,562,689	212,239,593
ප්‍රවර්තන සේවා වියදම	15,341,305	16,945,554
පොලී වියදම	44,201,284	24,407,553
ප්‍රතිලාභ ගෙවීම්	(45,509,997)	(18,589,241)
ආයුගණක (ලාභ)/අලාභ	32,283,252	10,559,230
එකතුව	291,878,533	245,562,689

නිශ්චිත ප්‍රතිලාභ වගකීම්වල වර්තමාන අගයේ සංවේදීතාවය විශ්ලේෂණය කිරීම

වෙනස් වූ උපකල්පන (අනෙකුත් සියලුම උපකල්පන නොවෙනස්ව පවතින විට)	PV-DBO (රු.)	PV-DBO (රු.)
වට්ටම් අනුපාතයේ සියයට එකක් (+1%) වැඩිවීම	275,457,498	234,841,503
වට්ටම් අනුපාතයේ සියයට එකක් (+1%) වැඩිවීම	310,420,576	257,416,374
වේතන වැටුප් වැඩිවීමේ අනුපාතයේ සියට එකක (+1%) වැඩිවීම	312,316,801	259,314,946
වේතන වැටුප් වැඩිවීමේ අනුපාතයේ සියට එකක (+1%) වැඩිවීම	273,530,916	232,988,743

2023.12.31 දිනට පාරිතෝෂික ප්‍රතිපාදනයේ කල්පිරීමේ සාරාංශය

වයස් කාණ්ඩය	සේවකයින් ගණන	මුළු මූලික වැටුප (රු.)	මුළු ජීවන වියදම් දීමනාව (රු.)	ඉදිරි වැඩ කාලයේ සාමාන්‍යය	මුළු ප්‍රතිපාදන (PV-DBO) (රු.)
XV: 20 to 24	5	124,795	64,129	18.5	82,076
XV: 25 to 29	42	1,351,595	1,282,572	17.3	3,209,475
XV: 30 to 34	75	3,718,835	4,809,644	16.2	22,204,878
XV: 35 to 39	59	4,376,295	3,783,587	13.9	30,075,016
XV: 40 to 44	56	4,410,860	3,591,201	11.6	39,835,728
XV: 45 to 49	47	4,231,465	3,014,044	9.0	49,191,301
XV: 50 to 54	34	3,344,915	2,180,372	5.7	53,209,424
XV: 55 to 59	36	3,902,960	2,308,629	2.2	94,070,635
එකතුව	354	25,461,720	21,034,178	12.0	291,878,533

වෛද්‍යාධාර

වෛද්‍යාධාර සඳහා වෙන්කිරීම	2023 (රු.)	2022 (රු.)
වර්ෂය ආරම්භයේදී ශේෂය	276,264,014	225,349,295
ප්‍රවර්තන සේවා පිරිවැය	4,386,865	5,077,880
පොලී පිරිවැය	49,727,522	25,915,169
ආයුගණක (ලාභ) / (අලාභ)	(7,734,321)	35,346,147
ගෙවූ ප්‍රතිලාභ	(16,848,390)	(15,424,477)
එකතුව	305,795,690	276,264,014
සේවක ප්‍රතිලාභ වගකීම් එකතුව	597,674,223	521,826,703

ප්‍රතිලාභ වගකීමේ වර්තමාන අගය පිළිබඳ සංවේදීතා විශ්ලේෂණය

කාණ්ඩ	+1% වට්ටම් අනුපාතය PV-DBO (රු.)	-1% වට්ටම් අනුපාතය PV-DBO (රු.)
ක්‍රියාකාරී සේවකයින් - විශ්‍රාමික වෛද්‍ය ප්‍රතිලාභ (වෛද්‍ය අරමුදල)	99,937,988	143,656,110
විශ්‍රාමිකයන් - වෛද්‍ය ප්‍රතිලාභ (වෛද්‍ය අරමුදල)	172,695,706	202,845,191
එකතුව	272,633,694	346,501,301

25. වෙනත් වගකීම්

ගිණුම්කරණ ප්‍රතිපත්තිය
අනෙකුත් වගකීම් සඳහා ගාස්තු හා වියදම්, බදු ගෙවිය යුතු නොපැවැරූ ගනුදෙනුකරුවන්ගේ ලැබීම්, නිවාඩු සඳහා මුදල් ගෙවීම් සහ වෙනත් වියදම් ගිණුම්වල සිදුකර ඇති වෙන්කිරීම් ඇතුළත් වේ. වාර්තාකරණ දිනට ගෙවියයුතු ලෙස අපේක්ෂා කරන වටිනාකම් තුළ මෙම වගකීම් වාර්තා කර ඇත.

2023 දෙසැම්බර් 31න් අවසන් වර්ෂය සඳහා	2023 (රු.)	2022 (රු.)
ගෙවියයුතු බදු	35,637,120	22,567,182
උපචිත වියදම්	93,706,978	82,307,504
වෙනත් වගකීම්	72,562,152	88,231,424
බූදල නැවතගෙවීමේ ණයහිමි	12,006,515	19,857,397
ආන්තික ගිණුම- ETF මණ්ඩලය සඳහා SP ණය	343,156,868	58,400,108
ආන්තික ගිණුම	98,776,709	67,720,997
ආන්තික ගිණුම - අපද්‍රව්‍ය කළමනාකරණය	25,552,215	25,072,048
ගනුදෙනුකරුවන්ට ආපසු ගෙවීම්- වැසූ ණය මුදල	13,414,849	29,073,781
එකතුව	694,813,406	393,230,439

25.1 බදු ගෙවියයුතු

2023 දෙසැම්බර් 31න් අවසන් වර්ෂය සඳහා	2023 (රු.)	2022 (රු.)
උපයනවිට ගෙවීම් බදු	7,161,290	2,172,154
WHT ගෙවියයුතු	21,485,961	(0)
VAT ගෙවියයුතු	6,989,869	17,016,191
SSCL ගෙවියයුතු	-	3,378,836
ගෙවියයුතු බදු	35,637,120	22,567,182
ගෙවිය යුතු ආදායම් බදු		
ආරම්භක ශේෂය	134,000,281	115,088,376
වර්ෂය සඳහා ප්‍රතිපාදන	-	149,908,409
අධි/(ඌන) ප්‍රතිපාදන	(55,492,480)	(45,185,882)
ගෙවූ ආදායම් බදු	(78,507,801)	(85,810,622)
අවසන් ශේෂය	(0)	134,000,281

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

26. ප්‍රකාශිත ප්‍රාග්ධනය / වෙන් කළ ප්‍රාග්ධනය

2023 දෙසැම්බර් 31න් අවසන් වර්ෂය සඳහා	2023 (රු.)	2022 (රු.)
බලයලත් ප්‍රාග්ධනය	**2,000,000,000**	2,000,000,000
දායක ප්‍රාග්ධනය	**889,812,899**	889,812,899

1975 අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ ප්‍රතිපාදන සහ එහි සංශෝධනයන්ට අනුව බලය ලත් ප්‍රාග්ධනය රු. බිලියන 2කි. කෘෂිකාර්මික හා කාර්මික ණය සංස්ථා අඥා පනතේ වගන්ති අංක 22 අනුව කෘෂිකාර්මික හා කාර්මික ණය සංස්ථාව වෙත 1976 ජනවාරි 1වැනි දිනට ලබා දුන් අත්තිකාරම්වල හිඟ මුදල් වලින් සහභාගීත්ව ප්‍රාග්ධනය සමන්විත වේ. එමෙන්ම කෘෂිකාර්මික හා කාර්මික ණය සංස්ථාව යටතේ වන සංචිත සහ 1979 ජනවාරි 01 දිනට ලංකා රාජ්‍ය උකස් බැංකුවට අයත් ණය සංචිතය ද බැංකුවේ ප්‍රාග්ධනයෙන් කොටසක් වෙයි. එය බැංකුවේ ආරම්භක ප්‍රාග්ධනය නියෝජනය කරන අතර, එවැනි සියලුම මුදල් රජය විසින් බැංකුවේ ප්‍රාග ධනයට ලැබෙන දායකත්වය ලෙස සලකනු ලැබේ.

1979 ජනවාරි 1 දිනට පසුව රජය විසින් බැංකුවේ ප්‍රාග්ධනය සඳහා දායකත්වයක් ලබා දී ඇති අතර, එම දායකත්වය සහ ඉහත ඡේදයෙන් සඳහන් කරන ලද ප්‍රාග්ධන යෙදවීම් ද ඇතුළු සමස්ථ ප්‍රාග්ධන යෙදවීම 2023 දෙසැම්බර් 31 දිනට රු. 889,812,899ක් විය.

තවද පනතෙහි අදාළ ප්‍රතිපාදනයන්ට අනුව, රාජ්‍ය උකස් සහ ආයෝජන බැංකුව, එහි ප්‍රාග්ධන වෙත අමතර දායකත්වයක් ලෙස එවැනි අරමුදලක් කලින් කලට යෙදවීම සිදු කරන අතර රජයෙන් හෝ වෙනත් ප්‍රභවයකින්, ශ්‍රී ලංකා ජනරජයෙන් හෝ ඉන් පිටතින් බැංකුව සුදුසුයි තීරණය කරන පරිදි සිදුකරනු ලබයි. රජය වෙතින් යෙදවූ එවැනි අරමුදල්, ඒකාබද්ධ අරමුදල මත අයකරනු ලබයි.

27. ව්‍යවස්ථාපිත සංචිත අරමුදල

2023 දෙසැම්බර් 31න් අවසන් වර්ෂය සඳහා	2023 (රු.)	2022 (රු.)
ජනවාරි 1 දිනට ආරම්භක ශේෂය	**306,650,839**	296,560,939
වර්ෂය තුළ මාරු කිරීම්	**-**	10,089,900
දෙසැම්බර් 31 දිනට අවසන් ශේෂය	**306,650,839**	306,650,839

28. රඳවාගත් ඉපයීම්

2023 දෙසැම්බර් 31න් අවසන් වර්ෂය සඳහා	2023 (රු.)	2022 (රු.)
ජනවාරි 1 දිනට ආරම්භක ශේෂය	**4,200,211,965**	4,019,389,735
පෙර කාලසීමාවේ ගැළපීම්	**-**	21,247,904
හානිකරණය පළමු දින ගැළපීම	**-**	-
අනෙකුත් විස්තරාත්මක ආදායමේ සංචිත මාරු කිරීම	**-**	-
වර්ෂය සඳහා ලාභය	**(1,003,131,419)**	201,797,990
වෙනත් සංචිත වලට මාරු කිරීම්	**-**	(10,089,900)
අනෙකුත් විස්තීරණ ආදායම්	**(17,184,252)**	(32,133,764)
ගෙවිය යුතු ලාභාංශ බදු	**-**	-
දෙසැම්බර් 31 දිනට අවසන් ශේෂය	**3,179,896,294**	4,200,211,965
පෙර කාල සීමාවේ ගැළපීම්		
වගකීම් ප්‍රතිපාදන යටතේ ඉක්මවා යාම හේතුවෙන් ඇති වූ දෝෂ	**-**	22,111,034
සමුච්චිත ක්ෂයවීම් ප්‍රතිපාදනය මත	**-**	(36,720)
ලැබිය යුතු පොලී ආපසු හැරවීම හේතුවෙන් ඇති වූ දෝෂ	**-**	
නොගැළපෙන පාලන හිඟුම	**-**	(826,410)
එකතුව	**-**	21,247,904

29. වෙනත් සංචිත

අ. බැංකුව - ප්‍රවර්තන වසර (2023)

සංචිතය	2023/01/01 දිනට ආරම්භක ශේෂය	සංචලන/ පැවරීම්	2023/12/31 දිනට අවසාන ශේෂය
පොදු සංචිතය	683,280,000	-	683,280,000
ප්‍රාග්ධන සංචිතය	393,498,004	-	393,498,004
හිමිකම් සුරක්ෂිත අරමුදල	1,031,000	-	1,031,000
එකතුව	1,077,809,004	-	1,077,809,004

29.1

ආ. බැංකුව - පෙර වසර (2022)

සංචිතය	2022/01/01 දිනට ආරම්භක ශේෂය	සංචලන/ පැවරීම්	2022/12/31 දිනට අවසාන ශේෂය
පොදු සංචිතය	683,280,000	-	683,280,000
ප්‍රාග්ධන සංචිතය	393,498,004	-	393,498,004
හිමිකම් සුරක්ෂිත අරමුදල	1,031,000	-	1,031,000
එකතුව	1,077,809,004	-	1,077,809,004

30. අසම්භාව්‍ය වගකීම් හා බැඳීම්

ගිණුම්කරණ ප්‍රතිපත්තිය
ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති LKAS 37 හි අසම්භාව්‍ය වගකීම් හා අසම්භාව්‍ය වත්කම් ප්‍රතිපාදනයන්ගේ නිර්වචනය කර ඇති පරිදි, ආර්ථික ප්‍රතිලාභ මාරු කිරීම් කළ නොහැකි හෝ විශ්වාසදායක ලෙස තක්සේරු කළ නොහැකි, අවිනිශ්චිත අනාගත සිදුවීමක් හෝ වර්තමාන බැඳීම්වලින් පමණක් පැවැත්ම තහවුරු කරනු ලබන, වියහැකි බැඳීම් අසම්භාව්‍ය වත්කම් නම් වේ.

ගනුදෙනුකරුවන්ගේ මූල්‍ය අවශ්‍යතා ඉටුකිරීම පිණිස බැංකුව විවිධ වෙනස්කළ නොහැකි බැඳීම් හා අසම්භාව්‍ය වගකීම්වලට ඇතුළත් වෙයි. මේ සඳහා මූල්‍ය ඇපකර හා ණය දීම සඳහා වෙනත් ආදාන නොකළ බැඳීම් ඇතුළත් වේ.

2023 දෙසැම්බර් 31න් අවසන් වර්ෂය සඳහා	2023 (රු.)	2022 (රු.)
නිකුත් කර ඇති ඇපකර	-	350,000
වෙනත් බැඳීම්	62,395,844	40,802,056
එකතුව	62,395,844	41,152,056

බැංකුවේ සාමාන්‍ය ව්‍යාපාරික කටයුතුවල දී එහි ගනුදෙනුකරුවන් වෙනුවෙන් විවිධ වූ බැඳීම් ඇති කර ගන්නා අතරම, එය නෛතික රාමුව තුළ එවැනි අසම්භාව්‍ය වගකීම්ද ඇති කර ගනු ලබයි. මෙම ගනුදෙනුවල ප්‍රතිඵලයක් ලෙස සැලකිය යුතු අලාභයක් බලාපොරොත්තු නොවනු ඇත.

දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් පහත තක්සේරු බැංකුව වෙත ලැබී ඇත.

2020/2021 වරිපනම් වර්ෂය සඳහා ආදායම් බදු සඳහා භාවිතා කරන ලද තොරතුරු ඉල්ලා ඇති අතර පියවීම සඳහා සාකච්ඡා සිදුවෙමින් පවතී. දැනට අභියාචනාධිකරණ අදියරේ පවතින නමුත්, පියවීමේ ක්‍රියාවලියේ පවතින පහත බදු තක්සේරුව කැපී පෙනේ.

කාල සීමාව / බදු වර්ගය	ගාස්තු අංකය	තක්සේරු අගය	වත්මන් තත්ත්වය
2018/2019 - ආදායම් බදු	0201819002	(5,191,892.28)	අභියාචනාධිකරණය
2018/2019 - FS මත වැට් බද්ද	7501920002	2,886,900.00	සාකච්ඡා සිදුවෙමින් පැවතුනි
2018/2019 - ණය ආපසු ගෙවීමේ බද්ද	DRL/1920/70/D41/16	1,128,594.00	සාකච්ඡා සිදුවෙමින් පැවතුනි

කළමනාකාරිත්ව ඇගයීම සහ විනිශ්චය අනුව ඉහත සඳහන් කළ තක්සේරු වලින් කිසිදු අමතර බදු වගකීමක් ඇති නොවේ.

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

31. සම්බන්ධිත පාර්ශව එළිදරවු කිරීම්

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති LKAS 24 හි "සම්බන්ධිත පාර්ශව එළිදරව් කිරීම්" යටතේ සම්බන්ධිත පාර්ශව ලෙස අර්ථ දක්වා ඇති සම්බන්ධිත පාර්ශව සමග එනම් ශ්‍රී ලංකා රජය, අනුබද්ධ සමාගම්, බැංකුවේ සේවකයින් සඳහාවන පශ්චාත් සේවක ප්‍රතිලාභ සැලසුම් සහ ප්‍රධාන කළමනාකරණයේ නිලධාරීන් (KMP) සමඟ වාණිජ අනුපාතයන්ට අතේ දුරින් පදනම මත සාමාන්‍ය ව්‍යාපාර කටයුතු සිදු කිරීමේදී බැංකුව ගනුදෙනු සිදු කරනු ලබයි. මෙකී ගනුදෙනු සඳහා සාමාන්‍ය ව්‍යාපාරවලදී වාණිජ අනුපාත යටතේ අතේ දුරින් සිදු කරනු ලබන ණයදීමේ ක්‍රියාකාරකම්, ස්ථාපන, ශේෂ පත්‍රයෙන් බැහැර ගනුදෙනු සහ වෙනත් බැංකු සහ මූල්‍ය සේවා සැපයීම ඇතුළත්වන අතර, ප්‍රධාන කළමනාකරණයේ නිලධාරීන් විසින් සිදු කරන ගනුදෙනු සහනදායී මිල ගණන් මත සියලු කාර්ය මණ්ඩල සඳහා ඒකාකාරව අදාළ වන යෝජනා ක්‍රම යටතේ ලබාගෙන ඇත. සම්බන්ධිත පාර්ශව සමඟ ගනුදෙනු පිළිබඳ විස්තර පහත වගුවේ දක්වා ඇත.

31.1 ශ්‍රී ලංකා රජය (මව්) සමාගම හා රජය මගින් පාලනය කරන ආයතන සමඟ ගනුදෙනු

2023 දෙසැම්බර් 31න් අවසන් වර්ෂය සඳහා	2023 (රු.)	2022 (රු.)
රජයේ සුරැකුම් මත සිදුකළ ආයෝජන	10,255,697,045	2,112,448,122
රජය සහ රජය මගින් පාලනය වන ආයතන වෙත සිදු කළ ආයෝජන	3,711,223,515	11,677,879,812
නැවත විකුණුම් ගිවිසුම් යටතේ මිලදී ගත් සුරැකුම්පත්	970,572,268	70,055,770
රජයෙන් ලැබිය යුතු වෙනත් ලැබීම්	-	571,719,963
එකතුව	14,937,492,828	14,432,103,667
ගෙවූ බදු		
ආදායම් බදු	-	85,810,622
එකතු කළ අගය මත බදු සහ SSCL	18,000,000	224,608,218
එකතුව	18,000,000	310,418,840

32. ප්‍රධාන කළමනාකරණ පුද්ගලයින් සමඟ ගනුදෙන(KMPs)

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති LKAS 24 - සම්බන්ධිත පාර්ශව හෙළිදරවු කිරීම්වලට අනුව, ප්‍රධාන කළමනාකරණ පිරිස් සඳහා බැංකුවේ සහ එහි අනුබද්ධිත සහ ආශ්‍රිත ආයතනවල ක්‍රියාකාරකම් සැලසුම් කිරීම, මෙහෙයවීම සහ පාලනය සම්බන්ධයෙන් බලය සහ වගකීම දරන පිරිස අයත් වේ. බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය, සංස්ථාපිත කළමනාකරණ සාමාජිකයින්, ප්‍රධාන සේවකයින් සහ ඔවුන්ගේ පවුලේ සාමාජිකයින් ආදිය බැංකුවේ ප්‍රධාන කළමනාකරණ පිරිස ලෙසට වර්ගීකරණය කර ඇත.

32.1 ප්‍රධාන කළමනාකරණ පුද්ගලයින් වෙත සිදුකරන වන්දි ගෙවීම්

2023 දෙසැම්බර් 31න් අවසන් වර්ෂය සඳහා	2023 (රු.)	2022 (රු.)
කෙටිකාලීන සේවක ප්‍රතිලාභ	60,869,340	43,947,612
පශ්චාත් සේවක ප්‍රතිලාභ	9,653,878	7,911,734
එකතුව	70,523,218	51,859,347

32.2 (අ) ප්‍රධාන කළමනාකරණ පිරිස, ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින් (සැසී) සම්බන්ධ ගනුදෙනු, ගැළපීම් සහ සම්මුතින් සහ ප්‍රධාන කළමනාකරණ පිරිස හෝ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින්ගෙන් පාලනය කරන හා සැලකියයුතු බලපෑමක් ඇති ආයතනය

2023 දෙසැම්බර් 31න් අවසන් වර්ෂය සඳහා	2023 රු	2022 රු
ආදායම් ප්‍රකාශනය		
ඉපැයූ පොලී (ණය මගින්)	1,917,773	2,613,865
ගෙවූ පොලී (තැම්පතු සඳහා)	2,998,160	2,328,357
33 (අ) හි දක්වා ඇති ගෙවීම්	70,523,218	51,859,347
මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය		
වත්කම්		
ණය සහ අත්තිකාරම්	28,345,975	55,811,615
වගකීම්		
තැම්පතු	18,527,716	27,691,700

33. කල්බදු

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

හඳුනාගැනීමේ පදනම

කල්බදු ආරම්භක දිනයේ දී (එනම් කල්බදු ගිවිසුමේ සඳහන් කර ඇති දිනයේ දී) භාවිත වත්කම් හිමිකම බැංකුව විසින් හඳුනාගැනේ. ඒවා කල්බදු කාලය තුළ ගෙවීම් කළයුතු කල්බදු ගෙවීම් වල වර්තමාන අගය වේ.

තක්සේරු කිරීමේ පදනම

